LITTLE HOUSE

LITTLE HOUSE IN THE BIG WOODS

Laura Ingalls Wilder

වන අරණක කුඩා නිවස



Little House
කතා මාලාවේ
නිත්‍යානුකූල
සිංහල
පරිවර්තනය

පරිවර්තනය

ගංගා නිරෝෂිණී සුදුවැලිකන්ද

Scanned with CamScanner

වන අරණක කුඩා නිවස

ලෝරා ඉන්ගල්ස් වයිල්ඩර්

පරිවර්තනය

ගංගා නිරෝෂිණී සුදුවැලිකන්ද

විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය

Scanned with CamScanner

ගංගා නිරෝෂිණී පුදුවැලිකන්ද

1973 කොළඹ දී උපන් ගංගා සිය අධ්‍යාපන කටයුතු අවසන් කළේ කැලණිය ශාන්ත පාවුළු බාලිකා විද්‍යාලයෙනි. ඉන් පසු වසර කිහිපයක් සමුදුර හා සක්වළ පුවත්පත්වල සේවය කළ ඇය, 1998 දී සිය පළමු කෘතිය වන 'හිම අම්මා' ළමා කෘතිය ලියා පළ කළා ය. ඇ පරිවර්තිකාවක ලෙස කලඑළි බටුයේ 'වෘකයන් ගේ අඩවිය' හෙවත් 'වයිට් ෆැන්ග්' සහ 'වන අරණක කුඩා නිවස' යන කෘතීන් දෙක පරිවර්තනය කරමිනි. ගංගා දැනට හොංකොං දේශයේ පදිංචි ව සිටියි.

ලෝරා එලිසබෙත් ඉන්ගල්ස් වයිල්ඩර්

1867 පෙබරවාරි 07 වැනි දා විස්කොන්සින් මහ වනයේ කුඩා ලී නිවෙසක මෙලොව එළිය දුටු ලෝරා ගේ ළමා විය ගෙවුණේ, ආවරණය කළ ගැලක නැගී බටහිරට ගමන් කරමිනි. මුලින් ම කැන්සස්හි රතු ඉන්දියානු ප්‍රාන්තයටත්, ඉන් පසු මිනෙසොටාවේ පළඟැටියන් ගේ දේශයටත් ගිය ඇය අනතුරුව ඩකෝටා ප්‍රාන්තයට ගියා ය. ඇ අල්මන්සො වයිල්ඩර් සමඟ විවාහ වූයේ එහි දී ය.

ලෝරා ගේ දියණිය වන රෝස් වැඩුණේ ඇගේ මව ගේ කුඩා කාලයේත්, තරුණ කාලයේත් ඒ අපූරු කතාන්දර අසමිනි. 1900 දශකය මුල භාගයේ ජනප්‍රිය ලේඛිකාවක වූ රෝස්, සිය මව ගේ ජීවිත කතා පුවත් යළි සිහිපත් කරමින් ඒ කතාන්දර අසන්නට තමා ආසා කළාක් මෙන් අනෙක් ළමයිනුත් ආසා වනු ඇතැයි සිතුවා ය. එබැවින් ඇය ඒ කතාන්දර ලියන්නට සිය මව උනන්දු කළා ය. පසු ව 'ලිට්ල් හවුස්' කතා මාලාව බවට පත් වූ ප්‍රථම අත් පිටපත ලෝරා ගේ අතින් ලියැවුණේ Pioneer Girl නමිනි. එයින් අල්මන්සො වයිල්ඩර් හා විවාහ වන තුරු ම ගෙවුණු ලෝරා ගේ මුළු ළමා විය ම විස්තර කෙරිණි. එහෙත් මේ අත් පිටපත, සංස්කාරකවරුන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අතර කිසි දා මුද්‍රණය වූයේ නැත.

ඉන් පසු ලෝරා ඇගේ මුල් අත් පිටපතෙන් කොටසක් When Grandma was a Little Girl නමින් ළමයින් සඳහා පින්තූර පොතක් වශයෙන් නිර්මාණය කළා ය. එහි වූයේ ඇ හා මේරි, මහ වනයේ කුඩා දැරියන් ව සිටින අවදියේ අප්පච්චි විසින් ඔවුනට කියන ලද කතාන්දර ය. මේ පොත 1932 දී Little House in the Big Woods යනුවෙන් පළ කෙරිණි.

ඊ ළඟ දශකය තුළ සිය ජීවිත කතාව කෘති මාලාවක් වශයෙන් ලියා පළ කළ ලෝරා These Happy Golden Years කෘතියේ දී තරුණ ලෝරා අල්මන්සො වයිල්ඩර් සමඟ විවාහ වීමත් සමඟ ම, සිය ලිට්ල් හවුස් කතාන්දර මාලාව අවසන් කළා ය. ඒ 1943 වසරේ දී ය. එනමුත් ලෝරා ඇගේ විවාහ දිවියේ ප්‍රථම සිවු වසර අළලා අත් පිටපතක් ලිවා ය. මේ පොත 1971 දී The First Four Years නමින් පළ කෙරිණි. (එය දැන් ලෝරා ගේ

Scanned with CamScanner

'ලිට්ල් හවුස්' කතා මාලාවේ අවසන් කෘතිය වේ.) මේ පොත ලියූ කාල වකවානුව පිළිබඳ නිශ්චිත තොරතුරක් නොමැති වුව ද වැඩිහිටියන් සඳහා පොතක් ලෙස ඇගේ දෙවැනි 'ලිට්ල් හවුස්' පොත වන Farmer Boy කෘතිය ලියන කාලයේ, ඇ එය ලියන්නට ඇති බව බොහෝ උගතුන් ගේ විශ්වාසයයි.

ඊළඟ වසර කිහිපය තුළ ලෝරා ගේ කතා මාලාව භාෂා ගණනාවකට පරිවර්තනය වූ අතර ඒවා මුළු ලෝකය පුරා ම අතිමහත් ජනාදරයට පත් විය. 1970 හා 80 දශකවල මයිකල් ලන්ඩන් (චාල්ස් ඉන්ගල්ස් ගේ චරිතය රඟපෑවේ ඔහු ය.) විසින් නිර්මාණය කරන ලද Little House on the Prairie රූපවාහිනී වෘතාන්තය ලෝරාට තවත් සුවිශාල ජනප්‍රියත්වයක් ලබා දුන්නේ ය.

පටුන

1.	වන අරණක කුඩා නිවස	11 - 25
2.	සීත දවස් හා සීත රාත්‍රීන්	26 - 39
3.	දිග රයිෆලය	40 - 49
4.	නත්තල	50 - 65
5.	ඉරිදා	66 - 77
6.	ලොකු වලස්සු දෙදෙනා	78 - 88
7.	සීනි හිම	89 - 98
8.	සීයා ගේ නිවසේ නැටුම් උත්සවය	99 - 115
9.	නගරයට යාම	116 - 129
10.	ග්‍රීෂ්ම සෘතුව	130 - 144
11.	අස්වැන්න	145 - 153
12.	අරුම පුදුම යන්ත්‍රය	154 - 164
13.	කැලෑවේ සිටි මුවා	165 - 171

Scanned with CamScanner

1 පරිච්ඡේදය

වන අරණක කුඩා නිවස

මීට වසර හැටකට එපිට, එකෝමත් එක කාලයක, විස්කොන්සින් මහ වනයේ ලී කොටවලින් තැනූ කුඩා අළු පැහැති නිවසක කුඩා දැරියක් ජීවත් වූවා ය.

මහ වනයේ දැවැන්ත අඳුරු ගස් නිවස වටා නැඟී සිටියේ ය. ඒවාට එපිටින් තවත් ගස් ද, ඒවාට එපිටින් තව තවත් ගස් ද පැතිරී තිබිණි. දවසක් පුරා, සතියක් පුරා නො ව මුළු මාසයක් පුරා වුව ද තමාට හැකි තරම් දුරක් උතුරු දිගට ඇවිද යන මිනිසෙකුට, මහ වනය මිස අන් කිසිවක් හමු වන්නේ නැත. එහි ගෙවල් නො වී ය. මං මාවත් නො වී ය. මිනිස්සු නොවූ හ. එහි දක්නට ලැබුණේ ගස් හා ඒවා අතර සිය නිවාස තනාගත් කැලෑ සතුන් පමණි.

වෘකයෝ, වලස්සු හා විශාල කැලෑ බළල්ලු මහ වනයේ ජීවත් වූ හ. හික්මීයෝ, මින්ක් මුගටියෝ* හා දිය බල්ලෝ දිය පාරවල් අසබඩ පදිංචි ව සිටිය හ. නරින්ට කුඩා කඳු ගැටවල ගුහා තිබූ අතර මුවෝ සෑම තැන ම නිදැල්ලේ ඇවිදිමින් සිටිය හ.

* මින්ක් මුගටියා - දිය ගොඩ දෙකෙහි ම වසන කුඩා මුගටි විශේෂයක්.

කුඩා ලී නිවසේ සිට නැගෙනහිරටත්, බටහිරටත් සැතපුම් ගණනාවක් ඈතට යන තුරු ගස් වැවී තිබූ අතර කුඩා ලී නිවාස කිහිපයක් පමණක් මහ වනය මායිමේ තැන තැන ඉදිවී තිබෙනු දක්නට ලැබිණි.

කුඩා දැරිය ගේ දෑසට පෙනෙන මානයේ පිහිටියේ එක ම එක කුඩා නිවසක් පමණි. ඒ, ඈ ඇගේ පියාත්, මවත්, වැඩිමහල් සොහොයුරිය මේරි හා බිලිඳු සොහොයුරිය කේරිත් සමඟ ජීවත් වූ නිවසයි. නිවස ඉදිරියෙන් කරත්ත පාරක් දිවෙයි. කැරකෙමින් හා ඇදවෙමින් දිවෙන එය සතුන් ජීවත් වන මහ වනය මැදින් අතුරුදහන් වී යයි. එහෙත් එය යන්නේ කොතැනට ද කියාවත්, එහි අවසානය කුමක් වනු ඇති ද කියාවත් කුඩා දැරිය නොදන්නා ය.

මේ කුඩා දැරිය ගේ නම ලෝරා ය. ඇය සිය පියාට අප්පච්චි කියාත්, සිය මවට අම්මා කියාත් ඇමතුවා ය. ඒ කාලයේ ඒ පළාතේ දරුවන් දැන් කාලයේ මෙන් පියාට හා මවට තාත්ති හා අම්මි කියා ඇමතුවේ නැත.

රාත්‍රියේ රෝද සහිත මිටි ඇඳේ වැතිර නොනිදා සවන් දෙමින් සිටින ලෝරාට, ගස් එකිනෙකාට රහස් කියාගන්නා හඬ හැරෙන්නට අන් කිසිවක් ම ඇසෙන්නේ නැත. රාත්‍රි කාලයේ ඉඳහිට ඈත දුරකින් වෘකයෙකු උඩු බුරලනු ඇසේ. ඊළඟට ඌ වඩාත් සමීපයට ඇවිදින් යළිත් උඩු බුරලයි.

එය බිය උපදවන හඬක් විය. ඒ වෘකයන් කුඩා දැරියන් ව කාදමන බව ලෝරා දැන සිටියා ය. එහෙත් ශක්තිමත් ලී බිත්ති තුළ ඇය සුරක්ෂිත වූවා ය. ඇගේ පියා ගේ තුවක්කුව දොරට ඉහළින් එල්ලා ඇති අතර යහපත් මහලු ජැක් - වෛරම් වැවුණු බුල්ඩෝග් වර්ගයේ බල්ලා - ඒ ඉදිරියේ වැතිරී මුර කරමින් සිටියි. එවන් විටෙක ඇගේ පියා මෙසේ කියයි:

"නිදාගන්න, ලෝරා. ජැක් වෘකයන්ට ඇතුළට එන්න දෙන්නෙ නෑ" ඉතින් ලෝරා, මේරි අසලින් මිටි ඇඳේ ඇතිරිලි යට උණුසුමට ගුලිගැහී නින්දට වැටෙයි.

එක් රාත්‍රියක ඇය ව ඇඳෙන් නැඟිටුවාගත් ඇගේ පියා වෘකයන් පෙන්වනු පිණිස ඈ ව ජනේලය අසලට රැගෙන ගියේ ය. උහු දෙදෙනෙක් නිවස ඉදිරිපිට වාඩිවී සිටිය හ. උන් පෙනුණේ දළ ලොමින් වැසුණු බල්ලන් ලෙසිනි. සිය නාස් විශාල, දීප්තිමත් සඳ දෙසට එල්ල කරගත් උහු උඩු බුරලූ හ.

ජැක් ගොරව ගොරවා දොර ඉදිරියේ එහා මෙහා යන්නට වූයේ ය. උගේ පිට දිගේ ලොම් ඉලිප්පී තිබූ අතර ඌ තම තියුණු රෞද්‍ර දත් වෘකයන් දෙසට විලිස්සුවේ ය. උන් උඩු බුරලන්නට වූ නමුත් ඇතුළට ඒමට උන්ට නොහැකි විය.

නිවස සැප පහසු එකක් විය. ඉහළ මාලයේ විශාල අට්ටක් තිබිණි. වැසි පොද වහල මත වැටී බෙර හඬ නංවන විටෙක එහි සෙල්ලම් කිරීම ඉතා ප්‍රියජනක ය. පහළ මාලයේ කුඩා නිදන කාමරයක් හා විශාල කාමරයකි. ලී පියනකින් වැසූ ජනේලයක් නිදන කාමරයේ විය. විශාල කාමරයේ වීදුරු පියන් සහිත ජනේල දෙකක් වූ අතර, එයට ඉදිරිපස දොර හා පසුපස දොර යනුවෙන් දොර දෙකක් ද විය.

නිවස වළසුන් ගෙන් හා මුවන් ගෙන් ආරක්ෂා කරගැනීම සඳහා ගෙවත්ත වටා ශක්තිමත් ඉනි වැටක් ගසා තිබිණි.

නිවස ඉදිරිපස මිදුලේ විශාල මනරම් ඕක්* ගස් දෙකක් විය. සෑම උදෑසනක ම නින්දෙන් පිබිදුණු විගස ලෝරා ජනේලයෙන් පිටත බැලීම සඳහා දුව ගිය අතර, එක් උදෑසනක ඈ දුටුවේ විශාල ගස් දෙකේ අතු දෙකක එල්ලෙමින් ඇති මැරුණු මුවන් දෙදෙනෙකි.

අප්පච්චි කලින් දවසේ මුවන්ට වෙඩි තබා තිබුණේ ය. මනු රාත්‍රියේ උන් ව ගෙදර ගෙනැවිත් වෘකයන්ට මස් කෑමට නො හැකි වන සේ උන් ව ගස්වල උස අතුවල එල්ලන විට ලෝරා නින්දට ගොස් සිටියා ය.

එදා රාත්‍රියේ ආහාර වේලට අප්පච්චිට, අම්මාට, ලෝරාට හා මේරිට අලුත් මුව මස් තිබිණි. එය කොතරම් රසවත් ද යත්, ඒ සියල්ල ම කන්නට ඇත්නම් යැයි ලෝරා සිතුවා ය. එහෙත් මස්වලින් බොහොමයක් ලුණු දමා, දුම් ගසා, සීත සෘතුවේ දී ප්‍රයෝජනයට ගැනීම සඳහා ගබඩා කර තැබිය යුතු ය.

සීත සෘතුව ළං වෙමින් තිබේ. දවස් වඩාත් කෙටි වන්නට වූ අතර රාත්‍රි කාලයේ දී තුහින, ජනෙල් පියන් මතට බඳගැවේ ය. ඉක්මනින් ම හිම වැටෙනු ඇත. එවිට ලී නිවස සම්පූර්ණයෙන් ම හිම කතරේ සැඟවී යනු ඇත. විල හා දිය පාරවල් සීතලෙන් මිදෙනු ඇත. දැඩි සීත කාලගුණය මැද අප්පච්චිට මස් සඳහා දඩයමක් සොයාගැනීමට ලැබේ ද යන්න සැක සහිත ය.

* ඕක් - බොහෝ සවි ඇති ලීවලින් යුතු ගස් වර්ගයක්.

සිය ගුහාවල සැඟවෙන වලසුන් මුළු සීත සෘතුවේ ම ගොරවගොරවා නිදනු ඇත. ලේනුන් සිය ලොම් සහිත වලිග තාස් වටා උණුසුමට ඔතාගෙන ගස් බෙනවල ඇති කුඩුවල ගුළි වෙනු ඇත. මුවන් හා හාවුන් මහ කලබලයෙන් පැනපැන දුවනු ඇත. අප්පච්චිට මුවකු අල්ලාගැනීමට හැකි වුවත්, ඌ සරත් සෘතුවේ ගැවසෙන මුවන් මෙන් මස් පිරුණු, පුෂ්ටිමත් එකෙකු වන්නේ නැත. ඌ දුර්වල, කෙට්ටු එකෙකු වනු ඇත.

එවන් සමයක, මහා සීතලේ, හිමෙන් වැසුණු මහ වනය පුරා මුළු දවස ම තනි ව දඩයමේ ගොසින් අම්මාට, මේරිට හා ලෝරාට කෑමට කිසිවක් සොයාගත නො හැකි ව රාත්‍රියේ හිස් අතින් නිවසට ඒමට අප්පච්චිට සිදු වනු ඇත.

ඒ නිසා සීත සෘතුව උදා වීමට පෙර, කුඩා නිවසේ හැකි තරම් ආහාර ගබඩා කර තැබීම අත්‍යවශ්‍ය විය.

පරිස්සමට මුවා හම ගැසූ අප්පච්චි, එයට ලුණු දමා හම දිග හැර තැබුවේ ය. ඒ හම්වලින් ඔහු සිනිඳු, පදම් කළ හම් සාදනු ඇත. ඊ ළඟට මස් කපන්නට වූ ඔහු, කැපූ මස් කැබැලි ලෑල්ලක් මත තබමින් ලුණු ඉස්සේ ය.

ගෙවත්ත කෙළවර විශාල බෙනයක් සහිත ගසක කඳකින් කපාගත් උසැති කොටයක් තිබිණි. අප්පච්චි තමාට හැම අන්තයකින් ම අත දිගු කළ හැකි තරම් දුරට ඒ කොටය තුළ ඇණ ගැසුවේ ය. ඊ ළඟට එය කෙළින් සිටවූ ඔහු එහි උඩට කුඩා පියස්සක් සවි කොට, කොටයේ පහළට වන්නට එක් පැත්තකින් කුඩා දොරක් කැපුවේ ය. කැපූ දොරට හම් සරනේරු සවි කළ ඔහු ඊ ළඟට එය විවරයට සවි කළේ ය. ගසේ පොත්ත ද සහිත එය කොටයේ කුඩා දොර විය.

දින කිහිපයක් තිස්සේ මුව මස්වලට ලුණු දැමූ අප්පච්චි, මස් කැබැලිවල එක් කොනකින් සිදුරක් සාදා ඒ තුළින් නූලක් දැමුවේ ය. ලෝරා ඔහු එය කරන අයුරු බලා සිටියා ය. ඊළඟට ඔහු බෙනය සහිත කොටය තුළ ඇති ඇණවල මස් එල්ලනු ඇය බලා සිටියා ය.

කුඩා දොරින් අත ඇතුළට දැමූ ඔහු, තමාට අත පෙවිය හැකි තාක් දුරින් ඇති ඇණවල මස් එල්ලුවේ ය. අනතුරුව කොටයට ඉණිමඟක් හේත්තු කොට උඩට නැග, වහලය එක් පැත්තකින් ගලවා අත ඇතුළට දමා, ඉහළ ඇති ඇණවල මස් එල්ලුවේ ය.

අනතුරුව යළිත් වහලය තිබූ පරිදි සකස් කළ ඔහු ඉණිමඟෙන් බැස ලෝරාට මෙසේ කීවේ ය:

Scanned with CamScanner

"දර කපන තැනට දුවලා ගිහිං, අමු හිකරි* ලී පතුරු ටිකක් අරං එන්න - අලුත්, පිරිසිදු, කොළ පාට ඒවා."

ඉතින් අප්පච්චි දර කපන ස්ථානයට දිව ගිය ලෝරා ඇගේ ඒප්‍රනය අලුත්, මිහිරි සුවඳැ'ති දර පතුරුවලින් පුරවාගත්තා ය.

බෙනය සහිත කොටයේ කුඩා දොර ඇතුළෙන් පොතු කැබැලි හා පාසි එක්කර ගිනි මැලයක් ගැසූ අප්පච්චි, ඉතා පරිස්සමට දර පතුරු කිහිපයක් එයට ඇතුළු කළේ ය.

අමු දර පතුරු වහා ඇවිළෙනු වෙනුවට ගිනි පිට නො වී දැවෙමින්, බෙනය සහිත කොටය ගනකමැ'ති විශාල දුමාරයකින් පිරෙව්වේ ය. අප්පච්චි දොර වැසුවේ ය. එය වටා වූ කුඩා විවරය තුළ සිහින් දුමාරයක් ඇහිරී තිබූ අතර, වහලය තුළින් සිහින් දුමාරයක් ගලා ආවේ ය. එහෙත් එයින් වැඩි දුම් ප්‍රමාණයක් මස් කැබැලිවලින් වසාගෙන තිබිණි.

"හොඳ හිකරි දුම තරං හොඳ, වෙන දුමක් නෑ," අප්පච්චි කීවේ ය. "හිකරි දුම් ගැහුව ම ඔන ම කාලගුණෙකදි, ඕන ම තැනක තියාගන්න පුළුවං හොඳ මුව මස් හදාගන්න ඇහැකි."

* හිකරි - වෝල්නට් පවුලේ උතුරු ඇමෙරිකානු ගසක්. ශක්තිමත් ලී සහිත මේ ගසේ ගෙඩි ආහාරයට ගනු ලැබේ.

අනතුරුව සිය තුවක්කුව ගත් ඔහු පොරොව උරහිසේ එල්ලාගෙන තවත් ගස් කිහිපයක් කැපීම සඳහා එළිමහන් ප්‍රදේශයට ගියේ ය.

ලෝරා සහ අම්මා දින කිහිපයක් පුරා ගිනිමැලය අවුළුවා තබාගැනීමට වග බලාගත් හ. දුමාරය කුඩා විවරයන් තුළින් පිටතට ගලා එම නතර වූ විට, ලෝරා තවත් හිකරි දර පතුරු ගෙනා අතර අම්මා මස් යටින් වූ ගිනිමැලයට ඒවා ඇතුළු කළා ය. සෑම මොහොතක ම ගෙවත්ත පුරා සියුම් දුම් සුවඳක් පැතිර තිබූ අතර, දොර විවර කළ විට ඝනැ'ති දුමාරය සහිත මස් සුවඳක් පිටතට ගලා ආවේ ය.

අන්තිමේදී මුව මස් හොඳින් දුම් ගැසී ඇති බව අප්පච්චි කීවේ ය. ඉන් පසු ඔවුන් ගිනිමැලය නිවී යන්නට හැරිය අතර, අප්පච්චි ගස් බෙනය තුළින් සියලු ම මස් තීරු හා කැබැලි පිටතට ගත්තේ ය. සෑම කැබැල්ලක් ම කරදාසිවලින් හොඳින් එතූ අම්මා, ඒවා සුරක්ෂිත ව හා වියලි ව තබනු පිණිස අටුවේ එල්ලුවා ය.

එක් උදෑසනක අරුණාලෝකය වැටෙන්නටත් පෙර අශ්වයින් ගැලට බැඳගෙන බැහැරව ගිය අප්පච්චි, රාත්‍රියේ යළි නිවසට ආවේ ගැල පුරවාගත් මාළුත් සමඟ ය. ගැලේ විශාල පෙට්ටියේ මාළු ගොඩ ගසා තිබූ අතර සමහර උන් ලෝරා තරම් විශාල විය. අප්පච්චි පෙපින් විලට ගොස් දැල් දමා ඒ සියලු ම මාළු අල්ලා තිබුණේ ය.

අම්මා කොරපොතු සහිත සුදු මාළුවෙකු ගෙන එක කටුවක් හෝ ඉතිරි නොවන පරිදි කටු සියල්ල හැර, එය විශාල කැබැලිවලට කැපුවා ය. ඒ ලෝරාට හා මේරිට ය. ඔවුහු සියලු දෙනා ම ප්‍රණීත, අලුත් මාළුවලින් සන්තර්පනය වූ හ. ඔවුන් නොකෑ අලුත් මාළු සියල්ල ලුණු දමා, ශීත සෘතුවට ගනු පිණිස බැරල්වල අසුරන ලදි.

අප්පච්චි ඌරකු ඇති කළේ ය. ඌ මහ වනයේ ඇවිදිමින් ඕක් ගස්වල ගෙඩි, අල හා මුල් කමින් ජීවත් වූයේ ය. දැන් ඌ අල්ලාගත් අප්පච්චි ඌ තර කිරීම පිණිස ලීවලින් සාදන ලද කොටුවක දමා තිබුණේ ය. ඌරු මස් ශීත කිරීමට තරම් සීතල කාලගුණයක් ඇති වූ සැණින් ඔහු ඌ මරනු ඇත.

එක් මැදියම් රැයෙක පිබිදුණු ලෝරාට, ඌරා ඇඬූ වේදනාවෙන් කෑගානු ඇසුණේ ය. ඇඳෙන් බිමට පැන්න

අප්පච්චි බිත්තියෙන් සිය තුවක්කුව වහා අතට ගෙන ගෙවත්තට දිව්වේ ය. තුවක්කුව වරක් දෙවරක් පත්තු වනු ඒ ළඟට ලෝරාට ඇසිණි.

ආපසු නිවසට ආ අප්පච්චි සිදු වූයේ කුමක් දැයි විස්තර කළේ ය. විශාල කළු වලසකු ඌරු කොටුව අසල සිටිනු අප්පච්චි දැක තිබේ. වලසා, ඌරා අල්ලාගැනීම සඳහා ඌ වෙත ළං වෙමින් සිටි අතර, ඌරා එහා මෙහා දුවමින් කෑගාන්නට වූවේ ය. තරු එළියෙන් මෙය දුටු අප්පච්චි වහා වෙඩි තැබුවේ ය. එහෙත් ආලෝකය ඉතා මලානික වූ අතර ඔහු ගේ ඉක්මන්කම නිසා ඔහුට වලසා මග හැරුණේ ය. ඌ කිසි ම අනතුරක් නැති ව වනයට පැන ගියේ ය.

අප්පච්චිට වලසා අල්ලාගැනීමට නො හැකි වීම ගැන ලෝරා දුක් වූවා ය. ඇ වලස් මස්වලට ඉතා කැමැති ය. අප්පච්චි ද ඒ පිළිබඳ ව කනගාටු වූ නමුත් මෙසේ කීවේ ය:

"කොහොමුණත් ඌ බේකන් ටික ඉතුරු කරගත්ත නෙව."

කුඩා නිවස පිටුපස ඇති එළවළු කොටුව මුළු ග්‍රීෂ්ම කාලුව පුරා ම සරුවට වැවී තිබිණි. එය නිවසට ඉතා ආසන්නයෙන් තිබූ බැවින්, දවල කාලයේ දී මුවන්ට වැට පැන ඇතුළට වී එළවළු

කෑමට නො හැකි විය. රාත්‍රී කාලයේ ජැක් උන්ට ඒ වෙත ළං වීමටවත් ඉඩ තැබුවේ නැත. ඇතැම් දවසක උදෑසන කැරට් හා ගෝවා පඳුරු අතරේ කුඩා කුර සලකුණු දක්නට තිබිණි. එහෙත් ජැක් ගේ පා සලකුණු ද එහි වූ අතර එළවළු කොටුවට ආ මුවෝ යළිත් ඈතට පැනගොස් තිබුණ හ.

දැන් සීත රාත්‍රීන් උදා වී තිබූ බැවින් අර්තාපල්, කැරට්, බීට්, ටර්නිප්* හා ගෝවා ආදි එළවළු එකට එක්කොට බිම් ගෙයි ගබඩා කර තබන ලදි.

රතු ලූනු ඒවායේ ඉහළ කෙළවරින් එකට අල්ලා ගොතා දිග වැල් ආකාරයෙන් සාදා නූල්වල අමුණා, රැලි ලෙස අට්ටාලයේ එල්ලා ඇති මාළු මිරිස් අසලින් එල්ලා තිබිණි. තැඹිලි, කහ සහ කොළ පැහැයෙන් දිලෙන වට්ටක්කා හා ස්කොෂ්* ගෙඩි අට්ටාලයේ කොනක ගොඩ ගසා ඇත.

ලුණු දැමූ මාළු බැරල් ආහාර ගබඩාවේ තබා තිබූ අතර, කහ පැහැති චීස් ආහාර ගබඩාවේ රාක්කවල අසුරා තිබිණි.

එක් දිනයක හෙන්රි මාමා අසු පිට නැගී වනය මැදින් නිවසට ආවේ ය. ඔහු පැමිණියේ අප්පච්චි ගේ මස් මැරීමට උදවු වීම සඳහා ය. අම්මා ගේ විශාල මස් පිහිය දැනටමත් හොඳින් මුවහත තබා තිබූ අතර, හෙන්රි මාමා පොලී නැන්දා ගේ මස් පිහිය ගෙනැවිත් තිබුණේ ය.

ඌරු කොටුව අසල ගිනිමැලයක් ගැසූ අප්පච්චි හා හෙන්රි මාමා, රත් වනු පිණිස විශාල වතුර බඳුනක් ඒ මත තැබූ හ. වතුර උතුරාගෙන එන විට ඔවුහු ඌරා මැරීම පිණිස ගියහ. ගෙතුළට දිව ගිය ලෝරා ඇගේ හිස ඇඳේ ඔබාගෙන ඌරා ගේ කෑගැසීම නො ඇසෙනු වස්, සිය ඇඟිලිවලින් කන් වසාගත්තා ය.

"මේකෙන් ඌට රිදෙන්නෙ නෑ, ලෝරා," යි අප්පච්චි කීවේ ය. "අපි හරි ම ඉක්මනට ඒ වැඩේ කරනවා" එහෙත් ඌගේ වේදනාබර හඬ ඇසීමට ඇට ඕනෑ නො වී ය.

මොහොතකට පසු ඇය විපරමින් යුතු ව සිය ඇඟිලි කන්වලින් ඉවතට ගෙන සවන් දුන්නා ය. ඌරා ඌගේ කෑගැසීම නවත්වා තිබුණේ ය. එතැන් පටන් මස් මැරීමේ කාලය ඉතා විනෝදජනක එකක් විය.

---

*ටර්නිප් : [illegible]
*ස්කොෂ් : [illegible]

එය බලන්නට හා කරන්නට බොහෝ දේ තිබූ ඉතා කාර්යබහුල දවසක් විය. හෙන්රි මාමා හා අප්පච්චි විනෝදයෙන් සිටිය හ. අද දිවා ආහාරය සඳහා ඌරා ගේ ඉළ ඇට කන්නට ලැබෙනු ඇත. ලෝරාට හා මේරිට හුළං බෝක්ක හා ඌරු වලිගය දෙන බවට අප්පච්චි පොරොන්දු වූයේ ය.

ඌරා මැරුණු විගස අප්පච්චි හා හෙන්රි මාමා එකතුව ඌරා හොඳින් තැම්බෙන තුරු උතුරන වතුරේ ඌ ඒ මේ අත පෙරළූ හ. අනතුරුව ඌ ලෑල්ලක් මත දිගා කළ ඔවුහු, සිය පිහිවලින් ඌගේ සිරුර සූරන්නට වූ හ. සිරුරේ සියලු ම ලෝම ගැලවී ගියේ ය. ඉන් පසු ව ඌරා ගසක එල්ලූ ඔවුහු, ඌගේ බොකු ඉවත් කර ඌ සිසිල් වීම සඳහා තැබූ හ.

ඌ සිසිල් වූ පසු බිමට ගත් ඔවුහු ඌරා මස් කරන්නට වූ හ. එහි හැම්*, උරහිස්, බේකන්*, ඉළ ඇට හා උදරය විය. එසේ ම හදවත, පිකුදු, හා හෙඩ් චීස්* සෑදීම සඳහා හිස ද තිබූ අතර සොසේජස් සෑදීම සඳහා ගන්නා කුඩා කැබලිවලින් තාච්චුවක් පිරී තිබිණි.

*හැම් - ඌරා ගේ තට්ටවල මස්වලින් සාදන ආහාරය
*බේකන් - ඌරා ගේ ඇලපතේ මස්වලින් සාදන ආහාරය
*හෙඩ් චීස් - ඌරා ගේ හිසේ මස්වලින් සාදන ආහාරය

පිටුපස මිදුලේ මඩුව තුළ වූ ලෑල්ලක මස් අතුරා, සෑම කැබැල්ලකට ම ලුණු ඉසින ලදි. හැම් හා උරහිස් ලුණු දියේ දමා ඒවා මුව මස් මෙන් දුම් ගසනු පිණිස බෙනය සහිත කොටය තුළට දමන ලදි.

"හිකරි දුම් ගහපු හැම් තරං, හොඳ හැම් කොහේවත් නෑ." අප්පච්චි කීවේ ය.

ඔහු හුළං බෝක්ක පිම්බුවේ ය. එය කුඩා සුදු බැලූනයක් මෙන් වූ අතර, ඔහු එහි කෙළවර නූලකින් තදට බැඳ සෙල්ලම් කිරීම සඳහා මේරිට හා ලෝරාට දුන්නේ ය. ඔවුහු එය උඩ දමමින්, අත්වලින් එහාට මෙහාට ගසමින් සෙල්ලම් කරන්නට වූ හ. නැති නම් එය බිම දිගේ පැන පැන ගිය අතර එවිට ඔවුනට එයට පයින් ගැසීමට හැකි විය. එහෙත් බැලූනයට වඩා ඌරු වලිගය ඔවුනට විශාල ප්‍රීතියක් ගෙන දුන්නේ ය.

ඔවුනට දීම සඳහා පරිස්සමට ඌරු වලිගය හම ගැසූ අප්පච්චි, එහි විශාල කෙළවරට උල් ලීයක් ඇතුළු කළේ ය. පෝරණුවේ ඉදිරිපස කොටස විවර කළ අම්මා ගිනියම් අඟුරු කැට එක්කොට යකඩ උඳුනට ඇමුවා ය. අනතුරුව ලෝරා හා මේරි මාරුවෙන් මාරුවට ඌරු වලිගය ගිනි අඟුරුවලට උඩින් අල්ලාගෙන සිටින්නට වූ හ.

සුරු සුරු හඬ නගමින් බැදෙන්නට වූ ඌරු වලිගයේ තෙල්, බිඳිති ලෙසින් වැස්සී අඟුරු කැට මහත් දීප්තියෙන් අවුළුවයි. රස්නය වැදී ඔවුන් ගේ අත් හා මුහුණු ඉතා උණුසුම් ව තිබූ අතර ලෝරා ඇගේ ඇඟිල්ලක් ද පුළුස්සාගත්තා ය. එහෙත් ඇගේ සිතේ වූ උද්‍යෝගය කොතරම් ද යත්, ඇට ඒ පිළිබඳ ව තැකීමක් නො වී ය. ඌරු වලිගය පිළිස්සීම විශාල ප්‍රීතියක් ඇති කළ අතර, මාරුවෙන් මාරුවට එය පිළිස්සීමේ වාරය සාධාරණ ව ලබාගැනීම දෙදෙනාට ම අසීරු කටයුත්තක් විය.

අන්තිමේ දී ඒ කාර්යය අවසන් විය. ඌරු වලිගය ඉතා මනහර ලෙස සම්පූර්ණයෙන් ම දුඹුරුවන් වී තිබිණි. එපමණක් ද, එයින් නැගෙන ප්‍රණීත සුවඳ! එය නිවීම සඳහා ගෙවත්තට ගෙන ගිය ඔවුහු එය හොඳින් නිවෙන්නටත් පෙර ම එහි රස බලන්නට ගොස් දිව පුච්චාගත් හ.

කටුවල සෑම කුඩා මස් කැබැල්ලක් ගානේ ම අනුභව කළ ඔවුහු, ඉතිරි වූ කටු ජැක්ට කන්නට දුන් හ. එය උරු වලිගයේ

අවසානය විය. ලබන අවුරුද්ද වන තෙක් තවත් වලිගයක් ආහාරයට ලැබෙන්නේ නැත.

දිවා ආහාරයෙන් පසු හෙන්රි මාමා පිටත් ව ගියේ ය. ඊ ළඟට අප්පච්චි තමා ගේ එදිනෙදා කටයුතු සඳහා මහ වනයට ගියේ ය. එහෙත් ලෝරාට, මේරිට හා අම්මාට මස් මැරීමේ සමය ආරම්භ වූවා පමණි. අම්මාට කිරීමට තවත් වැඩ රාශියක් තිබූ අතර ලෝරා හා මේරි ඇට උදවු වූ හ.

ඒ දවස පුරාමත්, ඊළඟ දවසේත් අම්මා උදුන මත තබන ලද විශාල යකඩ හැළිවල ඌරු තෙල් සෑදුවා ය. ලෝරා හා මේරි ළිපට දර ගෙන ඇවිදින් ගින්න හොඳින් දැල්වීමේ කාර්යය බාරගත් හ. ඌරු තෙල් සඳහා රස්නය අවශ්‍ය නමුත් විශාල රස්නයක් නොලැබිය යුතු ය. එසේ වුවහොත් ඌරු තෙල් පිලිස්සී යනු ඇත. විශාල හැළිවල ඇති ඌරු තෙල් හීන් හඬක් නගමින් මඳ ගින්නේ බැදිය යුතු නමුත්, එයින් දුමක් පිට නොවිය යුතු ය. අම්මා වරින් වර දුඹුරු පැහැගැන්වුණු, බැදුණු ඌරු මස්වල පිට සිවිය ඉවත් කළා ය. අනතුරුව ඒ සියල්ල රෙදි කඩකට දැමූ ඇය, අන්තිම තෙල් බිංදුවත් එන තුරු එය හොඳින් මිරිකුවා ය. ඉන් පසු තෙල් මිරිකාගත් ඌරු මස්වල පිට සිවිය පසෙකින් තැබුවා ය. ජොනි-කේක රස ගැන්වීම සඳහා ඈ පසු ව ඒවා ප්‍රයෝජනයට ගනු ඇත.

ඌරු මසේ පිට සිවි ඉතා රසවත් ආහාරයක් වූ නමුත් ලෝරා හා මේරි එය යන්තම් රස බැලුවා පමණි. ඒවා කුඩා දැරියන්ට කෑමට බර වැඩි බව අම්මා කීවා ය.

ඌරු හිස පරිස්සමින් සූරා පිරිසිදු කළ අම්මා, කටුවල මස් සියල්ල ගැලවී යන තුරු එය තැම්බුවා ය. ඊ ළඟට මස් සියල්ල ලී කෝප්පයකට දමා සිය මන්නයෙන් ඒවා ඉතා සිහින් වන තුරු කෙටුවා ය. දෙවනු ව එයට ගම්මිරිස්, ලුණු හා කුළුබඩු එක්කොට පදම් කළා ය. ඊ ළඟට එයට මස් තැම්බූ වතුර ද මිශ්‍ර කළ ඇය, එය තාච්චුවක දමා සිසිල් වන්නට තැබුවා ය. ඒවා සිසිල් වූ පසු කැබැලිවලට කපනු ලැබේ. හෙඩ් චීස් යනුවෙන් හඳුන්වන්නේ ඒවා ය.

විශාල මස් කැබැලිවලින් ඉතිරි වූ සිහින් හා මහත කුඩා මස් කැබැලි සියල්ල එකතු කළ අම්මා, ඒවා ඉතා සිහින් වන තුරු පිහියෙන් කැපුවා ය. අනතුරුව ගම්මිරිස් හා ලුණු ද

ගෙවත්තෙන් කඩාගන්නා ලද සේජ්* කොළ ද දමා එය පදම් කළා ය. ඊ ළඟට එය හොඳින් මිශු වන තෙක් සිය අත්වලින් මිශ්‍රණය එහා මෙහා පෙරළමින් කළවම් කොට ගුළි ගැසුවා ය. අනතුරුව ඒ ගුළි තාච්චුවක දමා මඬුවේ තැබුවා ය. මඬුවේ දී සීතලෙන් මිදෙන ඒ මස් මුළු සීත සෘතුව පුරා ම කෑමට ගත සඳහා ප්‍රණීත ආහාරයක් වනු ඇත. ඒ සොසේජස් ය.

මස් මරන කාලය අවසන් වූ විට සොසේජස් හා හෙඩ් චීස් ද, ඌරු තෙල් පිරුණු විශාල බුජම් ද, මඬුවේ තබන ලද ලුණු දැමූ සුදු ඌරු මස් පිජ්ප හා අටුවේ එල්ලන ලද දුම් ගැසූ හැම් හා උරහිස් ද ඔවුන් සතු ව තිබිණි.

දීර්ඝ සීත සෘතුවේ දී ප්‍රයෝජනයට ගැනීම සඳහා ගබඩා කරන ලද හොඳ ආහාර වර්ගවලින් කුඩා නිවස සෑහෙන තරම් පිරී තිබිණි. අටුව සේ ම ගබඩා කාමරය, මඬුව හා බිම් ගෙය ද ආහාරවලින් පිරිලා ය.

පිටත අධික සීතල විසින් ගිලගෙන ඇති බැවින දැන් ලෝරා හා මේරි නිවස තුළට වී සෙල්ලම් කළ යුතු වූ හ. පිටත ගස්වල දුඹුරු පැහැති කොළ සියල්ල බිමට වැටෙමින් තිබේ. පෝරණුවේ ගිනිමැළය කිසිවිටෙකත් නොනිවන ලදි. උඳුසන වන තුරු ම ගිනි අඟුරු නොනිවී තබාගැනීම සඳහා රාත්‍රියේ දී අප්පච්චි පෝරණුව වටා අළු ගොඩ ගැසුවේ ය.

අටුව සෙල්ලම් කිරීම සඳහා ඉතා මනහර ස්ථානයක් විය. විශාල රවුම්, පාට පාටැති වට්ටක්කා ගෙඩි විසින් මේස හා පුටුවල අඩුව පිරිමසන ලදි. මාළු මිරිස් හා රතු ලූනු හිසට ඉහළින් එල්ලෙයි. කරදාසිවල ඔතන ලද හැම් හා මුව මස් උඩ එල්ලා ඇත. පොකුරු වශයෙන් එල්ලා ඇති වියළි පැළෑටි, ඉවුම් පිහුම් සඳහා කුළුබඩු වශයෙන් ගනු ලබන පැළෑටි හා බෙහෙතට ගනු ලබන තිත්ත පැළෑටි ආදිය ඒ ස්ථානයට දූවිලි සහිත කුළුබඩු සුවඳක් ගෙන දුන්නේ ය.

ගෙවත්තේ එහා මෙහා හමමින්, නිරන්තරයෙන් ම හුදෙකලාව පිරුණු රාවයක් නංවන සුළඟ සීතල ය. එහෙත ලෝරා හා මේරි සෙල්ලම් කරන වට්ටක්කා හා ස්කොෂ් කැකිරි පිරුණු අටුව ඇතුළු මුළු නිවස පුරා උණුසුම හා සැප පහසුව නො අඩුව තිබිණි.

* සේජ් - මින්ච් වැනි පැළෑටි වර්ගයක්.

මේරි, ලෝරාට වඩා වයසින් වැඩිමල් වූ අතර ඇට නෙටී නම් රෙදි බෝනික්කෙක් සිටියා ය. ලෝරාට තිබුණේ ලේන්සුවකින් මසන ලද ඉරිඟු කරලක මැද නාරටියක් පමණි. එහෙත් ඇය හොඳ බෝනික්කෙක් වූවා ය. ඇගේ නම සූසන් ය. සූසන් ඉරිඟු කරලේ මැද නාරටියක් වූයේ ඇගේ වරදකින් නො වේ. ඉඳහිටෙක නෙටී ඇල්ලීමට මේරි, ලෝරාට අවසර දුන්නා ය. එහෙත් ඈ එය කළේ සූසන් ළඟ පාතක දකින්නට නැති විටෙක පමණි.

මේ සියල්ලට ම වඩා හොඳ ම කාලය රාත්‍රියයි. රෑ කෑමෙන් පසු මඩුවෙන් සිය උගුල් පිටතට ගන්නා අප්පච්චි, ගිනිමැළය අසල හිඳගෙන ඒවායේ තෙල් ගල්වයි. ඒවා දීප්තිමත් වන තුරු ඔප දමන අප්පච්චි වලස් තෙල්වල ගිල්වන ලද පිහාටුවකින් ඒවායේ හනුවල ඇති අසව්වල හා යකඩ කුරුවල ඇති දුනුවල තෙල් ගැල්වූවේ ය.

ඔහු සතු ව කුඩා උගුල්, මධ්‍යම ප්‍රමාණයේ උගුල් හා වලසුන් අල්ලන විශාල උගුල් ද විය. ඒවායේ හනුවල ඇති තිබූ අතර මිනිසෙකු ගේ පයකට හසු වුවහොත් ඔහු ගේ පය වුවත් එයින් කැඩී යා හැකි බව අප්පච්චි කීවේ ය.

උගුල්වල තෙල් ගල්වන අතරේ අප්පච්චි ලෝරාට හා මේරිට පුංචි පුංචි විහිළුත්, කතාන්දරත් කියා දුන්නේ ය. ඉන් පසු ව ඔහු රවුකිඤ්ඤය වයයි. ,

නිවසේ දොරවල් හා ජනේල තදින් වසා තිබූ අතර, සීතල ඇතුළට ඒමෙන් වැළැක්වීම සඳහා ජනේල රාමුවල කුඩා විවරවලට රෙද්දක් ඔබා තිබිණි. එහෙත් ඔවුන් ගේ සුරතල් බැළලිය, බ්ලැක් සූසන් නිවසේ ඉදිරිපස දොරේ පහළින් වූ කුඩා විවරයේ පැද්දෙන දොරින් වරෙක පිටතට යමින් ද, වරෙක ඇතුළට එමින් ද ඇට කැමැති හැටියට රැයෙත් දවාලෙත් සක්මන් කළා ය. ඈ නිතර ම වේගයෙන් ගමන් කළ බැවින් ඈට පිටුපසින් වැසෙන දොරට කිසිවිටෙකත් ඇගේ වලිගය අල්ලාගැනීමට නො හැකි විය.

එක් රාත්‍රියක උගුල්වල තෙල් ගල්වමින් සිටි අප්පච්චි බ්ලැක් සූසන් ඇතුළට එනු දැක මෙසේ කීවේ ය:

"ඔන්න එක මනුස්සයෙකුට බළල්ලු දෙන්නෙක් හිටියා. ලොකු එකෙකුයි, පුංචි එකෙකුයි."

ලෝරා සහ මේරි කතාන්දරයේ ඉතිරි කොටස අසනු කැමැත්තෙන් ඔහු වෙත දිව ගොස් ඔහු ගේ දෙදණට බර වූහ.

"එයාට බළල්ලු දෙන්නෙක් හිටියා" යි අප්පච්චි යළිත් කීවේ ය, "ලොකු බළලෙකුයි, පුංචි බළලෙකුයි. ඉතිං මේ මනුස්සයා ලොකු බළලාට යන්න එයා ගෙ දොරේ ලොකු සිදුරක් හැදුවා. ඊ ළඟට පුංචි බළලට යන්න පුංචි සිදුරක් හැදුවා."

අප්පච්චි මෙහැන දී කතාව නතර කළේ ය.

"ඇත් ඇයි පුංචි බළලට යන්න බැරි?" මේරි කියන්නට වූවා ය.

"ලොකු බළලා එයාට යන්න දෙන්නෙ නැතෙ." ලෝරා මැදට පැන්නා ය.

"ලෝරා, ඔන්න නරක වැඩක් කරනවා. කවදාවත් තව කෙනෙක් කතා කරන කොට මැදට පනින්න එපා." අප්පච්චි කීවේ ය.

"ඒත් මං දන්නවා," ඔහු කතා කරන්නට විය. "ඔය දෙන්නට ම තමන් ගෙ දොරේ බළලුන්ට සිදුරු දෙකක් හදාපු මනුස්සයට වඩා දැනුං තේරුං තියෙනවා."

අනතුරුව උගුල් පසෙක තැබූ අප්පච්චි පෙට්ටියෙන් සිය රවුකිඤ්ඤය පිටතට ගෙන එය වයන්නට වූවේ ය. එය සියල්ලට ම වඩා හොඳ ම කාලයයි.

2 පරිච්ඡේදය

සීත දවස් හා සීත රාත්‍රීන්

ශී‍්‍ර ම වැටීම ආරම්භ වූ අතර පරිසරය දැඩි සීතලකින් යුතු විය. සෑම උදෑසනක ම සිය තුවක්කුව හා උගුල් අතැ'ති ව නිවසින් පිටවන අප්පච්චි, මහ වනයේ ඇවිද හික්මීයන්ට හා මින්ක් මුගටියන්ට දිය පාරවල් දිගේ කුඩා උගුල් අටවමින් ද, වනයේ නරින්ට හා වෘකයන්ට මධ්‍යම ප්‍රමාණයේ උගුල් අටවමින් ද කාලය ගත කළේ ය. සීත කාලය ගත කිරීම සඳහා වලසුන් සියල්ලන් ම උන් ගේ ගුහාවලට යන්නට පෙර තර වලසකු අල්ලාගැනීමේ බලාපොරොත්තුවෙන් ඔහු විශාල වලස් උගුල් ද අටවා තැබුවේ ය.

එක් උදෑසනක නිවසට ආ ඔහු සිය අශ්වයින් හා හිම යානය ගෙන යළිත් කඩිමුඩියේ පිටත් ව ගියේ ය. ඔහු වලසකු දඩයම් කර තිබේ. ලෝරා හා මේරි ඉතා සතුටට පත් වී උඩ පනිමින් අත්පුඩි තළන්නට වූ හ. මේරි කෑගැවා ය:

"මට ඕනෙ කකුලක්! මට ඕනෙ කකුලක්!"

වලස් කකුලක් කොතරම් විශාල දැයි මේරි දැනසිටියේ නැත.

අප්පච්චි ආපසු නිවසට එන විට ඔහු ගේ ගැලේ වලසකු පමණක් නො ව ඌරෙක් ද සිටියේ ය. තුවක්කුව උරහිසේ රඳවාගෙන විශාල වලස් උගුල් අතින් ගෙන වනය මැදින් යමින් සිටි අප්පච්චි, හිමෙන් වැසුණු විශාල පයින්* ගසක් අසලට ආවේ ය. ගසට පිටුපසින් සිටියේ වලසායි.

මොහොතකට පෙර ඌරා මරාදැමූ වලසා, ඌ මිලදැමීම සඳහා ඌව බුවට ළං කරමින් සිටියේ ය. වලසා දැතින් යමක ඔසවන්නාක් මෙන් තමා ගේ ඉදිරි ගාත්වලින් ඌරා ඔසවාගෙන පසුපස ගාත්වලින් වාඩිවී සිටි බව අප්පච්චි කීවේ ය.

අප්පච්චි වලසාට වෙඩි තැබුවේ ය. ඌට ඌරකු ලැබුණේ කෙසේ ද යන්නවත්, ඌරා කාට අයිති එකෙකු ද යන්නවත් දැනගැනීමට හැකියාවක් නැත.

"ඉතිං මං ඌව බේකන් හදන්න ගෙදර ගෙනාවා," යි අප්පච්චි කීවේ ය.

දැන් දීර්ඝ කාලයකට සෑහෙන තරම් අලුත් මස් නිවසෙහි තිබේ. දිවා කාලය හා රාත්‍රී කාලය දැඩි සීතලෙන් මිරිකී තිබිණි. පෙට්ටියක අසුරන ලද ඌරු මස් හා පිටුපස මිදුලේ කුඩා මඩුවේ එල්ලා ඇති වලස් මස්, ගල් මෙන් ඝන වී තිබූ අතර ඒවායේ අයිස දිය වී ගියේ නැත.

පයින්* දේවදාර ගස් වර්ගයක

Scanned with CamScanner

රාත්‍රී ආහාරය සඳහා අම්මාට අලුත් මස් අවශ්‍ය වූ විට, අප්පච්චි කොරොටුවක් ගෙන මිදුලේ වලස් මස් හෝ උරුමස් කුට්ටියක් කපා දුන්නේ ය. එහෙත් සොසේජස් ගුලි, ලුණු දැමූ උරුමස් හෝ දුම් ගැසූ හැම් හා ලුණු මස් මඩුවෙන් හෝ අටුවෙන් ගැනීම අම්මාට තනි ව ම කළ හැකි විය.

හිම නොනවත්වා ම වැටෙන්නට විය. අන්තිමේ දී ඒවා සුළඟේ ගසාගෙන විත් නිවස වටා හිම ගොඩැල්ලක් සෑදී තිබිණි. උදෑසන ජනෙල් වීදුරු වටා හිමවලින් ගස්වල, මල්වල හා සුරංගනාවියන් ගේ මනහර පින්තූර ඇඳී තිබෙනු දැකගත හැකි විය.

සියලු දෙනා ම නින්දට ගිය පසු රාත්‍රී කාලයේ දී පැමිණෙන ජැක් ෆ්‍රොස්ට් ඒ පින්තූර අඳින බව අම්මා කීවා ය. ජැක් ෆ්‍රොස්ට් හිම මෙන් සුදු, දිලිසෙන උල් තොප්පියක් හා මුව සමින් සෑදූ දණහිස දක්වා උස සුදු බූට් සපත්තු පලඳින කුඩා මිනිසෙකු ලෙස ලෝරා ගේ සිතේ මැවී තිබිණි. ඔහු ගේ කබාය සුදු පැහැති ය. අත් මේස් සුදු පැහැති ය. ඔහු ගේ පිටේ තුවක්කුවක් නැත. එහෙත් ඔහු ගේ අත්වල දිස්න දෙන උල් ආයුධ වෙයි. ඔහු පින්තූර අඳින්නේ ඒවායිනි.

අම්මා ගේ දිගාලය ගෙන ලෝරා හා මේරි ද වීදුරුවල රැඳුණු හිම මත රවුම් හැඩයේ ලස්සණ රූප අඳින්නට වූ හ. එහෙත් ඔවුහු කිසි විටෙකත් ජැක් ෆ්‍රොස්ට් විසින් රාත්‍රියේ අඳින ලද රූපවලට කිසි දු හානියක් නො කළ හ.

ඔවුහු සිය තුඩ ජනෙල් වීදුරුවට තබා ඉස්ම විම්ම විට හිම දිය වී ගොස් කිඳිති ලෙස වැක්කී වීදුරුව දිගේ පහළට ගලා ගියේ ය. පිටත හිම පතනයත්, සුදු හිම සහ සිහින් හිල් පැහැයත්, සෙවණැලි මෙන් පෙනී සිටින ගස් හා කඳවල් විශාල ලෙසත් එවිට බලන්නට දැකගත හැකි වෙයි.

ලෝරා හා මේරි ගෙදර දොර වැඩපළ සඳහා අම්මාට සහාය වූ හ. හැම උදෑසනක ම ඔවුහු පිඟන් පිසදැමූ හ. මේරි ලෝරාට වඩා වැඩිමල් නිසා ඇ පිඟන්වලින් වැඩි කොටස පිසදැමූ නමුත්, ලෝරා හැමවිට ම පරිස්සමට ඇගේ කුඩා කෝප්පයත්, පිඟානත් පිසදැමුවා ය.

පිඟන් සියල්ල පිසදමා අවසන් කළ පසු රෝද සහිත මිටි ඇඳ සකස් කරනු ලැබේ. ලෝරා හා මේරි ඇඳ දෙපස සිටගෙන ඇතිරිලි සකස් කොට, ඒවා ඇඳ පාමුලින් හා දෙපසින් මනා ව නවා යට කොට, කොට්ට හොඳින් ගසා ඒවා කිසි තැන තබති. ඊ ළඟට අම්මා මිටි ඇඳ එයට නියමිත ස්ථානය වූ විශාල ඇඳ යටට තල්ලු කරයි.

මේ කටයුත්ත හමාර වූ පසු අම්මා එදිනට නියමිත වැඩ කොටස අරඹයි. සෑම දිනක ම එදිනට නියමිත වැඩ කොටසක් තිබිණි. අම්මා නිතර මෙසේ කීවා ය:

"සඳදා එන්නේ රෙදි සෝදන්නයි,
අඟහරුවාදා ඇඳුම් මදින්නයි,
බදාදා ඉරුණු ඇඳුම් මහන්නයි,
බ්‍රහස්පතින්දා බටර් හදන්නයි,
සිකුරාදා තම පිරිසිදු වෙන්නයි,
සෙනසුරාද රස පාන් හදන්නයි,
ඉරිදා එන්නේ විවේක ගන්නයි."

ලෝරා සතියේ සියලු ම දවස් අතරින් බටර් හදන දිනයටත්, පාන් පුළුස්සන දිනයටත් වඩා ප්‍රිය කළා ය.

සීත කාලයේ කිරි යොදය, ග්‍රීෂ්ම සෘතුවේ දී මෙන් කහ පැහැයක් ගන්නේ නැත. එබැවින් ඒවායින් හදන බටර් සුදු පැහැති වන අතර කදිම පෙනුමක් ද නැත. තමා ගේ කෑම මේසය මත ඇති සියලු ම දේ ලස්සණට තබාගැනීමට කැමැති අම්මා ඒ නිසා සීත කාලයේ දී බටර්වලට පාට දැමුවා ය.

Scanned with CamScanner

කිරි යොදය පිඟන් මැටියෙන් කළ උසැ'ති කිරි හැළියකට දමා එය උණුසුම් වීම සඳහා උදුන අසලින් තැබූ අම්මා, ඉන් පසු නැඹිලි පැහැ'ති දිග කැරට් අලයක් සෝදා එහි පොත්ත සූරා දැමුවා ය. අනතුරුව ඇය එය හිල් වූ පරණ බෙලෙක් බඳුනක පතුලේ තබා ගාන්නට වූවා ය. බෙලෙක් බඳුනේ පතුල සම්පූර්ණයෙන් ම ඇණවලින් විද සිදුරු සාදා සකස් කොට දුන්නේ අප්පච්චි ය. කැරට් අලය සම්පූර්ණයෙන් ම සිදුරු සහිත රළු පතුලේ ගෑ අම්මා, බඳුන එසවූ විට එහි මෘදු යුෂ සහිත, ගාගත් කැරට් රැල් විය.

උදුන මත වූ කුඩා කිරි බඳුනට මෙසේ ගාගත් කැරට් දැමූ අම්මා කිරි උණු වූ විට කිරි හා කැරට් රෙදි බෑගයකට වත්කළා ය. ඊ ළගට දීප්තිමත් කහ පැහැ'ති කිරි, කිරි හැළියට අල්ලා මිරිකුවා ය. කිරි යොදය වර්ණවත් විය. දැන් බටර් කහ පැහැ'ති වනු ඇත.

කිරි මිරිකාගත් පසු කැරට් කෑමට ලෝරාට හා මේරිට අවසර ලැබිණි. තමා වැඩිමල් බැවින් තමාට වැඩි පංගුව ලැබිය යුතු බව මේරි කල්පනා කළා ය. ලෝරා කීවේ තමා කුඩා බැවින් තමාට වැඩි කොටස ලැබිය යුතු බවයි. එහෙත් එය සමාන ව බෙදාගත යුතු බව අම්මා කීවා ය. එය ඉතා ප්‍රණීත ආහාරයක් විය.

යොදය කහ පැහැ ගැන්වූ පසු ලීයෙන් තැනූ මත් දඬුව උණු දියේ දමා සේදූ අම්මා, එය කිරි හැළියට දමා කිරි හැළිය වසන ලී පියන ඒ තුළින් පහළට දැමුවා ය. මේ පියන මැද කුඩා රවුම් සිදුරක් තිබූ අතර අම්මා ඒ තුළින් මත් දඬුව ඉහළ පහළ ගෙන යමින් නොනවත්වා ම කිරි මත් ගාන්නට වූවා ය.

ඇය දීර්ඝ වේලාවක් කිරි මත් ගෑවා ය. අම්මා විවේක ගන්නා විට මේරි කිරි මත් ගෑවා ය. එහෙත් ලෝරාට මත් දඬුව එසවීමට නො හැකි තරමට බර විය.

මුලින් ම කුඩා රවුම් වටා රැඳුණු කිරි යොදය ගන හා මෘදු බවක් ගත්තේ ය. බොහෝ වේලාවකට පසු ඒවා කුඩා කැටිති බවට පත් වන්නට විය. ඊ ළගට අම්මා ඉතා සෙමින් මත ගාන්නට වූවා ය. මත් දඬුව මත කහ පැහැ'ති බටර් කුඩා කැටිති ලෙස රැඳී තිබෙනු පෙනිණි.

අම්මා කිරි හැළියේ පියන ඉවත් කළ විට බටර් රන පැහැ'ති ගුළියක් ලෙසින් කිරි මෝරුවල පතුලට බැස තිබිණි. ඊ ළගට එක්

කොනක් පැතැලි වන සේ සකස් කළ දිග මිටක් සහිත හැන්දෙන් බටර් ගුළිය ඉවතට ගෙන ලී බඳුනකට දැමූ අම්මා, ලී හැන්දෙන් එය ඒ මේ අත පෙරළමින් වතුර පිරිසිදු පැහැයක් ගන්නා තුරු ම බටර් ගුළිය කිහිප වතාවක් ම සේදුවා ය. ඉන් පසු ඇය එයට ලුණු එක් කළා ය.

දැන් ඇත්තේ බටර් සෑදීමේ හොඳ ම කොටසයි. අම්මා බටර්, අච්චුවකට වත්කරන්නේ දැන් ය. ලීවලින් සෑදූ බටර් අච්චුව පතුලේ ස්ට්‍රෝබෙරි ගෙඩියක හා කොළ දෙකක රූපයක් කැටයම් කර තිබිණි.

අම්මා ලී හැන්දට බටර් ගෙන අච්චුව හොඳින් පිරෙන තුරු ම එයට දැමුවා ය. ඉන් පසු එය පිඟානක් මත අනෙක් පැත්තට හැරවූ ඇය, ලිහිල් යටි පැත්තෙ ඇති මිට ඇතුළට තල්ලු කළා ය. තදට ඇසිරුණු රන්වන් පැහැ'ති කුඩා බටර් කුට්ටි, මුඳුනේ කැටයම් වූ ස්ට්‍රෝබෙරි ගෙඩිය හා එහි කොළ සමඟ පිටතට ආවේ ය.

ලෝරා හා මේරි, අම්මා දෙපසින් සිටගෙන හුස්ම ගන්නට අමතක වූවාක් මෙන් බලා සිටිය හ. අම්මා බටර් සියල්ල අච්චුවට දමා යටි අතට හරවා ඔසවන විට මතුපිට ස්ට්‍රෝබෙරි ගෙඩිය හා කොළ සිත්තම් වූ රන්වන් කුඩා බටර් කුට්ටි පිඟාන මත දිලිසෙන්නට වෙයි. ඊ ළගට අම්මා ඔවුන් දෙදෙනාට ම රසවත් නැවුම් බටර් කිරි බොන්නට දුන්නා ය.

සෙනසුරාදා දවස්වල අම්මා පාන් සාදන විට කුඩා පාන ගෙඩියක් සෑදීම සඳහා දෙදෙනාට ම පිටි මෝලියෙන් කුඩා ගුළි දෙකක් බැගින් ලැබෙයි. පුංචි විස්කෝතු සෑදීම සඳහා විස්කෝතු මෝලියෙන් ද ඇබිත්ත බැගින් ලැබෙයි. වරක් ලෝරා ඇගේ කුඩා තාච්චුවේ පස්තැලයක් ද සෑදුවා ය.

දවසේ වැඩ අවසාන වූ පසු අම්මා ඉඳහිටෙක කරදාසිවලින් බෝනික්කන් කපා ඔවුනට සෙල්ලම් කරන්නට දුන්නා ය. තනතමු කී සුදු කරදාසිවලින් බෝනික්කන් කැපූ ඇය, පැන්සලකින ඔවුන් ගේ මුහුණු ඇන්දා ය. ඊ ළඟට පාට කරදාසි කෑබැලිවලින් ඇඳුම්, තොප්පි, රිබන් පටි හා ලේස් කැපුවා ය. එවිට ලෝරාට හා මේරිට ඔවුන් ගේ බෝනික්කන් ලස්සනට ඇඳවිය හැකි ය.

එහෙත් මේ සියල්ලට ම වඩා හොඳ ම කාලය උදා වන්නේ අප්පච්චී ගෙදර නැවතී සිටි රාත්‍රියේ දී ය.

හිමෙන් වැසුණු වනය පුරා ඔහු අඩි තබමින් [illegible] රාත්‍රියේ ගෙදර එන විට ඔහු ගේ උඩු රැවුල දෙකොණේ කුඩා හිම කැට එල්ලී තිබේ. සිය තුවක්කුව දොරට උඩින් බිත්තියේ එල්ලා හිම තොප්පිය, කබායත්, අත් මේසුත් ගලවා තබන අතර ඔහු මෙසේ කියයි: "කෝ මගේ බාගයක් පිපුණු ඇපිත්තය කැබිලි සයිඩර් බෝතලේ?"

ඔහු මෙසේ අමතන්නේ ලෝරාට ය. ඒ ඇ ඉතා කුඩා නැවිනි.

ඔහු ගේ දණ මත හිඳ [illegible] ලෝරා හා මේරි ඔහු ගේ දණහිස මත [illegible] උණුසුම් වන තුරු එහි වාඩිවී සිටිති. [illegible] කබාය, තොප්පිය හා අත් මේසුත් [illegible] ඔහු [illegible] හිමිවැලුය [illegible] ඒවා කිටගට යයි.

[illegible] ළමුන් සිටින්නේ [illegible] වූ දවසක හෝ වෙනදාට වඩා [illegible] වූ දවසක හෝ අප්පච්චී [illegible] එවිට ලෝරා හා මේරි සමග සෙල්ලම් කිරීමට ඔහුට කාලය තිබේ.

මේ සෙල්ලම් අතරින් ළමුන් ආසා කළ එක් සෙල්ලමක් වූයේ පිස්සු බල්ලා නමින් හැඳින්වූ සෙල්ලමයි. අප්පච්චී සිය කොණ්ඩය [illegible] කෙළින් ඇඹිලි වන සේ [illegible] ඊ ළඟට ඔහු හාරමින් ලෝරාට හා මේරිට ඇහෙන සේ [illegible] ඔවුන් මුල්ලකට හිරකොට [illegible] මුළු කාමරය පුරා ම දුවයි.

[illegible] අවසානයේ ඔවුන් [illegible] සිටින්නට වෙති. එහෙත් එක්වරක් ඔහු ගිනි උදන පිටුපස ඇති

පෙට්ටගමට තොවු තර සවන දෙදෙනා ද [illegible] ය. ඔවුන්ට අප්පච්චී පසු කර යාමට නො හැකි විය. දැන යන්නට වෙනත් මාර්ගයක් ද නැත.

දැන් අප්පච්චී ඉතා [illegible] ලෙස ගොරවන්නට වූයේ ය. ඔහු ගේ කොණ්ඩය අවුල් වී, දෑස් ඉතා රෞද්‍ර පෙනුමක් ගෙන තිබිණි. හරියට ඇත්තට ම වාගේ ය. මේරි කොතරම් බියට පත් ව සිටියා ද යත්, ඇට සොලවීමට පවා නො හැකි විය. එහෙත් අප්පච්චී ඔවුන් ළඟට එද්දී මහ හඬින් කෑගැසූ ලෝරා, මේරි ද අතින් ඇදගෙන පෙට්ටගම දිගේ බඩගාමින් උමතුවෙන් මෙන් එට උඩින් පැන්නා ය.

එක්වර ම පිස්සු බල්ලා සම්පූර්ණයෙන් ම අතුරුදහන් ව ගොස් සිටියේ ය. අප්පච්චී පමණක් සිටගෙන ඔහු ගේ නිල් පැහැති දිලිසෙන දෑස්වලින් ලෝරා දෙස බලා සිටියේ ය.

"කලා හොඳයි නේ ද!" ඔහු ඇයට කීවේ ය. "බාගයක් පිපුණු මගේ ඇපිත්තය සයිඩර් බෝතලේ. ඔයා හරි ම දගකාරී පැටි [illegible] අස්සයෙක් වගේ ඔයා හරි ම ශක්තිමත් නේද!"

"ඔය විදියට ළමයි බය කරන්න එපා චාල්ස්" අම්මා කීවා ය. "බලන්න ඒගොල්ලන ගෙ ඇස්වල ලොකු"

ඔවුන් දෙස බැලූ අප්පච්චී සිය වයලීනය [illegible] ගත්තේ ය. ඔහු එය වයමින ගයන්නට වූයේ ය.

[illegible]
[illegible]
[illegible]
[illegible]

පිස්සු බල්ලා පිළිබඳ හැම දෙයක් ම ලෝරාට හා මේරිට අමතක ව ගියේ ය.

"නගරෙදි ඔහු දුටු කාලකුවක්කු,
මේපල් කඳක් තරමට ම ලොකුයි,
එය හරවන්නට ඒ මේ පැත්තට,
මහ ගොන් බාන් දෙකක් ඕනෑ වෙයි.

"ඒවායින් වෙඩි තබා හැම විට,
වෙඩි බේතුත් මලු ගාණක් යයි,
තාත්ත ගේ තුවක්කුව වගේ හඬ නඟයි
හැබැයි ඊට වැඩියෙන් සද්දයි."

අප්පච්චි සිය පාදයකින් තාල තබන්නට වූ අතර ලෝරා ඔහු ගයන විට ඔහු ගේ සංගීතයට අනුව අත්පුඩි තැළුවා ය.

"යැන්කි ඩූඩ්ල්-ඩී-ඩෝ මම ගයන්නෙමි,
යැන්කි ඩූඩ්ල් මම ගයන්නෙමි,
යැන්කි ඩූඩ්ල්-ඩී-ඩෝ මම ගයන්නෙමි,
යැන්කි ඩූඩ්ල් මම ගයන්නෙමි!"

දරුණු මහ වනය මැද හිමෙන් වැසී ගිය සීතල අරක්ගත් භූමියේ හුදෙකලා වූ කුඩා ලී නිවස උණුසුමින්, සුව පහසුවෙන් හා සනීපදායක බවින් පිරුණේ විය. අප්පච්චි, අම්මා, මේරි, ලෝරා හා කුඩා කේරි විශේෂයෙන් ම රාත්‍රී කාලයේ දී එහි සුව පහසුවෙන් හා සතුටින් සිටිය හ.

උදුනේ දීප්තිමත් ව දැල්වෙන ගින්න විසින්, සීතලෙන් හා අන්ධකාරයෙන් පමණක් නො ව කැලෑ සතුන් ගෙන් ද ඔවුන් ව ආරක්ෂා කරන ලදි. වයිරම් වැටුණු බුල්ඩෝග් වර්ගයේ බල්ලා ජැක් හා බලැක් සූසන් ගිනි උදුනේ ගිනි දැල් දෙසට ඇසි පිය ගසමින් වැතිර සිටිය හ.

සිය පැද්දෙන පුටුවේ වාඩිගත් අම්මා මේසය මත තබන ලද ලාම්පුවේ එළියෙන් කිසිවක් මසයි. ලාම්පුව දීප්තිමත් හා දිස්න දෙන සුලු විය. එහි භූමිතෙල් දමන ලද විදුරු බඳුන පතුලේ ලුණු කැට ඇත. භූමිතෙල්වලට ලුණු කැට දමන්නේ භූමිතෙල් පිපිරියාම වැළැක්වීම සඳහා ය. භූමිතෙල් බඳුනට ශෝභන පෙනුමක් ගෙන දීම සඳහා ලුණු කැට අතරට රතු ෆ්ලැනල් රෙදි තැබැලි දමන ලදි. ඇත්තට ම එය ශෝභන ය.

ඉතා පිරිසිදු හා කාන්තිය විහිදුවන විදුරු චිමිනිය සහිත ලාම්පුව දෙස බලා සිටින්නට ලෝරා ප්‍රිය කළා ය. එහි කහ පැහැ'ති දැල්ල ඉතා ශක්තිමත් ව දැල්වෙයි. කුඩා ෆ්ලැනල් රෙදි තැබැලි නිසා එහි පිරිසිදු භූමිතෙල් සහිත බඳුන රතු පැහැ ගැන්වී ඇත. ගිනි උදුනේ ගින්න දෙස බලා සිටින්නට ද ඇය ප්‍රිය කළා ය. එය නිරන්තරයෙන් ම සෙලවෙයි, වෙනස් වෙයි. එය කහ පැහැයෙන්, රතු පැහැයෙන් හා ඉදහිටෙක කොළ පැහැයෙන් දර කොට පරයමින් ඉහළ නඟිමින් ද, රන්වන පැහැ'ති හා රක්ත වර්ණ අඟුරු කැට නිල් පැහැයකින වසාගනිමින් ද දැල්වෙයි.

ඊ ළඟට අප්පච්චි කතාන්දර කීම අරඹයි.

ලෝරා හා මේරි කතාන්දරයක් කියන්නයි කියමින ඔහුට බැගෑපත් වන විට ඔවුන් සිය දෙදණ මත හිඳුවාගන්නා ඔහු, ඔවුන් මහ හඬින් සිනාසෙන තුරු ම සිය දිගු රැවුළ කෙඳි ඔවුන ගේ මුහුණේ අතුල්ලමින් කිති කවයි. ඔහු ගේ නිල් දෑස් ප්‍රීතියෙන පිරී ඇත.

එක් රාත්‍රියක බ්ලැක් සූසන් ගිනිමැලය ඉදිරියේ දිග ඇදී සිය නිය විහිදුවනු බලා සිටි අප්පච්චි මෙසේ කීවේ ය

"ඔයගොල්ලො දන්නව ද අඳුන් දිවිය බළලෙක් ය කියලා? ලොකු, යෝධ කැලෑ බළලෙක් ය කියලා?"

"නෑ," යි ලෝරා කීවා ය.

"ඔන්න එහෙනං දැන් දැනගන්නකෝ," අප්පච්චි කීවේ ය. "නිකං හිතන්න, බලැක් සූසන්, ජැක්ට වැඩිය ලොකු වෙලා, ජැක්ට වඩා නපුරු විදියට ගොරවනවා කියලා. අන්න එතකොට බලැක් සූසන් අඳුන් දිවියා වගේ තමයි."

ලෝරා හා මෙරී වඩා සුව පහසු ලෙස සිය දෙදණ මත හිඳුවාගත් ඔහු, "මං කියන්නංකො සීයයි, අඳුන් දිවියයි ගැන කතාව," යි කීවේ ය

"ඔයා ගෙ සීය ද?" ලෝරා ඇසුවා ය.

"නෑ ලෝරා, ඔයා ගෙ සීයා, මගේ තාත්තා."

"ආ," යි කී ලෝරා අප්පච්චි ගේ බාහුවට තවත් තෙරපුණා ය. ඇය සිය සීයා හඳුනයි. ඔහු මහ වනයේ ඉතා ඈත පිහිටි විශාල නිවෙසක ජීවත් වෙයි. අප්පච්චි කතාව කීමට පටන්ගන්නේ ය:

සීයා සහ අඳුන් දිවියා ගේ කතාන්දරය

"එක දවසක් ඔයගොල්ලන් ගෙ සීයා නගරෙට ගියා. ආපහු ගෙදර එන කොට හවස් වුණා. මහ කැලෑව මැද්දෙන් අස්සයා පිටේ එන කොට හොඳට ම කළුවර වැටිලා. කොච්චර කළුවර ද කියනවා නං පාර පේන්නෙත් නැති තරං. ඔන්න එක පාරට ම සීයට ඇහෙනවා අඳුන් දිවියෙක් කෑගානවා. සීයා හොඳට ම බය වුණා. ඒ වෙලාවෙ එයා ගෙ අතේ තුවක්කුව තිබුණෙත් නෑ.

"කොහොම ද අඳුන් දිවියා කෑගාන්නෙ?" ලෝරා ඇසුවා ය.

"හරියට ගෑනියෙක් වගේ," අප්පච්චි කීවේ ය. "මෙන්න මෙහෙම" ඊ ළඟට ඔහු ඒ අයුරින් කෑගෑවේ ය. ලෝරා හා මෙරී බියෙන් වෙව්ලන්නට වූ හ.

අම්මා වහා සිය පුටුවෙන් නැඟිට, "දෙවියනේ, චාල්ස්" යි කීවා ය.

එහෙත් ඒ අයුරින් බිය වීමට ලෝරා හා මෙරී ප්‍රිය කළ හ.

"සීය ව පිටේ තියාගත්ත අස්සයා හයියෙන් දිව්වා. ඌත හොඳට ම බයවෙලයි හිටියෙ. ඒත අඳුන් දිවිය ගෙන් බේරිල යන්න ඌට බැරි වුණා. අඳුන් දිවියා කළු පාට කැලෑව පීරගෙන ඌ පස්සෙ ආවා. ඌට හොඳට ම බඩගිනි වෙලයි හිටියෙ. ඉතිං ඌ අස්සයා දුවන වේගෙන් ම දුවගෙන ආවා. ඔන්න ඌ එකපාරකට පාරේ ඒ පැත්තෙ ඉඳගෙන කෑගානවා. තව පාරකට මේ පැත්තෙ ඉඳගෙන කෑගානවා. කොහොම වුණත් ඌ දැන ඉන්නෙ සීයා ළඟමයි.

"සීයා ඉස්සරහට බර වෙලා තට නවත හයියෙන අසසයා පැන්නුවා. අස්සයා ඌට දුවන්න පුළුවං උපරි ම වේගෙන දුවනවා. ඒත් අඳුන් දිවියා තවමත් ළඟ ම ඉඳගෙන කෑගානවා.

"එකපාරට ම සීයා ඌව දැක්කා. ඌ සීය ගෙ ඔළුවට උඩින ගහෙන් ගහට පනිනවා

"ඌ මහ විසාල කළු අඳුන දිවියෙක. බලැක සූසන් මීයෙක අල්ලන්න පනිනවා වගෙ ඌ අහසෙ එහාට මෙහාට පනිනවා ඌ බලැක් සූසන්ට වඩා දහ ගුණයක විතර විසාලයි. කොච්චර ලොකු ද කියනවා නං, සීය ගෙ ඇඟට පැන්නනං ඌට උගෙ යෝධ කඩු වගෙ නියපොතුවලින සූරලා, උල් දත්වලින් හපල සීය ව මරලදාන්න පුළුවං.

"ඉතිං අස්සයා පිට ඉන්න සීයා බළලෙක් ගෙන් බේරිලා යන මීයෙක් වගේ උගෙන් බේරිලා දුවනවා.

"අඳුන් දිවියා තවත් කෑගැවේ නෑ. සීයා ආයෙත ඌව දැක්කෙත් නෑ. ඒත් කළුවර කැලේ පීරගෙන ඌ පිටිපස්සෙන පැනපැන එනවා කියලා සීයා දන්නවා. තවමත් අස්සයා ඌට පුළුවං වේගෙන් දුවනවා.

"ඔන්න අන්තිමේ දී අස්සයා සීය ගෙ ගෙදරට ම ආවා. දිවියා දුන්නක් වගේ පනිනවා සීයා දැක්කා. සීයා දොර ඉස්සරහදි අස්සය ගෙ පිටෙන් පැනලා, කඩාගෙන බිඳගෙන දොරෙන්

ඇතුළට ගිහිං දිවියට එන්න නොදී දොර වහගත්තා, මෙන්න එකපාරට ම අඳුන් දිවියා අස්සය ගෙ පිටට පැන්නා.

"අස්සයා මහා බයංකාර විදියට කෑගාගෙන දුවන්න ගත්තා. ඌ අඳුන් දිවියවත් පිටේ තියාගෙන මහ කැලේට දිව්වා. දිවියා උගේ පිටේ එල්ලිලා නියපොතුවලින් අස්සය ගෙ පිට ඉරලාදැම්මා. ඒත් සීයා බිත්තියේ එල්ලලා තිබුණු තුවක්කුව අරගෙන ජනේලෙන් වෙඩි තිබ්බා. එක පාරින් ම අඳුන් දිවියා මැරිලා වැටුණා.

"තුවක්කුව නැතුව ආයෙ නං මහ කැලේට යන්නෙ නෑ කියලා සීයා කිවුවා."

අප්පච්චි මේ කතාන්දරය කියන විට ලෝරා හා මේරී වෙවුලමින් ඔහුට තව තවත් තුරුලු වී සිටිය හ. ඔහු ගේ දෙදණ

මත හිඳගෙන ඔහු ගේ ශක්තිමත් බාහු යුග්මයෙන් වට වී සිටින විට ඔවුහු සුරක්ෂිත ව හා සුවදායක ව සිටිය හ.

බ්ලැක් සූසන් පෝරණුව මත හිඳගෙන පුරු පුරු හඬ නගමින් ද, යහපත් ජැක් ඈ අසලින් දිගාවී ද සිටින ඒ මොහොතේ උණුසුම් ගිනිමැළය සමීපයේ හිඳ ඔහුට තුරුලු වී සිටීමට ඔවුහු ප්‍රිය කළ හ. වෘක උඩුබුරැලීමක් ඇසෙන විට ජැක් ගේ හිස එසවෙන අතර, උගේ පිට දිගේ මවිල් ඉලිප්පෙයි. එහෙත් මහ වනයේ අන්ධකාරය හා සීතල තුළින් නැගෙන ඒ හුදෙකලා හඬ අසා සිටින ලෝරා හා මේරී බියට පත් වූයේ නැත.

ලීවලින් තැනූ කුඩා නිවස තුළ ඔවුහු උණුසුම් ව, සුරක්ෂිත ව සිටිය හ. නිවස වටා හිම ගොඩ ගැසී තිබිණි. සුළඟ හමමින් තිබිණි. එහෙත් ගිනිමැළය නිසා ඒවාට නිවස තුළට ඒමට නො හැකි විය.

3 පරිච්ඡේදය

දිග රයිෆලය

අප්පච්චි සැඳෑ සන්ධ්‍යාවක ම කතාන්දර කීමට පෙර ඊ ළඟ දිනයේ දඩයමේ යාම සඳහා අවශ්‍ය පතරොම් සකස් කළේ ය.

ලෝරා හා මේරි ඔහුට සහාය වූ හ. ඔවුහු දිගැති මිට සහිත විශාල හැන්ද, ඊයම් කැබැලි සහිත පෙට්ටිය හා පතරොම් අච්චුව ඔහුට ගෙනැවිත් දුන් හ. ඊ ළඟට ඔහු පෝරණුව මත ඇනතියාගෙන පතරොම් හදන තුරු ඔවුහු, ඔහු දෙපසින හිඳගෙන බලා සිටිය හ.

පළමු ව විශාල හැන්දට ඊයම් කැබැලි දමා ගිනි අඟුරුවලට ඇල්ලා උණු කරන ඔහු, ඊයම් උණු වූ පසු ඒවා ඉතා පරිස්සමින් පතරොම් අච්චුවේ කුඩා සිදුරට වත්කරයි. මොහොතක් බලා සිටින ඔහු ඊ ළඟට අච්චුව හැර, දිලිසෙන සුලු අලුත් පතරොමක් පෝරණුව මතට දමයි.

පතරොම ඇල්ලිය නො හැකි තරමට රත් වී ඇත. එහෙත එය සිත් පොලඹවමින් දිලිසෙන්නට වූ අතර, ලෝරාට හා මේරිට එය නො අල්ලා සිටීමට නො හැකි විය. ඔවුහු එය අල්ලා ඇඟිලි පුච්චාගත් හ. එහෙත් අලුත් පතරොමක් කිසි දා නො ඇල්ලිය

යුතු යැයි අප්පච්චි අවවාද කර තිබූ හෙයින්, ඔවුහු ඒ පිළිබඳ ව කිසිවක් නො කී හ. ඔවුන් අත් පුච්චාගත්තේ නම් එය ඔවුන් ගේ වරද ය. ඔවුන් ඔහුට කීකරු විය යුතු ය. ඉතින් සිය පිච්චුණු ඇඟිලි සිසිල් වීම සඳහා මුව තුළ ලාගන්නා ඔවුහු, අප්පච්චි තවත් පතරොම් සාදන අයුරු බලා සිටින්නට වූ හ.

අප්පච්චි පතරොම් සෑදීම නවත්වන්නට පෙර පෝරණුව මත දිලිසෙන පතරොම් විශාල ප්‍රමාණයක් ගොඩගැසී තිබිණි. ඒවායේ රස්නය නිවෙන තුරු තැබූ ඔහු සිය ලොකු දුනු පිහියෙන අච්චුවේ සිදුරේ රැඳී ඇති කුඩා කැබැලි සූරන්නට විය. ඉතා තුනී ඊයම් පතුරු සියල්ල එක් කළ ඔහු, ලබන වාරයේ පතරොම් සාදන විට උණු කිරීම සඳහා ඒවා පරිස්සම් කොට තැබුවේ ය.

සාදා නිම කළ පතරොම් ඔහු සිය පතරොම් මඩිස්සලයෙ බහාලුවේ ය. එය අප්පච්චි විසින් දඩයම් කරන ලද මුවකු ගේ සමකින් අම්මා සැදූ කදිම පෙනුමැති කුඩා මල්ලකි.

පතරොම් සෑදූ පසු අප්පච්චි බිත්තියේ එල්ලා ඇති සිය තුවක්කුව ගෙන එය පිරිසිදු කිරීමට පටන් ගනී. හිමෙන් වැසිගිය වනයේ මුළු දවස ම ගත කිරීම නිසා එහි තෙත් බවක් ඇති වී තිබිය හැකි ය. තුවක්කු කානුව තුළ වෙඩි බේත්වලින් ඇති වන කුණු බැඳී ඇති බව නම් නිසැක ය.

ඉතින් තුවක්කු කානුව යටින් තුවක්කු කටේ වෙඩි බේත එබීමට යොදන බටය ඉවතට ගත් අප්පච්චි, එහි කෙළවරට පිරිසිදු රෙදිකඩක් බැන්දේ ය. පෝරණුව මත වූ තාච්චිය තුළ තුවක්කුවේ මහත කොන තැබූ ඔහු, කේතලයේ ඇති උතුරන වතුර තුවක්කු කානුව තුළට වත්කළේ ය. ඊ ළඟට වෙඩි බේත එබීමට යොදන බටය එය ඇතුළට රිංගවූ ඔහු, එය ඒ මේ අත කරකවමින් අතුල්ලන්නට වූවේ ය. තුවක්කුවට පතරොම් පිරවූ පසු එහි ඇබය වසන කුඩා සිදුර තුළින් වෙඩි බේත් දුම් පිටතට පලායමින්, උණු වතුර කළු පැහැ ගැන්වෙන තුරු ම ඔහු එය ඇතිල්ලුවේ ය.

අප්පච්චි තව නවත වතුර වත්කරමින් වතුර පිරිසිදු පැහැයක් ගන්නා තුරු ම වෙඩි බේත එබීමට යොදන බටය වටේ ඔතන ලද රෙදිකඩෙන් තුවක්කු කානුව සෝදන්නට වූවේ ය. අන්තිමේ දී තුවක්කුව පිරිසිදු විය. රත් වූ වානේ ක්ෂණයකින් වියැළීයන බැවින් වතුර නිරන්තරයෙන් ම උතුරමින් තිබීම අත්‍යවශ්‍ය විය.

ඊ ළඟට තෙල් ගල්වන ලද පිරිසිදු රෙදිකඩක් වෙඩි බේත් එබීමට යොදන බටය වටේ එතූ අප්පච්චි, තුවක්කු කානුව රත් ව තිබිය දී ම එය ඒ තුළට ඇතුළු කොට තෙල් ගැල්වූවේ ය. ඊ ළඟට තෙල් ගල්වන ලද තවත් පිරිසිදු රෙදිකඩකින් සෑම අඟලක් ම තෙල් ගැල්වී මටසිලුටු වන තුරු තුවක්කුවේ පිටත හොඳින් ඇතිල්ලුවේ ය. ඊටත් පසු ව තුවක්කු බඳේ ලීය දීප්තිමත් ව දිස්නය දෙන තුරු ම එය ද අතුල්ලමින් ඔපදැමූවේ ය.

දැන් යළිත් වරක් තුවක්කුවට පතරොම් පිරවීමට ඔහු සූදානම් ය. ලෝරා හා මේරි ඔහුට උදවු කළ යුතු ය. නැගී සිටි අප්පච්චි දිග තුවක්කුවේ මහත කොන පහළට සිටින සේ සෘජු ව තබාගෙන තමා දෙපස සිටගෙන බලා සිටින ලෝරාට හා මේරිට මෙසේ කීවේ ය:

"දැන් ඔයගොල්ලො හොඳට බලාගෙන ඉන්න ඕන. මං වැරැද්දක් කෙරුවොත් මට කියන්න."

ඉතින් ඔවුහු ඉතා සැලැකිල්ලෙන් බලා සිටිය හ. එහෙත් ඔහු අතින් කිසි දූ වරදක් සිදු වූයේ නැත.

ලෝරා වෙඩි බේත් පුරවන ලද ඔප දැමූ මටසිලුටු හරක් අඟ ඔහු අතට දුන්නා ය. එහි ඉහළ කෙළවර කුඩා ලෝහ ඇබයක් විය. ඇබය පුරවා වෙඩි බේත් ගත් අප්පච්චි එය තුවක්කු කානුව තුළට වත්කළේ ය. අනතුරුව තුවක්කුව මඳක් සෙලවූ ඔහු කානුවට තට්ටු කොට වෙඩි බේත් සියල්ල පතුලට බැස ඇති බව සැක හැර දැනගත්තේ ය.

"කෝ මගේ රෙදි කෑලි පෙට්ටිය?" ඔහු ඇසුවේ ය. මේරි තෙල් ගල්වන ලද රෙදි කැබැලි පිරුණු කුඩා බෙලෙක් පෙට්ටිය ඔහු අතට දුන්නා ය. මේ තෙල් ගැල්වූ කුඩා රෙදි කැබැල්ලක් ගත් අප්පච්චි එය තුවක්කු කට මත තබා දිලිසෙන අලුත් පතරොමක් ඒ මත තැබුවේ ය. ඉන් පසු වෙඩි බේත් ඔබන බටය ආධාරයෙන් පතරොම හා රෙදිකඩ තුවක්කු කානුව තුළට තල්ලු කළේ ය.

අනතුරුව ඔහු වෙඩි බෙත්වැ තද වී සිටින සෙ පතරොමට හා රෙදි කැබැල්ලට වැරෙන් තට්ටු කළේ ය. ඔහු වෙඩි බේත් ඔබන බටයට තට්ටු කරන විට එය තුවක්කු කානුව තුළට පෙරළී ගියේ ය. අප්පච්චි එය ගෙන යළිත් ඇතුළට එබුවේ ය. ඔහු මෙය දීර්ඝ වේලාවක් තිස්සේ කළේ ය.

ඊ ළඟට ඔහු වෙඩි බේත් ඔබන බටය තුවක්කු කානුවේ ඊට නියමිත ස්ථානයේ යළිත් තැබුවේ ය. සිය සාක්කුවෙන් ඇබ

කැලෑවෙ බලන්න ජාති ඕන තරං. ඉතිං කළුවර වැටිගෙන එනවා කියලා මට අමතක වුණා. රතු ලේන්නු ගස්වල ඉන්නවා මං දැක්කා. දඬු ලේන්නු ගස්වල කොළ අස්සෙන් දඩිබිඩියෙ දුවනවා. පුංචි හා පැටවු තණ බිස්සෙ සෙල්ලම් කරනවා. ඔයගොල්ලො දන්නවනෙ පුංචි හා පැටවු නිදාගන්න කලින් එකට එකතු වෙලා සෙල්ලම් කරනවා නෙව.

"ඉතිං මං දක්ස දඩයක්කාරයෙක් වෙලා කැලෑ සතුන්ගෙයි, ඉන්දියන්කාරයින්ගෙයි පස්සෙන් එළවගෙන ගියා. මං කෙරුවෙ ඉන්දියන්කාරයො එක්ක සටන් කරන සෙල්ලම. කැලෑව වනචාරී මිනිස්සුන් ගෙන් පිරෙන තුරු ම මං සෙල්ලම් කෙරුවා. ඔන්න එක පාරට ම මට ඇහුණා කුරුල්ලො සුබ රාත්‍රියක් කියලා කිචි බිචි ගානවා. පාර හොඳට ම කළු පාටයි. මුළු කැලෑව ම අන්ධකාර වෙලා.

"දැන් ඉතිං ඉක්මනට එළදෙන්නු ගෙදර ගෙනියන්න ඕන නෙව. නැත්තං උන් ව මඩුවට ගාල් කරන්න කලින් හොඳට ම ය වෙනවා. ඒත් මට උන් ව හොයාගන්න බැරි වුණා'

"මං හොඳට කන් දුන්නා. ඒත් මට උන් ගෙ ගෙජ්ජි සද්දෙ ඇහුණෙ නෑ. මං උන්ට කතා කෙරුවා, කතා කෙරුවා. ඒත් උන ආවෙ නෑ.

"හැම පැත්ත ම කළුවරයි. ඒ වෙද්දිවට කැලෑ සත්තු. මං හොඳට ම බය වුණා. ඒත් එළදෙන්නු නැතුව ගෙදර ගිහිං තාත්තට කියන්නත් මට බයයි. ඉතිං මං උන්ට කතා කරකර මුළු කැලෑව පුරා ම දිවුවා. ටිකෙන් ටික හෙවණැලි ලොකු වුණා තවත් කළුවර වුණා. කැලෑව එක පාරට ම විසාල වුණා වගෙයි මට දැනුණෙ. ගසුයි, පඳුරුයි වෙනදට වඩා අමුතු වෙලා වගේ මට පෙනුණා.

"එළදෙන්නු කොහේවත් නෑ. මං කඳුවලට නැගලා උන් ව හොයහොයා කෑගෑවා. කළුවර දෙණි අස්සෙ ගිහිං උන් ව හෙව්වා, අඬගැහුවා, නැවතිලා උන් ගෙ ගෙජ්ජි සද්දෙ ඇහෙනව ද කියලා කන් දුන්නා. ඒත් ගස්වල කොළ සර සර ගාන සද්දෙ මිසක් මුකුත් ම ඇහෙන්නෙ නෑ.

"එතකොට මට ඇහුණා කවුදෝ හයියෙන් හුස්ම ගන්න සද්දයක්. මං හිතුවෙ මට පිටිපස්සෙ කළුවරට මුවාවෙලා දිවියෙක් ඉන්නවා කියලයි. ඒත් ඒ ඇහිලා තියෙන්නෙ මං හුස්ම ගන්න සද්දෙමයි.

"සපත්තු නැති මගේ කකුල්වල කටු පඳුරු ඇනිලා සීරිලා තිබුණා. මං පඳුරු අස්සෙන් දුවද්දි ඒවයෙ අතු මගේ ඇඟේ හයියෙන් වැදුණා. ඒත් මං දිගට ම දිවුවා, උන් ව හොයහොයා උන්ට කතා කරකර දිවුවා, 'සූකී! සූකී!'

"'සූකී! සූකී!' මං පුළුවං තරං හයියෙන් කෑගෑවා, 'සූකී!'

"එකපාරට ම මගේ ඔළුවට උඩින් කටහඬක් ඇහුණා, 'හූ'

"මගේ ඔළුවෙ කෙස් කෙලින් වුණා.

"'හූ! හූ!' ඒ කටහඬ ආයෙත් ඇහෙනවා. මං පණ එපා කියලා දුවන්න පටන්ගත්තා!

"එළදෙන්නු ගැන මට එහෙම පිටින් ම මතක නැති වුණා. මට ඕන වුණේ මේ කළු පාට කැලෑවෙන් එළියට පැනලා ගෙදර දුවන්නයි.

"ඒත් අර කටහඬ මගේ පස්සෙන් ම ඇවිත් ආයෙමත කියනවා, 'හූ ඌ-ඌ!'

"මං දුවන්න පුළුවං අන්තිම වේගෙන් දිවුවා, හුස්ම ගන්න බැරි වෙනකං දිවුවා. නවතින්නෙ නැතුව ම දිවුවා. මොකෙද්දෝ මගේ කකුලකින් අල්ලගත්තා. මං උඩ පැනපැන නවතින්නෙ නැතුව ම දිවුවා. කොටින් ම වෘකයෙකුටවත් මාව අල්ලගන්න බෑ.

"අන්තිමේ දී මං කැලෑවෙන් එළියට ආවා. ඇවිල්ලා නතර වුණේ හරක් මඩුව ගාව. මෙන්න සේරම එළදෙන්නු මඩුවෙ දොර ගාව හිටගෙන ඉන්නවා. මං උන් ව ඇතුළට දාලා ගෙදරට දිවුවා.

"මගේ තාත්තා මං දිහා බලලා මෙහෙම අහනවා, 'ඉලන්ඩාරියා, මොකද පරක්කු වුණේ? මඟ දිගේ නටනටා හිටිය ද?'

මං මගෙ කකුල දිහා බැලුවා. එතකොටයි මං දැකතෙ මගෙ කකුලෙ ඇඟිල්ලක නියපොත්තක් එහෙම පිටින් ම කැඩිලා ගිහිං. කොච්චර බය වෙලා ද තිබුවොත්, ඒ වෙලාවෙ මට ඒ තුවාලෙ රිදුණෙවත් නෑ.

මෙතැන දී අප්පච්චි හැමදාමත කතාව නතර කොට ලෝරා මෙසේ කියන තුරු බලා සිටියි.

"අනේ අප්පච්චි! ඉතුරු ටිකත් කියන්නකෝ."

"හොඳයි," අප්පච්චි කීවේ ය. "ඉතිං ඔයගොල්ලන් ගෙ සීයා මිදුලට ගිහිං කෑපුවෙ නැතැයි ලොකු කෝටුවක්. ඒ ළඟට ගෙට ඇවිදිං මගේ පස්ස පැත්තට හොඳට ම ගුටි දුන්නා. එදායින් පස්සෙ තාත්තා කියන දේ අහන්න මං හොඳට මතක තියාගත්තා.

"වයස අවුරුදු නවයක ලොකු කොලුවෙකුට කීකරු වෙන්න පුරුදු වෙන එක මහ දෙයක් නෙවෙයි," ඔහු කීවේ ය. "මේ කතාව ඔයගොල්ලන්ටත් හොඳ පාඩමක්," ඔහු කියන්නට විය.

"දීලා තියෙන අවවාද පිළිපැද්දොත් ඔයගොල්ලන්ට කිසි ම කරදරයක් වෙන්නෙ නෑ."

"ඔව්, ඔව්, අප්පච්චි!" අප්පච්චි ගේ දණහිස මත උඩ පනිමින් ලෝරා කියයි. "ඉතිං සීයා තව මොනව ද කිවුවෙ?"

"සීයා කිවුවා, 'මං කියන දේ ඇහුවනං කළුවර වැටුණට පස්සෙ මහ කැලෑවෙ නටනටා ඉන්නෙ නැතෙ. එහෙම වුණා නං ඔය විදියට බස්සෙකු ගෙ ඇඬිල්ලට බය වෙන්නෙත් නෑ නෙව' කියලා."



4 පරිච්ඡේදය

නත්තල

කුඩා ලී නිවස සම්පූර්ණයෙන් ම වාගේ හිමෙන් වැසීගොස් ය. විශාල හිම ගොඩැලි නිවසේ බිත්ති හා ජනේල අසල පවුරු බැඳ සිටි අතර උදෑසන අප්පච්චි දොර අරින විට ලෝරා ගේ හිස තරමට ම උසැ'ති හිම ගොඩැල්ලක් දොර අසල විය. අප්පච්චි සවල ගෙන හිම ඉවතට ඇද දැමුවේ ය. ඊ ළඟට ඔහු හරක් මඩුවට යන අඩි පාරේ ගොඩගැසුණු හිම ද ඉවත් කළේ ය. අශ්වයෝ හා එළදෙන්නු මඩුව තුළ උන් ගේ ගාල්වලට වී සීතලට ගුළි ගැසී උණුසුම් වෙමින් සිටිති.

දවස්, පැහැදිලි හා දීප්තිමත් ස්වභාවයක් ගත්තේ ය. ලෝරා හා මේරි ජනේලය අසල තබාගත් පුටුවල හිඳගෙන පිටත බැබලෙන ගස් මත රැඳුණු දිලිසෙන හිම දෙස බලා සිටින්නට වූ හ. ගස්වල නග්න, කළු පැහැ අතු වසා පැතිරුණු හිම හිරු එළියෙන් දිස්න දෙයි. නිවසේ පියසිවල එල්ලෙන හිම කූරු හිම ගොඩැලි මතට වැටෙයි. විශාල හිම කූරු කොතරම් විශාල ද යත්. ලෝරා ගේ උරහිස ළඟට ම උස ය. ඒවා වීදුරු මෙන් වූ අතර තියුණු ආලෝකයන් ගෙන් පිරී ඇත.

ගව මඩුවේ සිට අඩි පාර දිගේ නිවසට එන අප්පච්චි හුස්ම පිට කරන විට එය දුමක් මෙන් ඉහළ නැගෙනු පෙනේ. පටලයක් මෙන් වායු ගෝලයට පිවිසෙන ඔහු ගේ හුස්ම සුදු පැහැ'ති හිම කැටි බවට පත් වී ඔහු ගේ උඩු රැවුළ හා යටි රැවුළ වසාගෙන සිටී.

තමා ගේ බූට් සපත්තුවල ඇලුණු හිම ගැලවෙන සේ අඩි පොළොවේ හප්පා ගෙතුළට ආ අප්පච්චි, ලෝරා අල්ලා සිය සීතල විශාල කබාය සහිත සිරුරට තෙරපාගෙන ඇව තදින් සිපගත්තේ ය. ඔහු ගේ උඩු රැවුළ මත රැඳුණු, දිය ව යන කුඩා හිම බිඳු පබළු වැළක සිරි මවයි.

සෑම රාත්‍රියක ම ඔහු විශාල ලෑලි කෑල්ලක් හා කුඩා ලෑලි කෑලි දෙකක් සමඟ කුමක්දෝ ලොකු වැඩක නියැලෙන්නට වූවේ ය. සිය පිහියෙන් ලෑලි කෑලි කදිම හැඩයකට කැපූ ඔහු වැලි කරදාසියකින් හා සිය අත්ලෙන් ඒවා හොඳින් මැද්දේ ය. ලෝරා ලෑලි කෑලි ස්පර්ශ කරන විට ඒවායේ සේද මෙන් සිනිඳු හා මටසිලුටු බවක් ඇති වී තිබිණි.

අනතුරුව සිය මුවහත් පිහිය ගත් ඔහු විශාල ලෑල්ලෙ කෙළවරවල් කුඩා උල් හා ශිඛර හැඩයට කපා ඉතා උසැ'ති මුදුන මත විශාල තරුවක් කැපුවේ ය. ඊ ළඟට ලීයේ තැන තැන කුඩා සිදුරු කැපුවේ ය. ඉන් පසු ඒ සිදුරු ජනේල, කුඩා තරු, අඩ සඳවල් හා රවුම් හැඩවලට කැපුවේ ය. ඊටත් පසු ව ඒ සියල්ල වටා පුංචි පුංචි කොළ, මල් හා කුරුල්ලන් ගේ රූප කැපුවේ ය.

කුඩා ලෑලි කෑලි දෙකෙන් එකක් කදිම රවුමක හැඩයට කැපූ ඔහු එහි කොන් වටා කොළ, මල් හා තරු කපා ඒ මැදින් අඩ සඳවල් හා දඟර හැඩ කැපුවේ ය. කුඩා ම ලෑල්ලේ කොන වටා ඔහු කැපුවේ පුංචි මලින් ගැවසි මිදි වැලකි.

අහක දමන ලද ලී පතුරුවලිනුත් ඔහු ලස්සණ වනු ඇතැ'යි තමාට කල්පනා වූ කුමක් හෝ හැඩයක් ඉතා සෙමින් හා පරිස්සමින් කැපුවේ ය.

අන්තිමේ දී සියලු රූප කපා නිම කළ ඔහු පය රාත්‍රියක එ කොටස් සියල්ල එකට සවි කළේ ය. එය නිම වූ පසු දක්නට ලැබුණේ ශෝභන පෙනුමැ'ති කුඩා රාක්කයකි. රාක්කයේ පිටුපස කොටස වූයේ කදිමට කැටයම් කපන ලද විශාල ලෑල්ලයි. විශාල තරුව එහි මුදුනින් ම පායා තිබිණි. එක් කුඩා

Scanned with CamScanner

ලෑල්ලක් රාක්කයේ ආධාරකය ලෙස පහළින් සවි වී තිබූ අතර එය ද මනරම් ලෙස නිමවා තිබිණි. කුඩා මිදි වැළ රාක්කයේ ගැටිය වටා දිවෙයි.

අප්පච්චි මේ රාක්කය සැදුවේ අම්මාට නත්තල් තෑග්ගක් වශයෙනි. ඔහු ජනෙල් අතර ලී බිත්තියේ එය පරිස්සමට එල්ලුවේ ය. අම්මා රාක්කය මත ඇගේ පිගන් මැටියෙන් සෑදූ කාන්තාව ගේ ප්‍රතිමාව තැබුවා ය.

කුඩා පිගන් මැටි කාන්තාව, හිසේ පිගන් මැටි තොප්පියක් පැළඳ සිටියි. ඇගේ ගෙල මත අඳුරු වන් හිසකේ වැටී ඇත. ඈ ඇඳ සිටි ගවුම ඉදිරිපසින් ලේස් පටි ඇල්ලූ එකක් වූ අතර ඇය ළා රෝස පැහැ'ති ඒප්‍රනයක් ඇඳ රන් ආලේප කරන ලද පාවහන් පැළඳ සිටියි. මල්, කොළ, කුරුල්ලන් හා හඳ වට කරගෙන විශාල තරුවක් ඇති මුද්‍රාක් සහිත රාක්කය මත සිටගෙන සිටින ඈ ඉතා සුන්දර ය.

නත්තලට අවශ්‍ය රසවත් කෑම වර්ග සාදමින් අම්මා මුළු දවස පුරා ම කාර්ය බහුල වී සිටියා ය. ඇය ලුණු දැමූ පාන් හා රයි ඇන්ඩ් ඉන්ජන් නමැති පාන් පිලිස්සුවා ය. ස්වීඩන් විස්කෝතු සෑදුවා ය. ලුණු දැමූ ඌරු මස් හා පැණි සමග බේක් කරන ලද විශාල බෝංචි බඳුනක් සෑදුවා ය. විනාකිරි පස්තැල හා වියළි ඇපල් පස්තැල සෑදුවා ය. ප්‍රණීත කුඩා විස්කෝතු සාදා විශාල බුජමක් පිරවූ ඇය කේක් හැන්ද ලෙව කෑමට ලෝරාට හා මේරිට ඉඩ දුන්නා ය.

ඇය එක් උදෑසනක පැණි හා සීනි එක්කර ගනැ'ති පැණියක් වන තුරු උණු කළා ය. අප්පච්චි පිටතට ගොස් සාස්පාන් දෙකකට පිරිසිදු සුදු හිම පුරවාගෙන ආවේ ය. ලෝරාට හා මේරිට සාස්පාන බැගින් ලැබුණු අතර අප්පච්චි හා අම්මා හිම මතට තද දුඹුරුවන් පැණිය වත්කරන අයුරු ඔවුන්ට කියාදුන් හ.

ඔවුන් හිම මත රවුම්, විසිතුරු දඟර හා කැරකුණු රේඛා ඇන්ද අතර ඒවා වහා ගන වී දෝසි බවට පත් විය. ලෝරාට හා මේරිට එක් කැබැල්ල බැගින් කෑ හැකි වූ අතර ඉතිරිය නත්තල් දවස සඳහා තබාගත යුතු ය.

මෙසේ රසවත් කෑම වර්ග සාදනු ලැබුවේ නත්තල ගත කිරීම සඳහා එලිසා මහම්මා, පීටර් මහප්පා සහ ඥාති සොයුරු සොයුරියන් වන පීටර්, ඇලිස් හා එලා නිවසට එන බැවිනි.

නත්තලට පෙර දා ඔවුහු පැමිණිය හ. හිම යානයක සීනු ප්‍රීතිමත් හඬකින් නාදදෙනු ලෝරාට හා මේරිට ඇසිණි. ඒ හඬ මොහොතින් මොහොත වැඩි වන්නට වූ අතර ඊ ළඟට විශාල ලී හිම යානයක් කැලෑවෙන් පිටතට අවුත් දොර අසල නැවතිණි. එලිසා මහම්මා, පීටර් මහප්පා හා ඥාති සොයුරු සොයුරියෝ එහි සිටිය හ. ඔවුහු සියලු දෙනා ම බ්ලැන්කට්වු, කබා හා මී හරක් සම්වලින් සිරුරු ආවරණය කරගෙන සිටිය හ.

කබා, මෆ්ලර්, සළු හා පොරෝනා බොහෝ ගණනක් මුහුණේ හා සිරුරේ ඔතාගෙන සිටි බැවින් ඔවුන් පෙනුණේ හැඩයක් නැති විශාල පොට්ටනි මෙනි.

ඔවුන් ඇතුළට පැමිණි විගස කුඩා නිවස පිරී ඉතිරී යන බවක් පෙනිණි. බ්ලැක් සූසන් පිටතට ගොස් මඩුවේ සැඟවුණු අතර ජැක් කිසි දා නොනවත්වමියි කියන්නට මෙන් හිම මත කරකැවිකැවී උඩ පනිමින් බුරන්නට වූවේ ය. දැන් සෙල්ලම් කරන්නට ඕනෑ තරම් යාළුවෝ සිටිති!

එලිසා මහම්මා, පීටර්, ඇලිස් හා එලා සිරුරේ ඔතාගෙන සිටි පොරෝනා ඉවත් කළ විගස ඔවුහු ලෝරා හා මේරි සමග එක් ව දුවන්නටත්, කෑගාන්නටත් වූ හ. අන්තිමේ දී එලිසා මහම්මා නිහඬ වන ලෙස ඔවුන්ට අවවාද කළා ය. එවිට ඇලිස් මෙසේ කීවා ය:

"මං කියන්න ද වැඩක්. අපි පින්තූර අඳිමු."

ඒ සෙල්ලම කරන්නට නම් ගෙවත්තට යා යුතු යැයි ඇලිස් කීවා ය. එහෙත් ලෝරාට පිටතට ගොස් සෙල්ලම් කිරීමට නො හැකි තරමට සීතල ඉතා ඇඩි බව අම්මා කීවා ය. මේ කතාවෙන් ලෝරා කොතරම් බලාපොරොත්තු විරහිත තත්ත්වයට පත් වූවා ද යන්න දුටු අම්මා, සුළු වේලාවකට පමණක් ඈට පිටතට යන්නට අවසර දුන්නා ය. එහෙත් ඈ ලෝරා ව පිටතට යැවුවේ ඇගේ කබාය අන්දවා, අත් මේස් දමා, හිස් වැස්ම සහිත කොට කබාය අන්දවා, මල්ලරය ගෙන ඇගේ ගෙල වටා බැඳීමෙන් පසු ව ය.

එතරම් ප්‍රීතියක් ලෝරාට අන් කවරදාවත් දැනී තිබුණේ නැත. ඇලිස්, එලා, පීටර් හා මේරි සමග පින්තූර අඳිමින් ඇය මුළු උදේ වරුව ම ගත කළා ය. ඔවුන් ඒ ක්‍රීඩාව කළේ මේ අයුරිනි:

එක් එක්කෙනා කොටයක් මතට නැග එකිනෙකා ගේ අත් අල්ලාගෙන, එක්වර ම මෘදු, ගැඹුරු හිම මතට පැනිය යුතු ය. මෙසේ පනින විට මුහුණ පොළොවට සමතලා වන සේ තිබිය යුතු ය. ඉන් පසු වැටුණු ආකාරය සහිත ව හිම මත ඇඳුණු චිත්‍රය අවුල් නොවන සේ එතැනින් නැගී සිටිය යුතු ය. එය නිවැරදි ව කළේ නම්, කුඩා දැරියන් සිවු දෙනා ගේ හා පිරිමි ළමයා ගේ රූප හරියට ම ඒ ආකාරයෙන් ම අත් කකුල් හා අනෙක් අංග සහිත ව රූප පහක් වන සේ හිම මත ඇඳී තිබෙනු දැකගත හැකි වේ. ඔවුන් ඒවා හඳුන්වන්නේ ඔවුන් ගේ පින්තූර යනුවෙනි.

මුළු දවස පුරා ම වෙහෙස වී සෙල්ලම් කළ ඔවුන්ට රාත්‍රියේ නින්දට යාමට පවා ඕනෑකමක් නො වී ය. එහෙත් ඔවුන් නිදාගත යුතු ය. නැති නම් නත්තල් සීයා එන්නේ නැත. ඉතින් සිය මේස්, ගිනි උදුන අසල එල්ලා තැබූ ඔවුහු, යාච්ඤා කොට නින්දට ගිය හ. ඇලිස්, එලා, මේරි හා ලෝරා බිම සාදන ලද විශාල ඇඳක නිදාගත් හ.

පීටර්ට රෝද සහිත මිටි ඇඳ ලැබිණි. එලිසා මහම්මාට හා පීටර් මහප්පාට විශාල ඇඳ වෙන් කොට තිබූ අතර අටුවේ බිම තවත් ඇඳක් අප්පච්චිට හා අම්මාට නිදාගැනීම පිණිස සාදා තිබිණි. පීටර් මහප්පා ගේ හිම යානයේ තිබූ මී හරක් සම්න් මසන ලද පොරෝනා හා සියලු ම බ්ලැන්කට්ටු ගෙන ආ බැවින්, හැම දෙනාට ම පෙරවීම සඳහා ඇති තරම් පොරෝනා තිබිණි.

අප්පච්චි, අම්මා, එලිසා මහම්මා හා පීටර් මහප්පා ගිනිමැළය අසල වාඩිවී කතා කරමින් සිටිය හ. නින්දත් නොනින්දත් අතර සිටිය දී පීටර් මහප්පා මෙසේ කියනු ලෝරාට ඇසිණි:



"මං ලෙක් සිටිවලට ගිහිං ඉන්දැද්දි එලිසා එක දවසක් අනුභවයෙන් බේරිලා තියෙන්නෙ. දන්නවා නේ ද මං ඇති කරන අර ලොකු බල්ලා, ප්‍රින්ස්?"

ලෝරා එක්වර ම නින්දෙන් පිබිදුණා ය. බල්ලන් පිළිබඳ කතා ඇසීමට ඈ කවදත් කැමැති ය. මීයෙකු මෙන් නිහඬ ව වැතිරගත් ඇය ලී බිත්ති මත මඳ දීප්තියක් විහිදුවන ගිනිමැළයේ ආලෝකය දෙසට නෙත් හරවාගෙන, පීටර් මහප්පා ගේ කතාවට සවන් දුන්නා ය.

"ඉතිං," පීටර් මහප්පා කියන්නට විය. "උදේ පාන්දර එලිසා වතුර ගේන්න උල්පතට යනව නෙව. එතකොට ප්‍රින්සුත් එයා ගෙ පස්සෙන් යනවා. ඉතිං මේ කියන දවසෙ, එලිසා වතුර ගේන්න උල්පතට යන පාරෙ දෙණිය අයිනට ගියා විතරයි, මෙන්න ප්‍රින්ස් එකපාරට ම උගෙ දත්වලින් එලිස ගෙ සාය අල්ලගෙන පිටිපස්සට අදින්න පටන්ගත්තා.

"දන්නවනෙ ඌ කොයිතරං විසාල ද කියලා. එලිසා ඌට කෑගැව්වා. ඒත් මේකා සාය අත අරින්නෙ ම නෑ. ඌ හොඳ හයිහත්තිය තියෙන එකෙක්. ඉතිං එලිසට ඌව තල්ලු කරල දාන්නත් බෑ. ඉතිං මූ සායෙ කෑල්ලක් ඉරිලා යනකං ම එලිස ව පිටිපස්සට ඇද්දා."

"අර මගේ තිල් පාට සාය," එලිසා මහම්මා කීවා ය.

"දෙයියනේ!" ඒ අම්මා ගේ කටහඬයි.

"ඌ ඒකෙ පිටිපස්ස පැත්තෙන් ලොකු කෑල්ලක් ම ඉරලා ගත්තා," එලිසා මහම්මා කීවා ය. "මට හරි ම කේන්තියි. ඌව හොඳ පාරවල් දෙකක් දෙන්නයි මට ඕන වුණේ. ඒත් මූ මට ගෙරෙව්වා."

"ප්‍රින්ස් ඔයාට ගෙරෙව්වා?" අප්පච්චි ඇහුවේ ය.

"ඇත්තං," එලිසා මහම්මා පිළිතුරු දුන්නා ය.

"ඉතිං, එලිසා ගාණක් ගන්නෙ නැතුව ආයෙමත් උල්පතට යන්න හැදුවා," පීටර් මහප්පා යළිත් කතාව පටන්ගත්තේ ය. "ඒත් ප්‍රින්ස් මෙයාට ඉස්සරහින් පාරට පැනලා ගොරවනවලු. මෙයා කොච්චර කතා කළත්, බැන්නත් ඌ ගාණකටවත් අරං නෑ. ඌ දිගට ම දත් විලිස්සගෙන ගොරවනවා. මෙයා ඌව පහු කරලා යන්න හැදුවා විතරයි, ඌ එකපාරට ම මෙයා ගෙ ඉස්සරහට කඩාපැන්නා. ඒකෙන් එලිසා හොඳට ම බය වුණා."

"බය වුණේ නැත්තං නෙ පුදුමේ!" අම්මා කීවා ය.

"ඌ කොච්චර දරුණු ද කිව්වොත්, මං හිතුවා ඌ මාව කයි කියලා," එලිසා මහම්මා කීවා ය. "මං විශ්වාස කළේ ම ඌ මාව කයි කියලයි."

"මං කවදාවත් මෙහෙම කතාවක් අහලා නෑ!" අම්මා කීවා ය. "ඉතිං දෙයියනේ ඔයා මොකද කෙරුවේ?"

"මං ආපහු හැරිලා ගෙට ගිහිං දරුවෙක් එක්ක දොර වහගත්තා," එලිසා මහම්මා පිළිතුරු දුන්නා ය.

"ඇත්තට ම ප්‍රින්ස් අඳුරන්නෙ නැති අයට හරි ම දරුණුයි," පීටර් මහප්පා කීවේ ය. "ඒත් ඌ එලිසාටයි, දරුවන්ටයි හරි ආදරෙයි. ඌ එක්ක ඊගොල්ලන් ව දාලා ගියා ම මගෙ හිතට බයක් නෑ. එලිසට කීයටවත් ඒක තේරුං ගන්න බැරි වුණා.

"මෙයා ගෙට ගියාට පස්සෙත් ඌ ගේ වටේ ඇවිද ඇවිද ගොරවනවලු. මෙයා දොර අරින හැම පාරක ම ඌ මෙයා දිහාව පැනලා ගොරවනවා."

"ඌට පිස්සු හැදිල ද?" අම්මා ඇහුවා ය.

"මාත් හිතුවෙ ඒක ම තමයි," එලිසා මහම්මා කීවා ය.

"මොනවා කරන්න ද කියලා මට හිතාගන්න බැරි වුණා. මං ළමයි එක්ක දොර වහගෙන ගේ ඇතුළෙ ම වෙලා හිටියා. එළියට යන්නත් බයයි. එදා අපට වතුරත් නෑ. හිම ටිකක් දිය කරලා වතුර හදාගන්නත් එළියට යන්න එපැයි. මං මහ සද්දෙන් දොර අරින කොයි වෙලාවෙ හරි ප්‍රින්ස් මාව කෑලිවලට ඉරන්න වගේ පනිනවා."

"කොයිතරං වෙලා එහෙම හිටිය ද?" අප්පච්චි ඇහුවේ ය.

"මුළු දවස ම, හවස් වෙනකං ම," එලිසා මහම්මා කීවා ය. "පීටර් තුවක්කුව ගෙනිහිං තිබුණෙ නැත්තං මං ඌට වෙඩි තියනවා."

"හවස් වෙනකොට," පීටර් මහප්පා කියන්නට විය, "ඌ දොර ඉස්සරහ දිගා වෙලා නිශ්ශබ්ද ව බලා හිටියා. එලිසා හිතුවා ඌට නින්ද ගිහිං කියලා. ඉතිං මෙයා ඌට හොරෙන් වතුර ටිකක් ගේන්න උල්පතට යන්න හිතුවා.

"ඉතිං එලිසා හෙමිහිට දොර ඇරියා. ඒත් මූ ඇහැරිලයි ඉඳලා තියෙන්නෙ. මෙයා ගෙ අතේ වතුර බාල්දිය තියෙනවා දැක්ක විතරයි ඌ නැගිටලා මෙයාට ඉස්සර වෙලා උදේ වගේ ම

පාර දිගේ යන්න ගත්තා. මෙන්න, උල්පත ළඟ හිම තලාව දිගේ අඳුන් දිවියෙකු ගෙ අලුත් අඩි පාරවල් තියෙනවා."

"ඒ අඩි පාරවල් මගේ අත තරං ලොකුයි," එලිසා මහම්මා කීවා ය.

"ඔව්," පීටර් මහප්පා කීවේ ය. "ඌ ලොකු එකෙක්. උගෙ අඩි පාරවල් තරං ලොකු ඒවා මං කවදාවත් දැකලා නෑ. ප්‍රින්ස් උදේ එලිසට උල්පත ළඟට යන්න දුන්නනං එහෙම, ඌ එලිස ව කනවා, ඒකෙ කිසි සැකයක් නෑ. මං අඩි පාරවල් දැක්කා. ඌ උල්පත ළඟ ලොකු ඕක් ගහේ නැඟගෙන බලා ඉඳලා තියෙනවා, කවුරුහරි සතෙක් වතුර බොන්න එනකං. මෙයා ගියා නං එහෙම, ඌ මෙයා ගෙ ඇඟට පනිනවා. ආයෙ බොරු නෙවෙයි."

"මෙයා උගෙ අඩි පාරවල් දකින කොට ටිකක් ය බෝ වෙලා. ඉතිං වතුර බාල්දියකුත් අරගෙන ඉක්මනට ගෙදර ආවා. ප්‍රින්ස් සැරෙන් සැරේ දෙණිය දිහා හැරිහැරි බලබලා, මෙයා ළඟින් ම මෙයා පස්සෙන් ආවා."

"මං ඌව ගේ ඇතුළට ගත්තා," එලිසා මහම්මා කීවා ය. "පීටර් එන තුරු ම අපි සේරම ගේ ඇතුළට වෙලා හිටියා."

"ඌව අල්ලගත්ත ද?" අප්පච්චි පීටර් මහප්පා ගෙන් ඇසුවේ ය.

"නෑ," පීටර් මහප්පා කීවේ ය. "මං තුවක්කුවක් අරගෙන හැම තැන ම ගියා. ඒත් හම්බ වුණේ නෑ. මං උගෙ අඩි පාරවල් හුගක් දැක්කා. ඌ මහ කැලේ දිගේ ඈතට ඈතට ගිහිං උතුරු දිකාවට ගිහිං තිබුණා."

මේ වන විට ඇලිස්, එලා හා මේරි ද පිබිදී සිටි අතර ලෝරා සිය හිස පොරෝනාව තුළින් පිටතට දමා ඇලිස් ගේ කනට මුව ළං කොට, "මගෙ අම්මේ! ඔයගොල්ලො බය වුණේ නැද්ද?" යි රහසින් ඇසුවා ය.

තමා බිය වූ බවත්, එලා ඊට වඩා බිය වී සිටි බවත් ඇලිස් ලෝරා ගේ කනට කොඳුරා කීවා ය. තමා එවැනි දේවල්වලට බිය නැතැයි එලා ද ඇට රහසින් කීවා ය.

"ඒ වුණාට ඔයා තමයි වතුර බොන්න ඕනෙ, තිබහයි තිබහයි කියලා නාහෙන් ඇඬුවෙ," ඇලිස් කෙඳිරුවා ය.

ඔවුන් දිගට ම රහස් කියාගන්නා අතරේ අම්මා මෙසේ කියනු ඇසිණි: "චාල්ස්, අරගොල්ලො ඔයා සිංදුවක් කියන තුරු නිදාගන්නෙ නෑ."

ඉතින් අප්පච්චි සිය රවුකිඤ්ඤය අතට ගත්තේ ය.

කාමරය නිහඬතාවෙන්, උණුසුමින් හා ගිනිමැළයේ ආලෝකයෙන් පිරී තිබිණි. අම්මා ගේ, එලිසා මහම්මා ගේ හා පීටර් මහප්පා ගේ විශාල සෙවණැලි ගිනිමැළයේ ආලෝකය පතිත වූ බිත්ති මත ලෙළදෙයි. අප්පච්චි ගේ රවුකිඤ්ඤය ප්‍රීතිමත් ස්වරයෙන් නාද නගන්නට විය.

අප්පච්චි රවුකිඤ්ඤයෙන් 'සල්ලි මවන කස්තුරි', 'රතු වැස්සි', 'යක්ෂයා ගේ සිහිනය', හා 'ආකැන්සස් සංචාරකයා' යන ගීත වාදනය කළේ ය. අප්පච්චි ගේ ලයාන්විත ගායනයත්, රවුකිඤ්ඤයේ මිහිරි නාදයත් අසමින් ලෝරා නින්දට වැටුණා ය.

"මගෙ ආදර නෙලී ග්‍රේ, ඔවුන් ඔබ ව උදුරගෙන ගියා,
ආයෙ කවදාවත් මට මගෙ ආදරිය හමුවන්නේ නෑ . . ."

පසු දා උදෑසන ඔවුහු සියලු දෙනා ම එක ම වේලාවේ ම වාගේ නින්දෙන් පිබිදුණ හ. රැයේ එල්ලා තැබූ මේස් කකුල් දෙස බැලූ ළමයි ඒවායේ කුමක් හෝ ඇති බව දුටුව හ. නත්තල් සීයා රාත්‍රියේ මෙහි ඇවිදින් තිබේ. ෆ්ලැනල් රෙදිවලින් මැසූ රාත්‍රි නිදන ඇඳුම් හැඳගත් වන ම ඇලිස්, එලා හා ලෝරාත්, රතු ෆ්ලැනල් නිදන-කමිසය හැඳගත් පීටරුත් කෑගාමින් නත්තල් සීයා ගෙනැවිත් ඇත්තේ මොනවා දැයි බලන්නට දුව ගිය හ.

හැම මේස් කකුලක ම දිලිසෙන රතු අත් මේස් කුට්ටමක් හා රතු හා සුදු ඉරි වැටුණු දිග, සිහින් කෝටුවක හැඩයේ පැණි රස පෙපර්මින්ට් සූකිරි එකක් තිබිණි. එහි වටේට ඉතා ශෝභන ලෙස කන්තු කපලා ය.

ළමයින් කොතරම් සතුටට පත් වී ද යත් ඔවුන්ට එක් වර ම කතා කරගැනීමට පවා නො හැකි විය. ඔවුන් දිලිසෙන ඇස්වලින් ඒ කදිම නත්තල් තෑගි දෙස බලා සිටියා පමණි. ලෝරා අන් සැමට ම වඩා සතුටට පත් ව සිටියා ය. ඇයට රෙදි බෝනික්කෙකු ද තෑගි වශයෙන් ලැබී තිබේ.

ඈ ඉතා ලස්සණ බෝනික්කෙකි. සුදු රෙද්දකින් සෑදූ මුහුණක් ද, කළු පැහැති බොත්තම් ඇස් ද ඇට තිබිණි. කළු පැන්සලකින් ඇගේ ඇහි බැම ඇඳ තිබූ අතර, පෝක්බෙරි*වලින් සෑදූ රතු සායම්වලින් ඇගේ කම්මුල් හා දෙතොල් පාට කර තිබිණි. ඇගේ හිසකේ ගොතන ලද ගැට ගැසුණු කළු කැටි නූලෙන් සෑදූ නිසා කැරලි වී ඇත.

* පෝක්බෙරි - සායම් සෑදීමට ගන්නා රතු ගෙඩි වර්ගයක්.

ඇයට රතු ෆ්ලැනල්වලින් මැසූ මේස් ද, සපත්තු වෙනුවට කුඩා කළු රෙදි කඩකින් මැසූ යටි පතුල හා වළලුකර වැසුණු සා වැස්මක් ද විය. ඇගේ ඇඳුම මනහර රෝස හා නිල් පැහැ'ති කුඩු රෙද්දෙන් නිම වී තිබිණි.

ඈ කොතරම් ලස්සණ ද යත් ලෝරාට වචනයක්වත් කතා කරගැනීමට නො හැකි විය. බෝනික්කා ඇතින් ම බදාගෙන සිටි ඇයට අනෙක් සියල්ල ම මතක නැති විය. හැම දෙනා ම තමා දෙස බලා සිටින බව පවා ඈ දැනගත්තේ එලිසා මහම්මා, මෙසේ කියන විට ය:

"බලන්නකෝ ඇස් ලොකු කරගෙන බලා ඉන්න හැටි!"

ලෝරා කුඩා ම දැරිය බැවින් ඇට අත් මේස් හා රස කැවිලි සමග බෝනික්කෙකු ද තෑගි ලැබීම ගැන අනෙක් ගැහැනු ළමයින් ඊර්ෂ්‍යයා වූයේ නැත. සිගිති කේරි හා නැන්දා ගේ සිගිති දැරිය වන ඩොලි වාර්ඩන් හැරුණු විට එහි සිටි කුඩා ම දැරිය ලෝරා ය. සිගිති දැරියන් බෝනික්කන් සෙල්ලම් කිරීමට තව ම කුඩා වැඩි ය. ඔවුන් කොතරම් කුඩා ද කියතොත්, නත්තල් සීයා ගැන පවා දන්නේ නැත. සෑම උදෙෂාගයක දී ම ඔවුන් කළේ සිය කුඩා ඇඟිලි මුවේ ලාගෙන ඒ මේ අත ඇඹරීම පමණි.

ලෝරා සිය බෝනික්කා අල්ලාගෙන ඇඳේ කොනක හිඳගත්තා ය. ඇය ඇගේ රතු අත් මේස්වලට හා සුකිරිවලට ආසා කළා ය. එහෙත් ඒ සියල්ලට ම වඩා ඇට බෝනික්කා වටී. ඇය බෝනික්කාට චාලට් යනුවෙන් නම් තැබුවා ය.

අනතුරුව ඔවුහු එකිනෙකා ගේ අත් මේස්වල හැඩ බලන්නට ද, තම තමන් ගේ අත්වල ඒවා දමාගන්නට ද වූ හ. පීටර් ඔහු ගේ සුකිරි කෝටුවෙන් ඇනටමත් විශාල කැබැල්ලක් කා හමාර කර තිබූ නමුත් ඇලිස්, එලා, මේරි හා ලෝරා බොහෝ

වේලාවක් එහි රස බලනු පිණිස තම තමන් ගේ සුකිරි කෝටුව සෙමින්සෙමින් ලෙවකන්නට වූ හ.

"හොඳයි, හොඳයි!" පීටර් මහප්පා කීවේ ය. "හොඳ හොඳ තෑගි වෙනුවට වේවැලක් තිබුණු එක ම මේස් කකුලක්වත් මෙහෙ තිබුණෙ නැද්ද? හරි පුදුමයිනෙ. මේ ළමයි ඒ තරමට ම හොඳ ළමයි ද, ආ?"

නත්තල් සීයා තමන් වෙත් කිසිවෙකුටත් තෑගි වෙනුවට වේවැලක් දෙනු ඇතැයි ඇත්තෙන් ම ඔවුහු විශ්වාස නො කළ හ. සමහර ළමයින්ට එසේ සිදු වෙයි. එහෙත් ඔවුනට එසේ වන්නේ නැත. හැම විට ම, හැම දා ම, මුළු අවුරුද්ද පුරා ම හොඳ ළමයෙකු වීම ලේසි පහසු කාර්යයක් නො වේ.

"ළමයින්ට විහිළු කරන්න එපා, පීටර්," එලිසා මහම්මා කීවා ය. අම්මා, "ලෝරා, අක්කලාට ඔයා ගෙ බෝනික්කා ව අල්ලන්න දෙන්නෙ නැද්ද?" යි ඇසුවා ය. ඇ එයින් අදහස් කළේ කුඩා දැරියන් එතරම් ආත්මාර්ථකාමී නොවිය යුතු බවයි.

ඉතින් ලෝරා ඇගේ ලස්සණ බෝනික්කා අතට ගන්නට මේරිට ඉඩ දුන්නා ය. ඊ ළඟට ඇලිස් ද, එලා ද මොහොතකට බෝනික්කා අතට ගෙන බැලූ හ. ගෝහන ඇඳුම සිනිඳුවට අල්ලා බැලූ ඔවුහු රතු ෆ්ලැනල් මේස් කකුල්, පා වැසුම් හා කැරලි ගැසුණු කැටි නූලෙන් සෑදූ හිසකේ අගය කරන්නට වූ හ. ලෝරාට සතුටක් දැනුණේ අන්තිමේ දී චාලට් ඇගේ දෑතේ යළිත් සුරක්ෂිත වූ පසු ව ය.

අප්පච්චිට හා පීටර් මහප්පාට ද අලුත් උණුසුම් අත් මේස් ජෝඩුව ගණනේ ලැබී තිබිණි. ඒවායේ රතු හා සුදු කුඩා කොටු මසා ඇත. ඒවා මැසුවේ අම්මා හා එලිසා මහම්මා ය.

එලිසා මහම්මා කරාබු නැටි ගැසූ විශාල රතු ඇපල් කුඩයක් අම්මාට ගෙනැවිත් තිබුණා ය.

ඉත් හමන ප්‍රණීත සුවඳ! කරාබු නැටි නිසා ඇපල් නරක් නො වී, නැවුම්, මිහිරි රසයෙන් කල් තබාගත හැකි ය. එබැවින් ඇපල් අපතේ යන්නේ නැත.

අම්මා, ඇ විසින් සාදන ලද ඇල්පෙනෙති ගසන කුඩා පොතක් එලිසා මහම්මාට තෑගි කළා ය. එහි කවරය සේද රෙදි කැබැලිවලින් සාදා තිබූ අතර, ඉඳිකටු ගැසීම සඳහා ඇති පිටු මෘදු ෆ්ලැනල් රෙදිවලින් සාදා තිබිණි. ෆ්ලැනල් රෙදි ඉඳිකටු මලකඩ කෑමෙන් වළකයි.

ඔවුහු සියලු දෙනා ම අම්මා ගේ ලස්සණ රාක්කය අගය කළ හ. මීට වඩා වෙනස් කැටයම් කපා ඒ ආකාරයට ම රාක්කයක් සාදා දෙන ලෙස එලිසා මහම්මා, පීටර් මහප්පාට කීවා ය.

නත්තල් සීයා ඔවුන්ට කිසිවක් තෑගි කර තිබුණේ නැත. නත්තල් සීයා වැඩිහිටියන්ට තෑගි දෙන්නේ නැත. ඒ ඔවුන් අයහපත් අය නිසා නො වේ. අප්පච්චි හා අම්මා ඉතා හොඳ අය වෙති. එහෙත් ඔවුන් වැඩිහිටි අය නිසා ඔවුන් තම තමන් අතර තෑගි හුවමාරු කරගත යුතු ය.

අනතුරුව සියලු දෙනා ම සුළු වේලාවකට තෑගි පසෙක තැබූ හ. අප්පච්චි, පීටර් මහප්පා සමඟ ඉස්තාලයේ වැඩපළ

කිරීම සඳහා පිටත් ව ගිය අතර ඇලිස් හා එලා ඇඳවල් සකස් කිරීම සඳහා එලිසා මහම්මාට සහාය වූ හ. ඒ අතර ලෝරා හා මේරි, අම්මා උදෑසන ආහාර පිළියෙල කරන තුරු කෑම මේසය සූදානම් කළ හ.

උදෑසන ආහාරය සඳහා පැන් කේක් සාදා තිබිණි. අම්මා දරුවන් සඳහා පැන් කේක් මිනිසා බැගින් සාදා දුන්නා ය. එක් එක්කෙනාට සිය පිඟාන ද රැගෙන උදුන අසලට එන ලෙස කී අම්මා, හැන්දක් පුරවාගත් බිත්තර හා කිරි දමා උකු කළ පිටිවලින් අත්, කකුල් හා හිස සහිත මිනිසෙකු සෑදුවා ය. ඇ උණු කේක් තැටිය මත තබා කුඩා මිනිසා ඉක්මනින් හා පරිස්සමට අනෙක් පිට හරවන ආකාරය බලා සිටින්නට ආසා ය. තැම්බීමට පිළිස්සුණු පසු ඇය දුම් දමන පැන් කේක් මිනිසා උණු උණුවේ ම ඔවුන් ගේ පිඟන්වලට දැමුවා ය.

පීටර් දැනටමත් ඔහු ගේ පැන් කේක් මිනිසා ගේ හිස කාදමා හමාර ය. එහෙත් ඇලිස්, එලා, මේරි හා ලෝරා ඔවුන් ගේ පැන් කේක් මිනිසා සිහින් කැබැලිවලට කඩමින් ඉතා සෙමින් කන්නට වූ හ. මුලින් අත්, කකුල් හා සිරුර කෑ ඔවුහු, හිස අවසානයට කන්නට ඉතිරි කොටගත් හ.

අද කාලගුණය ඉතා සීතල වූ බැවින් ඔවුන්ට පිටතට ගොස් සෙල්ලම් කිරීමට බැරි ය. එහෙත් අතපත ගාමින් ලස්සණ බලන්නට අලුත් අත් මේස් හා කෑමට රස තැවිලි ඔවුන්ට නිවසේ තිබේ. එක පොකුරට බිම වාඩිගත් ඔවුහු, බයිබලයේ පින්තූර බලමින් ද, අප්පච්චි ගේ විශාල කොළ පැහැති පොතේ ඇති විවිධාකාර සතුන් ගේ හා පක්ෂීන් ගේ පින්තූර බලමින් ද කාලය ගෙවන්නට වූ හ. ලෝරා ඒ හැම විට ම චාලට් ව සිය දෑතේ තබාගෙන සිටියා ය.

අනතුරුව එළැඹියේ නත්තල් දිවා භෝජනයයි. ඇලිස්, එලා, පීටර්, මේරි හා ලෝරා කෑම මේසයේ දී එක දු වදනක් හෝ කතා නො කළ හ. ළමයින් යනු අනෙක් අය විසින් දැකිය යුතු හා අනෙක් අයට කටහඬ නො ඇසිය යුතු පිරිසක් බව ඔවුහු දැනසිටිය හ. එහෙත් ඔවුන්ට දෙවැනි වරටත් කෑම ඉල්ලා සිටීමට අවශ්‍ය නො වී ය. අම්මා හා එලිසා මහම්මා සෑම ආහාරයකින් ම ඔවුන් ගේ පිඟන් පුරවා ඔවුන්ට කෑමට හැකි සෑම රසවත් ආහාරයක් ම සිතූ සේ කෑමට ඉඩහළ හ.

"නත්තල එන්නෙ අවුරුද්දකට වතාවයිනෙ," එලිසා මහම්මා කීවා ය.

එලිසා මහම්මාට, පීටර් මහප්පාට හා දොතී සොයුරු සොයුරියන්ට ආපිට බොහෝ දුර යාමට ඇති හෙයින් දිවා ආහාරය ඉක්මනින් ම ගන්නා ලදි.

"අස්සයන් ගෙ පිහිට තමයි," පීටර් මහප්පා කීවේ ය. "උන් හයියෙන් යන තරමට රෑ බෝවෙන්න කලියෙන් ගෙදර යන්න ඇහැක් වේවි."

ආහාර ගැනීම අවසන් වූ විගස පීටර් මහප්පා හා අප්පච්චි හිම යානයට අශ්වයින් බැඳීම පිණිස නික්ම ගිය හ. ඒ අතර අම්මා හා එලිසා මහම්මා ඈගෙ දරුවන්ට ඇඳුම් ඇන්දවූ හ.

ඔවුහු හැඳගෙන සිටින ලොම් මේස් කකුල් හා පාවහන්වලට උඩින් බර'ති ලොම් මේස් කකුල් ඇඳගත් හ. ඊ ළඟට අත් මේස්, කබා, උණුසුම් හිස් වැසුම් හා සළු ඇඳගෙන, ගෙල වටා මෆ්ලර් බැඳගෙන, ගොරෝසු ලොම් සළුවලින් සිය මුහුණු

ආවරණය කරගත් හ. අම්මා ඔවුන් ගේ අත් උණුසුම් ව තබනු පිණිස ඉතා උණුසුම'ති පිලිස්සූ අර්තාපල් ගෙඩි ඔවුන් ගේ කබා සාක්කුවලට දැමුවා ය. හිම යානයේ දී දෙපා අසලින් තබනු පිණිස එලිසා මහම්මා ගේ පැතලි ඉස්ත්‍රික්ක පෝරණුව මත තබන ලදි. බ්ලැන්කෙට්ටු, ඇතිරිලි හා මී හරක් සමින් මැසූ පොරෝනා ද උණුසුම් කරන ලදි.

අනතුරුව ඔවුහු සියලු දෙනා සැප පහසු හා උණුසුම'ති විශාල හිම යානයට ගොඩ වූ හ. අප්පච්චි අවසන් පොරෝනාව ඔවුන් වටා හොඳින් වැසෙන සේ දැමුවේ ය.

"ආයුබෝවන්! ආයුබෝවන්!" ඔවුහු ආචාර කළ හ. යානය පිටත් විය. අශ්වයින් කෙලිලොල් ලෙස හැල්මේ යන්නට වූ අතර හිම යානයේ සීනු මිහිරි හඬින් පැද්දෙන්නට විය.

මඳ වේලාවකට පසු සීනුවල ප්‍රීතිමත් හඬ වියැකී ගියේ ය. නත්තල ගෙවී ගොස් හමාර ය. එහෙත් එය ඉතාමත් ම ප්‍රීතිමත් නත්තලකි!

5 පරිච්ඡේදය

ඉරිදා

දීන සීත සෘතුව දීර්ඝ වූවාක මෙනි. නිතර ම නිවස තුළට වී කල් ගෙවන්නට වීමෙන් ලෝරා හා මේරි පීඩාවට පත් වන්නට වූ හ. විශේෂයෙන් ම ඉරිදා දවසේ දී කාලය ගෙවුණේ ඉතා සෙමිනි.

සෑම ඉරිදාවක ම ලෝරා හා මේරි ඔවුන් ගේ හොඳ ම ඇඳුම්වලින් සැරසෙති. ඔවුන් ගේ හිසකෙස් අලුත් පීත්ත පටිවලින් ගැටගසනු ලැබේ. සෙනසුරාදා රාත්‍රියේ ස්නානය කරන ලද බැවින් ඔවුන් ඉතාමත් පිරිසිදු ය.

ග්‍රීෂ්ම සෘතුවේ දී ඔවුහු උල්පතෙන් එන ජලයෙන් ස්නානය කළ හ. එහෙත් සීත සෘතුවේ දී නාන බේසම පිරිසිදු හිමවලින් පුරවන අප්පච්චි, හිම දිය වී ජලය බවට පත් වනු පිණිස එය උදුන මත තබයි. ඊ ළඟට උණුසුම් උදුන සමීපයේ තබන ලද පුටු දෙකක් මත බ්ලැන්කට්ටුවක් දමා ආවරණය කරන ලද ස්ථානයේ අම්මා ලෝරා ව නාවයි. ඉන් පසු මේරි ව නාවයි.

මේරිට වඩා කුඩා බැවින් ලෝරා පළමු ව නාවනු ලැබුවා ය. නැවීමෙන් පසු පිරිසිදු නිඳන ගවුම අඳින බැවින් ලෝරා, චාලට් සමඟ සෙනසුරාදා රාත්‍රියේ කලින් ම නින්දට යා යුතු ය.

නාන බේසමේ කිලිටි වතුර ඉවත් කරන අප්පච්චි මේරි නාවනු පිණිස නැවත වතාවක් එය හිමවලින් පුරවයි. මේරි නින්දට ගිය පසු අම්මාත් බ්ලැන්කට්ටුවෙන් ආවරණය කර ඇති ස්ථානයට වී ස්නානය කරන්නී ය. ඉන් පසු අප්පච්චිත් ස්නානය කරයි. ඉතින් ඉරිදා දිනය සඳහා ඔවුහු සියලු දෙනා ම හොඳින් පිරිසිදු වී සිටිති.

ඉරිදා දවසේ දී ලෝරා හා මේරි සෙල්ලම් කරන විට ඔවුනට දිවීම තහනම් ය. කෑගෑම හෝ ශබ්ද කිරීම තහනම් ය. මේරිට ඇගේ රෙදි කැබැලි ඇතිරිල්ල මැසිය නො හැකි ය. ලෝරාට සිගිති සෝරි සඳහා කුඩා අත් මේස් ගෙතිය නො හැකි ය. ... නිශ්ශබ්ද ව කරදාසි බෝනික්කන් සමඟ සෙල්ලම් කළ හැකි ය. එහෙත් බෝනික්කන් සඳහා අලුතෙන් කිසිවක සැදිය නො හැකි ය. රෙදිවලින් බෝනික්කන්ට ඇඳුම් මැසීම ඔවුනට තහනම් විය. ඇල්පෙනෙතිවලින් පවා එය කිරීම තහනම් විය.

අම්මා ඔවුන්ට බයිබල් කතාන්දර හෝ අප්පච්චි ගේ 'සත්ත්ව ලෝකයේ අසිරිය' නම් කොළ පැහැති විශාල පොතෙහි සිංහයන් කොටින් හා සුදු වලසුන් ගැන කතාන්දර කියා දෙන විට ඔවුන් නිහඬ ව ඒවාට සවන් දිය යුතු ය. ඔවුනට එහි පින්තූර බැලිය හැකි ය. ඔවුන් ගේ රෙදි බෝනික්කන හෙමිහිට අල්ලාගෙන ඔවුන් සමඟ කතා කළ හැකි ය. එහෙත් ඒ හැරෙන්නට ඔවුනට කළ හැකි කිසිවක් නො වී ය.

ලෝරා කරදාසි කවර සහිත විශාල බයිබලයේ පින්තූර බැලීමට වැඩිපුර ආසා කළා ය. ඒ පින්තූර අතරින් ඇගේ සිත නදින් ඇද බැඳගත්තේ, ආදම් සතුන්ට නම් තබන චිත්‍රයයි.

ආදම් ගලක් උඩ වාඩිවී සිටියි. සියලු ම සිවුපා සත්තු හා කුරුල්ලෝ, ලොකු පොඩි හැම දෙනා ම තමා මොන සත්ත්ව වර්ගයාට අයත් දැයි දැනගන්නා තුරු උනන්දුවෙන් ඔහු දෙස බලා සිටිති. ආදම් පෙනීන් ඉතා සුවපහසු පෙනුමක් දිස්වෙයි. සි... ඇඳුම් පිරිසිදු ව තබාගැනීම සඳහා කරදර වීමට ඔහුට ඕනෑ නැති වන්ද යත් ඔහුට ඇඳුම් තිබුණේ නැත. ඔහු ඇඳ සිටියේ යටි ... ගෙසන සම් කඩක් පමණි.

"ඇඳුම්වට ඉරිදට අඳින ... ඇඳුම් තිබුණා ද?" ලෝරා අම්මා ගෙන් ඇහුවා ය.

"නෑ නෙව," අම්මා කිව්වා ය. "අසරණ ආදම්, එයාට අඳින්න තිබුණෙ සතෙකු ගෙ හමක් විතරයි."

ලෝරාට ආදම් ගැන දුක හිතුණේ නැත. තමාටත් අඳින්නට සම් පමණක් තිබුණා නම් යැයි ඇය සිතුවා ය.

එත් ඉරිදුවක සන්ධ්‍යා ආහාරයෙන් පසු ඇට තවදුරටත් නිසොල්මන් ව බලා සිටීමට නො හැකි විය. ඇය ජැක් සමඟ සෙල්ලම් කිරීමට පටන්ගත්තා ය. මිනිත්තු කිහිපයකින් ඇය දුවන්නටත්, කෑගාන්නටත් වූවා ය. ඇගේ පුටුවේ වාඩිවී නිහඬ ව සිටින ලෙස අප්පච්චි ඇට කීවේ ය. සිය පුටුවේ වාඩිගත් ලෝරා හඬන්නටත්, පුටුවට පයින් ගසන්නටත් වූවා ය.

"මට ඉරිදා පෙන්නන්න බෑ!" ඇය කිවා ය.

අප්පච්චි කියවමින් සිටි පොත පහත දැමුවේ ය. "ලෝරා," ඔහු දැඩි හඬකින් කතා කළේ ය, "මෙහාට එන්න."

ඇය අසීරුවෙන් මෙන් ඇදි ඇදී ඔහු වෙත ගියා ය. අප්පච්චි තමා ගේ පස්සා පැත්තට පහරක් දෙනු ඇතැයි ඇය සිතුවා ය. එහෙත් ඇ අප්පච්චි වෙත ගිය විට අනුකම්පා සහගත ලෙස මොහොතක් ඇ දෙස බලා සිටි අප්පච්චි, ඊ ළඟට ඇව සිය දණහිස මත හිඳුවාගෙන තුරුලු කරගත්තේ ය. අනෙක් අතින් මෙරී ව අල්ලාගත් ඔහු මෙසේ කීවේ ය:

"ඔන්න මං ඔය දෙන්නට සීය ගෙ පුංචි කාලෙ කතන්දරයක් කියන්නයි හදන්නෙ."

සීයා ගේ හිම යානය හා ඌරා ගේ කතාන්දරය

"ඔයගොල්ලන් ගෙ සීයා පුංචි කාලෙදි, ඉරිදා දවස පටන්ගත්තෙ දැන් වගේ ඉරිදා උදේට නෙවෙයි. ඒ කාලෙ ඉරිදා උදා වුණේ සෙනසුරාදා හැන්දෑවෙ ඉර බැහැගෙන යනවත් එක්කමයි. එතකොට හැම දෙනා ම හැම වැඩක් ම නවත්තන්න ඕන. සෙල්ලමුත් නවත්තන්න ඕන.

"රෑ කෑම කන වෙලාවට කවුරුත් කතාවක් නෑ. කෑමෙන් පස්සෙ සීය ගෙ තාත්තා බයිබලෙන් කොටසක් හයියෙන් කියවනවා. එතකොට හැම දෙනා ම තම තමන් ගෙ පුටුවල වාඩිවෙලා සද්දයක් නැතුව අහගෙන ඉන්නවා. ඊ ළඟට හැම දෙනා ම දණ ගහනවා. සීය ගෙ තාත්තා දිග යාඥාවක් කියනවා. එයා 'ආමෙන්', කිවුවට පස්සෙ හැම දෙනා ම නැඟිටලා ඉටිපන්දමක් අරගෙන නින්දට යනවා. සෙල්ලම් නොකර, හිනාවක් කතාවක් නැතුව ඒගොල්ලො කෙළින් ම නින්දට යන්න ඕන.

"ඉරිදා උදේට ඒගොල්ලො කෑවෙ හීතල වෙච්ච කෑම, මොකද ඉරිදට ගෙදර මොකවත් උයන්නෙ නැති හන්දා. ඊ ළඟට හැම දෙනා ම හොඳ ඇඳුම් ඇඳලා පල්ලි යනවා. ඉරිදට අස්සයො බඳින්න බැහැ. ඒකත් වැඩක්. ඉරිදට කිසි ම වැඩක් කරන්නෙ නෑ නෙව. ඉතින් ඒගොල්ලො පයින් ම තමයි පල්ලියට ගියේ.

"ඒගොල්ලො කෙළින් ම ඉස්සරහ බලාගෙන, කිසි ම සද්දයක් නැතුව හෙමින් ඇවිදින්න ඕන. විහිළු කරන්න බෑ, හිනා වෙන්න බෑ. සීයයි, එයා ගෙ සහෝදරයො දෙන්නයි ඉස්සරහින් යනවා. ඒගොල්ලන් ගෙ තාත්තයි, අම්මයි පිටිපස්සෙන් යනවා.

"පල්ලියෙදි සීයයි, සහෝදරයො දෙන්නයි පැය දෙකක් තිස්සෙ හරියට වාඩිවෙලා පූජාව අහන්න ඕන. බංකුවල දඟලන්න බෑ, කකුල් පද්දන්න බෑ, ඔළුව හරවහරව පල්ලියෙ ජනේල දිහා, බිත්ති දිහා, සිවිලිම දිහා බලන්න තහනම්.

Scanned with CamScanner

ඒගොල්ලො සද්ද බද්ද නැතුව, අතක් පයක් හොලවන්නෙ නැතුව වාඩිවෙලා ඉන්න ඕන. ඒක නජ්පරේතුටවත් දේශන තුමා ගෙන ඇස් අහක් කරන්න තහනම්.

"පූජාව ඉවර වුණාට පස්සෙ ඒගොල්ලො හෙමිහිට ගෙදර ආවා. ඒගොල්ලන්ට පාරෙ එන ගමන් කතා කරන්න පුළුවන්. හැබැයි බොහොම හෙමින්. නිකමටවත් හිනා වෙන්න බෑ. ගෙදර ගිහින් ඒගොල්ලො කලින් දා උයපු සීතල දවල් කෑම කෑවා. ඊ ළඟට මුළු හැන්දෑ වරුව ම ඒක පෙළට බංකුවක වාඩිවෙලා කැතිකිස්මේ" පාඩම් කරන්න ඕන. අන්තිමේදි ඉර බැහැගෙන ගිහින් ඉරිදා දවස ඉවර වෙනකම් ම එහෙම තමයි.

"මින්න ඉතින්, සීය ගෙ ගෙදර තියෙන්නෙ උස කන්දක පැහැගෙන බාගයක් දුර ගියපු තැන. කන්ද මුදුනෙ ඉදන් පල්ලෙහාට වැටුණු පාර ගෙදර ඉස්සරහ දොර ළඟින් යනවා. සීත කාලෙට පල්ලෙහාට ලෙස්සලා යන්න කියාපු තැන එතන. ඒගොල්ලන්ට හිතාගන්නැති නෙව.

"එක සතියක සීයයි, එයා ගෙ සහෝදරයො දෙන්නා ජේම්සුයි, ජෝර්ජුයි එකතු වෙලා අලුත් හිම යානයක් හැදුවා. සෙල්ලම් කරන වෙලාවට ඒගොල්ලො තෝරුවෙ ඒක හදපු එක තමයි. ඒක ඒගොල්ලො හදපු හොඳ ම හිම යානෙ. ඒක තෝච්චර දිග ද තිබුණෙ ? ඒ එක්කෙනා පිටිපස්සෙ එක්කෙනා ගාණෙ තුන් දෙනාට ම වාඩිවෙන්න පුළුවන්. ඒක හදලා ඉවර කරලා සෙනසුරාදා හවස කන්ද පහළට පදින්න තමයි ඒගොල්ලො හිතාගෙන හිටියෙ. හැම සෙනසුරාදා දවසක ම ඒගොල්ලන්ට සෙල්ලම් කරන්න පැය දෙක තුනක් ලැබුණා.

"ඒත් ඒ සතියෙ ඒගොල්ලන් ගෙ තාත්තා ගස් කපන්න මහ කැලේට ගියා. එයා හුගක් මහන්සි වෙලා වැඩ කෙරුවා. ඉතින් පුතාලටත් ඒ වැඩේට එකතු කරගත්තා. ඒගොල්ලො උදේට කරන්න තියෙන ඉස්තාලෙ වැඩපළ සේරම ලාම්පු එළියෙන් කරලා උදේ ම කැලේට ගියා. ඉර පායනකොටත් ඒගොල්ලො කැලේට ගිහින් බරට ම වැඩ. මේ විදියට රෑ වෙනකම් ම වැඩ කෙරුවා. ඊ ළඟට ඉස්තාලෙ වැඩපළ කරන්න තිබුණා. කෑමෙන් පස්සෙ ඒගොල්ලො නිදාගන්න යන්න ඕන හොතෝ පහුවෙනි දා උදෙන් ම නැගිටින්න ඕන නෙව.

"සෙනසුරාදා හවස් වෙනකම් ම හිම යානෙ වැඩ කරගන්න ඒගොල්ලන්ට බැරි වුණා. ඒගොල්ලො පුළුවන් තරම් දඟිරිය අලා යානෙ හැදුවා. ඒත් සෙනසුරාදා ඉර බහින්න කලින් ඒක ඉවර කරගන්න බැරි වුණා.

"ඉර බැස්සට පස්සෙ කන්දෙ හිම යානෙ පදින්න ඒගොල්ලන්ට බැහැ. ඒක පාරක්වත් බැහැ. එතකොට සබත්" කඩ කළා වෙනවා. ඉතින් ඒගොල්ලො හිම යානෙ ගේ පිටිපස්සෙ මඩුවෙ දැම්මා. ඉරිදා පහුවෙලා එළියට ගන්න හිතාගෙන.

"පහුවෙනිදා පල්ලියෙ පූජාවට ගිහිං, ඒගොල්ලො කකුල පද්දන්නෙ නැතුව දේශකතුමා දිහා ම බලාගෙන හිතුවෙ මොකක් ගැන ද කියලා දන්නව ද, හිම යානෙ ගැන. ගෙදරදි දවල් කෑම කන වෙලාවේදි ඒගොල්ලන්ට වෙන දෙයක් කල්පනා වුණේ නෑ. කෑමෙන් පස්සෙ ඒගොල්ලන් ගෙ තාත්තා බයිබලෙ කියවන්න වාඩිවුණා. සීයයි, ජේම්සුයි, ජෝර්ජුයි මීයො වගෙ නිස්සද්ද ව තමන් ගෙ බංකුවෙ වාඩිවෙලා කැතිකිස්මේ කියෙවුවා. හැබැයි ඒගොල්ලන් ගෙ හිතේ තිබුණෙ හිම යානෙ ගැන.

"ඉර අහසෙ බොහොම දීප්තිමත් ව බැබළෙනවා. සිනිඳු හිම දිලිසෙනවා. ඒගොල්ලන්ට ඒවා ජනේලෙන් පේනවා. ඒක හිම යානෙ පදින්න කියාපු දවස. ඒගොල්ලො කැතිකිස්මේ දිහා බලාගෙන, අලුත් හිම යානෙ ගැන කල්පනා කෙරුවා. මේ ඉරිදා නං ඉවර වෙන ඉරිදාවක් නෙවෙයි.

"හුග වෙලාවකට පස්සෙ ඒගොල්ලන්ට ගොරවන සද්දයක් ඇහුණා. බලනකොට තාත්තා හොඳට ම නිදි. එයා ගෙ ඔළුව පුටු ඇන්දට බර කරගෙන එයා ගොරවගොරව නිදි.

"ජේම්ස්, ජෝර්ජ් දිහා බලලා බංකුවෙන් නැගිටලා ඇඟිලිවලින් රහසින් ඇවිදගෙන කාමරේ පිටිපස්සෙ දොරෙන්

සබත - ඉරිදා දිනයේ කතෝලිකයන් ගේ ආගමික චාරිත්‍ර.

එළියට ගියා. සීයා දිහා බලලා ජෝර්ජුත් හෙමිහිට අඩි තියතියා ජේම්ස් පස්සෙ ගියා. අන්තිමේ දී සීයත් බයෙන් බයෙන් තාත්තා දිහා බලබලා අර දෙන්නා පස්සෙන් මිදුලට ගියා.

"ඒගොල්ලො ඉක්මනට අලුත් හිම යානෙ එළියට අරගෙන කන්ද මුදුනට ගියා. එක පාරක්වත් හිම යානෙ පදින්නයි ඒගොල්ලන්ට ඕන වුණේ. එහෙම කරලා, තාත්තා ඇහැරෙන්න කලියෙන් හිම යානෙ පැත්තකට දාලා ආයෙමත් බංකුවෙ වාඩිවෙලා කැතිකිස්මෙ පාඩම් කරන්න පුළුවන් කියලා ඒගොල්ලො හිතුවා.

"ජේම්ස් හිම යානෙ ඉස්සරහින් වාඩිවුණා. ඊ ළඟට ජෝර්ජ්, ඊ ළඟට සීයා. මොකෝ එයා නෙව පුංචි ම ළමයා. ඔන්න හිම යානෙ යන්න පටන්ගත්තා. මුලින් ම හෙමින්, ඊ ළඟට හයියෙන්, තවත් හයියෙන්. දැන් ඒක කන්ද බෑවුමේ පල්ලෙහාට දුවනවා, ඉගිල්ලෙනවා. ඒත් ළමයි කෑගැහුවෙ නෑ. ඒගොල්ලො තාත්ත ව ඇහැරවන්නෙ නැතුව නිස්සද්ද ව ගේ පහු කරගෙන යන්න ඕන නෙ.

"හිම තලාවෙ ළිස්සන ධාවකවල පුංචි ගුරු ගුරු සද්දෙයි, වේගෙන් පහුවෙන හුළඟෙ සද්දෙයි ඇරෙන්න වෙන කිසි ම සද්දයක් නෑ.

"හිම යානෙ ගේ පහු කරගෙන යන්න ඔන්න මෙන්න තියෙද්දි ලොකු කළු පාට ඌරෙක් කැලෑවෙන් එළියට දුවගෙන ආවා. ඌ පාර මැද නැවතිලා බලා ඉන්නවා.

"හිම යානෙ යන වේගෙ තරම් කොච්චර ද කිවුවොත් ඒක නවත්තගන්න බෑ. ආපහු හරවන්න වෙලාවකුත් නෑ. ඉතිං මොකෝ වුණේ යානෙ ඌරු කඩියා ළඟට ගිහිං ඌවත් ඒකට නග්ගගත්තා. මහ හයියෙන් කෑගාගෙන ඌ ජේම්ස් ගෙ කකුල් උඩ ලැග්ගෙ නැතැයි. කොච්චර හරි උගේ කෑගැම් නතර වුණේ නෑ. ඌ දිගින් දිගට ම මහා අමිහිරි සද්දෙකින් කෑගැහුවා, 'ඊ ඊ ඊ - ඊ ඊ - ඊ - ඊ - ඊ - ඊඊ! ඊ ඊ ඊ - ඊ ඊ - ඊ - ඊ - ඊ - ඊඊ!'

"ඒගොල්ලො වේගෙන් ගේ පහුකරගෙන ගියා. ඌරා ඉස්සරහ වාඩිවෙලා ඉන්නවා. ඊ ළඟට ජේම්ස්, ඊ ළඟට ජෝර්ජ්, ඊ ළඟට සීයා. එතකොට ඒගොල්ලො දැක්කා තාත්තා දොර ළඟ හිටගෙන බලා ඉන්නවා. ඒගොල්ලන්ට හිම යානෙ නවත්තගන්නත් බෑ, හැංගෙන්නත් බෑ, මොකවත් කියන්න වෙලාවකුත් නෑ. දිගට ම බෙරිහන් දෙන ඌරත් එක්ක ම ඒගොල්ලො කන්ද පල්ලමට ම රූටනවා.

"කන්ද පල්ලමේ හිම යානෙ නැවතුණා. ඌරා ජේම්ස් ගෙ කකුල් උඩින් නැගිටලා කෑගගා කැලේ බිඳගෙන දිවුවා.

"පිරිමි ළමයි තුන්දෙනා හෙමිහිට, කතාවක් නැතුව කන්ද නැගලා හිම යානෙ පැත්තක දාලා හොරු වගේ ගේ ඇතුළට ගිහින් බංකුවෙ වාඩිවුණා. තාත්තා එයා ගෙ බයිබලේ කියවනවා. එයා වචනයක්වත් කතා නොකර ඒගොල්ලො දිහා බැලුවා.

"ඊ ළඟට එයා ආයෙමත් බයිබලේ කියවන්න පටන්ගත්තා. අර තුන්දෙනා කැතිකිස්මෙ පාඩම් කෙරුවා.

"ඒත් ඉර බැහැගෙන ගිහින් සබත් දවස ඉවර වුණාට පස්සෙ තාත්තා ඒගොල්ලන් ව දර මඩුවට එක්කරගෙන ගිහින් පස්ස පැත්තට හොඳට ම තැළුවා. ඉස්සෙල්ල ම ජේම්ස්ට, ඊ ළඟට ජෝර්ජ්ට, අන්තිමේදි සීයට.

"ඉතින් දැක්කා නේ ද, ලෝරයි, මේරියි," අප්පච්චි කීවේ ය. "හොඳ ළමයි වෙන එක අමාරු වැඩක් කියලා ඔයගොල්ලන්ට හිතේවි. ඒත් සීය ගෙ පොඩි කාලෙට වඩා දැන්

කාලෙ හොඳ ළමයි වෙන එක එච්චර අමාරු නැති එක ගැන මයගොල්ලො සංතෝස වෙන්න ඕන. තේරුණා ද?"

"පුංචි ගෑනු ළමයිනුත් ඒ තරමට ම හොඳ වෙන්න ඕන ද?" යි ලෝරා ඇසුවා ය. එවිට අම්මා මෙසේ කීවා ය:

"පුංචි ගෑනු ළමයින්ට ඒක හුඟක් අමාරුයි. මොකෝ ඒගොල්ලො ඉරිදා විතරක් නෙවෙයි, අනෙක් හැම දවසෙමත හොඳ නෝනලා වගේ හැසිරෙන්න ඕන. පුංචි ගෑනු ළමයින්ට පිරිමි ළමයින්ට වගේ හිම යානෙ ලිස්සලා යන්න බෑ. ගෑනු ළමයි ගෙදර ඉඳගෙන මහන්න ගොතන්න ඕන."

"දැන් දෙන්න ම දුවලා ගිහින්, අම්මට කියලා ඇඳුම් මාරු කරගෙන නිදාගන්න." යි කී අප්පච්චි, සිය රවුකිඤ්ඤය එහි පෙට්ටියෙන් පිටතට ගත්තේ ය.

ලෝරා හා මේරි රෝද සහිත මිටි ඇඳේ වැතිරී ඉරිදා ගීතිකාවන්ට සවන් දුන් හ. රවුකිඤ්ඤය පවා සතියේ දිනවට වයන ගීත ඉරිදා දිනවල වාදනය නො කළ යුතු ය.

අප්පච්චි රවුකිඤ්ඤය වයමින් 'සමිඳාණෝ මා සවු කරින මුදවාගත් සේක,' නම් ගීතිකාව ගැයුවේ ය. ඊ ළඟට ඔහු මෙසේ ගයන්නට විය:

"තෑගි දිනන්නට සටනේ යෙදෙමින
අන් අය ලේ ගංගා මැද පිහිනන අතරෙ
සමිඳාණෝ මා අහසට පසවාගෙන,
සහනය පිරී මල් යහනක සතපාවී ද?"

සංගීතයේ තාලයට අනුව ලෝරා ගේ සිත පාවෙන්නට විය. ඊ ළඟට සට සට හඬක් ඇට ඇසිණි. අම්මා උදුන අසල උදේ ආහාර පිළියෙල කරමින් සිටියා ය. ඒ සඳුදා උදෑසනයි. ආයෙත් සතියක් යන තුරු ඉරිදා උදා වන්නේ නැත.

ඒ උදෑසන උදේ ආහාරයට පැමිණි අප්පච්චි, ලෝරා අල්ලාගෙන තමාට ඇගේ පස්සා පැත්තට හොඳ පාරක් දිය යුතු බව කීවේ ය.

පළමු ව අද ඇගේ උපන් දිනය බව විස්තර කළ ඔහු, මේ අවුරුද්දේ දී ඇට හොඳ පාරක් ලැබුණේ නැති නම් ලබන අවුරුද්දේ දී ඇ හොඳට හැදෙන්නේ නැති බව කීවේ ය. ඉන් පසු ඔහු ඇට යන්තම්වත් නොරිදෙන පරිදි ඉතා සෙමින් හා මෘදු ව ඇගේ පස්සා පැත්තට තළන්නට වූවේ ය.

"එකයි - දෙකයි - තුනයි - හතරයි - පහයි - හයයි," ඔහු ගණන් කරමින් හෙමිහිට ඇට තැළුවේ ය. එක් එක් වසර වෙනුවෙන් එක පහරක් ගණනේ ලැබිණි. අන්තිමේ දී ඇගේ ඉදිරි වැඩීම සඳහා ඔහු ඇට ලොකු පහරක් දුන්නේ ය.

අනතුරුව ඔහු ලීයකින් ඉතා ශෝභන ලෙස කපා සකස් කළ කුඩා ලී මිනිසෙකු ඇට තෑගි කළේ ය. ඔහු චාලට් ගේ මිතුරා වනු ඇත. අම්මා කුඩා කේක් ගෙඩි පහක් ඇට දුන්නා ය. එක් එක් කේක් ගෙඩිය ලෝරා, ඇ හා අප්පච්චි සමග සිටි එක් එක වසර වෙනුවෙනි. මේරි, චාලට්ට ඇන්දවීම සඳහා අලුත් ගවුමක් ඇට තෑගි කළා ය. මේරි එය මසන කල, ලෝරා සිතුවේ ඇ ඒ මසන්නේ ඇගේ රෙදි කැබැලි ඇතිරිල්ල කියායි.

ඒ රාත්‍රියේ විශේෂ උපන්දින තෑග්ගක් වශයෙන් අප්පච්චි 'පොප් ඔන්න වීසල්* පැනලා ගියා'. යන ගීතය ඈ වෙනුවෙන වාදනය කළේ ය.

* වීසල් - මුගටි වර්ගයේ කුඩා කිරපායි සතෙක්

ඔහු වාදනය කරන අතරේ ලෝරා හා මේරි ඔහු ගේ දෙදණ මත හිඳගෙන සිටිය හ. "ඔන්න බලන්න," ඔහු කීවේ ය. "බලන්න, බාගදා ඔයගොල්ලන්ට පෙනේවි විසල් එකපාරට ම පැනලා යන හැටි" අනතුරුව ඔහු මෙසේ ගයන්නට විය:

"නූල් පන්දුවට පැන්සයයි,
ඉඳිකටුවට පැන්සයයි,
සල්ලි ඉවර වුණේ එහෙම තමයි -"

දැන් වේලාව හරි බැවින් ලෝරා හා මේරි වඩාත් ඉදිරියට නැමී බලන්නට වූ හ.

"පොප්!" (රවුකිඤ්ඤයේ තතක් මත වූ අප්පච්චි ගේ ඇඟිල්ලෙන් හඬක් නැඟිණි.)

"ඔන්න විසල් පැනලා ගියා!" (ඉතා පැහැදිලි ලෙස රවුකිඤ්ඤය නාද නැගුවේ ය.)

එහෙත් අප්පච්චි සිය ඇඟිල්ලෙන් තත පිරිමැද පොප් යන හඬ නංවනු ලෝරා හා මේරි දුටුවේ නැත.

"අනේ, ආයෙමත් කරන්න, ආයෙමත් කරන්න!" යි ඔවුහු බැගෑපත් වන්නට වූ හ. අප්පච්චි නිල් පැහැති දැස්වලින්

සිනාසුණු අතර ඔහු ගයන අතරේ රවුකිඤ්ඤය දිගට ම නාද නැගුවේ ය.

"සපතේරුව ගේ මේසෙ වටේ,
විසල් පස්සෙ වඳුරා යයි එළවා,
දේශකයා සපතේරුව ගෙ බිරිඳව සිඹලා,
පොප්! ඔන්න විසල් ගියා පැනලා!"

ඒ වතාවේත් අප්පච්චි ගේ ඇඟිල්ල තත පිරිමදිනු ඔවුන් දුටුවේ නැත. ඔවුනට සොයාගැනීමට බැරි තරම් ඉක්මනින් ඔහු එය කළේ ය.

ඉතින් සිනාසෙමින් නිදන්නට ගිය ඔවුහු ඇඳේ වැතිරී අප්පච්චි ගේ ගායනයටත්, රවුකිඤ්ඤයේ වාදනයටත් සවන් දුන් හ.

"එක් මහලු කල්ලෙක් හිටියා
ඔහු ගේ නම නෙඩ් මාමා,
ඈත ඈත කාලයකට ඉස්සර ඔහු මියඇදුණා.
ගහ සැරේට කෙස් වැවෙනා තැන නම් හිස වේ,
ඒත් ඔහු ගෙ හිස් මුදුනේ කෙස් ගසක්වත් නැත්තේ.
ඔහු ගේ ඇඟිලිත් හරියට
අතුලේ ඇති කෝටු වාගේ හරි ම දිගයි
පිටට පෙනෙන්නේ ඔහුට ඇස් දෙකක් නෑ වාගෙයි.
හෝ-කේක්* කන්නට දත් නැති හන්දා,
ඔහු හෝ-කේක් ගෙඩියක් පැත්තක තැබුවයි.

"ඉස්කෝප්ප, නගුල් පෝරු අතට අරන්,
රවුකිඤ්ඤෙයි, වීණා පතයි බිම තියපල්ලා,
නෙඩ් මාමට තව කරන්න කිසි ම වැඩක් නෑ,
හොඳ කල්ලන් ගිය තැනට ම ඔහුත් ගිහිල්ලා."

* හෝ-කේක් - මුල් කාලයේ උදැල්ලක තලය මත තබා පුලුස්සන ලද ඉරිඟු පිටියෙන් සාදන ලද රස කේක් වර්ගයක්.

6 පරිච්ඡේදය

ලොකු වලස්සු දෙදෙනා

වසන්ත කාලය ළං වෙමින් ඇති බව එක දිනක අප්පච්චි කීවේ ය.

මහ කැලයේ හිම දිය වෙමින් තිබේ. ගස්වල අතු මත රැඳුණු හිම කැට බිමට වැටී දිය වී යන හිම ගොඩැලි මත කුඩා සිදුරු සාදයි. මධ්‍යාහ්නයේ දී කුඩා නිවසේ පියසි පුරා ඇති විශාල හිම කුරු සියල්ල හිරු එළිය වැදී ලෙළදෙන්නටත්, කාන්ති විහිදුවන්නටත් වෙයි. ඒවායේ කෙළවර කුඩා වතුර බිඳු එල්ලෙමින් තිබෙනු පෙනේ.

තමා මුළු සීත කාලය පුරා ම උගුල් අටවා අල්ලාගත් කැලෑ සතුන් ගේ සම් විකිණීම සඳහා නගරයට යා යුතු බව අප්පච්චි කීවේ ය. ඉතින් එක සැන්දෑවක ඔහු සම් එක්කොට විශාල මිටියක් බැන්දේ ය. එහි කොතරම් සම් ප්‍රමාණයක් තිබුණේ ද යත් ඒවා එක්කොට එක මිටියක් වන්නට තිටි තිටියේ ගැටගැසූ විට එය අප්පච්චි තරමට ම විශාල විය.

ඊට දවසක හිමිදිරි පාන්දර සම් මිටිය උරහිසේ එල්ලාගත් අප්පච්චි, පයින් ම නගරයට යන්නට පිටත් වූයේ ය.

ගෙන යන්නට විශාල සම් ප්‍රමාණයක් ඇති බැවින් ඔහු තුවක්කුව ගෙන ගියේ නැත.

අම්මා මේ පිළිබඳ ව කනස්සල්ලට පත් වූවා ය. එහෙත් ඉර නැගෙන්නට පෙර පිටත් වී, මුළු දවස පුරා ම හැකි තරම් වේගයෙන් නගරයට ගියහොත්, අඳුර වැටෙන්නට පෙර ආපිට නිවසට ආ හැකි බව අප්පච්චි කීවේ ය.

ළඟ ම ඇති නගරය පිහිටා තිබෙන්නේ බොහෝ දුරිනි. ලෝරා හා මේරි කවදාකවත් නගරය දැක නැත. කවදාකවත් වෙළෙඳ සලක් දැක නැත. නිවෙස් දෙකක් එකට පිහිටා ඇති අයුරුවත් දැක නැත. එහෙත් නගරයක ගෙවල් බොහෝමයක් ඇති බවත්, රස කැවිලි, රෙදි පිළි හා තවත් අපූරු දේවල් වෙඩි බෙත්, මුනිස්සම්, ලුණු හා ගබඩා සීනි ආදි තවත් බොහෝ දේ පිරුණු වෙළෙඳ සලක් තිබෙන බවත් ඔවුහු දැනසිටිය හ.

අප්පච්චි වෙළෙන්දාට සම් විකුණා නගරයෙන් ලස්සණ ලස්සණ දේ ගෙන එන බව දන්නා ඔවුහු, ඔහු ඒ තෑගිත් රැගෙන එන තුරු මුළු දවස පුරා ම බලා සිටිය හ. ඉර ගස් මුදුන් අතරින් බැස ගියේ ය. හිම කුරු අග රැඳුණු වතුර බිඳු පොළොවට වැටීම නැවතිණි. ඔවුහු නො ඉවසිල්ලෙන් අප්පච්චි එන පෙරමඟ බලා සිටින්නට වූ හ.

ඉර ඇසට පෙනෙන මානයෙන් අතුරුදහන් ව ගියේ ය. වනය අන්ධකාරයේ ගිලිණි. ඔහු තවමත් ආවේ නැත. අම්මා රෑ කෑම පිස මේසය සූදානම් කළා ය. එහෙත් ඔහු තව ම නැත. එය ඉස්තාලයේ වැඩපළ කිරීමට වේලාවයි. එහෙත් ඔහු තවමත් නැත.

එළදෙන ගෙන් කිරි දෙවීම සඳහා ලෝරාට තමා සමඟ යන්නට එන්නැයි අම්මා කීවා ය. ඇ කිරි දොවන තුරු ලෝරා ලන්තෑරුම අල්ලාගෙන සිටිය යුතු ය.

ඉතින් ලෝරා සිය කබාය හැඳගත් අතර අම්මා එහි බොත්තම් පියවූවා ය. ඊ ළඟට අම්මා ලන්තෑරුම දල්වන තුරු, ලෝරා ඇගේ ගෙල වටා ඇති රතු කැටි නූල් පටියෙන් එල්ලෙන රතු අත් මේස් දමාගත්තා ය.

අම්මාට කිරි දෙවීම සඳහා සහාය වන්නට ලැබීම ලෝරා තුළ මහත් ආඩම්බරයක් ඇති කළේ ය. ඇය ඉතා පරිස්සමට ලන්තෑරුම අල්ලාගෙන සිටියා ය. බෙලෙක් තහඩුවලින් සාදා

Scanned with CamScanner

ඇති ලන්තෑරුමේ තැන තැන ඉටිපන්දම් එළිය පිටතට විහිදීම සඳහා සිදුරු කපා ඇත.

ලෝරා අම්මා පිටුපසින් අඩි පාර දිගේ ගව මඩුවට යන විට ඇ අත ඇති ලන්තෑරුමේ ඉටිපන්දම් එළිය කුඩා තීරු ලෙස හිම තලාව පුරා පැතිරිණි. තවමත් හොඳට ම කළුවර වැටී නැත. කැලෑව පුරා අන්ධකාරය පැතිරී තිබුණ ද හිමෙන් වැසුණු අඩි පාර මත මලානික එළියක් වැටී තිබිණි. අහසේ පාණ්ඩු පැහැති තාරුකා කිහිපයක් බැබලෙයි. ඒ තරු ලන්තෑරුමෙන් විහිදෙන සිහින් ආලෝකය තරම් උණුසුම් හා දීප්තිමත් නැත.

සූකි නම් දුඹුරු පැහැ'ති එළදෙන ගේ හැඩයේ අඳුරු ඡායාවක් ගව මඩුවේ දොරකොඩ සිටගෙන සිටිනු දුටු ලෝරා මවිත වූවා ය. අම්මා ද එයින් පුදුම වී සිටියා ය.

මේ වසන්ත කාලයේ සූකිට තණකොළ කෑම සඳහා මහ වනයට යාමට තවම කල් වැඩි ය. ඇය ගව මඩුවේ ජීවත් වූවා ය. එහෙත් ඉඳහිටෙක, උණුසුම් දිනවල අප්පච්චි ඇගේ ගාලේ දොර හැර තබයි. එවිට ඈට ගව මඩුවේ මිදුලට යා හැකි ය. දැන් ඈ මඩුවේ ඉනි වැට අසලට වී ඔවුන් එන තෙක් බලා සිටිනු අම්මා හා ලෝරා දුටුවා ය.

අම්මා ගේට්ටුව අසලට ගොස් එය අරිනු පිණිස පිටුපසට තල්ලු කළා ය. එහෙත් සූකි එය අවුරාගෙන සිටි බැවින් එය සම්පූර්ණයෙන් ම ඇරුණේ නැත. අම්මා මෙසේ කීවා ය:

"සූකි, යනවා එහාට!" ඇය ගේට්ටුවට උඩින් අත දිගු කොට සූකි ගේ උරහිසට පහරක් ගැසුවා ය.

ඒ මොහොතේ ම, ලන්තෑරුමෙන් නැගී ඒ මේ අත නටන සිහින් ආලෝක කිරණක් ගේට්ටුවේ ඉනි අතරින් ඇතුළට විහිදී ගියේ ය. එවිට ලෝරා ගේ ඇසට හසු වූයේ දිගු දළ කළු ලොම් හා දිලිසෙන කුඩා ඇස් දෙකකි.

සූකිට ඇත්තේ සිහින්, කෙටි, දුඹුරු පැහැ ලොම් ය. ඇගේ ඇස් විශාල ය, කරුණාවන්ත ය.

අම්මා, "ලෝරා ආපහු ගෙදර යන්න," (කීවා ය.

ඉතින් ආපසු හැරුණු ලෝරා නිවස දෙසට යන්නට වූවා ය. අම්මා ඈ පිටුපසින් ආවා ය. මඳක් දුර ඇවිද ගිය පසු අම්මා ලෝරා ඔසවාගෙන ලන්තෑරුමත් අතකින් ගෙන දුවන්නට වූවා ය. ඈ සමඟ ගෙතුළට ගිය අම්මා දොර වැසුවා ය.

"අම්මේ, ඒ වලහෙක් ද?" යි ලෝරා ඇසුවේ ඉන් පසු ව ය.

"ඔව්, ලෝරා," අම්මා කීවා ය. "ඒ වලහෙක් තමයි."

ලෝරා හඬන්නට වූවා ය. ඇය අම්මා ගේ ඇගේ එල්ලී, "අනේ, ඌ සූකිව කයි ද?" යි අසමින් ඉකිබින්දා ය.

"නෑ," අම්මා ඈව වැලඳගනිමින් කීවා ය. "සූකි ඉන්නෙ මඩුවෙනෙ. ඒ හන්දා ඌට කරදරයක් වෙන්නෙ නෑ. හිතන්න ලෝරා මඩුවෙ බිත්ති හදලා තියෙන ලී කොච්චර ලොකු ද, හයිය ද කියලා. දොරත් හරි බරයි, හයියයි. වලස්සුන්ට ඒකෙන් ඇතුළට යන්න බෑ. ඉතිං, මේ වලහට බෑ නෙව ඇතුළට ගිහිං සූකි ව කන්න."

ලෝරාට මඳ සැනසුමක් දැනිණි. "ඒත් ඌට අපි ව කන්න තිබුණා, නේ ද?" ඇය ඇසුවා ය.

"ඌ අපි ව කෑවෙ නැහැනෙ," අම්මා පිළිතුරු දුන්නා ය. "ඔයා හොඳ ළමයෙක්නෙ ලෝරා. මං කියන විදියට ම වැඩ කරනවා. මොනව හරි කිවුවම ප්‍රශ්න අහන්නෙ නැතුව ටක් ගාලා ඒක කරනවා."

"ඉතින් ගෙදර එන්න පාරට බහිද්දි ඉර බහින්නත් ළඟයි.

"මං පය ඉක්මන් කරලා ගෙදර එන්න පටන්ගත්තා. ඒත් ඉතින් හිමේ ඇවිදින්න හරි ම අමාරුයි. මට හොඳට ම මහන්සිත් එක්ක. ඉතින් රෑ වෙන්න කලියෙන් හුගක් දුර ඇවිදින්න මට බැරි වුණා. මගේ අතේ තුවක්කුවත් නෑ. මං විතරයි මහ කැලෑවෙ තනියෙන්.

"තව හැතැම්ම හයක් විතර ඇවිදින්න තියෙනවා. ඉතින් මං පුළුවන් තරම් ඉක්මනින් ඇවිද්දා. ටිකෙන් ටික කළුවර වැටුණා. සීත කාලෙ ගෙවිලා ගිහින් හන්දා සමහර වලස්සු උන් ගෙ ගුහාවලින් එළියට එනවා නෙව. ඉතින් මගේ අතේ තුවක්කුව නැති එක ගැන මං හරියට දුක් වුණා. උදේ නගරෙට යද්දි මං දැක්කා උන් ගෙ අඩි පාරවල්.

"මේ කාලෙ වලස්සු ඉන්නෙ හරි ම බඩගින්නෙන්. ඒ වගේ ම උන්ට හරියට තරහ යනවා. ඔයගොල්ලො දන්නවනෙ උන් මුළු සීත කාලෙ ම කන්න කිසි දෙයක් නැතුව ගුහාවට වෙලා නිදාගෙන ඉන්නවා කියලා. ඉතින් උන් ඇහැරුණාට පස්සෙ උන්ට හොඳට ම බඩගිනියි, ඒ වගේ ම උන් කෙට්ටුත් වෙලයි ඉන්නෙ. ඉතින් උන්ට ඇහැ ගැහෙන්නෙ නැතුව එන්නයි මට ඕන වුණේ.

"මං කළුවරේ ම පුළුවන් තරම් ඉක්මනට ඇවිද්දා. ටික වෙලාවකින් පුංචි තරු එළියක් වැටුණා. ඒත් ඝන සැරෙට කැලෑව වැවුණු තැන් තාර වගේ කළුයි. ඒ වුණාට එළිමහන් තැන් යාන්තමට පෙනුණා. ටිකක් ඈතින් තියෙන හිමෙන් වැහුණු පාර මට යාන්තමට පෙනුණා. අන්ධකාර කැලෑව මාව හැම පැත්තෙන් ම වට කරගෙන ඉන්නවා මට පෙනුණා. මට පොඩි එළියක් දෙන තරු තියෙන එළිමහන් තැනකට එන්න ලැබුණ ම මං හරියට සංතෝස වුණා.

"හැම තිස්සෙම මං මට පුළුවන් තරමින් වලස්සු ගැන හොඳිසියෙනුයි හිටියෙ. උන් පඳුරු අස්සෙන් ගාණක් නැතුව එහා මෙහා යන කොට සද්දෙ ඇහෙයි ද කියලා මං ඇහුම්කන් දුන්නා.

"ඊ ළඟට මං ආයෙමත් එළිමහන් තැනකට ආවා, එතන මං යන පාර මැද්දෙ මං දැක්කා ලොකු කළු වලහෙක් ඉන්නවා.

"ඌ පස්සා කකුල්වලින් හිටගෙන මා දිහා බලා ඉන්නවා. මං දැක්කා උගේ ඇස් දිලිහෙනවා. මට උගේ ඌරු හොම්බ පෙනුණා. තරු එළියෙන් උගේ නියපොතුත් මට පෙනුණා.

"මගේ හිසේ කෙස් කෙළින් වුණා. මං පාරේ එතෙම ම නැවතිලා සද්දයක් බද්දයක් නැතුව හිටියා. වලහා හෙල්ලුණේවත් නෑ. ඌ එතැන ම හිටගෙන මගේ දිහා ම බලා ඉන්නවා.

"ඌ වටෙන් යන එක හොඳ වැඩක් නොවෙයි කියලා මට හිතුණා. එතකොට ඌ මගේ පස්සෙන්, අන්ධකාර කැලෑව දිගේ එයි. අන්ධකාරේ ඌට මට වඩා හොඳට පේනවා. සීත කාලෙ හාමතින් හිටිය වලහෙක් එක්ක සටන් කරන්න මට බෑ. අපොයි! මට මගේ තුවක්කුව ගැන හිතිච්ච දේවල්!

"ගෙදර එන්න නම් මං වලහ ව පසු කරන්න ම ඕන. මං හිතුවා ඌව බය කෙරුවොත් ඌ පාරෙන් අයින් වෙලා මට යන්න ඉඩ දෙයි කියලා. ඉතින් මං දිග හුස්මක් අරන් එක පාරට ම මට පුළුවන් හයියෙන් කෑගාගෙන අත් වනවනා ඌ ඉස්සරහට ගියා.

"මේ සතා හෙලවුණේවත් නෑ.

"හැබැයි මං ඌ ළඟට ම දුවලා තිබුණෙ නෑ. හරි ද, මං නැවතිලා ඌ දිහා බැලුවා. ඌත් මා දිහා බලා ඉන්නවා. ඊ ළඟට මං ආයෙමත් කෑගැවා. මෙන්න මූ තාමත් එතන. මං දිගට ම අත් වනවනා කෑගැවා. ඒත් ඌ අඟලක්වත් හෙල්ලුණේ නෑ.

"දැන් ඉතින් දුවන එකත් නුවණක්කාර වැඩක් නෙවෙයි. කැලෑවෙ තවත් වලස්සු ඉන්නවා. ආයෙ කොයි වෙලාවෙ හරි මට තව එකෙක් හම්බ වෙයි. මේ වලහට වගේ ඌටත් බය වෙලා ඉන්න වෙයි. අනෙක, මං ඔයගොල්ලොයි, අම්මයි ළඟට එන්න ඕන නෙව.

"කැලේ මාව බය කරන හැම දේකින් ම ගැලවුණේ නැත්තම් මට කවදාවත් එන්න වෙන්නෙ නෑ.

"ඉතින් මං අන්තිමේ දී වටපිට බැලුවා. මං දැක්කා හොඳ ලොකු දණ්ඩක්. ඒක සීත කාලෙ හිමවල බරට ගහකින් කඩා වැටුණු හොඳ හයිය අත්තක්.

"මං ඒක අතට අරගෙන වලහා දිහාට දිවුවා. ඒ ළඟට පුළුවන් තරම් දහිරිය අලා දණ්ඩ උස්සලා ඩෝං ගාලා ඌගේ ඔළුවට දුන්නා පාරක්.

"ඒත් ඌ එහෙම ම ඉන්නවා. බැලින්නම් ඌ වලහෙක් නෙවෙයි. ලොකු, කළු පාට පිච්චුණු කොටයක්!

"උදේ නගරෙට යද්දි මං ඒක පහු කරලයි ගියේ. ඌ වලහෙක් නෙවෙයි, මං හිතුවෙ ම ඌ වලහෙක් කියලයි. ඇයි මං හිතහිතා ගියේ වලහෙක් කඩා පැන්නොත් මොකද කරන්නෙ කියලනෙ."

"ඇත්තට ම ඒ වලහෙක් නෙවෙයි ද?" මේරි ඇසුවා ය.

"නෑ, මේරි, ඒ වලහෙක් නෙවෙයි. මං මහ කැලෑවෙ ඉඳගෙන කෑගගා, අත වනවනා නටනටා බය කරන්න හදලා තියෙන්නෙ කොටයක්නෙ!"

ලෝරා මෙසේ කීවා ය: "අපි නම් දැක්කෙ ඇත්ත වලහෙක්. ඒත් අපි බය වුණේ නෑ. අපි හිතුවෙ ඌ සූකි කියලයි."

අප්පච්චි කිසිවක් නොකියා ඈ ව තදින් සිපගත්තේ ය.

"ඕ-ඕ! ඒ වලහා තව චුට්ටෙන් අපි දෙන්නව කනවා!" ලෝරා ඔහුට තවත් තුරුලු වෙමින් කීවා ය. "ඒත් අම්මා ඌ ළඟට ගිහින් ඌට පාරක් ගැහුවා. ඒත් ඌ මුකුත් කෙරුවෙ නැනෙ. ඇයි ඌ අපිට මුකුත් කෙරුවෙ නැත්තෙ?"

"මං හිතන්නෙ ලෝරා, ඌට කරන්නෙ මොනව ද කියලා හිතාගන්න බැරි වෙන්න ඇති," අප්පච්චි කීවේ ය. "ලන්තෑරුම් එළිය දැක්කම ඌ බය වෙන්න ඇති මගේ හිතේ. ඒත් අම්මා ඌ

ළඟට ගිහින් ඌට පාරක් ගැහුව නෙව. එතකොට ඌ දැනගන්න ඇති අම්මා බය නෑ කියලා."

"ඉතින් අප්පච්චිත් බය නෑ," ලෝරා කීවා ය. "ඒක කොටයක් වුණත් අප්පච්චි හිතුවෙ වලහෙක් කියලනෙ. ඌ වලහෙක් වුණත් ඔයා ඌට ගහනවා නේ ද, අප්පච්චි?"

"නෑතුව," අප්පච්චි කීවේ ය. "මං ගහනව ම තමයි. ඔයා දන්නව නෙව, මට ගහන්න ම වෙනවා."

දැන් නිදාගන්න වේලාව බව අම්මා කීවා ය. ලෝරාට හා මේරිට ඇඳුම් මාරු කිරීමට උදවු කළ ඇය, ඔවුන් ගේ රතු ෆ්ලැනල් නිදන ඇඳුම්වල බොත්තම් ඇමුවා ය. මිටි ඇඳ අසල දණ ගසාගත් ඔවුහු යාච්ඤා කරන්නට වූ හ.

"දැන් මම නින්දට යන්නෙමි,
මා රැක දෙන ලෙස සමිඳ යදින්නෙමි,
පිබිදෙන්නට පෙර මා මියගියහොත්,
මගේ ආත්මය සමිඳුට පුද දෙමි."

අම්මා ඔවුන් දෙදෙනා සිඹ, රෙදි පෙරවූවා ය. ඔවුහු මඳ වේලාවක් අම්මා ගේ බෙදා පීරන ලද කොණ්ඩය දෙසත්, ලාම්පු එළියෙන් කඩිසර ව ඇඳුම් මසන ඇගේ ඇඟිලි දෙසත් බලා සිටිය හ. ඉඳිකටුව ඇගේ දිදාලයේ වැදී සිහින් 'ටික් ටික්' හඬක් නංවයි. ඒ ළඟට නූල, අප්පච්චි සම් විකුණා ගෙනැවිත් දුන් ශෝභන කපු රෙද්ද විදගෙන මෘදු ලෙස ඇතුළට ඇදී යයි.

ලෝරා, බූට් සපත්තු ඔප දමන අප්පච්චි දෙස බැලුවා ය. ඔහු ගේ උඩු රැවුළ, හිසකේ හා දුඹුරුවන් දිග යටි රැවුළ ලාම්පු එළියෙන් සේද මෙන් දිලිසෙයි. ඔහු ගේ ජැකට්ටුවේ පැහැයන් දීප්තිමත් ය. සපත්තු ඔප දමන අතරේ ප්‍රීතිමත් ලෙස සිවුරුහන් කරන්නට වූ ඔහු මෙසේ ගැයී ය:

"සියොත් කැල උදෑසන ගී ගයයි,
මටල්* හා අයිවි* මල් පිපෙයි,
හිමිදිරියෙ කඳු මතින් හිරු එබෙයි,
ඒ මොහොතෙ මම ඈ ව සොයාගෙන් ගෙයි වැලපෙවෙමි."

* මටල් - සුදු මල් හා දම් පැහැයට හුරු කළ පැහැති ගෙඩි ඇති සදාහරිත ගාකයක්.
* අයිවි - උල් පහක් ඇති කද කොළ පැහැති හෝ කොළ හා සුදු පැහැති දිලිසෙන පත් ඇති වැල් වර්ගයක්.

ඒ රාත්‍රිය ඉතා උණුසුම් විය. උදුනේ අඟුරු ඉතිරි ව ඇති නමුත් අප්පච්චි එය ඇල්වූයේ නැත. මහ වනයේ පිහිටි කුඩා නිවසේ සෑම පැත්තකින් ම හිම වැටෙන සිහින් හඬ ඇසිණි. පියසි මත රැඳුණු හිම කුරු දිය වෙවී බිඳින් බිඳ පොළොවට වැටෙයි.

තව දින කිහිපයකින් ගස්වල ළපටි දළුලනු ඇත. එවිට ඒවා ලා රතු පැහැයෙන්, කහ පැහැයෙන් හා ලා කොළ පැහැයෙන් වර්ණවත් වනු ඇත. කැලෑවේ මල් පිපෙනු ඇත. කුරුල්ලන් ගී ගයනු ඇත.

එවිට රාත්‍රියේ ගිනිමැළය අසල හිඳගෙන කතාන්දර අසන්නට ලෝරාට හා මේරිට ඉඩ ලැබෙන්නේ නැත. එහෙත් මුළු දවස පුරා ම ගස් අතර දුව පනිමින් සෙල්ලම් කරන්නට ඔවුනට හැකි ය. මේ උදාවන්නේ වසන්ත කාලයයි.

7 පරිච්ඡේදය

සීනි හිම

දැන් හිරු දීප්තිමත් ව පායයි. කාලගුණය උණුසුම් ය. උළුසන ජනෙල් වීදුරු මත හිම තැන්පත් ව නැත. පියසි මත රැඳුණු හිම කුරු මෘදු හඬක් නංවා බිඳෙමින් හා පිපිරෙමින්, එකින් එක පහළ හිම ගොඩැලි මතට වැටෙයි. ගස් ඔවුන් ගේ තෙතබරිත, කළුවන් අතු සොලවසොලවා හිම කැටි බිම දමයි.

ලෝරා හා මේරි ඔවුන් ගේ නාස් සීතල ජනෙල් වීදුරුවලට තෙරපාගෙන පිටත බලමින් සිටිය හ. පියසි මතින් ගලා යන දිය පාරවල් හා නග්න අතු සහිත ගස් ඔවුන්ට පෙනේ. හිම දිලිසෙන්නේ නැත. ඒවා මෘදු හා මැලවුණු විලාසයක් පායි. ගස් යට හිම කැටි වැටුණු තැන්වල සිදුරු සෑදිලා ය. අඩි පාර අද්දර හිම ගොඩැලි දිය වී යටට බැස ඇත.

ගෙවත්තේ හිස් බිම තීරුවක් තිබෙනු එක් දිනක් ලෝරා දුටුවා ය. දවස පුරා ම එය විශාල වන්නට වූ අතර රාත්‍රිය උදා වන්නට පෙර මුළු ගෙවත්ත ම තනිකර ගොහොරු බිමක් වී තිබිණි. හිම සහිත අඩි පාර, අඩි පාර හා වැට දෙපස හිම

ගොඩැලි හා දර ගොඩ අසල බිම පමණක් ගොහොරු වී තිබුණේ නැත.

"මං එළියට ගිහින් සෙල්ලම් කරන්න ද, අම්මේ?" යි ලෝරා ඇසුවා ය. එවිට අම්මා මෙසේ කීවා යː

"කරුණාකරලා කියලා කියන්න ලෝරා."

"අනේ අම්මේ කරුණාකරලා මට එළියට ගිහින් සෙල්ලම් කරන්න දෙන්නකෝ," ඇය කීවා ය.

"හෙට බලමුකෝ," අම්මා පොරොන්දු වූවා ය.

ඒ රාත්‍රියේ ලෝරා වෙවුලමින් නින්දෙන් පිබිදුණා ය. ඇඳ ඇතිරිලිවල තුනී බවක් දැනුණු අතර ඇගේ නාසය අයිස් මෙන් සීතල විය. අම්මා තවත් පොරෝනාවකින් ඇ ව වැසුවා ය.

"මේරිට තුරුල් වෙලා නිදාගන්න," අම්මා කීවා ය, "එතකොට සීතල නැති වෙයි."

උදෑසන දී නිවස උදුනේ ගින්නෙන් උණුසුම් විය. එහෙත් ලෝරා ජනේලයෙන් පිටත බලන විට ගෙවත්ත මෘදු හා ගනැ'ති හිම කැටිවලින් වැසී ඇති බව දුටුවා ය. ගස්වල අතු පුරා පිහාටු මෙන් හිම රැඳී තිබිණි. ඉනි වැට දිගේ කුඩා කඳු ගැට මෙන් හිම රොක් වී තිබිණි. ගේට්ටු කණු උඩ රැඳුණු හිම තැටි සුදු පැහැ'ති විශාල බෝල මෙන් පෙනේ.

ගෙතුළට පැමිණි අප්පච්චි උරහිස්වල රැඳුණු මෘදු හිම ගසාදමන්නටත්, බූට් සපත්තුවල ඇලුණු හිම ගැලවෙන සේ අඩි හප්පන්නටත් වූවේ ය.

"මේ සීනි හිම," ඔහු කීවේ ය.

ලෝරා වහා ඔහු ගේ කමිස අතක වාටියේ රැඳී තිබූ සුදු හිම ඇබිත්තක් ලෙව කෑවා ය. ඒවා කිසි ම රසයක් නැත. අනෙත් හිම මෙන් ම ඒවා ද දිව තෙත් කළා පමණි. තමා හිම දිව ගා බලනු කිසිවෙකු නොදැකීම පිළිබඳ ව ලෝරා සතුටු වූවා ය.

"ඇයි අප්පච්චි ඒවට සීනි හිම කියලා කියන්නෙ?" යි ඇය ඇසුවා ය. එහෙත් එයට පිළිතුරු දීමට අප්පච්චිට ඉස්පාසුවක් නො වී ය. ඔහු ලහිලහියේ සීයා ගේ නිවසට යාමට සූදානම් වූවේ ය.

සීයා මහ වනයේ බොහෝ ඈත පිහිටි නිවෙසක ජීවත් වෙයි. එහි ගස් ඉතාමත් ළඟින් එක පෙළට ඉහළ නැගී සිටින අතර ඒවා ප්‍රමාණයෙන් ද විශාල ය.

ජනේලය අසල සිටගත් ලෝරා, ජව සම්පන්න, ශක්තිමත් හා විශාල මිනිසෙකු වන අප්පච්චි හිම තලාව මතින් ඇවිද යනු බලා සිටියා ය. ඔහු ගේ තුවක්කුව උර මත වූ අතර කෙටේරිය හා වෙඩි බෙත් සහිත අඟ පසෙකින් එල්ලුණේ ය. ඔහු ගේ උසැ'ති බූට් සපත්තු මෘදු හිම තලාව මත විශාල සලකුණු ඇන්දේ ය. ඔහු තමා ගේ දෑස මානයෙන් නොපෙනී ගොස් වනය තුළ අතුරුදහන් වන තෙක් ලෝරා ඔහු දෙස බලා සිටියා ය.

ඔහු ආපසු නිවසට එන විට බොහෝ රෑ බෝ වී තිබිණි. ඔහු එන විට අම්මා ලාම්පුව දල්වා තිබුණි. ඔහු ගේ එක් අතක ලොකු පොදියකුත්, අනෙක් අතේ වසන ලද විශාල ලී බාල්දියකුත් විය.

"මෙන්න, කැරොලින්," අම්මා අතට පොදිය හා බාල්දිය දෙමින් කී ඔහු, තුවක්කුව දොරට උඩින් වූ කොකුවල එල්ලුවේ ය.

"මට මඟදී වලහෙක් හම්බ වුණා නම් එහෙම," ඔහු කියන්නට වූවේ ය, "මේ බඩු බිම හොඳා මට ඌට වෙඩි තියන්න බෑ" ඊ ළඟට ඔහු සිනාසුණේ ය. "මං මේ බාල්දියයි, පොදියයි බිම දැම්මනම් එහෙම මට ඌට වෙඩි තියන්න ඕන නෑ. මට තියෙන්නෙ ඌ මේවා හොඳට ගිලදාලා තොල කට ලොවිනකම් ම පැත්තකට වෙලා බලා ඉන්න එක විතරයි."

අම්මා පොදිය ලිහුවා ය. එහි ගනැ'ති දුඹුරුවන් කේක් ගෙඩි දෙකක් විය. ඒවා කිරි උණු කරන සාස්පානක් තරම් විශාල ය. ඇය බාල්දිය වැසූ දවටනය ගලවා බැලුවා ය. එය තද දුඹුරු පැහැ'ති පැණිවලින් පිරී තිබිණි.

"මෙන්න ලෝරටයි, මේරිටයි," කියමින් අප්පච්චි සිය සාක්කුවෙන් ගත් කුඩා රවුම් පොදිය බැගින් ඔවුන් දෙදෙනාට දුන්නේ ය.

ඔවුහු ඒවායේ කරදාසි දවටන ලිහා බැලූ හ. එහි වූයේ කුඩා, ගනැ'ති, දුඹුරුවන් කේක් කැබැල්ලකි. එහි කොන් ලස්සණට රැලි වැටී තිබිණි.

"ඒවා කන්න" නිල් පැහැති දීප්තිමත් දෑසින් සිනාසුණු අප්පච්චි කීවේ ය.

දෙදෙනා ම තමන්ට ලැබුණු කේක් කැබැල්ලේ රැලිනැසුණු කුඩා කොනක් කඩා කෑ හ. එය ඉතා රසවත් ය. එය ඔවුන් ගේ මුව තුළ සිහින් කුඩු බවට පත් විය. ඒ කේක් නත්තල් දෝසිවලටත් වඩා රසවත් ය.

Scanned with CamScanner

"මේපල් සීනි," අප්පච්චි කීවේ ය.

රාත්‍රි ආහාරය සූදානම් ව තිබූ අතර ලෝරා හා මේරි මේපල් පැණි සමඟ පාන් කෑ හ. ඒ අතර ඔවුහු තමන් ගේ කුඩා මේපල් සීනි කේක් කෑබලි පිඟන් අසලින් තැබූ හ.

කෑමෙන් පසු අප්පච්චි ගිනිමැලය ඉදිරියේ වාඩිවී ඔවුන් දණහිස් මත හිඳුවාගෙන සීයා ගේ ගෙදර දවස ගත කළ අයුරු හා සීනි හිම ගැන කියන්නට වූයේ ය.

"මුළු සීත කාලෙ ම," අප්පච්චි කියන්නට වූයේ ය. "සීයා ලී බාල්දියි, පොඩි කෑම ඔරුයි හදනවා. එයා ඒවා හදන්න ගන්නෙ දේවදාර ලීයි, සුදු ඈෂ්* ලීයි. මොකද ඒ ලීවලින් මේපල් පැණිවලට අමුතු රහක් ලැබෙන්නෙ නෑ.

"සීයා කෑම ඔරු හදන්නෙ මෙහෙමයි. ඉස්සෙල්ල ම මගේ අත තරම් දිග, මගේ ඇඟිලි දෙකක් තරම් ලොකු කෝටු කෑලි කපලා වෙන් කරගන්නවා. ඊට පස්සෙ එක පැත්තකින් හරස් අතට පළුවක් කපනවා හරි මැදට වෙන්න. ඊට පස්සෙ ඒක අරන්දානවා. දැන් තියෙන්නෙ එක පැත්තක හතරැස් කොටුවක් තියෙන සමතලා ලී කෑල්ලක්. ඊට පස්සෙ බුරුම කටුවෙන් අර හතරැස් කොටුව ඇතුළින් දිග අතට රවුමක් විදිනවා. ඊ ළඟට පිහියෙන් අර රවුම වටේ තුනී පොත්තක් වගේ වෙනකම් ලීය හොඳට කපනවා. ඊ ළඟට ලීයෙ සමතලා කොටස පුංචි ඔරුවක් වගේ වෙනකම් එයා ගෙ පිහියෙන් ඇතුළට හාරනවා.

"සීයා මේ ඔරු දුසිමක් විතර හදනවා. ඊ ළඟට අලුත් ලී බාල්දිත් දහයක් විතර හදනවා. කාලගුණය උණුසුම් වෙලා ගස්වලින් පැණි එන්න පටන්ගන්නවත් එක්ක ම සීයා ඒවා සේරම හදලා ඉවරයි.

"ඊට පස්සෙ එයා බුරුම කටුවෙන් මේපල් ගස්වල සිදුරු විදිනවා. ඊට පස්සෙ අර හදපු පුංචි ඔරුවෙ රවුම් කොන අර සිදුරට ඇතුළු කරලා ඇණ ගහනවා.

* ඈෂ් - අළු පාට පොත්තක් ඇති ගස් වර්ගයක්



අන්තිමට දේවදාර ලීයෙන් හදපු බාල්දියක් අර ඔරුවට පහළින් බිම තියනවා.

"දන්නවා නේ ද, ගහක සාරය තියන්නෙ හරියට ගහක ලේ වගෙයි. වසන්ත කාලෙ උණුසුම් කාලගුණය පටන්ගන්නවත් එක්ක ම ඒවා මුල් දිගේ ඇවිත්, ගහේ හැම අත්තකට ම, හැම රිකිල්ලකට ම ගලාගෙන යනවා. ඊකෙන් තමයි ගහේ අතුවල කොළ පාට කොළ හැදෙන්නෙ.

"ඉතින් මේපල් පැණි ගහේ විදපු සිදුර ළඟට ආව ම ඒවා සිදුරෙන් එළියට ඇවිත් අර පුංචි ඔරුව දිගේ බාල්දියට වැටෙනවා."

"අනේ එතකොට අහිංසක ගහට රිදෙන්නෙ නැද්ද?" ලෝරා ඇසුවා ය.

"හරියට ඔයා ගෙ ඇඟිල්ලක කටුවක් ඇනිලා ලේ ගලන කොට රිදෙනවා වගේ තමයි," අප්පච්චි කීවේ ය.

"ඉතින් සීයා හැමදා ම එයා ගෙ බූට් සපත්තු දාගෙන, උණුසුම් කබාය ඇඳගෙන, හම් තොප්පිය දාගෙන, හිමෙන් වැහිච්ච කැලෑවට ගිහින් පැණි එකතු කරනවා. හිම යාන පීප්පයක් තියාගෙන, එයා ගහෙන් ගහට ගිහින් බාල්දිවලට එකතු වෙච්ච පැණි පීප්පෙට පුරවනවා. ඊ ළඟට ගස් දෙකක තරු

අතරෙ කොටයක් දාලා, ඒකෙ දම්වැලක් බැඳලා, ලොකු යකඩ හැළියක් ඒකෙ එල්ලනවා. ඊට පස්සෙ අර පීප්පෙ එතෙන්ට අරගෙන යනවා.

"ගිහින් අර පැණි ඔක්කොම යකඩ හැළියට දානවා. හැළිය යට ලොකු ගිනි ගොඩක්. එතකොට පැණි උණු වෙනවා. සීයා එතෙන්ට වෙලා ඒක හොඳට බලාගෙන ඉන්නවා. පැණි උණු වෙන තරමට ගින්දර තියෙන්න ඕන. ඒත් පැණි උතුරලා යන්න දෙන්න හොඳ නෑ.

"හැම මිනිත්තු පහක දී ම පැණිවල පෙණ අරන් දාන්න ඕන. සීයා ලොකු මිටක් තියෙන ලී කෙණෙස්සකින් පෙණ අරන් දානවා. පැණි හොඳට උණු වුණා ම සීයා අර කෙණෙස්ස පිරෙන්න පැණි අරගෙන උඩට උස්සලා ආයෙමත් හෙමිහිට වක්කරනවා. එතකොට පැණි යාන්තමට නිවෙනවා. ඒ වගේ ම ඉක්මනට උතුරලා යන්නෙත් නෑ.

"පැණි ඇති පදමට උණු වුණාට පස්සෙ එයා පැණිවලින් බාල්දි පුරවනවා. ඊට පස්සෙ පීරිසියකට දාලා නිවෙන්න තිව්වා ම ගන වෙන පදම එනකන් ම උණු කරනවා.

"පැණි කැටි ගැහෙන්න පටන්ගත්ත හැටියෙ ම සීයා ඉක්මනට හැළිය යට ඇවිළෙන දර ඔක්කොම පැත්තකට ඇදලා දාලා පුළුවන් තරම් ඉක්මනින් අර ගන වෙච්චි පැණි



කෙණෙස්සෙන් අරන් ලැස්ති කරලා තියෙන කිරි උණු කරන සාස්පාන්වලට දානවා. සාස්පාන්වලට දාපු පැණි දුඹුරු පාට, ගන මේපල් සීනි කුට්ටිවලට හැරෙනවා."

"එහෙනම් ඒකයි ඒවට සීනි හිම කියන්නෙ, සීයා සීනි හදන නිසා?" ලෝරා ඇහුවා ය.

"නෑ," අප්පච්චි කිවේ ය. "ඒවට සීනි හිම කියන්නෙ මෙන්න මේකයි, අවුරුද්දෙ මේ කාලෙට වැටෙන හිමවල තේරුම මිනිස්සුන්ට හුගාක් සීනි හදන්න පුළුවන් කියන එකයි. දන්නව ද, මේ සීත කාලෙ හිම වැටෙන කොට ගස්වල කොළ එන්නෙ නෑ. එතකොට ගස්වල සාරය හුගක් වැඩි වෙනවා.

"හුග කාලයක් තිස්සෙ පැණි උනන කොට සීයට මුළු අවුරුද්දට ම ඇති තරම් මේපල් සීනි හදන්න පුළුවන් වෙනවා. ඒ සීනි එදිනෙදාට පාවිච්චි කරන්න පුළුවන්. නගරෙට ගිහින් සත්තුන් ගෙ හම් විකුණලා, කඩෙන් සීනි ගොඩක් ගේන්න සීයට ඕන නෑ. එයා කඩෙන් ගේන්නෙ සීනි පොඩ්ඩයි. ඒවා පාවිච්චි කරන්නෙ ගෙදරට අමුත්තො ආව ම මේසෙට තියන්න විතරයි."

Scanned with CamScanner

"සීනි හිම තියෙනකොට සීයට ගොඩාරියක් ආස ඇති." ලෝරා කීවා ය.

"නැතුව," අප්පච්චි කීවේ ය. "සීයට හරි සංතෝසයි. ලබන සඳුදා ආමෙයමත් සීයා සීනි හදනවා. එයා කිවුවා අපි හැමෝටම එහෙ එන්න කියලා."

අප්පච්චි ගේ නිල් ඇස් දිලිසෙන්නට විය. කතාවේ හොඳම හරිය අන්තිමට කියන්නට ඉතිරි කොටගත් ඔහු අම්මා දෙස බලා මෙසේ කීවේ ය:

"ආ කැරොලින්! එදාට නැටුමකුත් තියෙයි!"

අම්මා සිනාසුණා ය. ඇගේ මුහුණ ප්‍රීතියෙන් විකසිත වූ අතර ඇය එළලමින් සිටි ඇඳුම මොහොතකට පහත දැමුවා ය. "හානේ, චාල්ස්!" ඇය කීවා ය.

ඊ ළඟට ඇය යළිත් ඇඳුම මසන්නට වී දිගට ම මඳ සිනා පාන්නට වූවා ය. "මං මගේ ඩිලේන්* ගවුම අඳිනවා." ඇය කීවා ය.

අම්මා ගේ ඩිලේන් ගවුම ඉතා අලංකාර ය. එහි කොළ පැහැ පසුබිම වසා පැතිරුණු කුඩා මෝස්තරය ඉදුණු ස්ට්‍රෝබෙරි ගෙඩි මෙනි. අම්මා, අප්පච්චි සමඟ විවාහ වී විස්කොන්සින් මහ වනයේ වාසය සඳහා බටහිරට පැමිණීමට පෙර ඈ වාසය කළ නැගෙනහිර ඇඳුම් මසන්නෙකු විසින් එය මසන ලදි. අප්පච්චි සමඟ විවාහ වන්නට පෙර අම්මා ඉතා හැඩට අඳින පළඳින

* ඩිලේන් - [illegible]

ජේත්තුකාරියක වූ අතර, ඇගේ ඇඳුම් මැසුවේ ඇඳුම් මසන්නෙකි.

ඩිලේන් ගවුම කරදාසියක ඔතා පරිස්සමට තබන ලදි. අම්මා එය ඇඳ සිටිනු ලෝරා හා මේරි කෙදිනකවත් දැක තිබුණේ නැත. එහෙත් ඇය එක් වරක් එය ඔවුන්ට පෙන්වා තිබුණි. ගවුම් හැට්ටයේ අල්ලා ඇති රතු පැහැති ශෝභන බොත්තම් අල්ලා බැලීමට ඇය ඔවුන්ට ඉඩ දුන්නා ය. සිය යොදා ඉතා පිළිවෙළට මසා ඇති අන්දම ඇය ඔවුන්ට පෙන්වූවා ය.

අම්මා ඒ ලස්සණ ඩිලේන් ගවුම අඳින්නේ නම් නැටුම් උත්සවය කොතරම් වැදගත් එකක් ද යන්න සිතාගත හැකි ය. ලෝරා ගේ හා මේරි ගේ සිත් කුතුහලයෙන් පිරී ගොස් තිබිණි. ඔවුහු අප්පච්චි ගේ දණහිස් මත උඩ පනිමින්, නැටුම් උත්සවය ගැන නොයෙකුත් ප්‍රශ්න අසන්නට වූ හ. අන්තිමේ දී ඔහු මෙසේ කීවේ ය:

"දැන් දෙන්න ම ඇඳට දුවන්නකෝ. ඔයගොල්ලො නැටුම් උත්සවය දැක්කම ඒ ගැන ඔක්කෝ ම විස්තර දැනගනීවි. මට මගේ රවුකියේ‍ෂෙදුට අලුත් තතක් දාන්නත් තියෙනවා."

* වෙල්බෝන් - [illegible] ... ලදී.

නින්දට යාමට පෙර ඔවුන් ඇලෙන සුලු දැත් පිරිසිදු කළ යුතු ය. පැණි රස වූ මුව සෝදාගත යුතු ය. ලෝරා හා මේරි ඔවුන් ගේ රෝද සහිත මිටි ඇඳේ ගුළි වන විට, අප්පච්චි රවුකිඤ්ඤය වයමින් ගයන්නට විය. ඔහු සිය පාදය පොළොවට ගසමින් තාල ඇල්ලුවේ ය.

"මම අශ්වාරෝහක සේනාවේ කපිත්තා ජින්ක්ස්,
ඉරිඟු සමඟ කඩල කන්නෙ මගේ අශ්වයින්,
මං අන දිගඇරලා වියදම් කරන්න සූරයා,
මම අශ්වාරෝහක සේනාවේ කපිත්තා ජින්ක්ස්,
මමයි හමුදාවෙ කපිත්තා!"



8 පරිච්ඡේදය

සීයා ගේ නිවසේ නැටුම් උත්සවය

සීදුදා හිමිදිරි පාන්දර පිබිදුණු සියලු දෙනා ම සීයා ගේ නිවසට යාම සඳහා ලහිලහියේ සූදානම් වන්නට වූ හ. එහි ගොසින් පැණි එකතු කිරීමට හා උණු කිරීමට සීයාට සහාය වීමට අප්පච්චිට ඕනෑ වී තිබුණේ ය. නැටුම් උත්සවයට පැමිණෙන අමුත්තන්ට සංග්‍රහ කිරීම සඳහා රසවත් කෑම වර්ග පිළියෙල කිරීමට අම්මා ආච්චිටත්, නැන්දලාටත් උදවු වනු ඇත.

ලාම්පු එළියෙන් උදෑසන ආහාරය ගෙන, ඉඳුල් බඳුන් සෝදා ඇඳන් සකස් කරන ලදි. රවුකිඤ්ඤය එහි පෙට්ටිය තුළ පරිස්සමට තැන්පත් කළ අප්පච්චි, එය දොරකඩ නවතා ඇති විශාල හිම යානය තුළට දැමුවේ ය.

වාතය සීතල වූ අතර පරිසරය හිම සහිත විය. ආලෝකය මලානික ය. ලෝරා, මේරි, අම්මා හා බිලිඳු කේරි හිම යානයේ පතුළට දමා ඇති පිදුරු මත වූ පොරෝනා තුළට වැදී එහි උණුසුමට ගුළි ගැසුණ හ.

අශ්වයෝ උන් ගේ හිස් හා පස්සා ගාත් සොලවසොලවා හිම යානයේ සීනු ප්‍රීතිමත් හඬකින් නාද කරමින් මහ වනය

Scanned with CamScanner

මැදින් වැටුණු මහ ඉස්සේ සීයා ගේ නිවෙස බලා හැල්මේ යන්නට වූ හ.

පාරේ හිම තෙහැ'ති හා මෘදු බවක් සහිත වූයෙන් හිම යානය ඒ මත වේගයෙන් ලිස්සා ගියේ ය. දෙපස තැඹුණු මහා ගස් වේගයෙන් දුවන්නාක් මෙන් පෙනිණි.

මඳ වේලාවකට පසු කැලෑව හිරු එළියෙන් ආලෝකවත් විය. සුළඟ ප්‍රාණවත් වන්නට විය. ගස් කඳන්වල සෙවණැලි මැද කහ පැහැ'ති දිග ආලෝක රේඛාවන් පතිත වූ අතර හිම මත ළා රෝස පැහැයක් රැඳී තිබිණි. සියලු ම ඡායාවන් සිහින් ව, නිල් පැහැයෙන් යුතු වූ අතර හිම ගොඩැලිවල සෑම කුඩා නැමීමකට ම හා හිම මත ඇඳුණු සෑම කුඩා අඩි සලකුණකට ම ඡායාවක් විය.

අප්පච්චි මහ දෙපස හිම තලාව මත ඇඳුණු කැලෑ සතුන් ගේ අඩි සලකුණු ලෝරාට පෙන්වූයේ ය. පුළුන් වලිග ඇති හාවුන් පැනපැන ගිය කුඩා අඩි සලකුණු, වතු මීයන් ගේ ඉතා කුඩා අඩි සලකුණු හා හිම කුරුල්ලන් ගේ පියාපත්වල වෙරට දකුණට හැරී ගිය රේඛා සලකුණු එහි විය. නරින් දුව ගිය තැන්වල බල්ලන් ගේ මෙන් විශාල අඩි සලකුණු තිබූ අතර, කැලෑවට පැන ගිය මුවකු ගේ අඩි සලකුණු ද එහි විය.

වාතයේ උණුසුම දැනටමත් වැඩි වෙමින් තිබූ අතර හිම වැඩි වේලාවක් නොපවතින බව අප්පච්චි කීවේ ය.

වැඩි වේලා ගෙවෙන්නට මත්තෙන් හිම යානය එහි සියලු ම සීනු නාද කරමින් ඔවුන් ව සීයා ගේ නිවසේ දොරකඩට ගෙන ආවේ ය. සිනාසෙමින් දොර වෙත ආ ආච්චි ඔවුන් සියලු දෙනා ව ගෙතුළට කැඳවාගෙන ගියා ය.

සීයා සහ ජෝර්ජ් බාප්පා වැඩකටයුතු සඳහා මේපල් වනයට ගිය බව ඇය කීවා ය. ඉතින් අප්පච්චි ඔවුන්ට උදවු වීමට ගිය අතර ලෝරා හා මේරි, කුඩා කේරි වඩාගත් අම්මා සමඟ ගෙතුළට ගොස් සිය කබා උනාදැමූ හ.

ලෝරා ආච්චි ගේ නිවසට ඉතා කැමැති ය. එය ඔවුන් ගේ නිවසට වඩා තරමක් විශාල ය. එහි විශාල කාමරයක් ද, ජෝර්ජ් බාප්පාට අයිති තවත් කුඩා කාමරයක් ද, ඩොෂියා හා රූබි නැන්දලා සිටින තවත් කාමරයක් ද වෙයි. ඊ ළඟට ඇත්තේ ලොකු උදුනක් සහිත මුළුතැන් ගෙයයි.

විශාල කාමරයේ එක් කොනක වූ ලොකු ගිනි උදුන අසල සිට අනෙක් කෙළවරේ ජනේලය අසල ඇති ආච්චි ගේ ඇඳ දක්වා කාමරය දිගේ දුව යාම විනෝදජනක ය. එහි බිම පළල්, ඝන පැහැ'ති ලැලිවලින් සාදා ඇත. ඒවා සීයා හිනු ගේ පොරොවෙන් කැපූ ලී කොටවලින් තැනූ ඒවා ය. ඒ පොළොව සම්පූර්ණයෙන් ම වටපිළුම් වූ අතර ඉතා පිරිසිදු සුදු පැහැයක් ගත්තේ ය. ජනේලය අසල ඇති විශාල ඇඳ මෘදු පිහාටු පුරවා සකස් කොට ඇත.

ලෝරා හා මේරි විශාල කාමරයේ සෙල්ලම් කරමින් ද, අම්මා මුළුතැන්ගෙයි කටයුතු සඳහා ආච්චිට හා නැන්දලාට සහාය වෙමින් ද සිටිද්දී දවස වේගයෙන් ගෙවී යන්නට විය. නිවසේ පිරිමි ඔවුන් ගේ දින ආහාර මේපල් වනයට ගෙන ගියෙන්, කාන්තාවෝ මේසය සූදානම් නොකර සීතල වූ මුව මස් සැන්ඩ්විච් හා කිරි පානය කළ හ. එසේත් සන්ධ්‍යා භෝජනය සඳහා ආච්චි හැස්ටි පුඩිමක් සෑදුවා ය.

ඇය ගිනි උදුන අසල සිටගෙන, කහ පැහැ'ති සිරිගු පිටි අතට ගෙන උදුන මත කැබී දුමු ඇදී උතුරන වතුර බඳුනට දැමුවා ය. ඉන් පසු ලොකු ලී හැන්දකින් වතුර බඳුන නොනවත්වා ම කැඳ ගාන්නට වූ ඇය බඳුනේ වතුර ඝන'වී, කහ පැහැ'ති බුබුලු දමන උකු දියරයක් බවට පත් වන තුරු බඳුනට සිරිගු පිටි දැමුවා ය. ඊ ළඟට ඇය එය සෙමෙන් පිසෙන පරිදි උදුනේ පිටුපස කොටස මත තැබුවා ය.

එයින් ඉතා ප්‍රණීත සුවඳක් නිස්විණි. මුළු නිවස ම ඒ සුවඳින් පිරිගියේ ය. මුළුතැන්ගෙයින් නැගෙන පැණි රස කෑම හා කුළුබඩුවල සුවඳත්, ගිනි උදුනේ දිප්තිමත්, ප්‍රසන්න දර නංවමින් ඇවිලෙන හිකරි දර කොටවල සුවඳත්, මේසය මත ආච්චි ගේ මැහුම් කූඩය පසෙකින් ඇති කරාබු නැටි ගසන ලද ඇපල් ගෙඩිවල සුවඳත් නිවෙස පුරා පැතිරී යයි. හිරු එළිය දිප්තිමත් ජනෙල් විදුරු අතරින් ගෙතුළට පෙරී එන්නට වූ අතර, සෑම දෙයක් ම විශාල වූත්, ඉඩකඩ සහිත වූත්, පිරිසිදු වූත් ඒවා මෙන් පෙනෙන්නට විය.

සන්ධ්‍යා භෝජනය ළං වන විට අප්පච්චි හා සීයා වනයේ සිට පැමිණිය හ. දෙදෙනා ගේ ම උරහිස් මත සීයා විසින් සාදන ලද ලී කඳක් විය. එය පිටුපසින් ඔවුන් ගේ ගෙලට හා උරහිස්වලට සිරවන පරිදි කපා තිබිණි. කඳ දෙකෙළවරින්

කොක්කක් සහිත දම්වැලක් එල්ලුණු අතර ඒ කොකුවල උණු මේපල් පැණි පිරුණු විශාල ලී බාල්දි රඳවා තිබිණි.

අප්පච්චි හා සීයා මේ ගෙන ආවේ කැලෑවේ දී විශාල හැළියේ දමා උණු කරන ලද පැණි ය. ඔවුන් සිය දෑත්වලින් බාල්දි කොකු තදින් අල්ලාගෙන සිටි නමුත්, ඒවායේ මුළු බර ඔවුන් ගේ උරහිස් මත පැටවී තිබිණි.

ආච්චි විශාල පිත්තල හැළිය ළිප තැබීම සඳහා උදුන සූදානම් කළා ය. අප්පච්චි හා සීයා තමන් ගෙනා පැණි පිත්තල හැළියට වත්කළ හ. හැළිය කොතරම් විශාල ද යත්, විශාල බාල්දි හතරක වූ සියලු පැණි එයට ඇතිමට හැකි විය.

අනතුරුව කුඩා පැණි බාල්දියක් රැගෙන ජෝර්ජ් බාප්පා පැමිණියේ ය. සියලු දෙනා ම සන්ධ්‍යා භෝජනය සඳහා උණු හැස්ටි පුඩිං සමඟ මේපල් පැණි අනුභව කළ හ.

ජෝර්ජ් බාප්පා යුද පෙරමුණේ සිටි අයෙකි. පිත්තල බොත්තම් සහිත නිල් පැහැ'ති යුද කබාය ඇඳ සිටින ඔහුට නිර්භීත වූත්, සිනාසෙන්නාක් වැනි වූත් නිල් පැහැ'ති දෑසක් තිබී ය. ඔහු ඉතා විශාල හා පළල් මිනිසෙකු වූ අතර ආඩම්බර ලෙස පැද්දිපැද්දී ඇවිද්දේ ය.

ලෝරා ඇගේ හැස්ටි පුඩිම කෑ මුළු වේලාවේ ම ඔහු දෙස බලාගත්වන ම සිටියා ය. ඔහු වියරු වැටුණු මිනිසෙකු බව අප්පච්චි අම්මා සමඟ කියනු ඈ අසා තිබේ.

"පෙරමුණෙන් ආවට පස්සෙ ජෝර්ජ් හරියට වියරු වැටිච්ච මිනිහෙක් ගාණයි," අප්පච්චි කීවේ කනගාටු වන්නාක් මෙන් සොලවමිනි. එහෙත් ඒ වෙනුවෙන් කළ හැකි කිසිවක් නො වී ය. යුද හමුදාවේ බෙර වයන්නෙකු වීම සඳහා ජෝර්ජ් බාප්පා නිවසින් පැන ගියේ දහ හතර හැවිරිදි වියේ දී ය.

ලෝරා මින් පෙර කිසිදාක වියරු මිනිසෙකු දැක තිබුණේ නැත. තමා ජෝර්ජ් බාප්පාට බිය ද, නැති නම් බිය නැති දැයි ලෝරාට සිතාගත නො හැකි විය.

සන්ධ්‍යා ආහාරයෙන් පසු පිටතට ගිය ජෝර්ජ් බාප්පා හමුදා නළාව දීර්ඝ ලෙස මහ හඬින් පිඹින්නට වූවේ ය. ඒ හඬ මහ වනයේ ඈතින් ඈතට මිහිරි සිනු නාදයක් පතුරුවාලී ය. වනය පුරා අන්ධකාරය හා නිහඬතාව ගුළි ගැසී සිටි අතර, ඒ හඬට සවන් දෙන්නාක් මෙන් ගස් ද නිශ්චල ව සිටියේ ය. මොහොතකට පසු දීර්ඝ නළා හඬට පිළිතුරු දෙන්නට මෙන් වනයේ ඈත කෙළවරකින් සිහින් හා පැහැදිලි කුඩා නළා හඬක් ඇසිණි.

"අහන්න," ජෝර්ජ් බාප්පා කීවේ ය. "ලස්සණයි නේ ද, ඒ සද්දෙ?" ලෝරා ඔහු දෙස බලා සිටියා විනා කිසිවක් නො කීවා ය. ජෝර්ජ් බාප්පා නළාව පිඹීම නතර කළ විගස ඈ ගෙතුළට දුව ගියා ය.

අම්මා හා ආච්චි පිගන් කෝප්ප සෝදා ගිනි උදුන පිසදමන අතරේ ඩොෂියා නැන්දා හා රූබි නැන්දා ඔවුන් ගේ කාමරයට වී ශෝභන ලෙස සැරසෙන්නට වූ හ.

ලෝරා ඔවුන් ගේ ඇඳේ වාඩිවී ඔවුන් සිය දිගු කෙස් වැටි පීරා සීරුවෙන් බෙදන අයුරු බලා සිටියා ය. ඔවුහු එය නළලේ සිට හිසේ පහළ දක්වා බෙදා යළිත් එක් කනක සිට අනෙක් කන දක්වා හරහට සිටින සේ බෙදූ හ. ඉන් පසු පිටුපස කොණ්ඩය දිගට ගොතා, ඒ කොණ්ඩා කරල් ලොකු ගුළියක් වන සේ පරිස්සමට ගැට ගැසූ හ.

ඔවුහු මුළුතැන්ගෙයි බංකුව මත ඇති මුහුණ සෝදන බේසමේ ඇති ජලයෙන් සිය මුහුණු හා දෑත් සබන් ගා හොඳින් සෝදා සිටිය හ.

ඔවුන් මුහුණේ ගාන්නේ වෙළෙඳ සලෙන් ගෙනෙන සබන් මිස ආච්චි විශාල බුජමක දමා එදිනෙදා ගෙදර දොර පාවිච්චිය සඳහා ගන්නා තුනී, මෘදු, තද දුඹුරු පැහැ'ති සබන් නො වේ.

ඔවුහු බොහෝ වේලාවක් තිස්සේ ඉතා වෙහෙස වෙමින් ඉදිරිපස කොණ්ඩය සකසන්නට වූ හ. ලාම්පුව ඉදිරියට එබී අල්ලාගෙන, ලී බිත්තිය මත එල්ලා ඇති කුඩා කැඩපතට එබී ඔවුහු කොණ්ඩය පීරූ හ. ඔවුන් සෑප්පු සිදු බෙදුම දෙපසින් වූ

කොණ්ඩය කොතරම් සෞම්‍ය ලෙස පීරුවා ද යත්, එය ලාම්පු එළියෙන් සේද මෙන් දිලිසෙන්නට විය. හිස දෙපසින් පුම්බා සකසන ලද කොණ්ඩය ද දිලිසෙන්නට වූ අතර ඒවායේ අග පිටුපසින් බඳින ලද ලොකු කොණ්ඩා කරල්වලට යටින් මනාව කරකවා එකට අල්ලා බැඳ තිබිණි.

අනතුරුව ඔවුහු දෙපාවල ලස්සණ, සුදු දිග මේස් පැළඳ ගත් හ. ඒවා හොඳ කපු නූලෙන් සියුම් රේන්ද පටි වැනි හිඩැසි සහිත විසිතුරු මෝස්තරයකට අනුව ඔවුන් විසින් ම මසන ලදී. ඊ ළඟට ඔවුහු ඔවුන් ගේ හොඳ ම පාවහන් පැළඳ ගත් හ. බොස්තරොක්ක අඳින විට ඔවුහු එකිනෙකාට සහාය වූ හ. ඩොෂියා නැන්දා ඇට හැකි තරම් වෙර යොදා රූබි නැන්දා ගේ බොස්තරොක්කයේ පටිය අදින්නට වූ අතර, රූබි නැන්දා සිය පටිය අදින විට ඩොෂියා නැන්දා ඇඳ කකුලේ එල්ලී සිටියා ය.

"අදින්න, රූබි අදින්න!" ඩොෂියා නැන්දා හුස්ම නොහෙළා කීවා ය. "තව හයියෙන් අදින්න" ඉතින් රූබි නැන්දා ඇගේ දෙපයට හැකි තරම් ශක්තිය යොදා තවත් තදින් ඇද්දා ය. ඩොෂියා නැන්දා සිය අත්වලින් ඇගේ ඉණ මනින්නට වූ අතර අන්තිමේ දී වෙහෙසින් මුව අයා හුස්ම ගෙන, "මං හිතන්නෙ මච්චර තමයි අදින්න පුළුවන්," යි කීවා ය.

"කැරොලින් කියනවා ඒගොල්ලො බඳිනකොට වැල්සට කැරොලින් ගෙ ඉණ එයා ගෙ අත්වලින් වියත් ගාණට මනින්න පුළුවන් කියලා," යි ඇය ඊ ළඟට කීවා ය.

කැරොලින් යනු ලෝරා ගේ අම්මායි. ඉතින් මේ කතාව ඇසුණු විට ලෝරා තුළ ලොකු ආඩම්බරයක් ඇති විය.

අනතුරුව රූබි නැන්දා හා ඩොෂියා නැන්දා ඔවුන් ගේ ෆ්ලැනල් යට සායවල්, තනි පැහැ'ති යට සායවල් හා රැලි කළ වාටිය දිගේ ලේස් පටි ඇල්ලූ කැඳ දමන ලද ගොරෝසු යට සායවල් ඇඳගත් හ. ඊ ළඟට ඔවුන් ගේ ලස්සණ ඇඳුම්වලින් සැරසුණ හ.

ඩොෂියා නැන්දා ගේ ගවුම මල් කිනිති මෝස්තරයකින් හැඩ විය. එහි තද නිල් පැහැති පසුබිම වසාගෙන රතු මල් කිනිති හා තොළ පැහැති කොළ පිරී තිබිණි. ගවුම් හැට්ටයේ ඉදිරිපසින් උඩ සිට පහළට කළු බොත්තම් අල්ලා තිබුණේ ය. ඒවා හරියට ම යුෂ පිරී ලොකු බ්ලැක්බෙරි* ගෙඩි මෙන් වූ අතර ඒවායේ රස බැලීමට ලෝරාට ඕනෑ විය.

රූබි නැන්දා ගේ ගවුම වයින් පැහැ'ති පිහාටු මෝස්තරයක් සහිත වඩාත් ළා පැහැ'ති වයින්වල පැහැය ගත් කපු රෙද්දෙන් මැසූවකි. එයට රන්වන් පැහැ බොත්තම් අල්ලා තිබූ අතර ඒ සෑම බොත්තමක ම කුඩා මාලිගාවක් හා ගසක් කැටයම් කර තිබිණි.

ඩොෂියා නැන්දා ගේ ගවුමේ ශෝභන සුදු කොලරයේ ලොකු රවුම් කැමියෝ කටුවක් ගසා තිබිණි. ඒ කටුවේ කාන්තා හිසක් සිත්තම් ව තිබේ. රූබි නැන්දා ගේ කොලරයේ ගසා තිබුණේ ලාකඩවලින් සාදන ලද රතු රෝස මලක් සහිත කටුවකි. ඈ එය සාදා තිබුණේ ඉඳිකටුමල කැඩිගිය නිසා තවදුරටත් මැසිය නො හැකි ඉඳිකටුවකට රෝස මල සවි කිරීමෙනි.

විශාල රවුම් සායවල් සමඟ පොළොව මත සන්සුන් එහෙත් උදාරම් ගමනින් ඇවිදින ඔවුන් ඉතා ලස්සණ ය. ඔවුන් ගේ කුඩා ඉඟ ඇඳුම නිසා තද වී මැදින් සිහින් වී තිබිණි. ඔවුන් ගේ කම්මුල් රතු පැහැ ගැන්වී, දිලිසෙන සිනිඳු හිසකේ යටින් වූ ඇස් කාන්තිමත් වී තිබිණි.

අම්මා ද ස්ට්‍රෝබෙරි ගෙඩි විසිරී ඇතුවාක් මෙන් පෙනෙන කුඩා කොළ සහිත තද කොළ ඩිලේන් ගවුම හැඳ ශෝභන

* බ්ලැක්බෙරි - දම් පැහැයට හුරු කළු පැහැ'ති කෑමට ගන්නා පලතුරු වර්ගයක්.

පෙනුමකින් යුතු ව සිටියා ය. ගවුම් සාය රැලි කොට, තද කොළ පැහැ පිත්ත පටිවලින් හැඩ දමා තිබිණි. ඇගේ ගෙල අසල රත් පැහැති කටුවක් ගසා ඇත. පැතලි වූ ඒ කටුව පළලින් හා දිගින් ලෝරා ගේ ලොකු ඇඟිලි දෙක තරම් වූ අතර වටේට බික්කු කපා හැටයම් කර තිබිණි. අම්මා වෙතින් කොතරම් අලංකාර හා ශෝභන පෙනුමක් දිස්වූයේ ද යත්, ඈ ව ඇල්ලීමට ලෝරා බිය වූවා ය.

අමුත්තෝ නිවසට පැමිණ සිටිය හ. සමහරු ලන්තෑරුම් ගෙන හිමෙන් වැසුණු වනය මැදින් ඇවිද ආ හ. තවත් අය හිම යානාවලින් හා ගැල්වලින් පැමිණිය හ. නිරන්තරයෙන් ම හිම යානාවල සීනු කිංකිණි රාවයෙන් පරිසරය පුරවාලූවේ ය.

විශාල කාමරය උසැ'ති බූට් සපත්තුවලින් හා එකිනෙක ගැටී හඬ නංවන ගවුම් සායවලින් පිරිණි. ආච්චි ගේ ඇඳ මත කුඩා බිලිඳෝ බොහෝ දෙනෙක් පෙළට නිදා සිටිති.

ජේම්ස් බාප්පා හා ලිබී පුංචි අම්මා ඔවුන් ගේ දියණියත් සමග පැමිණිය හ. ඇගේ නමත් ලෝරා ඉන්ගල්ස් ය. ලෝරලා දෙදෙනා ඇඳට බරවීගෙන කුඩා බිලිඳුන් දෙස බලා සිටිය හ. කුඩා කේරිට වඩා තමන් ගේ බිලිඳු නැඟණිය ලස්සණ බව අනෙක් ලෝරා කීවා ය.

"නෑ, එයා ලස්සණ නෑ!" ලෝරා කීවා ය. "කේරි තමයි මේ මුළු ලෝකෙන් ම ඉන්න ලස්සණ ම බබා."

"නෑ, එයා නෙවෙයි," අනෙක් ලෝරා කීවා ය.

"ඔව්, එයා තමයි!"

"නෑ, එයා නෙවෙයි!"

ශෝභන ඩිලේන් ගවුම ඇඳගත් අම්මා උදාරම් ගමනින් පැමිණ තරවටුවක හඬින් කතා කළා ය.

"ලෝරා!"

ඉන් පසු ලෝරා තවත් වදනකුදු කතා කළේ නැත.

ජෝර්ජ් බාප්පා ඔහු ගේ නළාව පිඹින්නට වූවේ ය. එය විශාල කාමරය පුරා මහා සංගීත නාදයක් නැංවූවේ ය. ජෝර්ජ් බාප්පා නළාව පිඹිමින් විහිළු කරන්නටත්, සිනාසෙන්නටත්, නටන්නටත් වූවේ ය. ඊ ළඟට අප්පච්චි සිය රවුකිඤ්ඤය පිටතට ගෙන වයන්නට පටන්ගත්තේ ය. සියලු ම ජෝඩු හතරැස් හැඩයට සිටගෙන අප්පච්චි ගේ උපදෙස් අනුව නැටුම ආරම්භ කළ හ.

"දැන් වමට - දකුණට!" අප්පච්චි හඬ නගා කීවේ ය. සියලු ම ගවුම් සායවල් සුළඟේ සැලෙන්නටත්, බූට් පාවහන් පොළොවේ වැදෙන්නටත් විය. පිරිස රවුමට රවුමට යමින් නටන්නට වූ අතර සියලු ම ගවුම් සායවල් එක දිසාවකටත්, සියලු ම බූට් පාවහන් තවත් දිසාවකටත් කැරකෙමින් රඟන්නට විය. තරයේ බැඳුණු ඔවුන් ගේ අත් ඉහළට එසවී, දෙපසට විහිදී ගියේ ය.

Scanned with CamScanner

"දැන් හවුල්කාරයන් ව කරකවන්න!" අප්පච්චි කෑගා කිවේ ය. "හැම මහත්මයා ම වමේ ඉන්න නෝනට හිස නවා ආචාර කරන්න!"

සියලු දෙනා ම අප්පච්චි කී ලෙස කළ හ. අම්මා ගේ ගවුම් සාය පැද්දෙන අයුරුත්, ඇගේ සිහින් ඉඟටිය කැරකෙන අයුරුත්, කළුවන් හිස පහළට නැවෙන අයුරුත් ලෝරා බලා සිටියා ය. මේ ලෝකයේ ලස්සණ ම නැට්වුක්කාරිය අම්මා යැයි ඇට සිතිණි. රවුකිඤ්ඤය ඉම්හිරි සංගීත රාවයක් වයයි:

"අනේ, මගෙ මෝඩ කෙල්ලනේ,
ඔබ අද රෑට එන්නෙ නැද්ද,
ඔබ අද රෑට එන්නෙ නැද්ද,
ඔබ අද රෑට එන්නෙ නැද්ද,
අනේ, මගෙ මෝඩ කෙල්ලනේ,
ඔබ අද රෑට එන්නෙ නැද්ද,
සඳ එළිය මැද නටන්නට!"

කුඩා රවුම් හා විශාල රවුම් වශයෙන් සැදුණු නැට්ටුක්කරුවෝ වටේට කරකැවෙමින් නටන්නට වූ හ. ගවුම් සායවල් සැලෙයි. බූට් පාවහන් පොළොවේ වැදෙයි. සහකරුවෝ හිස නමා ආචාර කොට මදක් ඈත් වී, යළිත් ළං වී යළිත් හිස නමා ආචාර කළ හ.

ආච්චි තනි ව ම මුළුතැන්ගෙයට වී විශාල පිත්තල භාජනයේ උණු වන පැණි හැඳිගාමින් සිටියා ය. ඈ එය හැඳිගෑවේ සංගීතයේ තාලයට අනුව ය. පිටුපස දොර අසල පිරිසිදු හිම පිරි කුඩා බාල්දියක් විය. ඉඳහිටෙක ආච්චි බඳුනෙන් පැණි හැන්දක් ගෙන පිරිසියක දැමී හිම ස්වල්පයක් මතට වත් කළා ය.

ලෝරා යළිත් නැට්ටුක්කරුවන් දෙසට නෙත් යොමාගත්තා ය. අප්පච්චි දැන්, 'අයර්ලන්ත රෙදි අපුල්ලන්නී,' නම් ගීතය වයයි. ඔහු මෙසේ ගයන්නට විය:

"ඩෝ සී, නෝනා, ඩෝ සී ඩෝ,
ඔබේ දෙපා නගා, බයිනි අඩි සබා ඇවිද එනු මැනේ!"

ලෝරාට ඇගේ දෙපා සන්සුන් කරගැනීමට නො හැකි විය. ජෝර්ජ් බාප්පා ඇ දෙස බලා සිනාසුණේ ය. ඊ ළගට ඇගේ අතකින් අල්ලාගත් ඔහු කාමරයේ කෙළවරට වී ඈ සමඟ මද වේලාවක් නැටුවේ ය. ඇ ජෝර්ජ් බාප්පාට කැමැති ය.

හැම දෙනා ම මුළුතැන්ගෙයි දොර අසලට වී සිනාසෙමින් සිටිය හ. ඔවුහු ආච්චි ව මුළුතැන්ගෙයින් පිටතට අදින්නට වූ හ. ආච්චි ගේ ඇඳුම ද ලස්සණ ය. එය තද නිල් පැහැති කැලිකෝ රෙද්දේ සරත් සෘතුවේ වර්ණවත් කොළ විසිරුණු මෝස්තරයකින් යුතු එකකි. සිනාසීම නිසා ඇගේ කම්මුල් රෝස පැහැ ගැන්වී තිබූ අතර ඇය හිස සලමින් සිටියා ය. ලී හැන්ද ඇගේ අතේ විය.

"මේ පැණි ටික දාලා එන්න බැ," යි ඇය කීවා ය.

එහෙත් අප්පච්චි, 'ආකැන්සස් සංචාරකයා,' යන ගීය ගයන්නට වෙත් ම සියලු දෙනා ම ගීතයේ තාලය අනුව

අත්පොළසන් දෙන්නට වූ හ. ඉතින් ආච්චි ඔවුන් සැමට ආචාර කොට තාලයට පියවර කිහිපයක් තැබුවා ය. ඇයටත් අන් අය තරම් ම ලස්සණට නැටිය හැකි ය. අත්පොළසන් හඬ අප්පච්චි ගේ රවුකිඤ්ඤයේ හඬ යටපත් කළ තරම.

එක්වර ම ජෝර්ජ් බාප්පා පිජන් විංග් නම් නැටුම නටා ආච්චි ඉදිරියේ හිස නමා ආචාර කොට ජිග්* නැටුම නටන්නට වූයේ ය. ආච්චි ඇගේ අතේ වූ හැන්ද කිසිවෙකු වෙත දීම කළා ය. උකුළට දෑත් ගසාගත් ඇය ජෝර්ජ් බාප්පා සමග කරට කර නටන්නට වූවා ය. සියලු දෙනා ම කෑගාන්නට වූ හ. ආච්චි ඉක්මන් නැටුමක් නටයි.

අත්පොළසන් දෙන සියල්ලන් සමග ලෝරා ද සංගීතයේ තාලය අනුව අත්පුඩි ගසන්නට වූවා ය. අන් කවරදාවත් නොවූ හඬකින් රවුකිඤ්ඤය සංගීතය පතුරුවාලයි. ආච්චි වේගයෙන් ඇසි පිය සලන්නට වූ අතර ඇගේ කම්මුල් රත් පැහැ ගැන්වී තිබිණි. ඇගේ සාය යටින් පෙනෙන පාවහන්, ජෝර්ජ් බාප්පා ගේ බූට් සපත්තුවලින් නැඟෙන බර'ති ශබ්දය මෙන් ම වේගවත් සිහින් හඬක් නැගුවේ ය.

හැම දෙනා ම උද්‍යෝගිමත් ව සිටිය හ. ජෝර්ජ් බාප්පා නොනවත්වා ම වේගයෙන් නටන්නට වූ අතර ආච්චි ද වේගයෙන් නටමින් ඔහු හා කරට කර සිටියා ය. රවුකිඤ්ඤයේ සංගීතය නතර නො වී ය. ජෝර්ජ් බාප්පා මහ හඬින් හුස්ම ගන්නට වී සිය නළලත රැඳුණු දහදිය පිසදැමුවේ ය. ආච්චි ගේ ඇස් දිලිසෙන්නට විය.

"එයා ව පරද්දන්න බෑ, ජෝර්ජ්!" කිසිවෙක් කෑගැවේ ය.

ජෝර්ජ් බාප්පා තවත් වේගයෙන් නටන්නට වූයේ ය. ඔහු නටමින් සිටි වේගයට වඩා දෙගුණයක් වේගයෙන් නැටුවේ ය. ආච්චි ද එසේ කළා ය. හැම දෙනා ම නැවත ප්‍රීති ඝෝෂා කරන්නට වූ හ. කාන්තාවන් සැමවාම සිනාසෙමින් අත්පොළසන් දෙන්නට වූ අතර පිරිමි ජෝර්ජ් බාප්පාට කවටකම් කරන්නට වූ හ. ජෝර්ජ් ඒ පිළිබඳ ව තැකීමක් නොකළ නමුත් සිනාසෙන්නට ඔහුට විවේකයක් නො වී ය. ඔහු ජිග් නැටුමේ නටමින් සිටියේ ය.

* ජිග් - වේගවත් නැටුමක්.

අප්පච්චි ගේ නිල් පැහැති ඇස් වේගයෙන් සැලෙමින් දිලිසෙන්නට විය. සිටගෙන ජෝර්ජ් බාප්පා හා ආච්චි දෙස බලා සිටි ඔහු, රවුකිඤ්ඤයේ තත් මතින් වීණා පත තාලයට ගෙන ගියේ ය. ලෝරා උඩ පනිමින් මහ හඬින් කෑගාන්නටත්, අත්පොළසන් දෙන්නටත් වූවා ය.

ආච්චි නොනවත්වා ම නටමින් සිටියා ය. ඇගේ අත් උකුළ දෙපස වූ අතර ඇය නිකට ඔසවාගෙන සිනාසෙන්නට වූවා ය. ජෝර්ජ් ද දිගට ම නැටුවේ ය. එහෙත් ඔහු ගේ බූට් සපත්තු මුල දී තරම් මහ හඬක් නැගුවේ නැත. ආච්චි ගේ පාවහන්වලින් කෙළිලොල් හඬක් නැඟෙයි. ජෝර්ජ් ගේ නළලෙන් ගිලිහුණු දහදිය බිඳුවක් කම්මුල මත වැටී දිලිසෙන්නට විය.

එක්වර ම සිය දෑත් ඉහළට එසවූ ඔහු වෙහෙස නිසා අසීරුවෙන් හුස්ම ගනිමින්, 'මං පැරදුණා!' යි කියා සිය නැටුම නතර කළේ ය.

සියලු දෙනා ම කෑගාමින්, මොරදෙමින්, අඩි පොළොවේ හප්පමින් මහ හඬින් ආච්චිට ජය ඝෝෂා කරන්නට වූ හ. තවත් මොහොතක් නැටූ ආච්චි අනතුරුව නැටුම නැවැත්වූවා ය. ඇය වෙහෙස නිසා අසීරුවෙන් හුස්ම ගනිමින් සිනාසෙන්නට වූවා ය. ඇගේ ඇස්, අප්පච්චි සිනාසෙන විට මෙන් ම දිලිසෙන්නට වෙයි. සිනාසෙන්නට වූ ජෝර්ජ් කමිස අතින් නළලේ දහදිය පිසදැමුවේ ය.

එක්වර ම ආච්චි ගේ සිනාව නැවතිණි. ඈ හැරී හැකි තරම් වේගයෙන් මුළුතැන්ගෙට දිවූවා ය. රවුකිඤ්ඤයේ නාදය නැවතිණි. කතා කරමින් සිටි කාන්තාවෝ හා, ජෝර්ජ්ට සරදම් කරමින් සිටි පිරිමි සියලු දෙනා ම එක්වර ම කතාබහ නතර කොට ආච්චිට කුමක් සිදු වී ඇත්දැයි බලමින් මොහොතක් නිහඬ ව බලා සිටිය හ.

අනතුරුව මුළුතැන්ගෙය හා විශාල කාමරය මැද වූ දොර වෙත ආ ඇය මෙසේ කීවා ය:

"පැණි පදමට ඇවිල්ලා. කවුරුත් එන්න. ඇවිත් කෑම කන්න."

නැවතී තිබූ කතාබහ හා සිනා හඬ යළිත් ඇසෙන්නට විය. සියලු දෙනා ම ලහිලහියේ මුළුතැන්ගෙයින් පිගන් රැගෙන

පිටතට ගොස් හිමවලින් පිඟන් පුරවාගන්නට වූ හ. විවර වූ මුළුතැන්ගෙයි දොරෙන් සීත සුළං රැලි ගලා එයි.

අහස් තලය පුරා පායා ඇති තාරුකා සීතලෙන් මිදුණාක් මෙනි. පිටත හමන සුළඟ ලෝරා ගේ කම්මුල් හා නාසය සීතලෙන් මිරිකුවේ ය. ඇගේ හුස්ම දුමක් මෙන් පිටවෙයි.

ඈය හා අනෙක් ලෝරාත්, අනෙක් ළමයි හැම දෙනාමත් තම තමන් ගේ පිඟන් පිරිසිදු හිමවලින් පුරවාගත් හ. අනතුරුව ඔවුහු යළිත් සෙනඟ පිරුණු මුළුතැන්ගෙට ගිය හ.

ආච්චි පිත්තල බඳුන අසල .සිටගෙන ලොකු ලී හැන්දෙන් උණු පැණි ගෙන හිම පිරවූ පිඟන්වලට වත්කරයි. එය නිවුණු පසු මෘදු දෝසි බවට පත් වූ අතර නිවුණු හැටියේ ම ඔවුහු එය කන්නට වූ හ.

මේපල් සීනි කෑමෙන් කිසිවෙකුටත් හානියක් සිදු නොවන බැවින් තමන්ට අවශ්‍ය තරම් දෝසි කන්නට ඔවුන්ට හැකි ය. භාජනයේ ඇති තරම් පැණිත්, පිටත ඇති තරම් හිමත් තිබේ. එක් පිඟානක් හමාර කළ හැටියේ ඔවුන් යළිත් පිඟන්වලට හිම පුරවාගත් අතර ආච්චි ඒවා මතට යළිත් පැණි වත්කළා ය.

තවත් කෑ නො හැකි තරමට මෘදු මේපල් දෝසි කෑ ඔවුහු ඊ ළඟට කෑම පිරුණු දිග මේසය වෙත ගොස් එහි වූ කෑම වර්ග බෙදාගන්නට වූ හ. වට්ටක්කා පස්තෑල, වියළි බෙරි පස්තෑල, කුකීස් හා කේක් එහි විය. ලුණු ඉසින ලද පාන් ද, පිසින ලද ඌරු මස් ද, අච්චාරු ද එහි විය. අපෝ, අච්චාරුවල ඇඹුල්!

ඇති පදමට සප්පායම් වූ සියලු දෙනා යළිත් නැටුම් පටන්ගත් හ. එහෙත් ආච්චි භාජනයේ පැණි හැඳිගාමින් මුළුතැන්ගෙයි සිටියා ය. වරින් වර පැණි ස්වල්පයක් හැන්දට ගත් ඇය, එය පීරිසියකට වත්කර රවුමට රවුමට හැඳි ගෑවා ය. ඊ ළඟට හිස සලා යළිත් පැණි ස්වල්පය බඳුනට දැමුවා ය.

අනෙක් කාමරය රවුකිසද්සැගේ සංගීත රාවයෙන් හා නැටුමේ උද්‍යෝගයෙන් කෙළිලොල් හා ප්‍රීතිමත් විලාසයක් පායි.

ආච්චි පීරිසියට දමා හැඳි ගාන පැණි අන්තිමේ දී වැලි කැට මෙන් කුඩා කැටිති බවට පත්වන්නට විය. එවිට ඇය මෙසේ කෑගැසුවා ය:

"ඉක්මන් කරන්න ළමයිනේ! මේක කැටි ගැහෙනවා!"

රූබි නැන්දා, ඩොෂියා නැන්දා හා අම්මා නැටුම් නවත්වා එහි දුවගෙන ආ හ. ඔවුන් සාස්පාන්, ලොකු සාස්පාන් හා පොඩි සාස්පාන් මේසය මත තැබූ අතර ආච්චි එක එකා ඒවාට පැණි වත්කළා ය. ඔවුහු තව තවත් සාස්පාන් තැබූ හ. ඒවා සිසිල් වී මේපල් සීනි සෑදෙනු පිණිස ඔවුහු පිරවූ බඳුන් සගෙන තැබූ හ.

ඉන් පසු ආච්චි මෙසේ කීවා ය:

"දැන් පොඩි කට්ටියට පුංචි පිඟන් ගෙනත් දෙන්න."

සෑම කුඩා ගැහැනු ළමයෙකුට ම හා පිරිමි ළමයෙකුට ම පැණි දැමීම සඳහා කුඩා තැටියක්, අඩු තරමින් කැඩුණු කෝප්පයක් හෝ පීරිසියක් හෝ එහි තිබිණි. ආච්චි ලොකු හැන්දෙන් ඒවාට පැණි වත්කරන තුරු ඔවුහු නොඉවසුන් වූ සිතින් යුතු ව බලා සිටිය හ. සමහර විට හැම දෙනාට ම සෑහෙන

තරම් පැණි නොතිබෙන්නට පුළුවන. එවිට ඔවුන් ගෙන් කට හෝ පරාර්ථකාමී වීමටත්, කාරුණික වීමටත් සිදු වනු ඇත.

එහෙත් හැම දෙනාට ම ඇති වන තරමට පැණි එහි විය. පින්තල බඳුනේ අන්තිම පැණි ස්වල්පය අන්තිම කුඩා තැටිය පිරවීමට සෑහිණි. කිසිවෙකුටත් පැණි නොලැබී ගියේ නැත.

රවුකිස්සඳයේ සංගීතයත්, නැටුමත් දිගට ම පැවැතිණි. ලෝරා හා අනෙක් ලෝරා අසල සිටගෙන නැට්ටුක්කරුවන් දෙස බලා සිටින්නට වූ හ. අන්තිමේ දී ඔවුහු කාමරයේ කොනක බිම හිඳගත් හ. නැටුම් ඉතා ලස්සණ ය. සංගීතය ඉතා මිහිරි ය. එදෙස කොතරම් බලා සිටියත් ඇතිවන්නේ නැතැයි ලෝරාට සිතිණි.

සියලු ම ලස්සණ ගවුම්, සායවල් පැද්දෙයි, බූට් සපත්තු පොළොවේ වැදී තඩ නගයි. රවුකිස්සඳය නොනැවතී ම මිහිරි සංගීත රාවයක් පතුරවයි.

ඊ ළඟට ලෝරාට ඇහැරිණි. ඇය ආච්චි ගේ ඇඳ පාමුල හරහට නිදා සිටියා ය. උදෑසන එළැඹී ඇත. අම්මා, ආච්චි හා කුඩා කේරි ද එහි නිදා සිටිය හ. අප්පච්චි සහ සීයා ගිනි උදුන අසල අතුරන ලද බ්ලැන්කෙට්ටු මත ගුළි වී නිදා සිටිති. මේරි පෙනෙන මානයක නො වූවා ය. ඇය ඩොෂියා නැන්දා හා රූබි නැන්දා සමඟ ඔවුන් ගේ ඇඳේ නිදා සිටියා ය.

ඉක්මනින් ම හැම දෙනා ම නින්දෙන් පිබිදුණ හ. උදෑසන ආහාරය සඳහා පෑන්කේක් හා මේපල් පැණි පිළියෙල කර තිබූ අතර, ඉන් පසු අප්පච්චි අශ්වයින් හා හිම යානය දොරකඩට ගෙන ආවේ ය.

ඔහු අම්මාට හා කේරිට හිම යානයට නැගීමට උදවු කළ අතර සීයා මේරිවත්, ජෝර්ජ් මාමා ලෝරාවත් ඔසවා පිදුරු ඇතිරූ හිම යානය මතින් තැබූ හ.

අප්පච්චි ඔවුන් ගේ සිරුරු පොරෝනාවලින් වැසුවේ ය. හිම යානය මහ වනය මැදින් නිවෙස බලා පිටත් වන අතර සීයා, ආච්චි හා ජෝර්ජ් බාප්පා දොරකඩ අසල සිටගෙන, "ආයුබෝවන්! ආයුබෝවන්!" යි කියමින් ඔවුන්ට ආචාර කරන්නට වූ හ.

හිරු එළිය උණුසුම් වූ අතර තැල්මේ දුවන අශ්වයින් ගේ කුර වැදී මඩ සහිත හිම කැටි ඉහළට විසි විණි. හිම යානයට පිටුපසින් උන් ගේ අඩි සලකුණු ලෝරාට පෙනේ. හැම අඩි සලකුණක් ම තුනී හිම තට්ටුව විසාගෙන මඩ තුළට තාවැදී තිබිණි.

"ඊ වෙන්න කලියෙන්," අප්පච්චි කීවේ ය. "අපට සීනි හිම අන්තිම පාරට දකින්න පුළුවන්."

9 පරිච්ඡේදය

නගරයට යාම

සීනි හිම අතුරුදහන් ව ගිය පසු වසන්තය එළැඹියේ ය. ඇද වුණු ඉනි වැට දිගේ වැවුණු, දළුලන හේසල්* පඳුරුවල ලැග කුරුල්ලෝ ගී ගැයූ හ. තණකොළ යළිත් හරිත පැහැයෙන් වැඩෙන්නට වූ අතර කැලැව විවිධාකාර කැලෑ මල්වලින් පිරෙන්නට විය. බටර් කප්*, වයලට් මල්*, දිදාල මල් හා තාරුකා වැනි පුංචි තණකොළ මල් සෑම තැනක ම පිපී තිබිණි.

දවස් උණුසුම් වන්නට වූ වහා ම පාවහන් රහිත දෙපයින් එළිමහනේ දිවීම සඳහා අවසර ඉල්ලමින් ලෝරා හා මේරි බැගෑපත් වන්නට වූ හ. මුල දී ඔවුන්ට දොරකඩ හා පිටුපස මිදුල අවට පාවහන් නොමැති ව දිවීමට අවසර ලැබිණි. ඊ ළඟ දිනයේ ඔවුහු තවත් ඈතට දුව ගිය හ. ඉක්මනින් ම ඔවුන් ගේ පාවහන් ඔප දමා පසෙක තැබුණු අතර ඔවුහු මුළු දවස පුරා ම පාවහන් රහිත දෙපාවලින් එළිමහනේ දුවන්නට වූ හ.

* හේසල් - කෑමට ගත හැකි දුඹුරු පැහැ'ති ගෙඩි සහිත ගස් වර්ගයක්
* බටර් කප් - කහ පාට මල් ඇති පැළෑටි වර්ගයක්
* වයලට් - දම් පාට පුවඳැ'ති මල් වර්ගයක්

සෑම රාත්‍රියක ම නින්දට යාමට පෙර ඔවුහු දෙපා සේදිය යුතු වූ හ. ඔවුන් ගේ ගවුම් සායවල වාටි යටින් පෙනෙන වළලුකර හා පාද ඔවුන් ගේ මුහුණු මෙන් ම දුඹුරු පැහැ ගැන්වී තිබිණි.

නිවෙස ඉදිරිපිට වූ විශාල ඕක් ගස් දෙක යට ඔවුන්ට සෙල්ලම් ගෙවල් දෙකක් විය. මේරි ගේ සෙල්ලම් ගෙය ඔවුන්ට ඕක් ගස යටත්, ලෝරා ගේ සෙල්ලම් ගෙය ලෝරා ගේ ඕක් ගස යටත් තනා තිබිණි. මෘදු තණකොළ ඔවුන්ට කොළ පැහැ'ති බුමුතුරුණක් මෙන් විය.

කොළ පැහැ'ති පත්‍ර ඔවුන් ගේ වහලය වූ අතර කොළ අතරින් ඔවුන්ට නිල් අහස යාන්තමට පෙනිණි.

අප්පච්චි ගසක ශක්තිමත් පට්ටයකින් ඔංචිල්ලාවක් සාදා එය ලෝරා ගේ ඕක් ගසේ පහළින් ඇති විශාල අත්තක බැන්දේ ය. ඇගේ ගසේ එල්ලා ඇති බැවින් එය ඇගේ ඔංචිල්ලාවයි. එහෙත් ඈ ආත්මාර්ථකාමී නො වී මේරිට ඕනෑ වේලාවක ඔංචිල්ලාව පැදීමට ඉඩ දිය යුතු ය.

මේරිට සෙල්ලම් කිරීම සඳහා පළුදු වූ පීරිසියක් තිබිණි. ලෝරාට තිබුණේ ලොකු කැබැල්ලක් කැඩී ගිය ලස්සණ කෝප්පයකි. අප්පච්චි විසින් සාදා දෙන ලද කුඩා ලී බෝනික්කෝ දෙදෙනා වන චාලට් හා නෙටී ඔවුන් සමග සෙල්ලම් ගෙයි වාසය කළ හ. දිනපතා ම ඔවුහු චාලට්ට හා නෙටීට අලුත් කොළ තොප්පි සෑදූ හ. මේසය මත තැබීම සඳහා කුඩා කොළවලින් කෝප්ප හා පීරිසි සෑදූ හ. ඔවුන් ගේ මේසය වූයේ කදිම සමතලා ගලකි.

සූකි හා රෝසි නම් එළදෙනුන් දෙදෙනා මඩුවෙන් ඉවතට ගෙන කැලෑ කොළ හා යුෂ පිරි අලුත් තණකොළ කෑම සඳහා වනයට මුදා හරින ලදි. වසු පැටවුන් දෙදෙනා මඩුවේ ද, ඌරු මව සමඟ පැටවුන් හත්දෙනා ඌරු කොටුවේ ද ගාල් කොට තිබිණි.

ගිය අවුරුද්දේ එළිපෙහෙළි කළ බිම් ප්‍රදේශයේ තැන තැන වූ ගස් කොට වටා පොළොව කෙටූ අප්පච්චි, එහි ධාන්‍ය වර්ග සිටවූවේ ය. එක් රැයක එළිමහනේ වැඩ කර ගෙදර ආ අප්පච්චි ලෝරාට මෙසේ කීවේ යː

"අද මං දැක්කෙ මොනවද කියලා දන්නව ද, ලෝරා?"

ඇට එය සිතාගැනීමට නො හැකි විය.

"මං කියන්නම්," අප්පච්චි කීවේ ය. "අද උදේ මං එළියෙ වැඩ කරකර ඉන්න ගමන් ඔළුව උස්සලා බලද්දී කැලෑව මායිමේ මුවෙක් ඉන්නවා දැක්කා. එයා ගෑනු සතෙක්, මුව අම්මා කෙනෙක්. එයත් එක්ක හිටියේ කවුද කියලා ඔට්ටුයි ඔයගොල්ලන්ට කියන්න බෑ!"

"මුව පැටියෙක්!" ලෝරා හා මේරි ඔවුන් ගේ අත් කදින් අල්ලාගෙන එක්වර ම කී හ.

"හරි," අප්පච්චි කීවේ ය. "උගේ පැටියත් ඌ එක්ක හිටියා. එයා හරි ම ලස්සණ පුංචි පැටියෙක්. ඌට කළු පාට ලොකු ඇස් තිබුණා. උගේ ඇඟ ලා කහ පාටට හුරු දුඹුරු පාටයි. ඌට මගේ මාපටැ'ඟිලි තරම්වත් ලොකු නැති පුංචි පතුල් තිබුණා. උගේ පුංචි කකුල් ශීනියි, හොම්බ හරි ම සිනිඳුයි.

"ඌ එතන හිටගෙන මං කවුද කියලා කල්පනා කරකර උගේ ලොකු, අහිංසක ඇස්වලින් මං දිහා බලා හිටියා. ඌ පොඩ්ඩක්වත් බය වුණේ නෑ."

"ඔයා පුංචි මුව පැටවුන්ට වෙඩි තියන්නෙ නෑ නේ ද, අප්පච්චි?" ලෝරා ඇසුවා ය.

"නෑ, කවදාවත් නෑ!" අප්පච්චි පිළිතුරු දුන්නේ ය. "උගේ අම්මට එහෙම කරන්නෙත් නෑ. උගේ අප්පච්චිට එහෙම කරන්නෙත් නෑ. පුංචි කැලෑ සත්තු ලොකු වෙනකම් දැන් දඩයම් නෑ. සරත් කාලෙ වෙනකම් අපට අලුත් මස් නැතුව ඉන්න වෙනවා."

පැළ සිටුවා අවසන් වූ විගස ඔවුන් නගරයට යන බව අප්පච්චි කීවේ ය. ලෝරාට හා මේරිට ද නගරයට යාමට හැකි ය. ඔවුහු දැන් ලොකු ළමයි ය.

ඇඩි උදෙන්ගයට පත් ව සිටි ඔවුහු පසුදා නගරයට යාමේ සෙල්ලම් කරන්නට වූ හ. එහෙත් නගරයක් යනු කුමක් දැයි

හරියට ම දැන නොසිටි බැවින්, ඔවුන්ට එය ඉතා හොඳින් සිතීමට නො හැකි විය. නගරයේ වෙළෙඳ සලක් ඇති බව දැනසිටි නමුත් ඔවුන් කිසිදාක වෙළෙඳ සලක් දැක තිබුණේ නැත.

එතැන් පටන් සෑම දවසක ම වාගේ ලෝරා හා මේරි තමන්ටත් නගරයට යාමට හැකි දැයි විමසන්නට වූ හ. එහෙත් අම්මා හැමවිට ම මෙසේ කී ය: "බෑ වස්තුව, ඔයගොල්ලන්ට මේ අවුරුද්දෙ යන්න බෑ. හැබැයි හොඳට හිටියොත් ලබන අවුරුද්දෙ ඔයගොල්ලන්ට යන්න පුළුවන් වෙයි."

එක් රැයක අප්පච්චි, "අපි හෙට නගරෙට යමු." යි කීවේ ය.

සතියේ මැද දවසක් වුව ද එදා රෑ අම්මා ලෝරා ව හා මේරි ව නාවා ඔවුන් ගේ හිස පීරුවා ය. ඔවුන් ගේ දිගු හිසකේ කුඩා රොදවල්වලට බෙදූ ඇය තෙත පනාවකින් කෙස් රොදවල් පීරා රෙදි පටියකින් තදට බැන්ද ය. එවිට ඔවුන් ගේ හිස පුරා ඇති කුඩා කෙස් කැරලි නින්දේ දී කොතෙක් කොට්ටයට තෙරපුණ ද විසිරී යන්නේ නැත. උදෑසන වන විට ඒවා කැරලි ගැසුණු හිසකේ බවට පත් ව තිබෙනු ඇත.

කොතරම් උදෙන්ගයට පත් ව සිටියේ ද යත් ඔවුන්ට එදා රෑ ඉක්මනින් නින්ද ගියේ නැත. අම්මා වෙන දා මෙන් මැහුම් කුඩය ළඟ තබාගෙන ඇඳුම් මසමින් සිටියේ නැත. ඇය හෙට ඉක්මන් උදෑසන ආහාරයක් පිසීම සඳහා අවශ්‍ය කළමනා ලකලෑස්ති කළා ය. ඇය හෙට ගමන සඳහා කකුල්වලට දමන හොඳ ම මේස්, යට ඇඳුම් හා ගවුම්, අප්පච්චි ගේ හොඳ කමිසය හා ඇගේ දම් පැහැ'ති පුංචි මල් සහිත තද දුඹුරු කැලිකෝ කපු රෙද්දෙන් මැසූ ගවුම ද පිටතින් රැගෙන තැබුවා ය.

ඇත් දවල් කාලය ඉතා දීර්ඝ ය. උදෑසන ආහාර ගෙන නිමවන්නට පෙර අම්මා ලාම්පුව නිවාදැමුවා ය. එය මනහර වූත්, දීප්තිමත් වූත් වසන්ත උදෑසනක් විය.

උදෑසන ආහාරය ගැනීමට ලෝරා ව හා මේරි ව ඉක්මන් කළ අම්මා, ලහිලහියේ ඉඳුල් පිඟන් සේදුවා ය. අම්මා ඇඳන් සකස් කරන තුරු ඔවුහු මේස් කකුල් ඇඳගෙන පාවහන් දමාගත් හ. ඊ ළඟට ඔවුන් ගේ හොඳ ම ඇඳුම් - මේරි ගේ ලා අළු පැහැයට හුරු නිල් කැලිකෝ ගවුම හා ලෝරා ගේ තද රතු කැලිකෝ ගවුම - අඳින්නට අම්මා ඔවුන්ට උදවු කළා ය. මේරි ලෝරා ගේ ගවුමේ පිටුපස බොත්තම් දැමූ අතර අම්මා මේරි ගේ ගවුමේ බොත්තම් පියවූවා ය.

මවුන් ගේ කොණ්ඩය නැවී ගැසූ රෙදි පටි ලිහූ අම්මා නැවී ගැසුණු කිසකේ මවුන් ගේ උරහිස් මතින් පහළට වැටෙන පරිදි දිග රැලි නැලි වන සේ පීරුවා ය. ඈ කොතරම් වේගයෙන් පීරුවා ද යත් පසුගිය ලෙස වැටී ... විය. මේරි ගේ කොණ්ඩය ලස්සන රන්වන් පැහැයක් ගත් අතර ලෝරා ගේ කොණ්ඩය තිබුණු දුඹුරු පැහැයක් ගත්තේ ය.

මවුන් ගේ හිස පීරීම අවසන් වූ පසු අම්මා හිසේ කුඩා සිදුරු පළඳා ඒවායේ පටි නිකට යටින් ගැට ගැසුවා ය. ඈ සිය කොළපාටේ රන්වන් පැහැති කවුළුව පසාගෙන හිස් වැස්ම පැළඳගන්නා විට අප්පච්චි දොරටුව වෙත ගැල පදවාගෙන ආවේ ය.

අශ්වයින් දිලිසෙන තුරු ඔහු උන් ගේ ලොම් පීරූ තිබුණේ ය. ගැලේ පෙට්ටිය අතුගා පිරිසිදු කොට අසුන මත පිරිසිදු බ්ලැන්කට්ටුවක් අතුරා තිබුණේ ය. කුඩා කැරී වඩාගත් අම්මා, අප්පච්චි සමඟ ගැලේ වියැදුරු අසුන මත හිඳගත් අතර ලෝරා හා මේරි වියැදුරු අසුනට පිටුපසින් ගැලේ පෙට්ටිය හරහා බඳින ලද ලෑල්ලක් මත හිඳගත් හ.

වසන්ත සතුවේ වනය මැදින් ගමන් කරන අතරේ ඔවුහු සතුටින් සිටිය හ. කැරී සිනාසෙමින් උඩ පනින්නට වූ අතර අම්මා මඳ සිනා පාමින් සිටියා ය. අප්පච්චි අශ්වයින් දක්කන අතරේ සිවුරුහන් කළේ ය. දීප්තිමත් වූත්, උණුසුම් වූත් හිරු එළිය මඟ දිගේ පතිත වී තිබිණි. ගස් කොළන්වලින් ගැවසුණු වනය තුළින් මිහිරි සිසිල් සුගන්ධයන් හමා ආවේ ය.

හාවෝ පාරේ ඉදිරියෙන් සිටගෙන සිටිය හ. කුඩා ඉදිරි ගාත් පහළට එල්ලෙමින් තිබූ උන් ගේ නාස් ඉව අල්ලන්නට වූ අතර හිරු එළිය උන් ගේ දිග, ගැහෙන දෙකන් තුළින් දිලිසුණේ ය. ඒ ළඟට උන් උන් ගේ කුඩා සුදු වලිගයේ ක්ෂණික දසුනක් සමඟ වේගයෙන් ඉවත පැන ගිය හ. ගස්වල සෙවණැලි අතරින් මුවන් උන් ගේ ලොකු, කළු ඇස්වලින් තමන් දෙස බලා සිටිනු ලෝරා හා මේරි දෙවතාවක් ම දුටුවෝ ය.

නගරයට සැතපුම් පහක් දුර ය. නගරයේ නම පෙපින් ය. එයට ඒ නම ලැබුණේ පෙපින් විල ඉවුරේ පිහිටා තිබූ හෙයිනි.

බොහෝ වේලාවකට පසු ගස් අතරින් නිල් පැහැති ජලාශයක දර්ශනයක් හදිසියේ ම ලෝරා ගේ නෙත ගැටිණි.

ප්‍රධාන මාර්ගය සිහිඳු පාරක් බවට පරිවර්තනය වී තිබිණි. ගැලේ රෝද වැල්ලේ එරෙන්නට වූ අතර අශ්වයෝ දුඩි වෙහෙසින් යුතු ව ගැල අදින්නට වූ හ. අප්පච්චි උන්ට විවේක ගැනීම සඳහා වරින් වර මිනිත්තු කිහිපයක් ගැල නතර කළේ ය.

එක්වර ම මාර්ගය වනයෙන් පිටතට ඇතිවිණ වී තිබූ අතර ඒ ඇසිල්ලේ ලෝරා විල දුටුවා ය. එය අහස මෙන් නිල් පැහැති වූ අතර එය ලෝකයේ අන්තය තෙක් විහිදී තිබේ ය. ඇගේ නෙත ගැටෙන මානයේ එක දිගට ම දුරටම නිල් පැහැති ජලයයි ඉතා ඈතින්, අහස හා ජලය එක් වූ තැන තද නිල් පැහැති රේඛාවක් පෙනිණි.

හිසට ඉහළින් නැඹුණු අහස අතිවිශාල විය. අහස එතරම් විශාල බව ලෝරා මීට පෙර දැනසිටියේ නැත. ඈ වටා විශාල හිස් අවකාශයක් වූ අතර ඈට එවිට කුඩා බවක් හා බියක් දැනිණි. අප්පච්චි හා අම්මා තමා සමීපයේ සිටීම ගැන ඇය සතුටු වූවා ය.

හදිසියේ ම හිරු එළිය උණුසුම් විය. හිරු, හිසට ඉහළින් වූ විශාල හිස් අහස් තලයේ ඉහළින් පායා තිබූ අතර සිසිල් වනපෙත විල් ඉවුරෙන් එපිට පිහිටා තිබිණි. මේසා විශාල අහසක් යට මහ වනය වුව පෙනෙන්නේ ඉතා කුඩාවට ය.

අශ්වයින් නතර කළ අප්පච්චි වියැදුරු අසුනෙන් පිටුපසට හැරුණේ ය. ඔහු සිය අත ඇති කසය ඈතට දිගු කළේ ය.

"මන්න ආවා, ලෝරයි, මේරියි!" ඔහු කීවේ ය. "අර පේන්නෙ පෙපින් නගරෙ."

ලෝරා ලෑල්ල මතට නැගගත් අතර අප්පච්චි ඈ නොවැටෙන පරිදි ඇගේ අතින් අල්ලාගත්තේ ය. එවිට ඈට නගරය නැරඹිය හැකි විය. නගරය දුටු කල ඈට හුස්ම ගැනීමට පවා අසීරු විය. නිවාස විශාල සංඛ්‍යාවක් නිසා නගරය දැකගැනීමට නො හැකි වූ විට යැන්කි ඩූඩ්ල්ට කොතරම් දුක සිතෙන්නට ඇත්දැයි ඈට සිතිණි.

විල අද්දර විශාල ගොඩනැගිල්ලක් විය. එය වෙළෙඳ සල බව අප්පච්චි ඈට කීවේ ය. එය සාදා තිබුණේ

ලී කොටවලින් නො වේ. ඉහළට හා පහළට තබන ලද පළල්, අළු පැහැ'ති ලෑලිවලින් එය සාදන ලද්දේ ය. එය වටා වැල්ල පැතිරී තිබිණි.

වෙළෙඳ සල පිටුපස මහ වනයේ අප්පච්චි විසින් එළි කරන ලද බිමට වඩා විශාල එළිමහන් ප්‍රදේශයක් විය. ගස් කොට අතර ලෝරාට ගණන් කළ නො හැකි තරම් නිවාස සංඛ්‍යාවක් ඉදිවී තිබිණි. ඒවා ද සාදා තිබුණේ ලී කොටවලින් නො වේ. වෙළෙඳ සල මෙන් ම ඒවාත් ලෑලිවලින් සාදා තිබිණි.

මෙතරම් නිවාස සංඛ්‍යාවක් ඇති බව ලෝරා කවදාවත් කල්පනා කොට තිබුණේ නැත. ඒවා ඉතා ළඟින් පිහිටා තිබිණි. ඇත්ත වශයෙන් ම ඒවා වෙළෙඳ සලට වඩා කුඩා ය. එක් නිවසක් අලුත් ලෑලිවලින් සාදා තිබූ අතර ඒවා තවමත් අළු පැහැයට හැරී නැත. එය අලුත කපන ලද ලීවල කහ පැහැයෙන් යුතු විය.

ඒ නිවාස සියල්ලේ ම මිනිස්සු පදිංචි ව සිටියෝ ය. ඒවායේ දුම් කවුළු තුළින් දුම් රැලි ඉහළ නැගෙයි. එය සඳුදාවක්

හොඳුණ ද සමහර ගැහැනු ඔවුන් ගේ හිසෙත් අසල පළුවල හා තොට මත සේද රෙදි වනා තිබුණි.

වෙළෙඳ සල හා නිවාස අතර ඇති එළිමහන් බිමේ ගැහැනු ළමයි හා පිරිමි ළමයි හිරු එළියේ නැගැවෙමින් ක්‍රීඩා කරමින් සිටිය හ. ඔවුහු එක කොටයකින් තවත් කොටයකට පනිමින් නැගාහ.

"ඉතිං, මේ තමයි පෙපින්," අප්පච්චි කීවේ ය.

ලෝරා හිස සැලුවා පමණි. ඇය වදනක්වත් නොදොඩා නොනවත්වා ම වටපිට ඇස් කරකවමින් සිටියා ය. මඳ වේලාවකට පසු ඈ යළිත් හිඳගත් අතර අශ්වයෝ ගමන ඇරඹූ හ.

ඔවුහු විල් ඉවුරේ දී ගැලෙන් බිමට බැස්ස හ. අප්පච්චි අශ්වයින් ලිහා ගැලේ පෙට්ටිය දෙපසින් බැඳ තැබුවේ ය. ඊ ළඟට ඔහු ලෝරා ගේ හා මේරි ගේ අතින් අල්ලාගත්තේ ය. අම්මා කුඩා කෙරී වඩාගෙන ඔවුන් පසෙකින් ආවා ය. ඔවුහු ගැඹුරු වැල්ල මැදින් වෙළෙඳ සල වෙත ගමන් කරන්නට වූ හ. ලෝරා ගේ පාවහන්වල ඉහළ කෙළවර වැසෙන තරමට උණුසුම් වැල්ල ගැඹුරු විය.

වෙළෙඳ සල ඉදිරිපස පළල් වේදිකාවක් වූ අතර පඩිපෙළක් වැල්ලේ සිට එහි එක් කෙළවරකින් ඒ වෙත දිවෙයි. ලෝරා ගේ හදවත කොතරම් වේගයෙන් ගැහෙන්නට වී ද යත්, ඇට පඩිපෙළ නැගිය නො හැකි වූ තරම්. ඇගේ සියොළඟ ම වෙවුලමින් තිබිණි.

මෙය අප්පච්චි ඔහු ගේ සත්ත්ව සම් විකිණීමට ආ වෙළෙඳ සලයි. ඔවුන් ඇතුළට ගිය විට වෙළෙඳ සල් හිමියා ඔහු ව හඳුනාගෙන කවුන්ටරයෙන් පිටතට පැමිණ ඔහු හා අම්මා සමඟ කතා කළේ ය. ඊ ළඟට ලෝරාට හා මේරිට ඔවුන් ගේ හොඳ පුරුදු පෙන්වීමේ අවස්ථාව උදා විය.

මේරි, "සැප සනීප කොහොම ද?" යි ඇසූ නමුත් ලෝරාට කිසිවක් කියාගත නො හැකි විය.

"මොනතරම් ලස්සණ දුවෙක් ද ඔහෙලට මේ ඉන්නෙ," යි අප්පච්චිට හා අම්මාට කී වෙළෙඳ සල් හිමියා මේරි ගේ රන්වන් කොණ්ඩා කැරලි වර්ණනා කළේ ය. එහෙත් ඔහු ලෝරා පිළිබඳ ව හෝ ඇගේ කොණ්ඩය පිළිබඳ ව කිසිවක් කීවේ නැත. ඒවා කැත ය, දුඹුරු පැහැ'ති ය.

Scanned with CamScanner

වෙළෙඳ සැලේ බලන්නට බොහෝ දේ පිරී තිබිණි. එහි එක පැත්තක හොඳ පැහැති මුද්‍රිත රෙදි හා කැලිකෝ රෙදි පිරුණු රාක්ක ය. එහි ලස්සණ රෝස, නිල්, රතු, දුඹුරු හා දම් පැහැති රෙදි තිබිණි. ලෑලි කවුන්ටරය අසල බිම දිගේ ඇණ පිරවූ පීප්ප, රවුම් අළු පැහැති මුනිස්සම් පිරවූ පීප්ප හා රස කැවිලි පිරවූ විශාල ලී බාල්දි තබා තිබිණි. ලුණු ගෝනි හා ගබඩා සීනි ගෝනි ද එහි විය.

වෙළෙඳ සල මැද දිලිසෙන ලීයෙන් සෑදූ නගුලක් හා දිලිසෙන නඟුල් දතක් විය. එසේ ම වානේ පොරෝ තල, මිටි තල, කියත්, දඩයම් පිහි, සම් කපන පිහි, මස් කපන පිහි, දුනු පිහි ආදී සෑම වර්ගයක ම පිහි එහි විය. ලොකු බූට් සපත්තු හා කුඩා බූට් සපත්තු, ලොකු පාවහන් හා කුඩා පාවහන් ද එහි විය.

සති ගණනාවක් පුරා බැලූ ව ද ඒ වෙළෙඳ සලේ ඇති සියල්ල දැක බලාගන්නට ලෝරාට නො හැකි වනු ඇත. ලෝකයේ ඒ තරම් දේවල් ඇති බව පවා ඇ දැන සිටියේ නැත.

අප්පච්චි හා අම්මා දිවස වෙලාවක් පුරා ඒවායේ මිල ගණන් විමසමින් සිටිය හ. වෙළෙඳ සල් හිමියා රාක්කවලින් ලස්සණ කඩ රෙදි ගෙන කවුන්ටරය මත දිග හැරියේ ය. අම්මා ඇඟිලි තුඩින් ඒවා අල්ලා බලා මිල ගණන් ඇසුවා ය. ලෝරා හා මේරි බලා සිටිය හ. එහෙත් කිසිවක් නො ඇල්ලිය යුතු ය. හැම අලුත් පාටක් ම හා මෝස්තරයක් ම කලින් බැලූ රෙද්දට වඩා ලස්සණ වූ නිසා එහි එවැනි රෙදි බොහෝමයක් විය! අම්මා ඒවා කෙසේ තෝරන්නදැයි ලෝරා නොදන්නා ය.

අම්මා අප්පච්චිට කමිස දෙකක් මැසීම සඳහා මෝස්තර දෙකකින් යුතු කැලිකෝ රෙදි කෑබැලි දෙකකුත්, රට ඇඳීම සඳහා කමිසයක් මැසීම සඳහා දුඹුරු පැහැති ඩෙනිම් රෙදි කෑබැල්ලකුත් තෝරුවා ය. ඉන් පසු ඇය ඇතිරිලි හා යට ඇඳුම් මැසීම සඳහා සුදු රෙදිත් ගත්තා ය.

අප්පච්චි ඇට අලුත් ඒප්‍රනයක් මැසීම සඳහා කැලිකෝ රෙද්දක් ගත්තේ ය. අම්මා මෙසේ කීවා ය:

"අනේ, එපා, චාල්ස්. මට ඇත්තට ම ඕක නෑ."

එහෙත් සිනාසුණු අප්පච්චි ඇ එය ගත යුතු යැයි ද නැති නම් තමා ලොකු කහ පැහැති මෝස්තරයක් සහිත රතු රෙදි ඇට මිලදී ගෙන දෙන බව ද කීවේ ය. මද සිනා පෑ අම්මා රතු කරගත් මුහුණින් යුතු ව සොම්බ පඩු පැහැති පසුබිමේ රෝස මල් පොහොට්ටු හා කොළ විසිරුණු රෙද්දක් තෝරාගත්තා ය.

අනතුරුව අප්පච්චි ටලිසම් සමඟ පළඳින බ්‍රේස් පටි ජෝඩුවක් ද, දුම් පයිප්පයට දුම්කොළ ප්ලග් එකක් ද මිලදී ගත්තේ ය. අමුත්තන් පැමිණි විට සංග්‍රහ කිරීම සඳහා අම්මා තේ කොළ රාත්තලක් ද, ගබඩා සීනි සහිත කුඩා කරදාසි පැකට්ටුවක් ද ගත්තා ය. ඒ සීනි අම්මා එදිනෙදා ප්‍රයෝජනයට ගන්නා මේපල් සීනි මෙන් තද දුඹුරු පැහැති නොවූ ලා දුඹුරු පැහැති සීනි වර්ගයකි.

සියලු ම බඩු විකුණා අවසන් වූ පසු වෙළෙඳ සල් හිමියා මේරිට හා ලෝරාට සුකිරි කෑබැල්ල බැගින් දුන්නේ ය. මිනිසුන් මහත් විස්මයටත්, දැඩි ප්‍රීතියටත් පත් ව තමන් ගේ සුකිරි කෑබැලි දෙස බලාගත්වන ම සිටිය හ. අන්තිමේ දී මේරිට මතක් වී "ස්තුතියි," යි කීවා ය.

ලෝරාට කතා කරගත නො හැකි විය. හැම දෙනා ම ඈ කතා කරන තුරු බලා සිටි අතර ඈට හඬක්වත් පිට කරගත නො හැකි විය. අන්තිමේ දී අම්මාට මෙසේ ඇසීමට සිදු විය.

"දැන් මොනව ද කියන්න ඕන, ලෝරා?"

එවිට ලෝරා මුව විවර කොට කෙළ ගිල, "ස්තුතියි," යි කෙඳිරුවා ය.

ඉන් පසු ව ඔවුහු වෙළෙඳ සලෙන් පිටතට ආ හ. සූකිරි කැබැලි දෙක ම සුදු පැහැති තුනී, සිහින් හදවත් හැඩයේ ඒවා විය. ඒ මත රතු පැහැති අකුරු ලියැවී තිබිණි. අම්මා ඔවුන්ට ඇසෙන සේ ඒවා කියවූවා ය. මේරි ගේ සූකිරි කැබැල්ලේ මෙසේ ලියැවී තිබිණි:

රෝස මල් රතුයි.
වයලට් දම් පාටයි.
සීනි හරි මිහිරියි.
ඔබත් ඒ වාගේමයි.

ලෝරා ගේ දෝසි කැබැල්ලේ වූයේ මෙපමණකි:

මිහිරි අයට ඉමිහිරි රස කැවිලි.

සූකිරි කැබැලි දෙක ම එක ම ප්‍රමාණයේ වූ අතර ලෝරා ගේ සූකිරි කැබැල්ලේ අකුරු මේරි ගේ සූකිරි කැබැල්ලේ අකුරුවලට වඩා විශාල විය.

ඔවුහු යළිත් වැල්ල මැදින් විල් ඉවුරේ නවතා තිබූ ගැල වෙත ගමන් කළ හ. අප්පච්චි අශ්වයින්ට කෑම දුන්නේ ය. ඔහු උන්ට කෑම සඳහා ගැලේ පෙට්ටිය පතුලේ ඕට් මල්ලක් දමාගෙන විත් තිබුණේ ය. අම්මා ඔවුන් ගේ කෑම පෙට්ටිය විවර කළා ය.

ඔවුහු සියලු දෙනා ම ගැල අසල උණුසුම් වැල්ලේ වාඩිවී පාන්, බටර්, චීස් හා තැම්බූ බිත්තර සමග විස්කෝතු කෑ හ. පෙපින් විලේ රැළි කැරකි කැරකී වෙරළට විත් ඔවුන් ගේ දෙපා අසල නැවතී සිහින් සූ සූ හඬක් නගමින් යළිත් දියඹට ඇදී ගියේ ය.

දිවා ආහාරයෙන් පසු අනෙක් මිනිසුන් සමග සුළු වේලාවක්කතා බහ කිරීම සඳහා අප්පච්චි යළිත් වෙළෙඳ සලට ගියේ ය. කුඩා කේරි නින්දට වැටෙන තුරු අම්මා නිහඬ ව

ඈ වඩාගෙන සිටියා ය. එහෙත් ලෝරා හා මේරි විල් ඉවුරේ දුවමින්, දිය රැළිවලට හසුවී, මටසිලුටු වන තෙක් ම ඉදිරියටත්, පසුපසටත් කරකැවෙමින් සිට වෙරළට ගසාගෙන ආ ලස්සණ ගල් කැට අහුලන්නට වූ හ.

එබඳු ගල් කැට මහ වනයේ නැත.

ලස්සණ ගල් කැටයක් හමුවූ විට ලෝරා එය අහුලා ඇගේ ගවුම් සාක්කුවේ දමාගත්තා ය. ලස්සණෙන් එකකට එකක් පරයන ගල් කැට රාශියක් එහි වූ අතර ඈ සියල්ල ම එකතු කර සාක්කුව පුරවාගත්තා ය. අප්පච්චි අඬගැසූ කල ඔවුහු යළිත් ගැල වෙත දුව ගිය හ. අශ්වයින් ගැලට බැඳ තිබිණි. දැන් නිවෙස බලා යා යුතු වේලාවයි.

ගවුම් සාක්කුව පුරවාගත් ලස්සණ ගල් කැට සමග වැල්ල මැදින් අප්පච්චි වෙතට දුවන කල ලෝරා ගේ සිත සතුටින් ඉපිලී ගොස් තිබිණි. එහෙත් අප්පච්චි ඈව ඔසවා ගැල මතින් හිඳුවන කල භයානක දෙයක් සිදු විය.

බර වැඩි ගල් නිසා ඇගේ ගවුම් සාක්කුව ඉරී ගියේ ය. සාක්කුව බිමට වැටුණු අතර ගල් කැට ගැලේ පෙට්ටිය දිගේ පෙරළී ගියේ ය.

තමා ගේ හොඳ ම ගවුම ඉරුණු නිසා ලෝරා හැඬුවා ය.

අම්මා කේරි ව අප්පච්චි අතට දී ඉරුණු තැන බැලීම සඳහා එතැනට ආවා ය. ඉන් පසු හඬන්නට දෙයක් නැතැයි ලෝරාට කිවා ය.

"ඇඬිල්ල නවත්තන්න, ලෝරා," ඇය කීවා ය. "මං ඒක මහලා දෙන්නම්." සාක්කුව හෝ ගවුම සම්පූර්ණයෙන් ම ඉරී ගොස් නැති බව ඇය ලෝරාට පෙන්වූවා ය. සාක්කුව ගවුම් සාය පැත්තේ මූට්ටුවට අල්ලා මසන ලදුව, සායේ ඇතුළු පැත්තෙන් එල්ලෙන කුඩා මල්ලක් වූ අතර ඉරීගොස් තිබුණේ මූට්ටු පමණි. අම්මාට යළිත් අලුත් එකක් පරිද්දෙන් සාක්කුව මැසිය හැකි ය.

"ලස්සණ ගල් කැට අහුලගන්න, ලෝරා," අම්මා කීවා ය. "මීට පස්සෙ ඔය තරම් කෑදර වෙන්න එපා."

ඉතින් ලෝරා බිම වැටුණු ගල් එකතු කොට සාක්කුවේ දමාගෙන, සාක්කුව ඇගේ උකුළ මත තබාගත්තා ය. ගෙන යන්නට බැරි තරම් ගල් ගොඩක් ඔසවාගෙන කෑදර ගෑනු ළමයෙකු මෙන් හැසිරීම ගැන අප්පච්චි ඇට සිනාසුණු විට, ඇ ඒ පිළිබඳ ව එතරම් හැකීමක් කළේ නැත.

මේරිට කවදාවත් එවැනි දේ සිදු වන්නේ නැත. මේරි හොඳ දැරියක වූ අතර නිතර ම ඇගේ ඇඳුම පිරිසිදුවට හා පිළිවෙළට තබාගත්තා ය. හොඳ පුරුදු පිළිපැද්දා ය. මේරිට ලස්සණ රත්වන් පැහැ ති කැරලි කොණ්ඩයක් තිබේ. ඇගේ හදවත් හැඩයේ සුකිරි කැබැල්ල මත කවියක් ද ලියා තිබේ.

ලෑල්ල මත ලෝරා පසෙකින් හිඳගෙන සිටින මේරි වෙතින් ඉතා යහපත්, ප්‍රියමනාප පෙනුමක් දිස්විය. ඇ හිසකේ අවුල් කරගත්තේ නැත. ගවුම කිලුටු කරගත්තේ ද නැත. එහෙත් ඒ පිළිබඳ ව සතුටුදායක හැඟීමක් ලෝරා තුළ ඇති නොවිණි.

එහෙත් එය ආශ්චර්යවත් දිනයක් විය. ඇගේ මුළු ජීවිත කාලයට ම උදා වූ ඉතා ආශ්චර්යවත් ම දිනය එයයි. ඇය අලංකාර විලත්, තමා දුටු නගරය හා විවිධාකාර භාණ්ඩ පිරුණු විශාල වෙළෙඳ සලත් පිළිබඳ ව කල්පනා කළා ය. ඇ ගල් කැට පරිස්සමට උකුළ මත තබාගෙන සිටි අතර ඇගේ සුකිරි කැබැල්ල ගෙදර ගෙන යන තුරු පරිස්සමට ඇගේ අත් ලේන්සුවේ ඔතා තිබිණි. ගෙදර ගිය පසු ඇ එය හැමදාටමත් තිබෙන්නට පරිස්සමට අරන් තබනු ඇත. කෑමට ගැනීමට එය ලස්සණ වැඩි ය.

ගැල මහ වනය මැදින් නිවෙස දෙසට දිවෙන මාර්ගය දිගේ ගැස්සෙමින් ගමන් කරන්නට විය. හිරු බැස ගිය අතර කැලෑව වඩාත් අන්ධකාර වන්නට විය. එහෙත් සන්ධ්‍යාලෝකය වියැකී යන්නට පෙර සඳ පායා ආවේ ය. අප්පච්චි අත තුවක්කුව ඇති හෙයින් ඔවුහු සුරක්ෂිත වූ හ.

තුරු මුදුන් අතරින් එබී බලන සොම්නස සඳ එළිය මාර්ගය දිගේ ආලෝක ලප හා සෙවණැලි අඳියි. අශ්වයින් ගේ කුර පොළොව හා ගැටී උද්‍යෝගිමත් හඬක් නංවන්නට විය.

ඇඩි වෙහෙස නිසා ලෝරා හා මේරි වචනයකුදු කතා නො කළ හ. අම්මා ඇගේ ඇතේ නිදන කුඩා කේරි වඩාගෙන නිහඬ ව හිඳගෙන සිටියා ය. එහෙත් අප්පච්චි සිහින් හඬින් ගයන්නට විය:

නිදැල්ලේ අප ඇවිද යන මග සතුට හා සැලිය
බොහෝ ඇත.
එහෙත් කොතරම් දුගී වුව ද නිවස සේ සුව තැනක්
ලොව නැත

10 පරිච්ඡේදය

ග්‍රීෂ්ම සෘතුව

දීන ග්‍රීෂ්ම සෘතුව බැවින් මිනිසසු නිවසට එනනට වූ හ. ඉඳහිටෙක හෙන්රි මාමා හෝ ජෝර්ජ් බාප්පා නැති නම් සීයා අසෙකු පිට නැගී වනය මැදින අප්පච්චි හමු වන්නට ආවේ ය. ඔවුන් පිළිගන්නට දොරකඩට යන අම්මා සියලු ම නෑදැයින් ගේ තොරතුරු අසා මෙසේ කියන්නී ය:

"අන්න, චාල්ස් එළියෙ වැඩ."

එවන් දවසක ඇය වෙනදාට වඩා වැඩිපුර දවල් කෑම පිළියෙල කරයි. එවන් දිනවල දවල් කෑම වේලාව ඉතා දීර්ඝ වන්නේ ය. යළිත් සුපුරුදු වැඩ කටයුතුවලට යන්නට පෙර අප්පච්චි, අම්මා හා අමුත්තෝ ගෙතුළ හිඳගෙන සුළු වේලාවක් කතාබහ කරමින් සිටිති.

ඉඳහිටෙක පාර පැන කඳු බෑවුම වෙත ගොස් පීටර්සන් මහත්මිය හමු වීමට අම්මා ලෝරාට හා මේරිට අවසර දුන්නා ය. පීටර්සන් යුවළ මහ වනයේ පදිංචියට පැමිණියේ මෑතක දී ය. ඔවුන් ගේ නිවස අලුත් එකක් වූ අතර නිතර ම ඉතා පිළිවෙළට සකස් කර තිබිණි. නිවස හැඩි කිරීමට පීටර්සන් මහත්මියට කුඩා

දැරියන් සිටියේ නැත. ඇ ස්වීඩන් ජාතික කාන්තාවක වූ අතර ස්වීඩනයෙන් එන විට ගෙනා ලස්සණ දේවල් - වර්ණවත් එම්බ්‍රොයිඩර් මැහුම් හා පිගන් මැටියෙන් තැනූ වටිනා පිගන් කෝප්ප ආදිය ඇය ලෝරාට හා මේරිට පෙන්වූවා ය.

පීටර්සන් මහත්මිය ඔවුන් හා කතා කළේ ස්වීඩන භාෂාවෙනි. ඔවුන් ඇට ඉංග්‍රීසි භාෂාවෙන් කතා කළ අතර ඔවුන්ට ඔවුනොවුන් කියන දේ ඉතා හොඳින් තේරුම් ගැනීමට හැකි විය. ඔවුන් එහි සිට ආපසු එන හැම විටෙක ම ඇ ඔවුන්ට විස්කෝතුව බැගින් දුන් අතර ඔවුහු ගෙදර එන අතරමග ඉතා සෙමින් විස්කෝතුවේ රස බලන්නට වූ හ.

ලෝරා ඇගේ විස්කෝතුවෙන් හරියට ම භාගයක් කැවා ය. මේරි ද කෑවේ භාගයකි. අනෙක් භාග ඔවුහු කුඩා කේරිට දීමට ඉතිරි කරගත් හ. ඔවුන් ගෙදර ගිය විට කේරිට විස්කෝතු භාග දෙකක් ලැබුණු අතර එය සම්පූර්ණ විස්කෝතුවක් විය.

මෙය සාධාරණ නැත. ඔවුන්ට අවශ්‍ය වූයේ කේරිටත විස්කෝතුවලින් සාධාරණ කොටසක් ලබාදීමට ය. මේරි ඇගෙ විස්කෝතුවෙන් භාගයක් ඉතිරි කොටගෙන, ලෝරා ඇගේ මුළු විස්කෝතුව ම කැවා නම් එය සාධාරණ නැත. ලෝරා ඇගෙ විස්කෝතුවෙන් භාගයක් ඉතිරි කොටගෙන, මේරි ඇගේ මුළු විස්කෝතුව ම කැවා නම් එයත් සාධාරණ නැත.

කළ යුත්තේ කුමක් දැයි ඔවුහු දෙදෙනා ම හොඳත් හ. ඉතින දෙදෙනා ම තම තමන් ගේ විස්කෝතුවෙන් භාගයක් ඉතිරි කොටගෙන කේරිට දුන් හ. කෙසේ නමුත් මෙය සාධාරණ නොවන බව ඔවුන්ට නිතර ම සිතිණි.

ඉඳහිටෙක තමන් ගේ පවුල දවස ගත කිරීම සඳහා නිවසට එන බව දන්වා අසල්වැසියෙක් පණිවුඩයක් එවයි. එවිට අම්මා අන් දිනවලට වඩා ගේ පිරිසිදු කොට, ආහාර පිස, වෙළෙද සලෙන් ගෙනා සීනි පැකට්ටුව පිටතට ගත්තා ය. උදෑසන ගැලක පැමිණ දොරකඩ ඉදිරියේ නැවතෙනු ඇත. එවිට සෙල්ලම් කිරීමට අසල්වැසි ළමයින් ඕනෑ තරම් ය.

හියුලට් මහතා හා මහත්මිය නිවසට ආ විට ඔවුන් සමග ඊවා හා ක්ලැරන්ස් ද පැමිණිය හ. ඊවා කළු පැහැති ඇස් හා කළු පැහැති කැරලි කොණ්ඩයක් ඇති හුරුබුහුටි දැරියකි. ඇ පරිස්සමින් සෙල්ලම් කළ අතර ඇගේ ඇඳුම් පිරිසිදුවටත්

ප්‍රසන්න ලෙසටත් තබාගත්තා ය. මේරි එයට කැමැති වූ අතර ලෝරා වඩාත් ම ප්‍රිය කළේ ක්ලැරන්ස් සමඟ සෙල්ලම් කිරීමටයි.

ක්ලැරන්ස් රතුවන හිසකේ හා සමේ කුඩා ලප ඇති නිතර සිනාසෙන පිරිමි ළමයෙකි. ඔහු ගේ ඇඳුම ද ශෝභන ය. ඔහු ඉදිරිපස පේළියට දිලිසෙන බොත්තම් හා බීඩින් පටි ඇල්ලූ නිල් පැහැති ඇඳුමක් ඇඳ ඉදිරි කොටස තඹවලින් සැදූ පාවහන පැළඳ සිටියේ ය.

සපත්තුවේ ඉදිරිපස හරහා වැදුණු තඹවලින් සැදූ ඉරි කොතරම් දීප්තිමත් ව දිලිසුණා ද කියතොත් තමාටත් පිරිමි ළමයෙකු වන්නට තිබුණා නම් යැයි ලෝරාට සිතිණි. කුඩා දැරියන් තඹ ඉදිරි කොටසක් සහිත පාවහන් පළඳින්නේ නැත.

ලෝරා හා ක්ලැරන්ස් දුවමින් ද, කෑකෝගාමින ද, ගස් නගිමින් ද සිටි අතර, මේරි හා ඊවා සෙමින් ඇවිදඇවිද කතා කරමින් සිටිය හ. අම්මා හා හියුලට් මහත්මිය ඈ විසින් ගෙන ආ ගොඩීස් ලේඩීස් බුක් නම් පොතක් බලමින් ගෙතුළ සිටිය හ. අප්පච්චි හා හියුලට් මහතා අශ්වයින් දෙස බලමින් දුම් පයිප්ප උරන්නට වූ හ.

වරක් ලොටී පුංචි අම්මා දවස ගත කරන්නට එහි පැමිණියා ය. අම්මා රාත්‍රියේ කොණ්ඩයේ බඳින ලද රෙදි පටි ලිහා කොණ්ඩය කැරලි කරන තෙක් බොහෝ වේලාවක් සිටගෙන සිටින්නට ඒ උදෑසන ලෝරාට සිදු විය. කලින් ලකලෑස්ති වූ මේරි ඇගේ අලුත් නිල් පැහැති රැලි ගවුම හැඳ

දිලිසෙන රන්වන් කොණ්ඩා කැරලි සොලවමින් ශෝභන ලෙස පුටුවක් මත හිඳගෙන සිටියා ය.

ලෝරා ඇගේ රතු පැහැති ගවුමට ප්‍රිය කළා ය. එමෙන් අම්මා රිදෙන තරමට ඇගේ කොණ්ඩය ඇදීම ඇගේ අමනාපයට හේතු විය. අනෙක් අතට ඇගේ කොණ්ඩය දුඹුරු පාට ය. එහි රන්වන් පැහැයක් ඇත්තේ ම නැත. ඒ නිසා කිසිවෙකු ගේ නෙත ඒ වෙත යොමු වන්නේ නැත. හැම දෙනා ම බලබලා ලස්සණ යැයි කියන්නේ මේරි ගේ කොණ්ඩයයි.

"ඔන්න!" අම්මා අන්තිමට කීවා ය. "ඔයා ගෙ කොණ්ඩෙ ලස්සණට කෝල් වුණා. දැන් ලොටී එයි. දෙන්න ම ඉස්සරහට දුවන්න. දුවලා ගිහින් අහන්න කාගෙ කොණ්ඩෙට ද එයා වැඩියෙන් ම ආසා කියලා. දුඹුරු කොණ්ඩෙට ද, රත්තරන් පාට කොණ්ඩෙට ද කියලා."

ලොටී පුංචි අම්මා ගේට්ටුව අසලට ඇවිදින් සිටි බැවින් ලෝරා හා මේරි ගෙයින් පිටතට ගොස් ගෙවත්ත දිගේ දුවන්නට වූ හ. ලොටී පුංචි අම්මා මේරිට වඩා උස ලොකු ගැහැනු ළමයෙකි. ඇගේ ඇඳුම රෝස පැහැති ලස්සණ ඇඳුමක් වූ අතර ඇය රෝස පැහැති හිස් වැස්මක් එක පටියකින් පද්දමින් සිටියා ය.

"ලොටී පුංචි අම්මේ, ඔයා මොන කොණ්ඩෙට ද වැඩියෙන් ම ආසා?" මේරි ඇසුවා ය. "දුඹුරු කෙල්වලට ද, රත්තරන් පාට කෙල්වලට ද?" අම්මා ඔවුන්ට එසේ අසන්නට යැයි කී අතර මේරි හැමවිට ම තමාට කී දේ හරියට ම පිළිපදින ඉතා හොඳ දැරියක් වූවා ය.

ලොටී පුංචි අම්මා කෙබඳු පිළිතුරක් දෙනු ඇත්දැයි බලා සිටි ලෝරා ගේ හදවත දුකින් පිරී යන්නට විය.

"මං දෙකට ම ගොඩක් ආසයි," ලොටී පුංචි අම්මා මඳ සිනා පාමින් කීවා ය. ඕ ළඟට ඇ ලෝරා ව හා මේරි ව අතින් අල්ලාගත් අතර ඔවුහු අම්මා සිටින දොර අසලට නටමින් ගිය හ.

හිරු එළිය ජනෙල් කවුළු අතරින් ගෙතුළට එබිකම් කරන්නට වූ අතර ගෙතුළ සියල්ල ම ඉතා පිළිවෙළට, ඉතා ශෝභන ව අස්පස් කොට තිබිණි. මේසයට රතු රෙද්දක් අතුරා තිබූ අතර ඔප දමන ලද පෝරණුව කළු පැහැයෙන් දිලිසෙන්නට විය. නිදන කාමරයේ දොර අතරින් රෝද සහිත මිටි ඇඳ

විශාල ඇඳ යට දමා තිබෙනු ලෝරාට පෙනේ. ගබඩා කාමරයේ දොර විවර කොට තිබූ බැවින් එහි රාක්කවල ඇති කෑම වර්ග පිටතට පෙනුණු අතර ඒවායේ සුවඳ හාත්පස පැතිරී ගියේ ය. අටුවට වැද නින්දක් නිදාගත් බ්ලැක් සූසන් පුරු පුරු ගාමින් පඩිපෙළ බැස්සා ය.

සියල්ල ඉතා සතුටුදායක ව පැවතුණු අතර ලෝරා වෙතින් කොතරම් ප්‍රීතිමත් හා යහපත් පෙනුමක් දිස්වූයේ ද යත් ඒ සැන්දෑවේ ඈ අන් කවරදාටත් වඩා නරක ළමයෙකු වනු ඇතැයි කිසිවෙකු නොසිතන්නට ඇත.

ලොටී පුංචි අම්මා යන්නට ගොස් සිටි අතර ලෝරා හා මේරි වෙහෙසට හා අමනාපයට පත් ව සිටිය හ. ඔවුහු උදෑසන ගිනි මෙළවීම සඳහා කූඩයකට දර පතුරු එකතු කරමින් දර ගොඩ අසල සිටිය හ. දර පතුරු එකතු කිරීම ඔවුන්ට හැමවිට ම ඒපා කළ දෙයක් වූ නමුත්, දිනපතා ම ඔවුන්ට එය කිරීමට සිදු විය. අද සැන්දෑවේ ඔවුහු අන් කවරදාටත් වඩා ඊට නොකැමති වූ හ.

ලෝරා ලොකු ම දර පතුර බලෙන් ඩැහැගත් අතර මේරි මෙසේ කීවා ය:

"මට ඕන්නෑ. මොකවුණත් ලොටී පුංචි අම්මා වැඩියෙන් ම ආස මගේ කොණ්ඩෙටනෙ. රත්තරන් පාට කොණ්ඩෙ දුඹුරු පාටට වැඩිය ගොඩක් ලස්සණයි."

ලෝරා ගේ උගුර ඉදිමුණු අතර ඇට කිසිවක් කතා කරගත නො හැකි විය. රන්වන් පැහැ'ති හිසකේ දුඹුරු පැහැ'ති හිසකේවලට වඩා ලස්සණ බව ඇය දැනසිටියා ය. කතා කරගත නො හැකි වූ තැන ඇය වහා අත දිග හැර මේරි ගේ කම්මුලට පහරක් ගැසුවා ය.

අනතුරුව අප්පච්චි, "මෙහෙ එනවා, ලෝරා," යි කතා කරනු ඇට ඇසිණි.

ඇය දෙපා අද්දමින් හෙමිහිට ගියා ය. අප්පච්චි ගෙතුළ දොර අසල ම හිඳගෙන සිටියේ ය. ඈ මේරිට කම්මුල් පහරක් ගසනවා ඔහු දැක තිබුණේ ය.

"ඔයාට මතක ඇතිනෙ, මං කියලා තියෙනවා කවදාවත් දෙන්නා එක්ක ගුටි ගහගන්න එපයි කියලා," අප්පච්චි කීවේ ය.

ලෝරා කතා කරන්නට වූවා ය, "ඒත් මේරි කිවුවා-"

"ඒකෙන් කමක් නෑ," අප්පච්චි කීවේ ය. "ඔයා මං කියන දේ අහන්න ඕන."

අනතුරුව බිත්තියේ එල්ලා තිබූ පටියක් ගත් ඔහු ලෝරාට පහර කිහිපයක් ගැසුවේ ය.

ලෝරා මුල්ලේ පුටුවක හිඳගෙන ඉකිබිඳින්නට වූවා ය. ඉකිබිඳීම නතර කළ විට ඇය බුම්මාගෙන සිටින්නට වූවා ය. මේ ලෝකයේ ඇට සතුටු විය හැකි එක ම දේ මේරිට තනි ව ම දර පතුරු කූඩය පුරවන්නට සිදු වීමයි.

අන්තිමේ දී රෑ බෝ වන්නට මත් ම අප්පච්චි, "මෙහෙ එන්න, ලෝරා," යි කියමින් යළිත් ඇට කතා කළේ ය. ඔහු ගේ කටහඬ කරුණාවන්ත වූ අතර ලෝරා ඔහු වෙත ගිය කල ඔහු ඈ දෙදණ මතට ගෙන ඈ ව තුරුලු කොටගත්තේ ය. ඈ ඔහු ගේ බාහුවේ වක ගැසුණු තැන හිඳගෙන ඔහු ගේ උරහිසට හිස තබා ගත් අතර ඔහු ගේ දුඹුරු පැහැ'ති රැවුලින් ඇගේ ඇසෙන් අඩක් වැසිණි. යළිත් සියල්ල සතුටුදායක විය.

සිදු වූ සියල්ල අප්පච්චිට කී ඇය, "අප්පච්චි ඔයා දුඹුරු පාට කොණ්ඩෙට වඩා රත්තරන් පාට කොණ්ඩෙට ආස නෑ, නේ ද?" යි ඔහු ගෙන් ඇසුවා ය.

අප්පච්චි ගේ නිල් ඇස් ඈ වෙතට දිලිසුණු අතර ඔහු, "මෙ බලන්න, ලෝරා, මගේ කොණ්ඩෙත් දුඹුරු පාට නෙව," යි කීවේ ය.

ඇ ඒ ගැන කල්පනා කර තිබුණේ නැත. අප්පච්චි ගේ හිසකේ දුඹුරු පැහැති ය. ඔහු ගේ රැවුලත් දුඹුරු ය. ඉතින් දුඹුරු යනු ලස්සණ පාටක් යැයි ඇය සිතුවා ය. එහෙත් මේරිට තනි ව ම දර පතුරු සියල්ල ම එකතු කරන්නට සිදු වීම ගැන ඇය ඉතා සතුටු වූවා ය.

ග්‍රීෂ්ම සෘතුවේ සැන්දෑවන්වල අප්පච්චි කතාන්දර කීවේවත්, රවුකිඤ්ඤය වැයුවේවත් නැත. ග්‍රීෂ්ම දවස් දීර්ඝ වූ අතර මුළු දවස ම එලිමහනේ වැඩ පළ කර ගෙදර එන අප්පච්චි ඉතා වෙහෙස වී සිටියේ ය.

අම්මාට ද වැඩ කටයුතු අධික විය. ගෙවත්තේ වල් උදුරන්නටත්, වසු පැටවුනට හා කිකිළියනට කෑම දෙන්නටත් ලෝරා හා මේරි ඇට සහාය වූ හ. ඔවුහු බිත්තර එකතු කළ හ. චීස් හදන්නට අම්මාට සහාය වූ හ.

වනයේ තණකොළ උසට හා ඝනට වැවෙන කාලයේ දෙනුන් වැඩිපුර කිරි දෙන අතර එය චීස් සාදන කාලය වේ.

මුහුන් නොමැති ව චීස් සෑදිය නො හැකි බැවින් කවුරුන හෝ වස්සෙකු මැරිය යුතු ය. චීස් සඳහා ගන්නා කිරි මුහුන් වන්නේ, කුඩා වසු පැටවෙකු ගේ ආමාශයේ ඇති ස්ථරයයි. වස්සා ඉතා ළපටි එකෙකු විය යුතු අතර එනිසා ඌ කිසිදාක කිරි මිස වෙනත් කිසිවක් ආහාරයට ගෙන තිබෙන්නේ නැත.

අප්පච්චි මඩුවේ සිටින වසු පැටවුන් ගෙන් එකෙකු මරනු ඇතැයි ලෝරා බිය වූවා ය. උන් ඉතා හුරුබුහුටි ය. එකෙකු පඬු පැහැ වූ අතර අනෙකා රතු පැහැ විය. උන් ගේ ලොම් ඉතා සිනිඳු වූ අතර උන් ගේ විශාල ඇස් ඉතා විස්මයෙන් පිරුණු ඒවා විය. චීස් සෑදීම පිළිබඳ ව අම්මා අප්පච්චි සමග කතා කරනු ඇසුණු විට ලෝරා ගේ හදවත වේගයෙන් ගැහුණේ ය.

එහෙත් උන් වැස්සියන් බැවිනුත්, දෙනුන් ලෙස වැඩිය යුතු බැවිනුත් අප්පච්චි ඒ පැටවුන් මරන්නේ නැත. චීස් සෑදීම ගැන කතා කරන්නට ඔහු සීයා හා හෙන්රි මාමා හමුවන්නට ගියේ ය. තමා සතු වස්සන් ගෙන් එකෙකු මරන බව හෙන්රි මාමා කීවේ ය. එවිට පොලි නැන්දාට, ආච්චිට හා අම්මාට ඇති තරම් මුහුන් ලැබෙනු ඇත.

ඉතින් හෙන්රි මාමා ගේ නිවසට ගිය අප්පච්චි වසු පැටවෙකු ගේ ආමාශයේ කැබැල්ලක් ද රැගෙන පසින් ආවේ ය. එය එක් පැත්තකින් රවුම් හා උස් වූ අළු පැහැයට හුරු කහ පැහැයක් ගත් හම් කැබැල්ලක් මෙන් විය.

රාත්‍රියේ එළදෙනුන් ගෙන් කිරි දෙවූ පසු අම්මා ඒ කිරි භාජනවලට දමා පසෙකින් තැබුවා ය. උදෑසන ඇය කිරි යොදය ඉවත් කොට පසු ව බටර් සෑදීම සඳහා අරන් තැබුවා ය. ඉන් පසු උදේ දෙවූ කිරි සීතල වූ විට ඇය එය යොදය සහිත කිරිවලට මිශ්‍ර කොට ඒ සියල්ල ම උණු වන පිණිස උදුන මත තැබුවා ය.

මුහුන් ස්වල්පය රෙදි කඩක ඔතා උණුසුම් ජලයේ පොගවන ලදී.

කිරි පදමට උණු වූ පසු අම්මා රෙදි කැබැල්ලේ ඇති මුහුන්වල සෑම දිය බිඳුවක් ම මිරිකා අනතුරුව ඒ වතුර කිරිවලට ඇඹුවා ය. එය හොඳින් හැඳිගා ඇය උදුන අසල උණුසුම් ස්ථානයක එය තැබුවා ය. මඳ වේලාවකට පසු එය මෘදු ජෙලි වැනි කුට්ටියක් බවට පත් විය.

දිගු පිහියකින් ඒ කුට්ටිය කුඩා හතරැස් කැබලිවලට කැපූ අම්මා, මෝරුවලින් මුදවාපු කිරි වෙන් වන අතරේ එය පසෙක තැබුවා ය. අනතුරුව ඒ සියල්ල රෙදි කඩකට වත්කළ ඇය දියාරු, කහ පැහැයට හුරු මෝරු මිරිකා ඉවත් කළා ය.

රෙදි කැබැල්ලෙන් තවත් වතුර බිංදු නොවැටුණු විට මුදවාපු කිරි විශාල බඳුනකට දැමූ අම්මා, එයට ලුණු දමා එය හොඳින් මිශ්‍ර කරන්නට වූවා ය.

ලෝරා හා මේරි ඔවුන්ට හැකි පමණින් උදවු කරමින හැමවිට ම එහි සිටිය හ. අම්මා මුදවාපු කිරිවලට ලුණු දැමූ විට කිරි කැබැලි කන්නට ඔවුහු ඉතා ප්‍රිය කළ හ ඒවා දත් අතරෙ තෙරපී සිහින් හඬක් නංවයි.

චීස් සෑදීම සඳහා අප්පච්චි පිටුපස මිදූලේ චෙරි ගස යට ලෑල්ලක් ගැසුවේ ය. ලෑල්ලේ දිග අතට පීලි දෙකක් කැපූ අප්පච්චි එක් කෙළවරක් අනෙක් කෙළවරට වඩා මදක් උස් වන සේ ලී කොට මත ලෑල්ල තැබුවේ ය. එහි පහත් කෙළවර යට හිස් බාල්දියක් තබන ලදි.

ලී චීස් අච්චුව ඒ ලෑල්ල මත තැබූ අම්මා, ඒ තුළ පිරිසිදු තෙත රෙදි කඩක් අතුරා ලුණු දැමූ මුදවපු කිරි කුට්ටිවලින් එය පිරවූවා ය. එය තවත් පිරිසිදු තෙත රෙදි කඩකින් වැසූ ඇය ඒ මත චීස් අච්චුව තුළට යන තරමට කුඩා වූ රවුම් ලෑල්ලක් තැබුවා ය. ඉන් පසු බර'ති ගලක් ගෙන ඒ ලෑල්ල මත තැබුවා ය.

මුළු දවස පුරා ම ගලේ බරට රවුම් ලෑල්ල සෙමින් සෙමින් චීස් අච්චුව තුළට ගිය අතර එවිට මෝරු උඩට මතු වී ලෑල්ලේ පීලි දිගේ ගලා ගොස් පහළට වැටුණේ ය.

ඊ ළඟ උදයේ අම්මා කිරි උණු කරන සාස්පානක් තරම් විශාල, ළා කහ පැහැති රවුම් චීස් කුට්ටියක් පිටතට ගත්තා ය. අනතුරුව ඇ තවත් මුදවපු කිරි සාදා චීස් අච්චුව යළිත් පිරෙව්වා ය.

සෑම උදෑසනක ම අච්චුවෙන් අලුත් චීස් ගත් අම්මා එය මටසිලුටු වන සේ කොන් කපා අයින් කළා ය. රෙදි කැබැල්ලක් එය වටේ තබා තදට සිටින සේ මැසූ ඇය, රෙදි කැබැල්ල පුරා අලුත් බටර් ආලේප කළා ය. ඉන් පසු චීස් කුට්ටිය ගබඩා කාමරයේ රාක්කයක තැන්පත් කළා ය.

දිනපතා ම ඇය සෑම චීස් කුට්ටියක් ම පරිස්සමට තෙත රෙදි කඩකින් පිසදා යළිත් වරක් ඒ මත අලුත් බටර් තවරා එහි අනෙක් පැත්ත චීස් කුට්ටිය මත ඇතිරුවා ය. දින ගණනාවකට පසු චීස් හොඳින් පදම් වූ අතර එය වටා ඝන සිවියක් පැදී තිබිණි.

අනතුරුව ඇය සෑම චීස් කුට්ටියක් ම කරදාසිවල ඔතා උස රාක්කයක තැන්පත් කළා ය. දැන් ඒවා කෑමට ගැනීම මිස වෙනත් කරන්නට දෙයක් ඇත්තේ නැත.

ලෝරා හා මේරි චීස් සෑදීම ප්‍රිය කළ හ. සපන විට හීන් හඬක් නංවන මුදවාපු කිරි කෑමට ඔවුහු ප්‍රිය කළ හ. චීස් කුට්ටිය වටා රෙදි කැබැල්ලක් තබා මසන්නට පෙර කහ පැහැ'ති ලෙසට රවුම් චීස් මටසිලුටු කිරීම සඳහා අම්මා විසින් කපා අයින් කරන ලද කොන් කැලි කෑමටත් ඔවුහු ප්‍රිය කළ හ.

ඔවුන් නොපැසුණු චීස් කනු දැක අම්මා සිනාසුණා ය.

"සමහරු කියනවා හඳ හැදිලා තියෙන්නෙ කොළ පාට චීස්වලින් ය කියලා," ඇය ඔවුන්ට කීවා ය.

අලුත් චීස් කුට්ටිය ගස් පිටුපසින් පායා එන සඳ මෙන් රවුම් ය. එහෙත් එය කොළ පැහැ නැත. එය සඳ මෙන් ම කහ පැහැ'ති ය.

"ඒක කොළ පාටයි තමයි," අම්මා කීවා ය. "මොකද කිවුවොත් ඒක තාම පැහිලා නෑ නෙව. හල් සිහිං කොදට පැහුණට පස්සෙ ඒක කොළ පාට චීස් වෙන්නෙ නෑ."

"ඇත්තට ම හඳ හැදිලා තියෙන්නෙ කොළ පාට චීස්වලින් ද?" යි ලෝරා ඇසූ විට අම්මා සිනාසුණා ය.

"හඳ කොළ පාට චීස් කුට්ටියක් වගේ හන්දා මිනිස්සු එහෙම කියනවා මගේ හිතේ," අම්මා කීවා ය. "ඒත් ඒ දෙකේ පෙනුම ඇහැ රවට්ටනවා." ඉන් පසු ඇය සියලු ම නොපැසුණු චීස් කුට්ටි පිසදා ඒවායේ බටර් තවරන අතර කිසිවක් නොවැඩෙන කුඩා ලෝකයක් බඳු මළ, සීතල සඳ ගැන ඔවුන්ට කියා දුන්නා ය.

අම්මා චීස් සෑදූ පළමු දිනයේ ලෝරා මෝරුවල රස බැලුවා ය. ඇ එය කළේ අම්මාට රහසින් වුව ද ඇ දෙස හැරී බලා ඇගේ මුහුණ දුටු කල අම්මාට සිනා පහළ විය. එදා රාත්‍රී ආහාරයෙන් පසු මේරි හා ලෝරා ඉඳුල් පිඟන් සෝදමින් සිටින විට, ලෝරා මෝරු කා කට ඇඹුල් කරගත් බව අම්මා අප්පච්චිට කීවා ය.

"ඔයා අම්ම ගෙ මෝරු කාලා හාමතින් මැරෙන්නෙ නෑ, මහලු ග්‍රිම්ස් එයා ගෙ හාමිනේ හදාපු මෝරු කාලා මැරුණා වගේ," යි අප්පච්චි කීවේ ය.

මහලු ග්‍රිම්ස් ගේ කතාන්දරය කියන ලෙස ලෝරා ඔහුට බැගෑපත් වූවා ය. ඉතින් වෙහෙස වී සිටිය ද අප්පච්චි පෙට්ටියෙන් රවුකිඤ්ඤය ගෙන එය වයමින් ලෝරාට ඇසෙන සේ ගයන්නට වූයේ ය:

"මහලු ග්‍රිම්ස් මියගියා, ගුණ යහපත් මහල්ලා,
ආයේ අපට ඔහු දකින්න බෑ,
ඔහු උඩ සිට පහළට බොත්තම් ඇල්ලූ,
අළු පාට පරණ කබායක් නිතරෝ ම ඇන්දා.

"මහලු ග්‍රිම්ස් ගෙ බිරිඳ හැදුවා යොදේ රහිත චීස්,
ඉතිරි වෙච්ච මෝරු බිව්වා අපේ මහලු ග්‍රිම්ස්,
බටහිර සිට නැගෙනහිර සුළඟක් හමා ඇවිත්,
රැගෙන ගියා දුර ඈතට අපේ මහලු ග්‍රිම්ස්."

"ඔන්න දැක්කා නේ ද!" අප්පච්චි කීවේ ය. "එයා බොහොම තපුරු, මසුරු ගෑනියෙක්. එයා කිරිවල යොදේ සේරම අරන් දැම්මෙ නැත්නම් මෝරුවල කිරි යොදේ ටිකක් හරි ඉතුරු වෙනවා. එතකොට මහලු ග්‍රිම්ස්ට ඒ මෝරු කාලා ටිකක් හරි පණ තියෙයි.

"ඒත් එයා යොදේ ඩිංගක්වත් ඉතුරු නොවෙන්න අරන්දැම්මා. ඉතින් දුප්පත් මහලු ග්‍රිම්ස් හොඳට ම කෙට්ටු වුණා. ඉතින් එයා ව හුළඟට ගහගෙන ගියා. හාමතින් ම එයාට මැරෙන්න සිද්ද වුණා."

අනතුරුව අප්පච්චි අම්මා දෙස බලා, "ඔයා ළඟ ඉන්දැද්දි කිසි කෙනෙක් හාමතින් මැරෙන්නෙ නෑ, කැරොලින්," යි කීවේ ය.

"අනේ නෑ," අම්මා කීවා ය. "එහෙම නෙවෙයි, චාල්ස්. අපට කෑම ගෙනත් දෙන්න ඔයා ඉන්නව නම් එහෙම වෙන්නෙ නෑ."

අප්පච්චි සතුටට පත් ව සිටියේ ය. සියල්ල ඉතා සතුටු සහගත විය. ග්‍රීෂ්ම සෘතුවේ සැඳෑවේ දොරවල් හා ජනෙල් සම්පූර්ණයෙන් ම විවර කොට තිබිණි. අම්මා සෝදමින් හා මේරි හා ලෝරා පිසදමමින් සිටින පිඟන්වලින් සිහින් ප්‍රීතිමත් නාද නැඟෙයි. අප්පච්චි රවුකිඤ්ඤය පසෙක තබා තමාට ම සිනාසෙමින් සිවුරුහන් කරන්නට වූයේ ය.

මද වේලාවකට පසු ඔහු, "මං හෙට උදේ හෙන්රිල ගෙදර යනවා, කැරොලින්. එයා ගෙ තඹුල් පෝරුව ඉල්ලගෙන එන්න ඕන. තිරිඟු යායෙ ගස් කොට වටේ පඳුරේ ගාණට උස වල් වැවිලා. කොයි වෙලාවෙත් ඊතට ඇහැරගෙන ඉන්න නැත්නම් එළි කරපු බිම ආයෙත් කැලෑවට ම යයි," යි කීවේ ය.

පසු දා හිමිදිරි උදයේ ම ඔහු හෙන්රි මාමා ගේ නිවසට පිටත් ව ගියේ ය. එහෙත් වැඩි වේලාවක් ගෙවී යාමට මත්තෙන ලහිලහියේ ආපිට ආ ඔහු අශ්වයින් ගැලට බැඳ පොරොවක බේසම් දෙකත්, නාන කටාරම හා නිවසේ ඇති සියලු ම භාජන හා ලී බාල්දිත් ගැලට දමාගත්තේ ය.

"මේ සේරම ඕන වේවි ද දන්නෙ නෑ, කැරොලින්," ඔහු කීවේ ය. "ඒත් බැරි වෙලාවත් ඕන වුණොත් එහෙම මේවා අරන් නොගිහින් වෙන්නෙ අලි පාඩුවක්."

"අනේ, මොනව ද ඒ? මොනව ද ඒ" යි ලෝරා උද්දාමය නිසා උඩ පනිමින් ඇසුවා ය.

"අප්පච්චිට මී වදයක් හම්බ වෙලා," අම්මා කීවා ය. "සමහරවිට එයා අපට මී පැණි ටිකක් ගෙනේවි."

අප්පච්චි ආපසු ගෙදර එන්නට කලින් ඉර මුදුන් විය. ඔහු එන තුරු මඟ බලා සිටි ලෝරා ගැල පිදුරු මඩුවේ නතර වූ විගස ඒ වෙත දිවුවා ය. එහෙත් ඇට ඒ තුළ බැලිය නො හැකි විය.

"කැරොලින්, ඇවිත් මේ පැණි බාල්දිය ගෙනිච්චොත් මං අස්සයා ලිහන්න පුළුවන්," ඔහු කතා කළේ ය.

ගැල වෙත ආ අම්මා බලාපොරොත්තු සුන් වූ හඬින් මෙසේ කීවා ය:

"කමක් නෑ, චාල්ස්, පැණි බාල්දියක වුණත් වටිනවා." ඊ ළඟට ගැල තුළ බැලූ ඇය අත් ඉහළට එසවූවා ය. අප්පච්චි සිනාසුණේ ය.

සියලු ම භාජන හා ලී බාල්දි රන්වන් මී වදවලින් පිරී තිබිණි. නාන බේසම් දෙකත්, කටාරමත් කට ළඟට ම පිරීගොසිනි

අප්පච්චි හා අම්මා බේසම් දෙකත්, කටාරමත්, සියලු ම බඳුන් හා ලී බාල්දිත් ගැලෙන් බා කිහිප වතාවකට ගෙතුළට ගෙන ගිය හ. රන්වන් මී වද කුට්ටි පිඟානකට පුරවාගත් අම්මා, ඉතුරු සියල්ල පරිස්සමට රෙදිවලින් වසා තැබුවා ය.

එදා රාත්‍රී ආහාරය සඳහා ඔවුන් හැම දෙනාට ම ඇති තරම ප්‍රණීත මී පැණි තිබිණි. මී වදය හමු වූ අයුරු අප්පච්චි ඔවුන්ට විස්තර කළේ ය.

"මං මගේ තුවක්කුව ගෙනිච්චෙ නැත්තෙ," ඔහු කීවේ ය. "මං ගියේ දඩයම් කරන්න නෙවෙයි හන්දා. අනික මේ ග්‍රීස්ම කාලෙ සත්තුන් ගෙන් ඒ හැටි කරදර වෙන්නෙ නෑ. අවුරුද්දෙ මේ කාලෙට අඳුන් දිවියොයි, වලස්සුයි කෑම කාලා ඇති පදං තර වෙලානෙ ඉන්නෙ. ඒ හන්දා උන් හරි ම කම්මැලියි. ඒ වගේ ම හරි හොඳයි.

"ඉතිං මං කැලෑවෙ කොට පාරකින් යන්න පටං ගත්තා. තව පොඩ්ඩෙන් මං තඩි වලහෙකු ගෙ ඇඟේ හැප්පෙනවා. මං පඳුරක් ළඟට එනකොට ඌ ඉන්නවා. හරියට මං මේ කාමරේ මෙහා කොනේ, ඌ එහා කොනේ ඉන්නවා වගේ.

"ඌ මං දිහා බැලුවා. මං හොඳටෝ ම දැනගත්තා ඌ මගේ අතේ තුවක්කුව නෑ කියලා දැක්ක බව. කොහොම හරි ඌ එච්චර උනන්දුවකින් මගේ දිහා බැලුවෙ නෑ.

"ඌ ලොකු ගහක් පාමුල හිටගෙන ඉන්නවා. මී මැස්සො ගුමු ගුමු ගගා ඌ වටේ කරකැවෙනවා. ඌගේ ඝන ලොම් නිසා ඌට අනින්න උන්ට බෑ. ඌ එක කකුලකින් ඔළුවෙ වහලා ඉන්න මී මැස්සෙ එළවනවා.

"මං එතන හිටගෙන ඌ දිහා බලා හිටියා. ඌ අනික් අත ගහේ බෙනයක් ඇතුළට දාලා මී පැණි අරගන්නවා. ඒ ටික ලෙව කාලා තවත් පැණි ගන්න ආයෙමත් අත ඇතුළට දානවා. ඒ වෙනකොට මට දණ්ඩක් හම්බ වෙලයි තිබුණෙ. මට ඒ මී පැණි ටික ඕන වුණා

"ඉතිං මං අර දණ්ඩෙන මහ සද්දෙට ගහකට ගහ ගයියෙන් තැගැහුවා. මේ වලහා හරි මහතයි. ඒ වගෙ ම පැණිවලින් පිරිලා. ඒ හන්දා ඌ හතර ගාතෙන් වැනි වැනි ඝන අස්සෙන් ගාට ගාට යන්න ගියා. මං ඌ පස්සෙ ටික දුරක් එළවගෙන ගියා, ඉතිං ඌ මී වදේ තියෙන ගහෙන් ඈත්වෙලා හයියෙං යන්න පටන් ගත්තා. ඊට පස්සෙ මං ගැල ගෙනියන්න ගෙදර ආවා."

මී මැස්සන් ගේ දළවලින් බේරී මී පැණි එතනු කළ කෙසේ දැයි ලෝරා ඔහුගෙන් ඇසුවා ය.

"ඒක ලේසියි," අප්පච්චි කීවේ ය. "මං මී මැස්සන්ට විදින්න බැරි තැනක කැලෑවේ අස්සයො නවත්තලා ගහ ළඟට ගිහිං ගහ කපලා දෙකට පැළුවා."

"ඉතිං මී මැස්සො ඔයාට ඇන්නෙ නැද්ද?"

"නෑ," අප්පච්චි කීවේ ය. "මී මැස්සො කවදාවත් මට අනින්නෙ නෑ.

"ඒ මුළු ගහ ම බෙනයක්. ඒ බෙනේ උඩ ඉඳලා පල්ලෙහාට ම මී පැණි පිරිලා. මී මැස්සො අවුරුදු ගාණක් තිස්සෙ ඒකෙ පැණි එකතු කරලා තියෙන්න ඇති. සමහර ඒවා පරණයි, කළු පාටයි. ඒත් කාලයක් පාවිච්චි කරන්න පුළුවං තරමට හොඳ පිරිසිදු මී පැණි මට හම්බ වුණා මගේ හිතේ."

අසරණ මී මැස්සන් ගැන ලෝරාට දුක සිතිණි. ඇය මෙසේ කීවා ය:

Scanned with CamScanner

"ඒගොල්ලො හරියට මහන්සි වෙලා වැඩ කෙරුවා. ඒත් දැන් ඒගොල්ලන්ට පැණි නෑනෙ."

එහෙත් උන්ට තව මී පැණි ඉතිරි ව ඇති බවත්, උන්ට යා හැකි තවත් විශාල බෙනයක් සහිත ගසක් ඒ අසල ඇති බවත් අප්පච්චි කීවේ ය. උන්ට අලුත්, පිරිසිදු නිවසක් සාදාගැනීමට කාලය උදා වී ඇති බව ඔහු කීවේ ය.

උන් ඔහු පරණ ගසේ ඉතිරි කළ මී පැණි එකතු කර ඒවායින් නැවුම්, පිරිසිදු මී පැණි සාදා උන් ගේ අලුත් නිවහනෙහි තැන්පත් කරනු ඇත. උන ඉහිරුණු සෑම පැණි බිඳුවක් ම එකතු කර ඒවා ගබඩා කර තබනු ඇත. එවිට උන්ට සීත කාලය එළැඹීමට බොහෝ කාලයකට පෙර ඇති තරම් පැණි යළිත් ලැබෙනු ඇත.

11 පරිච්ඡේදය

අස්වැන්න

අප්පච්චි හා හෙන්රි මාමා හවුලේ හේන්වල වැඩ කරන්නට වූ හ. හේනේ ධාන්‍ය පැසුණු පසු හෙන්රි මාමා අප්පච්චිට සහාය වීමට පැමිණි අතර, පොලි නැන්දා හා ඔවුන් ගේ දරුවෝ ද දවස ගත කිරීම සඳහා එහි ආ හ. හෙන්රි මාමා ගේ හේනේ ධාන්‍ය පැසුණු විට අප්පච්චි ඔහුට සහාය වීමට යන විට අම්මා ලෝරා, මේරි හා කේරි ද කැටුව පොලි නැන්දා ගේ නිවසේ දවස ගත කිරීමට ගියා ය.

අම්මා හා පොලි නැන්දා නිවසේ වැඩපළ කළ අතර ළමයි ද කෑම වේලාව එන තුරු ගෙවත්තේ සෙල්ලම් කළ හ. පොලි නැන්දා ගේ ගෙවත්ත සෙල්ලම් කිරීමට කදිම ස්ථානයකි. එහි ගස්වල කොට ඉතා මහත ය. ඉතින් ළමයි පොළොව නො අල්ලා ම කොටයෙන් කොටයට පනිමින් සෙල්ලම් කරන්නට වූ හ.

කුඩා ම ළමයා වුව ද ලෝරාට කුඩා ගස් එක ළඟ වැටී තිබූ තැන්වල දී ලෙහෙසියෙන් ම පැනිය හැකි විය. පොලි නැන්දා ගේ පුතා වන චාලි එකොළොස් හැවිරිදි වියේ පසු වූ ලොකු පිරිමි ළමයෙකි. ඔහුට මුළු ගෙවත්ත පුරා ම කොටයෙන්

කොටයට පැනීමට හැකි විය. කුඩා ම කොට මත එක වරකට දෙවරක් පැනීමට ඔහුට හැකි වූ අතර ඔහු බිය නැති ව ඉනි වැට උඩ ඇවිද්දේ ය.

අප්පච්චි හා හෙන්රි මාමා දෑකැතිවලින් මිට කපමින් හේනේ සිටිය හ. දෑකැත්ත සාදා තිබුණේ ලී පතුරුවලින් තනන ලද රාමුවකට බඳින ලද මුවහත් වානේ තලයකිනි. වානේ තලයෙන් ධාන්‍ය කපන විට ලී රාමුව ධාන්‍යවල තවුව අල්ලා තබාගනියි. දිගු, වක් වූ මිටෙන් දෑකැති අල්ලාගත් අප්පච්චි හා හෙන්රි මාමා වානේ තලය ඉහළ නැගී සිටින මිට ගස් වෙත යවමින් ධාන්‍ය කැපූ හ. ගොඩකට සෑහෙන මිට කැපූ පසු ඔවුනු ලී රාමුව තුළ රැඳුණු කැපූ මිට ගස් බිම ගොඩගසන ලද ගොඩවල්වලට දැමූ හ.

ගිනි අව්වේ පිච්චෙමින්, හේන පුරා ඇවිද ඇවිද ඇතේ වෙර යොදා බර'නි දෑකැත්තෙන් ධාන්‍ය කැපීමත්, ඒවා ගොඩගැසීමත් අසීරු කටයුත්තකි.

ධාන්‍ය කැපීම අවසන් වූ පසු ඔවුන් යළිත් හේන පුරා යා යුතු ය. එවර ඔවුනු සෑම මිටි ගොඩක් අසල ම නැවතී දඟින් ම මිටි නවු කිහිපයක් බැගින් ගෙන ඒවා එක්කොට දිග ලණුවක් සැදූහ. අනතුරුව ඇඟින් ම ධාන්‍ය ගොඩවල් එක්කොට අර ලණුවෙන් තදට තදේ ගැට ගසති.

එවැනි මිටි හතක් සෑදූ පසු ඒවා එක කොටසකට ගැසිය යුතු ය. ඔවුනු ධාන්‍ය මිටි ගොඩගැසීම සඳහා මිටි පසක් ඔව ඇර අහළට සිටින සේ කෙළින් අතට එකට ගේන්දු කර තබති. ඊ ළඟට ඒවා පින්නෙන් හා වර්ෂාවෙන් ආරක්ෂා කරගැනීම සඳහා සෙවණක් වන සේ තවත් මිටි දෙක ඊට උඩින් තබා ඒවායේ ගස් හොඳින් ඒ මත අතුරා කුඩා වහලක් සේ සකස් කරති.

මෙසේ කපන ලද සෑම මිටි ගසක් ම රාත්‍රිය එළැඹෙන්නට පෙර ධාන්‍ය මිටි අතර සෑම විට ම ආරක්ෂා සහිත වෙයි. නැති නම් මුළු රැය පුරා ම තෙතමනය සහිත පොළොව මත තැබීමෙන් ඒවා නරක් විය හැකි ය.

පුළඟ ඉතා බර'නි. උණුසුම් හා තිස්වල ඔවුන් පැ කෙටින් හැන්දෑ වන විට වර්ෂාව ඇද වැටෙතැයි සිතූ අප්පච්චි හා හෙන්රි මාමා, ඉතා වෙහෙස වී වැඩ කළ හ. මිටි පැසී ඇති බැවින් වර්ෂාව වැටෙන්නට පෙර ඒවා කපා ගොඩගැසුවේ නැති නම් අස්වැන්න නොලැබෙනු ඇත. එවිට හෙන්රි මාමා ගේ අස්වයින්ට මුළු සීත සෘතුව පුරා ම හාමතේ ඉන්නට සිදු වනු ඇත.

මධ්‍යාහ්නයේ දී ලහිලහියේ නිවෙසට පැමිණි අප්පච්චි හා හෙන්රි මාමා, හැකි තරම් ඉක්මනින් දවල් කෑම කෑ හ. සවස් භාගයේ චාලි ද ඔවුන්ට උදවු කිරීම සඳහා හේනට ආ යුතු බව හෙන්රි මාමා කීවේ ය.

හෙන්රි මාමා එසේ කියන විට ලෝරා අප්පච්චි දෙස බැලුවා ය. හෙන්රි මාමා හා පොලී නැන්දා චාලි ව නරක් කරන බව නිවසේ දී අප්පච්චි අම්මාට කියනු ඇ අසා ඇත. එකොළොස් හැවිරිදි ළමයෙකු ව සිටිය දී අප්පච්චි ගොන් රැනක් සමඟ දිනපතා කෙතේ දක්ෂ ලෙස වැඩ කළේ ය. එහෙත් ඒ වයසේ ම සිටින චාලි කිසි ම වැඩක් කරන්නේ නැත.

චාලි හේනට ආ යුතු බව ඇත් හෙන්රි මාමා කියයි. ඔහු ඔවුන්ට වැඩ රාශියක් කර දිය යුතු ය. ඔහු උල්පතට ගොස් වතුර

ගෙන ආ යුතු ය. ඔවුන්ට බීමට වතුර අවශ්‍ය වූ විට වතුර ජෝගුව ගෙනැවිත් දිය යුතු ය. වාහේ තල මුවහත් කිරීමට අවශ්‍ය වූ විට මුවහත් ගල ගෙනැවිත් දිය යුතු ය.

ළමයි හැම දෙනා ම වාලි දෙස බැලූ හ. හේනට යාමට වාලිට ඕනෑ නො වී ය. ඔහුට ඕනෑ වූයේ ගෙවත්තේ නැවතී සෙල්ලම් කිරීමටයි. එහෙත් ඔහු මෙවේලේ වචනයක්වත් කීවේ නැත.

අප්පච්චි හා හෙන්රි මාමාට විවේකයක් නො වී ය. කෑම ගත් හැටියේ ඔවුහු යළිත් වැඩට ගිය හ. වාලි ද ඔවුන් හා ගියේ ය.

දැන් කණ්ඩායමේ ලොකු ම ළමයා මේරි බැවින් තැන්පත් නෝනා කෙනෙකු ගේ සෙල්ලමක් කිරීමට ඇට ඕනෑ විය. ඉතින් සැන්දෑවේ සියලු දෙනා ම එක් ව ගෙවත්තේ සෙල්ලම් ගෙයක් සෑදූ හ. ගස් කොට නිවසේ මේස, පුටු හා ගිනි උදුන් විය. කොළ පිගන් ද, ලී ළමයින් ද විය.

රාත්‍රියේ ආපසු ගෙදර එන අතර හේනේ දී සිදු වූ සියල්ල අප්පච්චි අම්මාට කියනු ලෝරාට හා මේරිට ඇසිණි.

අප්පච්චිට හා හෙන්රි මාමාට උදවු කරනු වෙනුවට වාලි ගාව හැකි තරම් කරදර ඔවුන්ට ගෙන දුන්නේ ය. ඔහු ඔවුන් ගේ ටර හරස් කරමින් සිටි නිසා ඔවුන්ට ඔට් ගස් වෙත ගොස් දෑකැත්තෙන් ධාන්‍ය කැපීමට අසීරු විය. ඔහු තරගල සැඟවූ බැවින් වාහේ තලය මුවහත් කිරීමට අවශ්‍ය වූ විට ඔවුන්ට එය සොයමින් කාලය ගත කරන්නට සිදු විය. හෙන්රි මාමා තුන් හතර වතාවක් ම කෑගාන තුරු ඔහු වතුර ජෝගුව ගෙනැවිත් දුන්නේ නැත. ඊ ළඟට ඔහු බුම්මාගෙන සිටින්නට වූයේ ය.

ඉන් පසු ඔහු ඔවුන් පසු පස යමින් කතා කරන්නටත්, නොයෙකුත් ප්‍රශ්න අසන්නටත් වූයේ ය. ඉතා වෙහෙස වී වැඩ කරමින් සිටි ඔවුන්ට ඔහු ගේ කතාවලට සවන් දෙන්නට ඉස්පාසුවක් නො වී ය. එබැවින් තමන්ට කරදර නොකර පැත්තකට වී සිටින ලෙස ඔවුහු ඔහුට කී හ.

මද වේලාවකට පසු ඔහු යටිගිරියෙන් මොරදෙනු ඇසුණු කල ඔවුහු අත වූ දෑකැති අතහැර කෙත හරහා ඔහු සිටින තැනට දුව ගිය හ. කෙත වටා ගන කැලෑව වූ අතර ඔට් ගස් අතර සර්පයෝ ද සිටිය හ.

ඔහු වෙත දුව ගිය කල ඔහුට කිසිදු අනතුරක් සිදු වී නැති බව ඔවුන් විසින් දක්නා ලදි. ඔහු ඔවුනට සිනාසෙමින් මෙසේ කීවේ ය:

"දෙන්න ම හොඳට ම රැවටුණෝ!"

තමා හෙන්රි මාමා නම් කොල්ලා ගේ නැහැදූණුකමට හොඳ මට්ටුවක් කරන බව අප්පච්චි කීවේ ය. එහෙත් හෙන්රි මාමා එවැන්නක් කළේ නැත.

ඉතින් වතුර බී පිපාසය නිවාගත් ඔවුහු යළිත් තමන් ගේ කටයුත්තේ නිරත වන්නට වූ හ.

පෙර පරිදි ම වාලි තුන් වතාවක් ම යටිගිරියෙන් මොරදුන් අතර ඒ හැම වතාවක ම ඔවුහු හැකි තරම් වේගයෙන් ඔහු වෙත දුව ගිය හ. එවිට ඔහු ඔවුන්ට සිනාසුණේ ය. එය ඉතා හොඳ විහිළුවක් බව ඔහු සිතුවේ ය. එහෙත් තවමත් හෙන්රි මාමා ඔහු ගේ නරක විහිළුවට තැළුවේ නැත.

හතරවැනි වතාවේ ඔහු අන් වතාවලට වඩා මහ හඬින් මොරදුන්නේ ය. අප්පච්චි හා හෙන්රි මාමා ඔහු දෙස බැලූ හ. ඔහු බෙරිහන්දෙමින් ද, උඩ පනිමින් ද සිටියේ ය. ඔහුට කිසි දු අනතුරක් වී ඇති බවක් ඔවුන්ට නොපෙනුණු අතර ඔහු බොහෝ වාරයක් තමන් ව රැවැට්ටූ බැවින් ඔවුහු ඔහු ගැන තැකීමක් නොමැති ව දිගට ම තමන් ගේ කටයුත්තේ නිරත වන්නට වූ හ.

වාලි පළාත ම දෙවනත් වන තරම් මහ හඬින් නොනවත්වා ම කෑගැවේ ය. අප්පච්චි කිසිවක් කීවේ නැත. එහෙත්, "ඕනතරම් කෑගාපුදෙන්," යැයි හෙන්රි මාමා කීවේ ය. ඉතින් ඔවුහු ඔහුට ඇති තරම් කෑගාන්නට ඉඩ හැර ධාන්‍ය කැපූ හ.

ඔහු උඩ පනිමින් නොනවත්වා ම මරහඬතැළුවේ ය. එහි අවසානයක් නො වී ය. අන්තිමේ දී හෙන්රි මාමා මෙසේ කීවේ ය:

"මෙදා පොටේ ඇත්තට ම මොකක් හරි වෙලා වගේ," ඔවුහු අත වූ දෑකැති බිම හෙළා කෙත හරහා ඔහු වෙත දිවූ හ.

වාලි ඒ මුළු වේලාවේ ම සිට ඇත්තේ යෙලෝ ජැකට්ස්* මී මැස්සන් ගේ කූඩුවක් මත උඩ පනිමිනි.

* යෙලෝ ජැකට්ස් - කහ පාට පිටක් ඇති, එනම් ඊ මැසි වර්ගය.

යෙලෝ ජැකට්ස් මී මැස්සන් පොළොවේ සාදන ලද වදයක ජීවත් වූ අතර චාලිට වැරැදීමකින් ඒ කුඩුව පෑගී තිබේ. දීප්තිමත් කහ පැහැති පිටක් සහිත කුඩා මී මැස්සෝ එක පොදියට කුඩුවෙන් පිටතට පැමිණ ඉවත පැන යා නො හැකි සේ උන් ගේ විෂ දළවලින් චාලිට විදින්නට වූ හ.

ඔහු උඩ පනින්නට වූ අතර සිය ගණන් මී මැස්සෝ ඔහු ගේ මුළු සිරුර පුරා ම විෂ දළ පහර එල්ල කළ හ. උහු ඔහු ගේ මුහුණටත්, අත්වලටත්, ගෙලට හා නාසයත් විදින්නට වූ හ. උහු ඔහු ගේ කලිසම් කකුල් දිගේ ඉහළට නගිමින් විද්ද හ. ඔහු ගේ ගෙල දිගේ පහළට බඩගාමින් විද්ද හ. ඔහු වැඩියෙන් උඩ පනිමින් බෙරිහන් දෙන තරමට උහු වැඩියෙන් ඔහුට විද්ද හ.

අප්පච්චි හා හෙන්රි මාමා ඔහු ගේ අත්වලින් අල්ලා ඔසවාගෙන ඔහු ව යෙලෝ ජැකට්ස් මී මැස්සන් ගේ කුඩුවෙන් ඉවතට ගෙන ගිය හ. ඊ ළඟට ඔවුහු ඔහු ගේ ඇඳුම් ගලවාදැමූ හ. ඔහු ගේ ඇඳුම්වල මී මැස්සන් පිරී සිටි අතර උන් ගේ දළ පහරින් ඔහු ගේ සියොලඟ ම තඩිස්සි වී තිබිණි. ඔහුට විදිමින් සිටි මී මැස්සන් මරාදැමූ ඔවුහු, ඇඳුම්වල සිටි මී මැස්සන් ගසාදමා යළිත් ඇඳුම් අන්දවා ඔහු ව නිවසට එවූ හ.

ගෙවත්තට වී නිහඬ ව සෙල්ලම් කරමින් සිටි ලෝරාට, මේරිට හා අනෙක් ළමයින්ට උස් හඬින් කෙරෙන දුක්බර හැඬුමක් ඇසිණි. චාලි බෙරිහන් දෙමින් ගෙවත්තට ආ අතර ඔහු ගේ මුහුණ කෙතරම් ඉදිමී තිබුණේ ද යත් ඔහු ගේ ඇස්වලින් කඳුළු ගැලුවේ නැත.

ඔහු ගේ ඇස් ද, ගෙල ද ඉදිමී තිබූ අතර කම්මුල් විශාල වී, තඩිස්සි වී තිබිණි. ඔහු ගේ ඇඟිලි දරදඬු වී, ඉදිමී තිබිණි.

ලෝරා, මේරි හා අනෙක් ළමයි සිටගත් වන ම ඔහු දෙස බලා සිටිය හ.

ගෙතුළ සිට දුව ආ අම්මා හා පොලී නැන්දා සිදු වූයේ කුමක් දැයි ඔහු ගෙන් අසන්නට වූ හ. චාලි හඬමින් බෙරිහන්දුන්නා පමණි. ඔහුට මී මැස්සන් විද ඇති බව අම්මා කීවා ය. මිදුලට දුව ගිය ඈ ලොකු බඳුනකට මැටි පුරවාගෙන එන අතර පොලී නැන්දා චාලි ව ඇතුළට ගෙන ගොස් ඔහු ගේ ඇඳුම් ඉවත් කළා ය.

විශාල මඩ බඳුනක් පිළියෙල කළ ඔවුහු, ඔහු ගේ මුළු සිරුර පුරා මඩ ගැල්වූ හ. ඊ ළඟට පරණ ඇතිරිල්ලකින් ඔහු ගේ මුළු

සිරුර ම ඔතා ඇඳේ දිගා කළ හ. ඔහු ගේ ඉදිමුණු ඇස් වැසී තිබූ අතර ඔහු ගේ නාසය විකට ස්වභාවයක් ගත්තේ ය. අම්මා හා පොලි නැන්දා ඔහු ගේ මුළු මුහුණේ ම මඩ ආලේප කර රෙදිවලින් ඒවා හොඳින් තද කර බැන්ද හ. සම්පූර්ණයෙන් ම රෙදිවලින් වැසුණු ඔහු ගේ සිරුරේ දැන් පෙනෙන්නට ඇත්තේ නාසය හා මුව පමණි.

පොලි නැන්දා ඔහු ගේ උණට දෙනු පිණිස බෙහෙත් පැළෑටි කිහිපයක් තැම්බුවා ය. ලෝරා, මේරි හා අනෙක් ළමයි ඔහු ගේ ඇඳ වටා සිටගෙන මඳ වේලාවක් ඔහු දෙස බලා සිටිය හ.

අප්පච්චි හා හෙන්රි මාමා කෙතේ සිට ගෙදර එන විට රෑ බෝ වී තිබිණි. සියලු ම ඕට් ගස් ගොඩගසා තිබූ අතර, දැන් වර්ෂාවෙන් ඒවාට කිසි දු හානියක් සිදු වන්නේ නැත.

අප්පච්චි රෑ කෑම සඳහා නතර වූයේ නැත. ඔහුට ගෙදර ගොස් දෙනුන් ගෙන් කිරි දෙවීමට තිබිණි. දැනටමත් දෙනුන් මඩුවේ ගාල් වී සිටිනා අතර වේලාවට උන් ගෙන් කිරි දෙවුවේ නැති නම් උන් යහමින් කිරි දෙන්නේ නැත. ඔහු ඉක්මනින් ම අශ්වයන් ගැලට බැඳගත් පසු සියලු දෙනා ම ගැලට නැගගත් හ.

ඉතා වෙහෙස වී සිටි අප්පච්චි ගේ ඇස් රිදුම් දෙමින් තිබිණි. එබැවින් ඔහුට ඉතා හොඳින් ගැල පැදවීමට නො හැකි විය. එහෙත් අශ්වයෝ නිවසට යන පාර හොඳින් දැනසිටිය හ. අම්මා කුඩා කෙරීන් සමග අප්පච්චි අසල වාඩිවී සිටි අතර ලෝරා හා මේරි පිටුපස ලෑල්ල මත වාඩිවී සිටිය හ. චාලි කළ කී දේ පිළිබඳ ව අප්පච්චි කියනු ඔවුන්ට ඇසුණේ එවිට ය.

ලෝරා හා මේරි තැතිගත් හ. ඔවුහු ද නොයෙක් විට මුරණ්ඩුකම් කරති. එහෙත් ළමයෙකුට චාලි තරම් මුරණ්ඩු විය හැකි බවක් ඔවුන් කිසි දා දැනසිටියේ නැත. ඔහු ඕට් එකතු කිරීමට උදවු වූයේ නැත. ඔහු ගේ පියා කිසිවක් කී විට ඔහු වහා එයට කීකරු වූයේ ද නැත. ඔහු කළේ අප්පච්චි හා හෙන්රි මාමා වෙහෙස වී වැඩ කරන අතරේ ඔවුන්ට කරදර ගෙන දීම පමණි.

ඉන් පසු යෙලෝ ජැකට්ස් මී මැස්සන් ගේ කූඩුව පිළිබඳ ව අප්පච්චි මෙසේ ද කීවේ ය:

"හොඳ පාඩම පුංචි බොරුකාරයට."

ඒ රාත්‍රියේ මිටි ඇඳේ වැතිරුණු ලෝරා වැහි බිඳු වහලයට වැටී නංවන බෙර හඬටත්, ඒවා පියසි දිගේ ගලා ගොස්

පොළොවට වැටෙන හඬටත් සවන් දුන්නා ය. ඇයට අප්පච්චි ගේ [illegible] මතක් විය.

යෙලෝ ජැකට්ස් මී මැස්සන් චාලිට කළ හදිය ගැන ඇය කල්පනා කළා ය. එය චාලිට හොඳ පාඩමක් බව ඇය ද සිතුවා ය. ඔහු ඉතා අකීකරු ළමයෙකු වූ බැවින් එය ඔහුට හොඳ පාඩමකි. ඔහු උන් ගේ කූඩුව පාගා දැමූ බැවින් මී මැස්සන් ඔහුට විෂ දළ පහර දීම සාධාරණ ය.

එහෙත් අප්පච්චි චාලිට 'පුංචි බොරුකාරයා' යි කීවේ ඇයි දැයි ඇයට තේරුම් ගත නො හැකි විය. වචනයක්වත් කතා නොකළ චාලි, බොරුකාරයෙකු වූයේ කෙසේ දැයි ඇය නොදන්නා ය.



12 පරිච්ඡේදය

අරුම පුදුම යන්ත්‍රය

ඊළඟ දිනයේ අප්පච්චි ඕට් මිට් කිහිපයකින් ධාන්‍ය සහිත කොටස් කපා පිරිසිදු, දීප්තිමත් කහ පැහැයකින් යුතු ඕට් ගස් අම්මාට ගෙනැවිත් දුන්නේ ය. ඇය ඒවා පෙඟී මෘදු වීම සඳහා වතුර බේසමක බහා තැබුවා ය. අනතුරුව වතුර බේසම අසල පුටුවක හිඳගත් ඇය ඕට් ගස් ගොතන්නට වූවා ය.

ඕට් ගස්වලින් කිහිපයක් ගත් ඇය, ඒවායේ කෙළවර එකට ගැටගසා ගෙතීම ඇරඹුවා ය. ගස් විවිධ දිග ප්‍රමාණවලින් යුතු වූ අතර එක් ගසක් ගොතා හමාර වන්නට ළං වෙත් ම ඇය බේසමෙන් අලුත් දිග ගසක් ගෙන ගොතා අවසන් කළ ගසට තබා දිගට ම ගොතන්නට වූවා ය.

ගෙතූ පටිවල අග යළිත් වතුර බේසමට වැටෙන්නට ඇමූ ඇය, පටි යාර ගණනක් වන තුරු ගෙතුම දිගට ම කරගෙන ගියා ය. දවස් ගණනාවක් පුරා විවේකයක් ලද හැම විටෙක ම මෙසේ ඇය ඕට් ගස්වලින් පටි ගෙතුවා ය.

ඇය කුඩා ම ගස් හතකින් මටසිලුටු බවින් යුතු සිහින් පටියක් ගෙතුවා ය. ඉන් පසු විශාල ගස් නවයකින් පළල් පටියක් ගෙතූ ඇය

එහි සෑම දාරයක් වටා ම කන්තු කැපුවා ය. ඊ ළඟට ඉතා විශාල ගස්වලින් හැම පටියකට ම වඩා පළල් පටියක් ගෙතුවා ය.

සියලු ම පටි ගොතා හමාර කළ පසු ඉදිකටුවකට ගස්තිමක් සුදු නූලක් ඇමූ ඇය එක් පටියක කෙළවරින් පටන්ගෙන රවුමට රවුමට එය මසන්නට වූවා ය. මසා අවසන් වූ පසු එය පැතලි පැදුරක් මෙන් වූ අතර එය තොප්පියක මුදුන බව අම්මා කීවා ය.

ඊ ළඟට පටියේ එක් කෙළවරක් තදින් අල්ලාගත් ඇය යළිත් රවුමට රවුමට මසන්නට වූවා ය. පටිය ඉදිකටුව සමඟ ඇදෙමින් තොප්පියේ මුදුන් කොටසේ පැති සකස් කළේ ය. මුදුන අවශ්‍ය තරමට උස් වූ පසු, අම්මා පටිය ලිහිල් ව අල්ලාගෙන යළිත් වටේට ම මැසුවා ය. පැතලියට ගෙතූ කොටස තොප්පියේ වාටිය විය.

වාටිය ඇති තරම් පළල් වූ පසු අම්මා පටිය කපා ගෙතුම නොලිහෙන පරිදි ඉක්මනින් එහි අග මැසුවා ය.

අම්මා ඉතා පටු, සිහින් ම පටිවලින් මේරිට හා ලෝරාට තොප්පි සෑදුවා ය. පළල් කන්තු කැපූ පටිවලින් සෑදූ තොප්පි ඇටත්, අප්පච්චිටත් ය. එය අප්පච්චිට ඉරිදාට පැළඳීම සඳහායි. ඊ ළඟට ඇය ඉතා පළල් පටිවලින් අප්පච්චිට එදිනෙදා බර වැඩ කරන විට පළඳින්නට තොප්පි දෙකක් සෑදුවා ය.

තොප්පියක් සාදා අවසන් වූ විට ඇය එය තදිමට හැඩ කොට වියළීම සඳහා ලෑල්ලක් මත තැබුවා ය. ඒවා වියළුණු පසුවත් ඈ එයට දුන් හැඩයෙන් ම පැවැතිණි.

අම්මාට ලස්සණ හිස් වැසුම් සාදන්නට හැකි ය. ඈ එය කරන අයුරු බලා සිටින්නට ප්‍රිය කළ ලෝරා, ඕට් ගස් ගොතන්නට ඉගෙනගෙන චාලට්ට කුඩා හිස් වැස්මක් සෑදුවා ය.

දවස් ඉතා කෙටි වන්නට වූ අතර රාත්‍රි කාලය ඉතා සීතල විය. එක් රැයෙක ජැක් ෆ්‍රොස්ට් ඔවුන් ගේ නිවෙස අවට සක්මන් කර තිබූ අතර පසුදා උදයේ මහ වනයේ කොළ පැහැති ගස් අතර දීප්තිමත් පැහැයන් රැඳී තිබෙනු දැකගත හැකි විය. ඉන් පසු ගස්වල පත්‍ර, කොළ පැහැ වීම නැවතිණි. කහ, තද රතු, තැඹිලි, රන්වන් හා දුඹුරු පැහැයන් ගෙන් අතු පතර වර්ණවත් විය.

ඉනි වැට දිගේ වැවුණු සුමැක්* ගස්වල දීප්තිමත් රක්ත වර්ණ කොළ අතරින් ඒවායේ තද රතු ගෙඩි දිලිසෙයි.

* සුමැක් - සායම් කිරීමට පත්‍ර ලබාගන්නා ශාක විශේෂයක්

ඔක් ගස්වලින් ගෙඩි වැටෙනනට වූ අතර ලෝරා හා මේරි සෙල්ලම් ගෙවල් සඳහා කුඩා ඔක් ගෙඩිවලින් කෝප්පත්, පීරිසිත් සාදාගත් හ. මහ වනයේ පොළොව වෝල්නට්* හා හිකරි ගස්වල ගෙඩිවලින් වැසුණු අතර ලේන්නු කඩිමුඩියේ සෑම තැන ම දුවමින් ගෙඩි එකතු කර සීත කාලයේ දී කෑමට ගනු පිණිස ගස් බෙනවල සැඟවූ හ.

ලෝරා හා මේරි, වෝල්නට්, හිකරි හා හැසල්නට් ගෙඩි එකතු කරනු පිණිස අම්මා සමග කැලෑවට ගිය හ. ඔවුහු ඒවා වියළෙනු වස් අව්වේ තබා ඉන් පසු වියළුණු ගෙඩිවල පිට පොත්ත තළා ඇතුළත ඇති මදය ගෙන සීත සෘතුවේ ප්‍රයෝජනය සඳහා අටුවේ තැබූ හ.

විශාල රවුම් වෝල්නට් ගෙඩි, ඉතා කුඩා හිකරි ගෙඩි හා පඳුරුවල එක පොකුරට වැවෙන හැසල්නට් ගෙඩි එකතු කිරීම විනෝදජනක ය. වොල්නට් ගෙඩිවල මොළොක් පිට පොත්ත දුඹුරු පැහැති යුෂවලින් පිරී තිබූ අතර ඒවා ඔවුන් ගේ ඇත්වල පැල්ලම් ඇති කළේ ය. හැසල්නට් ගෙඩිවල පිට පොත්ත සුවඳින් මෙන් ම රසයෙන් ද ඉතා ප්‍රණීත විය. ලෝරා එය දැනගත්තේ මදය ඉවතට ගැනීම සඳහා එහි පිට පොත්ත දත්වලින් හැපූ විටක දී ය.

දැන් හැම දෙනා ම කාර්යබහුල වී සිටිය හ. එළවළු කොටුවේ වැඩුණු සියලු ම එළවළු වර්ග ගෙතුළ ගබඩා කළ යුතු ය. ලෝරා හා මේරි, අප්පච්චි පොළොවෙන් උදුරන ලද දූවිලි සහිත අර්තාපල් එකතු කරමිනුත්, දිග තහ පැහැ'ති කැරට් හා ඉහළ කොටස දම් පැහැගත් රවුම් ටර්නිප් අල උදුරමිනුත් ගෙදර වැඩට සහාය වූ හ. අම්මාට වට්ටක්කා පස්තැල සෑදීම සඳහා වට්ටක්කා පිසින්නට උදවු කළේ ද ඔවුන් ය.



* වෝල්නට් - ලී බඩු සෑදීමට ගන්නා හොඳ ලී ඇති ගස් වර්ගයක්. මේවායේ ගෙඩි කෑමට ගනු ලැබේ.

අම්මා ඇගේ මස් පිහියෙන් විශාල කැබලි වලට වට්ටක්කා ගෙඩි දෙපළු වන සේ කැපුවා ය. මැද ඇති ඇට ඉවත් කළ ඇය ඒවායේ පොතු ඇර දිග පෙති කැපුවා ය. පෙති තවදුරටත් කැබැලිවලට කැපීමට ලෝරා ඇට උදවු වූවා ය.

උදුන මත තබන ලද ලොකු යකඩ බඳුනට වට්ටක්කා කැබැලි දැමූ අම්මා, එයට වතුර ස්වල්පයක් වත්කළා ය. ඉන් පසු මුළු දවස පුරා ම වට්ටක්කා හෙමි හෙමින් තැම්බෙන අතරේ ලිමසිලිමත් වූවා ය. බඳුනේ සියලු ම වතුර හා ඉස්ම සිඳිය යුතු අතර වට්ටක්කා රොස් නොවිය යුතු ය.

බඳුනේ වූ වට්ටක්කා තද පැහැ'ති, ප්‍රණීත සුවඳක් ඇති උකු මිශ්‍රණයක් බවට පත් විය. එය වතුර මෙන් උතුරා හියේ නැති මුත් වහා විවර වී එසැණින් ම වැසී යන සිදුරු සාදමින් බුබුලු දමන්නටත්, පිපිරී යන්නටත් විය. බුබුලු පිපිරෙන සෑම විටෙක ම උණුසුම්'ති, ප්‍රණීත වට්ටක්කා සුවඳ හමා ආවේ ය.

ලෝරා පුටුවක් මතට නැග වට්ටක්කා බඳුන රොස් නොවන සේ ලී හැන්දකින් එය හැඳිගාන්නට වූවා ය. ඇය හැන්ද දෑතින් ම අල්ලාගෙන පරිස්සමට එය හැඳි ගෑවා ය. වට්ටක්කා පිළිස්සී ගිය හොත් වට්ටක්කා පස්තැල කෑමට ලැබෙන්නේ නැත.

දිවා ආහාරය සඳහා ඔවුහු පාන් සමග තැම්බූ වට්ටක්කා අනුභව කළ හ. ඔවුහු වට්ටක්කා ලස්සණ හැඩවලට තම පිඟානේ තබාගත් හ. තදීම වර්ණයකින් යුතු මොළොක් වට්ටක්කා ඔවුන් ගේ පිහිවලින් තදීමට කැපිගියේ ය. කෑම මේසයේ දී ආහාර සමග සෙල්ලම් කිරීමට අම්මා කවදාකවත් ඔවුන්ට ඉඩ දෙන්නේ නැත. ඔවුන් පිඟානේ කිසිවක් ඉතිරි නොකොට බෙදන ලද සියල්ල විනීත ව ආහාරයට ගත යුතු ය. එහෙත් මෙවර කන්නට පෙර රසවත්, තහ පාට තැම්බූ වට්ටක්කාවලින් ලස්සණ හැඩ කපන්නට ඇය ඔවුනට ඉඩ දුන්නා ය.

තවත් වේලාවක ඔවුහු දවල් කෑම සඳහා හබඩ් ස්කොෂ්* කැකිරි බේක් කළ හ. ස්කොෂ් ගෙඩිවල පොත්ත ඉතා ඝන වූ අතර අම්මා ඒවා කැබැලිවලට කැපුවේ අප්පච්චි ගේ පොරොවෙනි. පෝරණුවේ දමා බේක් කරන ලද කැබැලිවල

* හබඩ් ස්කොෂ් - කොළ පැහැ'ති හෝ තද පැහැ'ති පොත්තක් [illegible] ශීත කාලයේ වැවෙන ස්කොෂ් කැකිරි වර්ගයක්.

Scanned with CamScanner

මොලොක් වූ මැදට බටර් ගා කෑමටත්, ලෙල්ලේ ඇති කහ පැහැති මදය හැන්දකින් සූරා කෑමටත් ලෝරා ඉතා ප්‍රිය කළා ය.

දැන් රාත්‍රි ආහාරය සඳහා ඔවුන්ට ඉරිඟු හා කිරි තිබිණි. එය ද ප්‍රණීත ආහාරයක් විය. එය කොතරම් ප්‍රණීත ද යත් අම්මා ඉරිඟු කරල් සුද්ද කිරීමෙන් පසු ඉරිඟු තම්බන තෙක් ලෝරාට ඉවසා සිටීමට නො හැකි වූ තරම්. ඉරිඟු සුද්ද කිරීම සඳහා දවස් දෙක තුනක් ගතවෙයි.

පළමු දිනයේ අම්මා උදුන පිරිසිදු කොට එහි ඇති අළු ඉවතට ඇදදැමුවා ය. ඉන් පසු අලුත් පිරිසිදු දර කැබැලි කිහිපයක් දවා එහි අළු ගෙන කුඩා රෙදි බෑගයකට දැමුවා ය.

ඒ රාත්‍රියේ අප්පච්චි විශාල, මහත ඇට සහිත ඉරිඟු කරල් ගෙන ආවේ ය. ඔහු ඒවායේ අග ඇති සිහින් බොල් පොතු ගැලවී යන සේ ඉරිඟු කරල් හොඳින් ඇතිල්ලුවේ ය. ඊ ළඟට ඔහු විශාල බඳුනක් ගෙන බඳුන පිරෙන තුරු ම හොඳ ඉරිඟු කරල් සියල්ල එයට දැමුවේ ය.

පසු දා උදයේ ම අම්මා පොතු ගලවන ලද ඉරිඟු කරල් හා අළු බෑගය ලොකු යකඩ බඳුනට දැමුවා ය. බඳුනට වතුර පිරවූ ඇය, දිගු වේලාවක් තිස්සේ එය රත් වන්නට තැබුවා ය. අන්තිමේ දී ඉරිඟු ඇට තැම්බෙන්නට විය. ඒවා තැම්බෙත් ම ඒවායේ සිවිය හැලී ගැලවී ගියේ ය.

සෑම කරලක ම පොතු ගැලවුණු පසු බර’ති බඳුන පිටතට ගෙන ගිය අම්මා පිරිසිදු බේසමකට උල්පතෙන් ගත් වතුර පුරවා බඳුනේ ඇති ඉරිඟු කරල් බේසමට දැමුවා ය.

අනතුරුව ඇඳ සිටි මල් සහිත ගවුමේ දිග අත් වැලමිට ළඟට නවාගත් ඇය බේසම අසල දණ ගසාගෙන පොතු ගැලවී යන තුරු ඉරිඟු කරල් අත්වලින් හොඳට අතුල්ලන්නට වූවා ය. ගැලවුණු ඉරිඟු පොතු වතුරේ පාවෙන්නට විය.

වරින් වර කිලුටු වතුර ඉවත හැලූ ඇය උල්පතෙන් ගෙනා වතුරෙන් යළිත් බේසම පුරවාගත්තා ය. සෑම පොත්තක් ම ගැලවී ඉරිඟු කරල් හොඳින් සේදෙන තුරු ම ඇය අලුත් වතුර දමමින් අත්වලින් ඉරිඟු කරල් හොඳින් ඇතිල්ලුවා ය.

පිරිසිදු වතුරෙන් ඉරිඟු කරල් සෝදන අම්මා වෙතින් ශෝභන පෙනුමක් දිස්විය. ඇගේ නග්න දෑත් මහත ය. සුදු ය. ඇගේ කම්මුල් තද රතු පැහැ වූ අතර කළු පැහැති හිසකේ සිනිඳු, දිස්න දෙන සුලු ඒවා විය.

ඈ කිසිවිටෙකත් ඇගේ කදිම ගවුමේ වතුර බිංදුවක්වත් ඉහිරවාගත්තේ නැත. අන්තිමේ දී ඉරිඟු කරල් පිරිසිදු වූ පසු අම්මා මෘදු සුදු පැහැති ඉරිඟු ඇට ගබඩා කාමරයේ ඇති විශාල බුජමකට දැමුවා ය. දැන් ඔවුන්ට රෑ කෑම සඳහා ඉරිඟු හා කිරි තිබේ.

ඉඳහිටෙක ඔවුහු උදේ ආහාරය සඳහා මේපල් පැණි සමඟ ඉරිඟු කෑ හ. තවත් විටෙක අම්මා ඌරු තෙල්වලින් ඉරිඟු ඇට බැද්දා ය. එහෙත් ලෝරා වැඩියෙන් ම ප්‍රිය කළේ කිරි සමඟ ඉරිඟු කෑමටයි.

සරත් සෘතුව ඉතා විනෝදජනක ය. ඒ කාලයේ කරන්නට වැඩ රාශියක් තිබේ. කන්නට ඉතා රසවත් කෑම වර්ග එමට ය. බලන්නට අලුත් අලුත් දේ බොහෝ ම ය. ලෝරා උදේ සවස් රෑ වන තුරු ම ලේනුන් මෙන් එහා මෙහා දුවමින් ද නොනවත්වා ම දොඩවමින් ද සිටියා ය.

එක් සීතල උදෑසනක පාර දිගේ යන්ත්‍රයක් එනු දක්නා ලදී. අශ්වයින් හතර දෙනෙකු විසින් ඇදගෙන ආ එහි මිනිස්සු දෙදෙනෙක් වාඩිවී සිටිය හ. අශ්වයින් යන්ත්‍රය ඇදගෙන ගියේ අප්පච්චි, හෙන්රි මාමා, සීයා හා පීටර්සන් මහතා ඔවුන් ගේ තිරිඟු ගොඩගසා ඇති තෙනට ය.

තවත් මිනිස්සු දෙදෙනෙක් ඊට පිටුපසින් තවත් කුඩා යන්ත්‍රයක් පදවාගෙන ගිය හ.

ධාන්‍ය පාගන යන්ත්‍ර ආ බව අප්පච්චි අම්මාට හඬ ගා කීවේ ය. ඊ ළඟට ඔහු සිය අශ්ව ජෝඩුව රැගෙන ලහිලහියේ කෙතට ගියේ ය. ලෝරා හා මේරි ද අම්මා ගෙන් අවසර ගෙන ඔහු පසුපස කෙතට දුව ගිය හ. ඔවුන්ට ඈත් වී බලා සිටිය හැකි ය. එහෙත් ඔවුන් යන්ත්‍ර වැඩ කරන තැනට නොයැමට පරිස්සම් විය යුතු ය.



අශ්වයා පිට පැමිණි හෙන්රි මාමා, අශ්වයා ව ගසක බැන්දේ ය. ඊ ළඟට ඔහු හා අප්පච්චි අනෙක් සියලු ම අශ්වයින් කුඩා යන්ත්‍රයට බැන්ද හ. එහි අශ්වයෝ අට දෙනෙක් සිටිය හ. යන්ත්‍රයේ මැදින් සතර අතට විහිදුණු දිග ලියක අගට, උන් දෙදෙනා බැගින් බඳින ලදි. දිගු යකඩ පොල්ලක් මේ යන්ත්‍රයේ සිට විශාල යන්ත්‍රයට බිම දිගේ දිවෙන පරිදි සවි කොට තිබේ.

එතැන් පටන් ලෝරා හා මේරි විවිධ ප්‍රශ්න අසන්නට වූ හ. විශාල යන්ත්‍රය ධාන්‍ය වෙන් කරන උපකරණය බවත්, යකඩ පොල්ල කැරකෙන දණ්ඩ බවත්, කුඩා යන්ත්‍රය අශ්ව බලය බවත් අප්පච්චි ඔවුන්ට කියාදුන්නේ ය. අශ්වයින් අට දෙනෙකු විසින් ඇදගෙන යනු ලබන බැවින් එය අශ්ව බල අටක යන්ත්‍රයක් විය.

මිනිසෙකු අශ්ව බල යන්ත්‍රය මත වාඩිවී සිටි අතර සියල්ල සූදානම් වූ පසු ඔහු අශ්වයින්ට කස පහරක් දුන්නේ ය. අශ්වයෝ ගමන ආරම්භ කළ හ. අශ්වයෝ දෙදෙනා බැගින් උන් බඳින ලද

ලිය ඇදගෙන එකා පසුපස එකා වශයෙන් මිනිසා වටා ගමන් කරන්නට වූ හ. මෙසේ රවුමට ගමන් කරන උහු පොළොව මත නොනවත්වා ම පෙරළෙන කැරකෙන දණ්ඩ මතින් පරිස්සමට පැන්න හ.

උන් ගෙ ඇදීම නිසා කැරකෙන දණ්ඩ නොනවත්වා ම පෙරළෙන්නට වූ අතර එය පෙරළෙත් ම තිරිඟු ගොඩ අසල නවතා තිබූ ධාන්‍ය වෙන් කරන යන්ත්‍රය පණ ගැන්වෙන්නට විය.

මේ සියලු යන්ත්‍රෝපකරණ කලබලකාරී, විනිවිද යන මහත ශබ්ද ඇති කළේ ය. ලෝරා හා මේරි කෙත අද්දර සිටගෙන අවුනොවුන් ගේ දෑත් තදින් අල්ලාගෙන, ඇස් විසල් කරගෙන බලා සිටිය හ. මින් පෙර ඔවුන් මෙවැනි යන්ත්‍රයක් දැක තිබුණේ නැත. මින් පෙර එවැනි ගාලගෝට්ටියක් අසා තිබුණේ ද නැත.

අප්පච්චි හා හෙන්රි මාමා තිරිඟු ගොඩ මත සිටගෙන තිරිඟු ගොඩවල් ලෑල්ලක් මතට විසි කළ හ. ලෑල්ල මත සිටගෙන සිටින මිනිසෙක් තිරිඟු මිටි බඳින ලද පටි කපා තිරිඟු මිටි ධාන්‍ය වෙන් කරන යන්ත්‍රයේ කෙළවර ඇති සිදුරකට දමයි.

මේ සිදුර ධාන්‍ය වෙන් කරන යන්ත්‍රයේ කට මෙන් වූ අතර එයට දිගු යකඩ දත් තිබිණි. ඒ දත් සපසපා සිටියි. ඒවා තිරිඟු මිටි සැපූ අතර ධාන්‍ය වෙන් කරන යන්ත්‍රය ඒවා ගිලදැමුවේ ය. යන්ත්‍රයේ අනෙක් කෙළවරින් පිදුරු පිටතට විසි වූ අතර ... පැත්තක වූ සිදුරකින් තිරිඟු පිටතට ආවේ ය.

මිනිස්සු දෙදෙනා පිදුරු පාගමින් හා ඒවා ගොඩගසමින් වේගයෙන් වැඩ කළ හ. එක් මිනිසෙක් පිටතට එන තිරිඟු

Scanned with CamScanner

මලුවලට දමමින් වේගයෙන් වැඩ කළේ ය. යන්ත්‍රයෙන් පිටතට වැගිරෙන තිරිඟු බුසල් භාගයේ බඳුනකට වැටුණු අතර බඳුන පිරුණු විගස තවත් හිස් බඳුනක් එතැනට තැබූ ඔහු, පිරුණු බඳුන ධාන්‍ය මල්ලකට ඇමුවේ ය. එය හිස් කොට අනෙක් බඳුන පිරෙන්නට පෙර තිරිඟු වැගිරෙන පීල්ල අසලින් තබන්නට ඔහුට ගතවූයේ නිමේෂයකි.

සියලු ම මිනිසුන් තමන්ට හැකි තරම් වේගයෙන් වැඩ කළ අතර යන්ත්‍ර ද ඔවුන් සමඟ හරි හරියට ක්‍රියා කළේ ය. ලෝරා හා මේරි හුස්ම ගන්නට නො හැකිවාක් මෙන් පුදුම වී බලා සිටිය හ. ඔවුන් ගේ ඇස් විසල් වී, ඇත් තරයේ එකට බැඳී තිබිණි.

අශ්වයෝ රවුමට රවුමට ගමන් කළ හ. උන් දක්කන මිනිසා සිය කසය හඬ නංවා, "වැඩ, වැඩ කරනවා. ජෝන්! වැඩ අතපසු කරන්න හදලා බෑ!" යි කෑගායි. සට සට ගාමින් කසය ද ඒ වේගයෙන් ම හඬ නඟයි. "ඒයි පරිස්සමින්, බිලී! හෙමින්, කොල්ලො! ඔය විදියට හයියෙන් දුවන්න ඕන නෑ."

ධාන්‍ය වෙන් කරන යන්ත්‍රය තිරිඟු මිටි ගිලදැමූ විට රන්වන පිදුරු ගස් රන්වන් වලාකුළක් සේ සුළඟේ පාවී ගියේ ය. රන් හා දුඹුරු පැහැ මිශ්‍ර තිරිඟු පීල්ල දිගේ වැගිරුණේ ය. එවිට මිනිස්සු ලහිලහියේ ඒවා මලුවලට පිරවූ හ. අප්පච්චි හා හෙන්රි මාමා හැකි තරම් වේගයෙන් තිරිඟු මිටි ලෑල්ල මතට ඇමූ හ. දහඩියා හා දූවිල්ල දස අත පැතිරී යයි.

ලෝරා හා මේරි ඔවුන්ට හැකි තරම් වේලා බලා සිටිය හ. ඉන් පසු ඒ මිනිස්සුන්ට දවල් කෑම පිසින අම්මාට උදවු කිරීම සඳහා යළිත් ගෙදර දුව ගිය හ.

ගෝවා හා මස් ඇමූ විශාල බඳුනක් උදුනේ තැම්බෙමින් තිබිණි. විශාල බෝංචි බඳුනක් හා ජොනි-කේක් ගෙඩියක් පෝරණුවේ බේක් වෙයි. ලෝරා හා මේරි කෑම මේසය සූදානම් කළ හ. ඔවුහු ලුණු ඇමූ පාන් හා බටර් ද, තැම්බූ වට්ටක්කා බඳුන් ද, වට්ටක්කා පස්තෑල, වියළි බෙරි පස්තෑල හා විස්කෝතු ද, චීස්, පැණි හා කිරි සහිත කෙණ්ඩි ද මේසය මත තැබූ හ.

අනතුරුව තැම්බූ අර්තාපල්, ගෝවා හා මස් ද, බේක් කළ බෝංචි ද උණු ජොනි-කේක් හා බේක් කළ හබඩ් ස්කොෂ් කැකිරි ද මේසය මත තැබූ අම්මා තේ වත් කළා ය.

ඉරිඟු පිටිවලින් සාදන ආහාරය ජොනි-කේක් යනුවෙන් හඳුන්වන්නේ ඇයි දැයි ලෝරා නිතර ම කල්පනා කළා ය. එය කේක් වර්ගයක් නො වේ. උතුරු දිග සොල්දාදුවන් එයට ජොනි-කේක් යනුවෙන් නො කීවා නම් අම්මා ද එය දන්නේ නැත. තමන් සටනේ යෙදී සිටි දකුණු පළාතේ මිනිසුන් මේ කේක් විශාල වශයෙන් ආහාරයට ගත් බැවින් උතුරු දිග සොල්දාදුවෝ ඒවා ජොනි-කේක් යනුවෙන් හැඳින්වූ හ. ඔවුන් දකුණු දිග සොල්දාදුවන් ව හැඳින්වූයේ ජොනි-රෙබ්ස්* යනුවෙනි. සමහර විට ඔවුන් විනෝදයට මෙන් දකුණුකරයේ පාන්, කේක යනුවෙන් හඳුන්වන්නට ඇත.

එය ජර්නි-කේක් යනුවෙන් නිවැරැදි විය යුතු යැයි සමහරු කියනු අම්මා අසා තිබේ. එහෙත් ඇ ඒ පිළිබඳ ව දන්නේ නැත. එය ගමනක් යන විට ගෙන යාමට තරම් ඉතා හොඳ පාන් වර්ගයක් නම් නො වේ.

මධ්‍යාහ්නය වන විට ධාන්‍ය කපන්නෝ ආහාරවලින් පිරුණු මේසය වෙත ආ හ. ඔවුන් ඉතා වෙහෙස වී වැඩ කොට ඇඩි කුසගින්නෙන් පසු වූ බැවින් ඒ ආහාර කිසිවක් වැඩි වූයේ නැත.

සන්ධ්‍යා භාගය වන විට ධාන්‍ය වෙන් කිරීමේ කටයුතු සියල්ල අවසන් විය. යන්ත්‍ර අයිතිකරුවෝ මහන්සිය සඳහා ඔවුන්ට ලැබුණු තිරිඟු මලු ද රැගෙන මහ වනය මැදින් යන්නට ගියහ. ඊ ළඟට ඔවුන් තිරිඟු ගොඩගසාගෙන ඒවා වෙන් කිරීමට යන්ත්‍ර එන තෙක් බලා සිටින අසල්වැසියන් ගේ කෙත්වලට යනු ඇත.

අප්පච්චි ඒ රාත්‍රියේ ඉතා වෙහෙසට පත් ව සිටියේ ය. එහෙත් ඔහු සිටියේ ප්‍රීතියෙනි. ඔහු අම්මාට මෙසේ කීවේ ය:

"ඔය මැෂිමෙන් මේ එක දවස කරපු වැඩ ටික ගොයම් ගහන ලීයෙන් කරන්න ගියා නම් එහෙම් හෙන්රිටයි, පීටර්සන්ටයි, අප්පච්චිටයි, මටයි සති ගාණක් ගත වෙයි. ඒ කොච්චර කෙරුවත් අපට මේ තරම් තිරිඟු අස්වැන්නක් නම් ලැබෙන එකක් නෑ. අනෙක මේ තරමට සුද්ද වෙන්නෙත් නෑ.

"ඒ මැෂිම අපූරු අලුත් නිස්පාදනයක්," ඔහු කීවේ ය. "අනෙක් කට්ටියට පරණ තාලෙන් ම වැඩ කරන්න ඕන නම්

* ජොනි-රෙබ්ස් - ඇමෙරිකානු සිවිල් යුද්ධයේ දකුණුදිග සොල්දාදුවෝ

Scanned with CamScanner

එහෙම කරපුදෙන්, ඒත් මං දියුණු වෙන්න කැමැති මිනිහෙක්. අපි මේ ජීවත් වෙන්නෙ හොඳ කාලෙක. මං තිරිඟු වවන තාක් කල් ළඟ පාත කොහේ හරි මැෂිමක් තියෙනව නම් ඒක ගෙනල්ලා තිරිඟු ටික වෙන් කරගන්නවා."

ලෝරා හා කතා කිරීමට නො හැකි තරමට ඒ රාත්‍රියේ ඔහු වෙහෙස වී සිටියේ ය. එහෙත් ලෝරා ඔහු පිළිබඳ ව ආඩම්බර වූවා ය. තම තමන් ගේ තිරිඟු ගොඩගසාගැනීමට අනෙක් මිනිසුන් ව උනන්දු කළේත්, තිරිඟු පාගන යන්ත්‍රය ගෙන්නුවේත් අප්පච්චි ය. එය පුදුමාකාර යන්ත්‍රයකි. එය පැමිණීම ගැන හැම දෙනා ම මහත් ප්‍රීතියට පත් ව සිටිය හ



13 පරිච්ඡේදය

කැලෑවේ සිටි මුවා

ග්‍රී කාලයේ තණකොළ වියළී මැලවී යමින් තිබූ අතර දෙනුන් කැලෑවෙන් ඉවතට දක්කාගෙන විත් පිදුරු මඩුවේ ගාල් කොට කෑම දිය යුතු විය. සීතල සරත් වර්ෂාව ඇදහැලෙන්නට පටන්ගනිත් ම සියලු ම දීප්තිමත් පැහැයන් ගෙන් යුතු ගස්වල කොළ මලානික දුඹුරු පැහැයකට හැරුණේ ය.

තවදුරටත් ගෙවත්තේ ගස් යට සෙල්ලම් කළ නො හැකි ය. එහෙත් වර්ෂා සමයේ අප්පච්චි නිවසේ සිටින බැවින් ඔහු යළිත් ඊ කැමෙන් පසු රවුකිඤ්ඤය වයන්නට වූයේ ය.

අනතුරුව වර්ෂාව නැවතිණි. කාලගුණය තවත් සීතල වන්නට විය. හිමිදිරි උදෑසන සෑම තැනම හිමෙන් බබලමින් තිබිණි. දවස් කෙටි වන්නට වූ අතර ගෙතුළ උණුසුමින් තැබීම සඳහා මුළු දවස පුරා ම උදුනේ කුඩා ගිනිමැළයක් දැල්විණි. ශීත සෘතුව උදා වීමට වැඩි කාලයක් නැත.

අටුව හා ගබඩාව යළිත් වරක් හොඳ කෑම වර්ගවලින් පිරී තිබිණි. ලෝරා හා මේරි ඔවුන් ගේ රෙදි හැඟැලි ඇතිරිලි

මසන්නට පටන්ගත් හ. යළිත් සියල්ල උණුසුමින් හා සුව පහසුවෙන් පිරෙන්නට විය.

එක් රාත්‍රියක ඉස්තාලයේ වැඩපළ කිරීමෙන් පසු නිවෙසට ආ අප්පච්චි රෑ කෑමෙන් පසු මුවකු අල්ලාගැනීම සඳහා ලුණු උගුලට යන බව කීවේ ය. වසන්ත කාලයේ පටන් කුඩා නිවසේ කෑමට අලුත් මස් නො වී ය. එහෙත් දැන් කුඩා පැටවුන් වැඩී ඇති බැවින් අප්පච්චිට යළිත් දඩයමේ යාමට හැකි ය.

අප්පච්චි තමාට සැඟවී බලා සිටි හැකි ගස් කොළන් අවට පිහිටි මහ වනයේ එළිමහන් බිමක ලුණු උගුලක් අටවා තිබිණි. ලුණු උගුල යනු මුවන් ලුණු කෑමට එන තැනකි. පොළොව මත ලුණු සහිත ස්ථානයක් හමු වූ විට උහු ඒවා ලෙව කෑම සඳහා එතැනට පැමිණෙති. ලුණු උගුල යනුවෙන් හඳුන්වන්නේ එයයි. අප්පච්චි එක් තැනක යහමින් ලුණු ඉස ලුණු උගුලක් සාදා තිබිණි.

රෑ කෑමෙන් පසු තුවක්කුව ගත් අප්පච්චි කැලෑවට ගියේ ය. ලෝරා හා මේරි කතාන්දර හෝ සංගීතය නොමැති ව නින්දට ගිය හ.

උදෑසන නින්දෙන් පිබිදුණු විගස ඔවුහු ජනේලය වෙත දිවූ හ. එහෙත් ඕක් ගස්වල මුවකු එල්ලා තිබුණේ නැත. අප්පච්චි මින් පෙර කිසිදාක මුවකු ඇල්ලීමට ගොස් හිස් අතින් ගෙදර විත් නැත. කුමක් සිතිය යුතු දැයි ලෝරා හා මේරි නොදත් හ.

සීතලෙන් ආරක්ෂා වීම සඳහා කුඩා නිවස හා ගව මඩුව වටේට වියළි කොළ හා පිදුරු ගොඩගසා, ඒවා උඩින් බරට ගල් තබමින් අප්පච්චි මුළු දවස පුරා ම කාර්යබහුල ව සිටියේ ය. කාලගුණය මුළු දවස පුරා ම වඩ වඩාත් සීතල වන්නට වූ අතර ඒ රාත්‍රියේ යළිත් වරක් පෝරණුවේ ගිනිමැළයක් ගසන ලදි. සීත කාලය සඳහා නිවසේ ජනේල තදින් වසා සිදුරු හා හිඩැසි අහුරා තිබිණි.

රෑ කෑමෙන් පසු අප්පච්චි ලෝරා ව සිය දණහිස මත හිඳුවාගත්තේ ය. මේරි ඔහු අසලින් ඇගේ කුඩා පුටුවේ වාඩිවී සිටියා ය. ඉන් පසු අප්පච්චි මෙසේ කීවේ ය:

"දැන් මං කියන්නම් මොකද අද කෑමට ඔයගොල්ලන්ට අලුත් මුව මස් නැත්තෙ කියලා.

"මං ලුණු උගුලට ගිහින් ලොකු ඕක් ගහකට නැඟගත්තා. උගුල දිහා හොඳට බලාගෙන සුව පහසුවෙන් ඉන්න පුළුවන් අත්තක් මට හම්බ වුණා. එන ඕන ම සතෙකුට වෙඩි තියන්න පුළුවන් තරම් ළඟින් තමයි මං හිටියෙ. මං පතරොම් පුරවපු තුවක්කුව දණහිස් උඩ තියාගෙන හිටියා.

"හඳ පායලා එළිමහන් තැන එළිය වෙනකම් මං එතන වාඩිවෙලා බලා හිටියා.

"ඊයෙ මුළු දවස ම දර කපලා මං ටිකක් මහන්සි වෙලයි හිටියෙ. ඉතින් මට නින්ද යන්න ඇති. මොකද මට තේරුණා මං ඇස් අරිනවා.

"ලොකු රවුම් හඳ නැඟුණා විතරයි, අහසෙ පහළින් හඳ පායලා තියෙනවා ගස්වල කොළ අස්සෙන් මට පේනවා. ඒක ළඟින් ම මං දැක්කා මුවෙක් හිටගෙන ඉන්නවා. ඌ ඔළුව උඩට උස්සගෙන ඇහුම්කන් දීගෙන ඉන්නවා. උගේ ලොකු අතු අං උගේ ඔළුවට උඩින් දික් වෙලා. හඳ එළියට ඌ කළු පාට වෙලා.

"ඒක නියම ඉලක්කෙ. ඒත් ඌ හරි ම ලස්සණයි. කොයිතරම් ශක්තිමත්, නිදහස්, හීලෑ නැති පෙනුමක් ඌට තිබුණ ද කිවුවොත් මට ඌට වෙඩි තියන්න බැරි වුණා. ඌ අන්ධකාර කැලෑවට පැනලා යනකම් ම මං එතන වාඩිවෙලා ඌ දිහා බලා හිටියා.

"ඊට පස්සෙ මට මතක් වුණා අම්මයි, මගේ පුංචි කෙල්ලො දෙන්නයි මං හොඳ අලුත් මුව මස් ටිකක් ගෙදර ගේනකං බලා ඉන්නවා නේ ද කියලා. ඊ ළඟ පාර නම් වෙඩි තියනවමයි කියලා මං හිතාගත්තා.

"ටික වෙලාවකට පස්සෙ ලොකු වලහෙක් ගාටගාට එළිමහන් තැනට ආවා. මුළු ග්‍රීස්ම කාලෙ ම බෙරි ගෙඩියි, ගස්වල මුලුයි කාලා ඌ කොච්චර මහත ද කිවුවොත් වලස්සු දෙන්නෙක් තරම් ලොකුයි. ඌ හඳ එළිය මැදින් එළිමහන් තැන හරහා හතර ගාතෙන් යන අතරෙ උගෙ ඔළුව දෙපැත්තට පැද්දුණා. අන්තිමේ දී ඌ දිරච්ච කොටයක් ළඟට ආවා. ඌ ඒක ඉව කරලා ඇහුම්කන් දුන්නා. ඊට පස්සෙ කකුලෙන් ඒක දෙකට පළලා කැඩිච්ච කෑලි ඉව කරලා මහත සුදු මුල් කන්න පටන්ගත්තා.

"ඊට පස්සෙ පස්ස ගාත්වලින් හිටගෙන සද්දයක්වත් නැතුව වටපිට බලන්න පටන්ගත්තා. මොකක් හරි අනතුරක් ගැන ඌට සැක හිතිලා වගෙයි පෙනුණෙ. ඒක මොකක් ද කියලා බලන්න හරි, ඉව කරන්න හරි තමයි ඌ හැදුවෙ.

"ඌට එක එල්ලෙ ම වෙඩි තියන්න පුළුවන්. ඒත් මං ලොකු ආසාවකින් ඌ දිහා බලා හිටියා. හඳ එළිය මැද කැලේ කොයිතරම් සාන්ත ද කිවුවොත් මට මගේ තුවක්කුව එහෙම ඊටින් ම අමතක වුණා. ඌ අමාරුවෙන් ඇවිදගෙන කැලේට යන තුරු ම මට ඌට වෙඩි තියන්න කල්පනාවක්වත් වුණේ නෑ.

"මේක හරියන වැඩක් නෙවෙයි," මං හිතුවා "මේ විදියට මට කවදාවත් මසක් හොයාගන්න වෙන්නෙ නෑ."

"මං ආයෙමත් අත්ත උඩ හරිබරි ගැහිලා බලා හිටියා. මේ වතාවෙ දකින සතාට වෙඩි තියනවා කියලා මං හිතාගත්තා.

"හඳ තවත් ඉහළට නැග්ගා. පුංචි එළිමහන් තැනට හඳ එළිය හොඳට ම වැටිලා. ඒ වටේට ගස් අතරෙ හෙවණැලි කළු පාටයි.

"හුඟ වෙලාවකට පස්සෙ මුව දෙනකුයි, උගෙ අවුරුද්දක් දෙකක් විතර ඇති පැටියයි හෙවණැලි අස්සෙන් හෙමිහිට එළියට ආවා. උන් පොඩියක්වත් බය වෙලා හිටියෙ නෑ. උන් මං ලුණු ඉහපු තැනට ගිහිං ඒකෙන් ඩිංගක් ලෙව කෑවා.

"ඊ ළඟට ඔළුව උස්සලා දෙන්නට දෙන්නා දිහා බැලුවා. පැටියා මුව දෙන ළඟට ගිහිං හිටගත්තා. උන් එතන එකට හිටගෙන කැලේ දිහායි, හඳ එළිය දිහායි බලාගෙන හිටියා. උන්ගේ ලොකු ඇස් දිලිසෙනවා, ඒවා කරුණාවන්තයි.

"උන් හෙවණැලිවලට මුවා වෙලා ඈතට යනතුරු ම මං එතන ඉඳගෙන උන් දිහා බලා හිටියා. ඊට පස්සෙ ගහෙන් බැහැලා ගෙදර ආවා."

"ඔයා උන්ට වෙඩි තිබ්බෙ නැති එක ගැන මට හරි සතුටුයි!" ලෝරා ඔහු ගේ කනට කොඳුරා කීවා ය.

"අපිට පානුයි, බටරුයි කන්න පුළුවන්." මේරි කීවා ය.

අප්පච්චි මේරි ව ඇගේ පුටුවෙන් ඔසවා දෙදෙනා ම තුරුලු කරගත්තේ ය.

"මගේ හොඳ කෙලි පැටව් දෙන්නා," ඔහු කීවේ ය. "දැන් ඉතිං නිදාගන්න වෙලාව හරි. මං රවුකිඤ්ඤය ගන්නකං දෙන්න ම දුවන්න."

ලෝරා හා මේරි යාච්ඤා කොට මිටි ඇඳේ ඇතිරිලි යට ඇඳී ගැහෙන විට අප්පච්චි රවුකිඤ්ඤය අතැ'ති ව ගිනිමැළය අසල වාඩිවී සිටියේ ය. ලාම්පුවේ එළිය අනවශ්‍ය බැවින් අම්මා එය නිවා දැමුවා ය. උදුනේ අනෙක් පසින් පැද්දෙන පුටුවේ වාඩිවූ ඈ

Scanned with CamScanner

මේස් කතුලක් ගොතන්නට වූවා ය. ගින්නේ ආලෝකය වැදී ඇගේ ගොතන කටු දිලිසෙයි.

ගිනිමැලයේ ආලෝකය හා සංගීත රාවය පිරුණු දීර්ඝ සිත සන්ධ්‍යාවන් යළිත් උදාවී ඇත.

අප්පච්චි ගයන අතරේ ඔහු ගේ රවුකිඤ්ඤය විලාප දුන්නේ ය:

"ඕ, සුසි-යා-නා, මා වෙනුවෙන් හඬන්නට එපා.
මං යනවා කැල්-ලි-ෆෝ-නි-යා,
බලන්නට රන් කුඩු සොයා."

අනතුරුව අප්පච්චි යළිත් මහලු ග්‍රිම්ස් ගේ ගීතය වයන්නට වූයේ ය. එහෙත් මෙවර ඔහු ගායනා කළේ අම්මා විස් සාදන විට කී වචන නො වේ. මේ වචන ඊට වඩා වෙනස් විය. අප්පච්චි ගේ ගැඹුරු ලයාන්විත හඬ මෘදු ලෙස මෙසේ ගැයුවේ ය:

"ඒ පරණ දැන හැඳුනුම්කම් අමතක වී,
මතකයෙන් ඈතට පලා යාවි ද?
ඒ පරණ දැන හැඳුනුම්කම් අමතක වෙවි ද,
ඈත අතීතය මතකෙට නෝවි ද?
ඈත අතීතය මතකෙට නෝවි ද මගේ යාළුවේ,
ඈත අතීතය මතකෙට නෝවි ද,
ඒ පරණ දැන හැඳුනුම්කම් අමතක වෙවි ද,
ඈත අතීතය මතකෙට නෝවි ද?"

වාදනය නැවතුණු පසු ලෝරා සිහින් හඬින් කතා කොට, "අප්පච්චි ඈත අතීතය කියන්නෙ මොකට ද?" යි ඇසුවා ය.

"ඒ කියන්නෙ හුඟාක් කාලෙකට ඉස්සර, ලෝරා," අප්පච්චි කීවේය. "දැන් නිදාගන්න ඉතින්."

එහෙත් මඳ වේලාවක් නොනිදා සිටි ලෝරා අප්පච්චි ගේ රවුකිඤ්ඤය නඟන ලයාන්විත සංගීත නාදයටත්, මහ වනයේ සුළඟ නඟන හුදෙකලා හඬටත් සවන් දුන්නා ය. ඇය ගිනි උදුන අසල බංකුව මත වාඩිවී සිටින අප්පච්චි දෙස බැලුවා ය. ගින්නේ ආලෝකය වැදී ඔහු ගේ දුඹුරුවන් හිසකේ හා රැවුළ දිලිසෙයි. තද දුඹුරුවන් රවුකිඤ්ඤය ද ඒ එළියේ දිස්න දෙයි. ඒ ළඟට ඇය හෙමිහිට පුටුව පද්දමින් ගොතන අම්මා දෙස බැලුවා ය.

"මේ දැන් කාලේ," ඇය සිහින් [illegible] ය.

උණුසුමින් පිරුණු නිවස, අප්පච්චි හා අම්මා, ගින්නේ ආලෝකය හා සංගීතය දැන් කාලෙට [illegible] ඇය සතුටු වූවා ය. ඒවා අමතක කරන්නට බැරි [illegible] මන්දයත් දැන් යනු දැන් ය. [illegible] කාලයකට එපිට එකක් වන්නේ නැත.

- විරාමය -

ලෝරා ගේ කතා මාලාවේ පළමුවැනි කෘතිය මෙතෙකින්
අවසන් වෙයි.